



★

# දිනමිණ


The Dinamina | 1909 ඇරැඹි ශ්‍රී ලංකාවේ ජාතික පුවත්පත | தினமின





යොවුන් ජනතා අද පත්‍රය සමඟ


ශ්‍රී බුද්ධ වර්ෂ 2564ක් වූ නවම් අව අමාවක ලත් ශනි දින | කාණ්ඩය 112 | පත්‍රය 75 | පිටු 20 | මිල රු.30 | web: www.dinamina.lk | ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කළ පුවත් පතකි | 2021 මාර්තු 13 සෙනසුරාදා


## නැ'හිර ජල ව්‍යාපෘතියට උපාංග ගෙන්වීමේ අක්‍රමිකතා නිසා

# කෝටි 6ක් වැඩියෙන් ගෙවන්න වෙලා



### රජයේ ගිණුම් කාරක සභාවේදී හෙළි වෙයි

ස්වර්ණා විජේකෝන්

නැගෙනහිර පළාතේ ජල සංවර්ධන ව්‍යාපෘතිය සඳහා 2013 වසරේදී ජීඅයි පයිප්ප සහ උපාංග ගෙන්වීමේදී සිදුව ඇති අක්‍රමිකතා හේතුවෙන් රුපියල් ලක්ෂ හයසිය විසි හතරකට අධික මුදලක් (62,499,656) වැඩි පුර ගෙවීමට රජයට සිදුව ඇතැයි පාර්ලිමේන්තුවේදී පැවැති රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේදී පසුගියදා (09) අනාවරණය කෙරිණි. පිට 06

## ශ්‍රී ලංකා ධජය සහිත පාපිස්නා පාවහන් වෙළෙඳපොළේ

### වෙළෙඳ දැන්වීම ගැන චීන සමාගමෙන් අහන්න

බීජිංහි ශ්‍රී ලංකා තානාපතිට විදේශ ලේකම් කියයි

නීත්‍යනුකූල පියවර ගන්නවා

රාජ්‍ය ඇමැති ලසන්ත අලගියවන්න



පිට 6

## දකුණු අප්‍රිකානු කොවිඩ් ප්‍රභේදය මෙරටින් හමු වෙයි

දකුණු අප්‍රිකානු කොවිඩ් වයිරස් ප්‍රභේදය වන B 1.351 පළමුවරට ශ්‍රී ලංකාවෙන්ද හමු වී ඇති බව වාර්තා වේ.

ටැන්සානියාවේ සිට පැමිණ නිරෝධායන මධ්‍යස්ථානයකට යොමු කර සිටියදී කොවිඩ් ආසාදිත බවට හඳුනා ගත් පුද්ගලයකුගෙන් එම වයිරස් ප්‍රභේදය හඳුනා ගෙන ගෙන ඇතැයි ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ අසාත්මිකතා, ප්‍රතිශක්ති විද්‍යා සහ සෛල ජෛව විද්‍යා ආයතනයේ අධ්‍යක්ෂ වෛද්‍ය චන්දිම ජීවන්දර මහතා පැවසීය.



ඡායාරූප - රුක්මාල් ගමගේ

## පාස්කු කොමිසමේ සියලු වාර්තා-වෙළුම් නීතිපතිට බාර දෙයි

රෝෂන් තුෂාර

පාස්කු ඉරු දින බෝම්බ ප්‍රහාර සම්බන්ධයෙන් විමර්ශන කළ ජනාධිපති කොමිෂන් සභාවේ සියලු වාර්තා වෙළුම් හා සාක්ෂි ලේඛන පිටුවක් අකුරක් නැර නීතිපතිවරයාට බාර දුන් බව ජනාධිපති නීති අධ්‍යක්ෂ ජනරාල් හරිගුප්තා රෝහණධීර මහතා ඊයේ (12) පැවසීය. පිට 06

## ප්‍රජාතන්ත්‍රවාදයට එන්නැයි මියන්මාරයට බල කරන්න

### එජාපය ආණ්ඩුවෙන් ඉල්ලයි

ශිරෝමි අබයසිංහ

ප්‍රජාතන්ත්‍රවාදී පාලනය නැවත ආරම්භ කරන්නැයි මියන්මාරයට බලපෑම් කරන ලෙස එක්සත් ජාතික පක්ෂය ශ්‍රී ලංකා ආණ්ඩුවෙන් ඉල්ලා සිටී. පිට 06

## සීනි බදු අඩු කිරීමෙන් කෝටි 1,590ක් රජයට අහිමි වෙලා

### හඳුන්නෙත්තිගෙන් පෙත්සමක්

නෙල්කා මැදගෙදර



ආනයනික සීනි සඳහා පැනවූ බදු අඩු කිරීමේදී රජයට රුපියල් කෝටි 1,590ක මුදලක් අහිමි වී ඇති බව පවසමින් ජනතා විමුක්ති පෙරමුණේ දේශපාලන මණ්ඩල සභික හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී සුනිල් හඳුන්නෙත්ති මහතා ශ්‍රේෂ්ඨාධිකරණයට ඊයේ (12) මූලික අයිතිවාසිකම් පෙත්සමක් ඉදිරිපත් කළේය. පිට 06

## සීනි ආනයනයෙන් ආණ්ඩුවට පාඩු නෑ




### මුදල් ලේකම් එස්. ආර්. ආටිගල

ජයසිරි මුණසිංහ

සීනි ආනයනය කිරීමේදී අය කළ විශේෂ තීරු බද්ද සීනි කිලෝ එකකින් රුපියල් 50 සිට ශත 25 දක්වා අඩු කිරීම තුළ රුපියල් බිලියන 15ක අලාභයක් හෝ පාඩුවක් රජයට සිදු වී නැතැයි මුදල් අමාත්‍යාංශය සහ මහා භාණ්ඩාගාරයේ ලේකම් එස්. ආර්. ආටිගල මහතා අවධාරණය කළේය. පිට 06

## කොළඹ රිමාන්ඩ් බන්ධනාගාරයේ සෝදිසියකින් තහනම් භාණ්ඩ රැසක් සොයා ගනී

බුද්ධිකා ඉඹුලාන



බන්ධනාගාර සෝදිසි රාජකාරියේ යොදවා සිටින විශේෂ කාර්ය බළකායේ නිලධාරීන් සමඟ කොළඹ රිමාන්ඩ් බන්ධනාගාර, වැලිකඩ බන්ධනාගාර හා බන්ධනාගාර බුද්ධි ඒකකයේ නිලධාරීන් එක්ව පෙරේදා (11) කොළඹ රිමාන්ඩ් බන්ධනාගාරයේදී කරන ලද සෝදිසි මෙහෙයුමකදී තහනම් භාණ්ඩ රැසක් සිරමැදිරි තුළ තිබී සොයා ගෙන ඇත. පිට 06

## මියන්මාරයට ආරාධනා කිරීම ගැටලුකාරියි



මෙරට පැවැත්වෙන බිම්ස්ටෙක් අමාත්‍ය මණ්ඩල රැස්වීම සඳහා මියන්මාර රජයේ විදේශ ඇමැතිවරයාට ආරාධනා කිරීම ගැටලු සහගත බව විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස මහතා පැවසීය. පිට 06

## ජාතික වෙළෙඳ ප්‍රතිපත්තියක් සකසන්න කමිටුවක්

පිට 6

## අසාද් සාලිට එරෙහිව ත්‍රෛනිකායික භික්ෂු එකමුතුව CIDයට යයි

සුභාෂිණී සේනානායක සහ රක්ෂණ ශ්‍රියන්ත

ජාතික පෙරමුණේ නායක අසාද් සාලි මහතා ඉකුත් 09 වැනිදා කළ ප්‍රකාශය සම්බන්ධයෙන් වහාම පරීක්ෂණයක් ආරම්භ කරන ලෙස ඉල්ලමින් ත්‍රෛනිකායික භික්ෂු එකමුතුව ඊයේ (12) අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට පැමිණිල්ලක් ඉදිරිපත් කළේය. පිට 06




පිට 6

එන්නත විද මෙරටට එන අයට නිරෝධායන තීරණය සළුදා

පිට 6

නි. ඇමැති නාලකට එරෙහි චෝදනා සාක්ෂි අනුව ප්‍රශ්න සහගතයි

ජනාධිපති නීතිඥ කාලිංග

එන්නත් කළ සුව සේවකයන් ප්‍රතිදේහ පරීක්ෂාවකට


සා/පෙළ පිළිතුරු පත්‍ර ඇගයීම 27 දා ඇරඹේ

20 නීතියට පටහැණියැයි ගොනු කළ පෙත්සම නිෂ්ප්‍රභයි

ජනවාරියේ සීනි-රසකැවිලි ආනයනයේ වැඩි වීමක්

රට වටා

ලොව වටා



# මෙරට කොරෝනා ආසාදිතයන් සංඛ්‍යාව 86,989 දක්වා ඉහළට

## සමස්ත මරණ 520ක්

**සුභාෂිණී සේනානායක**

මෙරටින් වාර්තා වන කොවිඩ් ආසාදිතයන් සංඛ්‍යාව මේ වන විට 86989 ක් දක්වා ඉහළ ගොස් තිබේ. මේ වන මින් සුවය ලැබූ සංඛ්‍යාව 83561 ක් වන අතර පෙරේදා (11) වාර්තා වූ මරණ සංඛ්‍යාවත් සමඟ සමස්ත මරණ සංඛ්‍යාව 520ක් දක්වා ඉහළ ගොස් තිබේ.

මේ අතර කොවිඩ්-19 ආසාදිතයන් 304 ක් ඊයේ (12 ) හඳුනාගත් බව යුද හමුදාපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා මහතා පවසයි. විදේශයන්හි සිට පැමිණි 12 දෙනෙකු කොවිඩ් ආසාදිත බවට හඳුනාගෙන ඇත.

මේ අතර ඊයේ(12) සිදු කර ඇති පී.සී.ආර්. පරීක්ෂණ සංඛාව 6054කි.

## 60ට වැඩි වැඩිහිටියන්ට පළමු එන්නත්කරණ වැඩසටහන ඇරඹේ



ශ්‍රී ලංකාවට ලැබුණු ඇස්ට්‍රා සෙනිකා කොවිෂීල්ඩ් එන්නත් මාත්‍රා 264 000 ප්‍රමාණය වයස අවුරුදු 60ට වැඩි වැඩිහිටියන්ට ලබාදීමේ පළමු එන්නත්කරණ වැඩසටහන සෞඛ්‍ය ඇමැතිනී පවිත්‍රා වන්නිආරච්චි මහත්මියගේ ප්‍රධානත්වයෙන් රාජගිරිය වික්ටෝරියා වැඩිහිටි නිවාසය සහ මාලබේ කොතලාවල පුර වැඩිහිටි නිවාසයේදී ඊයේ (12) ආරම්භ විය.

මෙහි පළමු එන්නත්කරණ වැඩසටහන යටතේ කොළඹ, ගම්පහ දිස්ත්‍රික්කවල සහ කොළඹ මහ නගර සභා සීමාවේ වෙසෙන වැඩහිටියන් ඉලක්ක කර ගනිමින් ලබාදීමට සැලසුම් කර ඇති බව වසංගත රෝග විද්‍යා අංශයේ අධ්‍යක්ෂ වෛද්‍ය සුදත් සමරවීර මහතා අවධාරණය කරයි.

එමෙන්ම, මේ වැඩපිළිවෙළට සමගාමීව කොළඹ සහ ගම්පහ දිස්ත්‍රික්කවල වැඩිහිටි නිවාසයන්හි සේවය කරන පාලිකාවන්ට සහ වැඩිහිටියන් බලා ගන්නා කාර්ය මණ්ඩලවලට ලබාදීමට ද සෞඛ්‍ය අමාත්‍යංශය තීරණය කර ඇත.

රාජ්‍ය ඇමැති මහාචාර්ය චන්න ජයසුමන, සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් විශ්‍රාමික මේජර් ජෙනරාල් විශේෂඥ වෛද්‍ය සංජීව මුණසිංහ, සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් වෛද්‍ය අසේල ගුණවර්ධන, සෞඛ්‍ය අමාත්‍යාංශයේ අතිරේක ලේකම් ලක්ෂ්මි සෝමතුංග, වසංගත රෝග විද්‍යා අංශයේ අධ්‍යක්ෂ වෛද්‍ය සුදත් සමරවීර මහත්ම මහත්මීහුද UNISEF ආයතනයේ නියෝජිතයන් ඇතුළු සෞඛ්‍ය නිලධාරීහු පිරිසක්ද මේ අවස්ථාවට සහභාගි වූහ.

## තවත් කොවිඩ් මරණ 5ක්

### සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්

**කොවිඩ් වයිරසය ශරීර ගත වීමෙන් තවත් මරණ 5ක් වාර්තා වී ඇති බව සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් වෛද්‍ය අසේල ගුණවර්ධන මහතා පවසයි. ඒ අනුව, මෙරටින් මේ දක්වා වාර්තා වී ඇති කොවිඩ් මරණ ගණන 520ක් දක්වා ඉහළ ගොස් තිබේ.**

**මෙලෙස මිය ගොස් ඇත්තේ නාවලපිටිය ප්‍රදේශයේ පදිංචිව සිටි 56 හැවිරිදි කාන්තාවක්, අඟුලාන ප්‍රදේශයේ පදිංචිව සිටි 63 හැවිරිදි කාන්තාවක්, මත්තේගොඩ ප්‍රදේශයේ පදිංචිව සිටි 80 හැවිරිදි කාන්තාවක්, බිබිල ප්‍රදේශයේ පදිංචිව සිටි 67 හැවිරිදි පිරිමි පුද්ගලයෙක් සහ දෙහිවල ප්‍රදේශයේ පදිංචිව සිටි 68 හැවිරිදි පිරිමි පුද්ගලයෙක් බව සෞඛ්‍ය අංශ අනාවරණය කර තිබේ.**

# ලොව කොවිඩ් වසංගතය පැතිරීම ඇරඹී වසරයි

## ආසාදිතයෝ කෝටි 12ක් ගෙවුණු වසරේ මරණ ලක්ෂ 26 පනී

**බුද්ධි කරුණාරත්න**

ලෝකයේ කොරෝනා වසංගතය පැතිරීම ආරම්භ වී මේ වන විට වසරක කාලයක් ගත වී ඇති අතර එම රෝග ආසාදිතයන් කෝටි 12කට එනම් එකොළොස් කෝටි අනූ එක් ලක්ෂ හතළිස් හයදහස් අටකට මේ වන විට ආසාදනය වී තිබේ. එයින් නව කෝටි හතළිස් හත් ලක්ෂ පනස් එක් ලක්ෂ තුන්සිය තිස් තුනක් සුවය ලබා ඇත. ගෙවී ගිය වසරට මෙතෙක් ලොව පුරා කොවිඩ් නිසා මරණ විසි හය ලක්ෂ හතළිස් දෙදහස් දෙසිය හැත්තෑ නවයක් සිදු වී තිබේ. මේ අනුව දැනට ක්‍රියාකාරී මට්ටමේ සිටින කොරෝනා රෝගීන් ගණන දෙකෝටි දාහත් ලක්ෂ පනස් දෙදහස් තුන්සිය අනූ හයකි.

එක් දිනක වාර්තා වූ කොරෝනා රෝගීන් ගණන අතරින් වැඩිම ආසාදිතයන් ගණන වාර්තා වූයේ ජනවාරි 08 වැනිදාය. එදින ලෝකයෙන් වාර්තා වූ කොරෝනා රෝගීන් ගණන 844,743කි. මාර්තු 10 වැනිදා වන විට එම ගණන 470,930ක් ලෙස වාර්තා වී ඇත. දෛනික මරණ ගණන වැඩියෙන්ම වාර්තා වූයේ ජනවාරි 20 වන අතර එය ගණිනින් 17,626ක් තරම් ඉහළ අගයක් ගත්තේය.





ලෝක පරිමාණයෙන් සෑම රටකටම පාහේ බලපෑ කොවිඩ් රෝගය වැඩි වශයෙන්ම ප්‍රචලිත වූයේ උතුරු සහ දකුණු අමෙරිකාවේ හා යුරෝපයේය. ලොව බලවත්ම රට වන අමෙරිකා එක්සත් ජනපදයේ කොරෝනා ආසාදන දෙකෝටි අනූ නව ලක්ෂ විසිපන්දහස් නවසිය දෙකක් වාර්තා විය. කොවිඩ් මරණ 543,721ක් ඊයේ (12) වනවිට අමෙරිකාවේ සිදු විය. ආසාදන අතින් දෙවැනි ස්ථානයේ ඉන්දියාව සිටියත් මරණ අතින් දෙවැනි ස්ථානයේ සිටින්නේ මරණ 273,124ක් වාර්තා වී ඇති බ්‍රසීලයයි. පවතින තත්ත්වය අනුව බ්‍රසීලය ලෝක ප්‍රජාවට අනතුරුදායක රටක් වශයෙන් ද නම් කෙරිණි.

යුරෝපයේ වැඩිම කොවිඩ් ආසාදන ප්‍රමාණයක් පෙන්නුම් කරන්නේ රෝගීන් 4,360,823ක් සහ මරණ 90,734ක් වාර්තා කළ රුසියාව සහ රෝගීන් 4,241,677ක් සහ මරණ 125,168ක් වාර්තා කළ එක්සත් රාජධානියයි. රෝගයේ මූලාරම්භය සිදු වූ චීනයේ මේ වන විට කොරෝනා රෝගීන් 90,027ක් වාර්තා වී ඇති අතර සම්පූර්ණ මරණ වාර්තා වී ඇත්තේ 4,636ක් පමණි. එරට සිටින රෝගීන් අතරින් 85,209ක් ම සුවය ලබා තිබීම ද විශේෂත්වයකි.

විවිධ පසුබෑම් තිබුණ ද කොවිඩ් මර්දනය කිරීම සඳහා එන්නත් කීපයක්ම දැන් භාවිත මට්ටමට පැමිණ තිබීම කොරෝනා අභියෝගය පරාජය කිරීම හමුවේ ලෝක ප්‍රජාව වෙත නව බලාපොරොත්තු ඇති කිරීමට සමත් වී ඇත.

## කොවිෂීල්ඩ් එන්නත් 59,548ක් දී අවසන්

### වසංගත විද්‍යා අංශය

**සුභාෂිණී සේනානායක**

මෙරට කොවිඩ් ව්‍යාප්තිය වැළැක්වීමට දෙන ඔක්ස්ෆර්ඩ් ඇස්ට්‍රා සෙනෙකා කොවිෂීල්ඩ් ප්‍රතිශක්තිකරණ එන්නත් 59548ක් ඊයේ (12) පෙරවරු 7.00 වනවිට ලබා දී ඇති බව වසංගත විද්‍යා අංශය පවසයි. පෙරේදා (11) එන්නත් 745ක් ලබා දී තිබේ. මෙරට කොරෝනා එන්නත්කරණ වැඩසටහන ඉකුත් ජනවාරි මස 29 වැනිදා ආරම්භ විය. සමස්තයක් ලෙස මේ ප්‍රතිශක්තිකරණ එන්නත්වලින් සියලු කොරෝනා වයිරස් ප්‍රභේද වැළැක්වීමේ සියයට 90ක හැකියාවක් ඇති බව නවතම සායනික පරීක්ෂණ අනාවරණය කර ඇති බව විදෙස් වාර්තා කියයි.

## දත්ත උපයෝගි කරගෙන සමාජයේ ආසාදිතයන් නැතැයි කියන්න බෑ

### මහජන පරීක්ෂකවරුන්ගේ සංගමයේ සභාපති

**සුභාෂිණී සේනානායක**

බස්නාහිර පළාතේ සිදු කරන පී.සී.ආර්. පරීක්ෂණ ප්‍රමාණය අඩුවීමත් සමඟ ආසාදිතයන් වාර්තා වීම පහළ ගොස් ඇති බව ශ්‍රී ලංකා මහජන පරීක්ෂකවරුන්ගේ සංගමයේ සභාපති උපුල් රෝහණ මහතා කියා සිටියි.

එම දත්ත උපයෝගි කරගෙන සමාජයේ ආසාදිතයන් නොමැතියැයි පැවසිය නොහැකි බව පවසන ඒ මහතා මරණ ඉහළයෑමෙන් සමාජයේ ආසාදිතයන් සිටින බව නිගමනය කළ හැකි බව ද කියා සිටියි.

"මේ වනවිට සමාජයේ වයස්ගත ජනතාව අතර මේ රෝගය පැතිරී තිබෙන බව පෙනී යනවා. ඒ නිසා කළ යුතුව තිබෙන්නේ එන්නත මත යැපිලා එයින් සියලු දේ විසඳෙනවායැයි සිතා නොසිට එන්නත ලබාදෙන ගමන් සමාජය පවතින ආකාරය ගැන අවබෝධයක් ගන්න අහඹු සාම්පල ලබාගෙන සැක සහිත ස්ථානවල පී.සී.ආර්. පරීක්ෂණ සිදුකිරීමයි. රටේ පවතින තත්ත්වය නිසියාකාරව අවබෝධ කරගත යුතුයි. යම් තරමකට රෝගීන් අඩුවීම අපට පෙන්නුම් කළත් පවතින තත්ත්වය නිසි ආකාරව අවබෝධ කරගන්නේ නැතිව මහජනතාවට එන්නත ලබාදීමෙන් සියලු ගැටලු විසඳෙනවායැයි සිතාගෙන කටයුතු කිරීම සුදුසු නැහැ. ඉන් අර්බුදකාරී තත්ත්වයකට කොවිඩ් -19 ව්‍යාප්තිය පත් වෙනවා. පසුගිය කාලයේ රෝගීන් අඩුවීමත් සමඟ පී.සී.ආර්. ප්‍රමණයත් අඩු කර තිබෙන ආකාරය අපි දුටුවා. රෝගීන් වැඩි ප්‍රමාණයක් හම්බ වුණු බස්නාහිර පී.සී.ආර්. පරීක්ෂණ ඉතාමත්ම පහළ ගිහින් තියෙනවා."

60 රස මිහිරු

## උස්වත්ත කන්ෆෙක්ෂනරි වර්ක්ස් ප්‍රයිවට් ලිමිටඩ්හි අනුග්‍රහයෙනි

# රුපියල් තිස්දහසක තෑගි

ත්‍යාග රටාව

පළමුවන ත්‍යාගය රුපියල් 10,000 — දෙවන ත්‍යාගය රුපියල් 5000

තෙවැනි ත්‍යාගය රුපියල් 3000 — රුපියල් 1000 බැගින් සැනසිලි ත්‍යාග 11යි.

ජයග්‍රාහකයන් තෝරාගනු ලබන්නේ කුසපත් ඇදීමෙනි. ජයග්‍රාහකයන්ගේ නම් සහ ප්‍රහේලිකාවේ නිවැරැදි විසඳුම් දිනමිණ පත්‍රයේ පළ වේ. ත්‍යාග මුදල් තෙමසක් ඇතුළත පිරිනැමේ.

## ටිපි ටිප් ප්‍රහේලිකා අංක - 38

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | | 3 | | 4 | 5 | ■ |
| ■ | | ■ | | ■ | 6 | | 7 |
| 8 | | 9 | ■ | 10 | | | |
| | ■ | 11 | 12 | ■ | 13 | | ■ |
| 14 | | ■ | 15 | | | | ■ |
| | ■ | 16 | | ■ | | ■ | 17 |
| 18 | | | | | ■ | 19 | |
| | ■ | 20 | | ■ | 21 | | |

නම: ------------------------------------

ලිපිනය: ------------------------------------

------------------------------------

දිනය: ------------ ------------ අත්සන:

**කොන්දේසි**

සතියට දෙවරක් පළවන මෙම ප්‍රහේලිකාව සඳහා මුදලින් රුපියල් තිස්දහසක් මාසිකව පිරිනැමේ. දිනමිණ පත්‍රයේ පළවන ප්‍රහේලිකා විසඳුම් පුරවා එය 6 X 3 සාමාන්‍ය කවරවල පහත සඳහන් ලිපිනයට එවිය යුතුය. ලිපියේ ඉහළින් වම් කෙළවරේ දිනමිණ ටිපි ටිප් ප්‍රහේලිකා අංක 38 යනුවෙන් සඳහන් කර දිනමිණ ප්‍රහේලිකාව තැ.පෙ. 1134, කොළඹ යන ලිපිනයට 2021 මාර්තු මස 31 වැනිදා හෝ ඊට පෙර උස්වත්ත Tipi Tip හෝ බිස්කට් දවටන දෙකක් සහිතව එවිය යුතුය. ලියුම් කවරයේ ඔබේ ආපසු ලිපිනය ද ලියන්න. ඡායාපිටපත් ප්‍රතික්ෂේප කැරේ. ලේක්හවුස් ආයතනයේ සහ උස්වත්ත සමූහ ව්‍යාපාරයේ සේවක සේවිකාවන්ට සහ ඔවුන්ගේ පවුල්වල සාමාජික සාමාජිකාවන්ට තරගයට ඉදිරිපත් විය නොහැකිය.

## උපකාරක පද

**හරහට**

1. බලයෙන් පහ කෙරුණු මියන්මාර නායිකාව
6. රෝදය
8. නිද්‍රාව
10. පාවැසුම්
11. සංස්කෘතික භාෂාව
13. තාල වර්ගයට අයත් ගසකි
14. ඉබේ සෑදුණු ජලාශය
15. ෂාරුක් ඛාන් හා කාජල් රඟන ජනප්‍රිය හින්දි චිත්‍රපටයකි.
16. ස්වර
18. ධර්ම මාර්ගය
19. භාවකු ගැන සඳහන් ජාතක කතාව
20. මාලදිවයිනේ අගනුවර
21. රාශි චක්‍රයේ 11 වැනි රාශිය

**පහළට**

2. කොරෝනා වයිරසය මුලින්ම හමු වූ චීන නගරය
3. සාර
4. යහපත් චර්යාවන් සහිත
5. සවන පැරකුම්බා රජුගේ බිසව
7. මේ කෘමියා කෑ තැන දැඩි වේදනාකාරීය
8. ස්පර්ශ සංවේදයක්, වේදනාව හා උෂ්ණත්වය දැනීමත් නැතිවීම.
9. දහය
12. පුරාතන තම්බපණ්ණිය අද හඳුන්වන නම
16. ශෝභන / යහපත්
17. පළමු ලම්භකර්ණ වංශික රජු
19. චර්ම

● සම්බන්ධීකරණය - ගාමිණී රූපානන්ද (අනුරූ මාධ්‍ය සේවා) 072 3561975




දිනමිණ
The Dinamina
1909 ඇරැඹි ශ්‍රී ලංකාවේ ජාතික පුවත්පත

35, ඩී. ආර්. විජයවර්ධන මාවත,
ලේක්හවුස්, කොළඹ.
දුරකතන - 2429429, 2331181, 2421181
ෆැක්ස් - 2429240
(කර්තෘ මණ්ඩලයට පමණයි)
2449069 (පොදු)
ඊ මේල් - editor.dinamina@lakehouse.lk
දැන්වීම් කළමනාකරු - 2429341

2021 මාර්තු 13 සෙනසුරාදා

# මිෂෙල් නෝනා - ඇවිත් යන්න!

ජිනීවා මානව හිමිකම් කවුන්සිලයේ හතළිස් හය වන සැසියේ අවසන් සාකච්ඡා මේ මස අග සතියේ පැවැත්වීමට නියමිතය. මේ අතර, විදේශ කටයුතු පිළිබඳ අමාත්‍ය දිනේෂ් ගුණවර්ධන මහතා කියා සිටින්නේ අපේ රණවිරුවන්ට එල්ල වී ඇති අභූත චෝදනාවලින් ඔවුන් නිදහස් කරගැනීම සඳහා ජාත්‍යන්තරය සමඟ සහයෝගයෙන් කටයුතු කරන බවය. මෙතෙක් ඒ සම්බන්ධයෙන් විදේශ කටයුතු අමාත්‍යාංශය සිදු කර ඇති කාර්යභාරය පැසසුම් කටයුතුය. එලෙසම ප්‍රතිඵලදායකය. මානවහිමිකම් සැසියේ පළමු වටයේදීම රටවල් විසි එකක් ශ්‍රී ලංකාව වෙනුවෙන් පෙනී සිටීමෙන් ඉහත තත්ත්වය තවදුරටත් සනාථ වෙයි. රජය මානව හිමිකම් කවුන්සිලයේ ඉදිරියේ නොසැලී ක්‍රියා කරන බව පෙනෙයි.

මානව හිමිකම් කවුන්සිලයේ ලෝකයේ මානුෂීය අයිතීන් වෙනුවෙන් පෙනී සිටින ප්‍රධාන ආයතනය ලෙස හැඳින්වීම නිවැරැදිය. එහෙත් එය අන්තර්ජාතික අධිකරණයක් නොවේ. එහි කාර්යභාරය වන්නේ එකිනෙක රටවල මානව හිමිකම් තත්ත්වය පිළිබඳ නිර්දේශ එක්සත් ජාතීන්ගේ සංවිධානය වෙත ඉදිරිපත් කිරීමය. අදාළ තීරණ ගත යුත්තේ එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලයයි. 2009 යුද්ධය අවසන් වීමෙන් පසු මානව හිමිකම් කවුන්සිලයේ ශ්‍රී ලංකාව දෙස බලා ඇත්තේ මධ්‍යස්ථ දෘෂ්ටියකින් නොවේ. එය දිගින් - දිගට ම පෙන්නුම් කර ඇති සත්‍යයකි. කවුන්සිලය මෙවර ද අපට චෝදනා පත්‍රයක් ඉදිරිපත් කළ අතර, පසුව එය සංශෝධනය කිරීමට තීරණයක් ගත්තේය.

ශ්‍රී ලංකාව එක්සත් ජාතීන්ගේ සංවිධානය සමඟ සහයෝගයෙන් කටයුතු කරන රාජ්‍යයකි. එක්සත් ජාතීන්ගේ සංවිධානයට අයත් විශේෂ ආයතන ගණනාවක සාමාජිකත්වය හිමි කර ගෙන ඇති ශ්‍රී ලංකාව සෑම ආයතනයක් සමඟම ආරවුලකින් තොරව කටයුතු කරගෙන යයි. එක්සත් ජාතීන්ගේ සාම සාධක හමුදාවට මෙරට බළ ඇණිවල සේවය සපයා දී ඇත. ගැටුම් ඇති කලාපවල සේවයට ගිය ශ්‍රී ලාංකේය ඇතැම් සෙබළුන් ඝාතනයට ලක් වී ඇත. එහෙත් සාම සාධක හමුදාව වෙනුවෙන් ශ්‍රී ලංකාව දක්වන දායකත්වය ඉවත් කරගෙන නැත. සාමයට ඇති කැමැත්ත හා සාමූහිකත්වයට ඇති දායකත්වය ඉන් පැහැදිලි වෙයි. ශ්‍රී ලංකාව යනු මානව හිමිකම් නොසලකා හරින රටක් නොවේ.

මානව හිමිකම් අංශවල අවධානයට ලක් වන ප්‍රධාන ක්ෂේත්‍ර කිහිපයක් පවතී. විවිධ ජාතීන්ට සමාන අවස්ථා ලබාදීම, ප්‍රජාතන්ත්‍රවාදය, මාධ්‍ය නිදහස, පුද්ගල අයිතීන් සුරක්ෂිත කිරීම ඒ අතර ප්‍රමුඛ වෙයි. 1970 ගණන්වල සිට 2009 දක්වාම ශ්‍රී ලංකාවේ මානව හිමිකම් අභියෝගයට ලක්කර ඇත්තේ එල්.ටී.ටී.ඊ. සංවිධානය මිස රජය නොවේ. උතුරේ ප්‍රජාතන්ත්‍රවාදය හා පුද්ගල නිදහස මුළුමනින්ම විනාශ කළ එල්.ටී.ටී.ඊ. සංවිධානය, රටේ සියලු ජාතීන්ගේ මානව අයිතීන් උල්ලංඝනය වන ලෙස ක්‍රියා කර තිබේ. ළමා සොල්දාදුවන් පුහුණු කිරීම, බිම් බෝම්බ ඇටවීම හා මරාගෙන මැරෙන බෝම්බකරුවන් ඇති කිරීම ශ්‍රී ලංකාවට හඳුන්වා දුන්නේ ප්‍රභාකරන්ය. එහෙත් කොටි සංවිධානයේ ක්‍රියාකාරකම් මානව හිමිකම් කවුන්සිලයේ අවධානයට ලක් වූයේ නැත.

මානව හිමිකම් කොමසාරිස්වරිය වන මිෂෙල් බැචලේ මැතිනිය ශ්‍රී ලංකාව පිළිබඳ සිය වාර්තාව සකස් කර ඇත්තේ රට හා රටේ ක්‍රියාකාරිත්වය පිළිබඳ හොඳ වැටහීමකින් නොවේ. එක අතකින් ඇගේ වාර්තාව අසත්‍ය තොරතුරු මත සම්පාදනය වී ඇත. තව අතකින් පක්ෂග්‍රාහී වී ඇත. ඇය පක්ෂග්‍රාහී වී ඇත්තේ දෙමළ ඩයස්පෝරාවේ හා ගෝලීය දෙමළ සන්ධානයේ මතවාදවලට යැයි සිතන්නට කරුණු තිබේ. මේ සංවිධාන විසින් ඉදිරිපත් කරන ලද පෙත්සම් වග විභාගයකින් තොරව කොමසාරිස්වරිය පිළිගෙන තිබේ. මෙබඳු වැදගත් ජගත් ආයතනයක් එලෙස ක්‍රියා කිරීම බරපතළ වැරැද්දකි. ලොව ප්‍රකට දේශපාලන විචාරකයන් කිහිපදෙනකු එය පෙන්වා දී තිබේ.

ශ්‍රී ලංකාව හා ඉන්දියාව ලෝකයේ ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍ය පාලනය පිළිබඳ නිදසුන් සේ දැක්විය හැකි හොඳම රටවල් දෙක ලෙස හඳුනාගත හැකිය. රටවල් දෙකෙහිම පාර්ලිමේන්තු සම්ප්‍රදායට දීර්ඝ ඉතිහාසයක් තිබේ. වරින් - වර විවිධාකාරයේ දේශපාලන අරගල මතු වුව ප්‍රජාතන්ත්‍රවාදය හා පාර්ලිමේන්තු ක්‍රමය ආරක්ෂා කරගැනීමට රටවල් දෙකම සමත් වී ඇත. ශ්‍රී ලංකාවේ වත්මන් ආණ්ඩුව බලයට පත් වූයේ වාර්තාගත ඡන්ද ප්‍රමාණයක් හිමි කර ගනිමින්ය. රාජ්‍ය නායකයා වන ජනාධිපතිවරයා බලයට පත් වූයේ ඊටත් වඩා වැඩි ඡන්ද ප්‍රමාණයක් හිමි කර ගනිමින්ය. වත්මන් ආණ්ඩුවට තුනෙන් දෙකක බලයක් හිමි වී ඇත. ඉන් පෙනී යන්නේ ජනතාව ආණ්ඩුව කෙරෙහි තබා ඇති විශ්වාසයයි. ශ්‍රී ලංකාවට මානව හිමිකම් කවුන්සිලය ඉදිරියේ ආකාර දෙකකට ක්‍රියා කළ හැකිය. එක ආකාරයක් වන්නේ කවුන්සිලයේ සියලු නිර්දේශ හිස් මුදුනින් පිළිගෙන රට හා රණවිරුවන් පාවාදීමය. යහපාලන ආණ්ඩුව එය සිදු කළේය. දෙවන ආකාරය වන්නේ සත්‍යය හා අවංකභාවය වෙනුවෙන් කොමිසම ඉදිරියේ සටන් කොට රටත්, රණවිරුවාත් නිදහස් කර ගැනීමය. වත්මන් ආණ්ඩුව දෙවන පිළිවෙත අනුගමනය කරයි. ඒ සම්බන්ධයෙන් මහජන ප්‍රසාදය හිමි වී ඇත. විදේශ අමාත්‍යවරයා විශ්වාසයකින් යුතුව කියා සිටින්නේ රටත් රණවිරුවාත් චෝදනාවලින් නිදහස් කර ගන්නා බවය. එම ප්‍රකාශය ගැන වුව ආඩම්බර විය හැකිය. මීට පෙර ඇතැම් විදේශ ඇමැතිලා කවුන්සිලය ඉදිරියේ දණින් වැටුණේය. මිෂෙල් බැචලේට ශ්‍රී ලංකාවේ සංචාරයක නිරත වන්නැ'යි ආරාධනයක් කිරීමට රජය අදහස් කරන බව ප්‍රකාශ වී ඇත. එය බුද්ධිමත් තීරණයකි. බැචලේට පමණක් නොව ශ්‍රී ලංකාවට එරෙහි රටවල නියෝජිතයන්ට ද ඒ සඳහා ආරාධනා කිරීම වැදගත්ය. එවිට යථාර්ථය දැක ගත හැකිය.

දිල්රුගෙ සීවුපද

කාටත් යහපතක් වෙන්න නීති කෙටුම්පත් කෙටුවේ
අපට එකකි අනිත් අයට තවෙකක් කියමින් කොටුවේ
මොන නීතිය වුණත් ඉන්න ටිකටයි කවුරුත් නැටුවේ
අවසානේ අප කවුරුත් සෝබා දහමට යටවේ

# වැක්සින් අයිස් පොප් සහ වැක්සින් පාස්පෝට්

ඉතිහාසයේ මෙතෙක් දියත් වූ දැවැන්තම එන්නත්කරණ වැඩපිළිවෙළ වශයෙන් කොවිඩ් 19ට එරෙහි එන්නත්කරණ වැඩසටහන් පෙරට යමින් පවතී. මේ වන විට ලොව පුරා එම එන්නත් ලබාගත් සංඛ්‍යාව දස කෝටියකට ආසන්න වෙමින් ඇත. දෛනිකව දෙලක්ෂයක් පමණ එන්නත්කරණය කිරීමට හැකි වී තිබේ. කෙසේ වුවද, දැනට මෙම එන්නත්කරණ වැඩසටහන් දියත්වෙමින් ඇත්තේ ලොව රටවල් 100ක් වැනි සංඛ්‍යාවකය. අවම වශයෙන් එක් මාත්‍රාවක් හෝ ලබාගත් ප්‍රතිශතය ලෝක ජනගහනයෙන් 5%ක් පමණ වේ. ලෝකයෙන් හරි අඩක් වැනි රටවල් ගණනකට තවමත් එක් එන්නත් මාත්‍රාවක් හෝ ලැබී නැති බව වාර්තා විය. සෑම රටකටම එම එන්නත් ගැනීම වෙනුවෙන් ලෝක සෞඛ්‍ය සංවිධානය (WHO) ද බලවත් පරිශ්‍රමයක යෙදී සිටී. වසරක් තුළ එන්නත් මාත්‍රා බිලියන 2ක් රටවල් 190කට බෙදාහැරීම එහි ඉලක්කය වී තිබේ. Lancet වාර්තාකරන පරිදි ලොව මෙතෙක් දියත්ව ඇති දැවැන්තම එන්නත්කරණ වැඩසටහන ඉන්දියාවේ මේ දිනවල ක්‍රියාත්මකය. පෙබරවාරි අග වන විට එරට ජනගහනයෙන් මිලියන 36කට එන්නත දීමට හැකි වී ඇත. අගෝස්තු වන විට මිලියන 300 කට එන්නත් දීම එරට ඉලක්කයයි. ඒ අතර, සෞඛ්‍ය සේවකයන් හා පොලිසිය, හමුදාව ඉදිරිපෙළ කණ්ඩායම් මිලියන 30ක් පමණ සිටින අතර, වයස අවුරුදු 50ට වැඩි ජනතාව මිලියන 270ක් සිටී. මෙලෙස ලබාදෙමින් ඇත්තේ කොවිෂීල්ඩ් හා කොවැක්සින් එන්නත්ය. සෞඛ්‍ය අංශ හා ඉදිරිපෙළ වෙනුවෙන් එන්නත්කරණය සඳහා වැයවන මුදල රජය මඟින් දැරීමට නියමිතය. සෙසු අයට ද එය නොමිලයේ දෙන්නේ ද යන්න සහ ඔසුසල් මඟින් එය ගැනීමට හැකියාව තිබේද යන්න තවමත් නිශ්චිතව සඳහන් නොවේ.

ඉන්දියාවේ එන්නත්කරණ වැඩසටහන් ඇරැඹුණේ ජනවාරි 16 වැනිදාය. මසකට අඩු කාලයක් තුළ මිලියන 6කට එන්නත් දෙමින් වේගයෙන්ම මෙම වැඩසටහන දියත් කරමින් ඇති රට බවට ඉන්දියාව පත්ව සිටී. එය ආරම්භ කරන විට කොවිඩ් 19 ව්‍යාප්තිය අතින් ඉන්දියාව සිටියේ බරපතළ තත්ත්වයකය. එරට සමස්ත ජනගහනය බිලියන 1.38කි.

එන්නත්වලින් 20%ක් පරිත්‍යාග වශයෙන් රටවල් කිහිපයකටම සපයා දී ඇත. ලොව ලොකුම එන්නත් නිෂ්පාදකයා ද ඉන්දියාවය. දැනට ලෝකයේ භාවිත වන එන්නත්වලින් අඩකට වඩා (60%) ඉන්දියානු සමාගම්වල නිෂ්පාදන වේ. ලොව ප්‍රමුඛ එන්නත් නිෂ්පාදකයා The Serum Institute නම් සමාගමය. ඇස්ට්‍රා සෙනිකා එන්නත නිපදවන්නේ ද මේ සමාගම මඟිනි.

අගමැති මෝදි ඉන්දියානු නිෂ්පාදනයක් වන එන්නත ලබාගත් අතර, එය එන්නත්කරණ වැඩපිළිවෙළ දිරිගැන්වීමට ද හේතු වී ඇතැයි වාර්තා වේ.

දැනට ලැබෙන වාර්තාවලින් පැහැදිලි වන පරිදි මෙලෙස දියත්කර ඇති එන්නත්කරණ වැඩසටහන්වල ප්‍රගතියක් තිබේ. අමෙරිකාවෙන් ද දෛනික ආසාදිතයන්ගේ සහ මරණ සංඛ්‍යාවේ අඩුවීමක් පෙන්නුම් කර ඇත. ඉන්දියාවේ ද එබඳුය. අමෙරිකාවේ ඇලස්කා ප්‍රාන්තය වයස අවුරුදු 16ට වැඩි සියලු ජනයා කොවිඩ් 19 එන්නත්කරණයට ලක් කිරීමට කටයුතු සම්පාදනය කර තිබේ. එය එවැනි පළමු ප්‍රාන්තයයි. වයිරසය මර්දනය කිරීමේදී මෙය තීරණාත්මක පියවරක් වනු ඇතැයි ඇලස්කා ආණ්ඩුකාර මයික් ඩන්ලෙවී පවසා ඇත. මේ වන විට අමෙරිකාවේ දී ඇති එන්නත් මාත්‍රා ගණන මිලියන 96ක් පමණ වේ.

පළමු එන්නත් මාත්‍රාව දීමෙන් පසු ඒ ඒ එන්නත් වර්ගය අනුව දෙවැනි මාත්‍රාව සපයාදීම සති 2 – 12 අතර කාලසීමාවක් තුළ සිදු වේ. මෙම එන්නත් බොහොමයක් සෙල්සියස් අංශක 2 – 8 අතර එනම්, සාමාන්‍ය ශීතකරණ උෂ්ණත්වය යටතේ ගබඩා කළ හැකිය. P- ෆයිසර් එන්නත සෙල්සියස් අංශක ඍණ 70ක උෂ්ණත්වයක් යටතේ ගබඩා කළ යුතු බැවින්, ගිම්හානයේදී අංශක 50 පමණ දක්වා උෂ්ණත්වය ඉහළ යන ඉන්දියාව වැනි රටවල එය භාවිතය ප්‍රායෝගිකව අසීරුය. අන්තර්ජාතික මට්ටමින් සිදුකර ඇති පරීක්ෂණවලට අනුව, ඔක්ස්ෆර්ඩ් ඇස්ට්‍රසෙනිකා එන්නතේ ක්‍රියාකාරිත්වය 90%ක් පමණ වේ. (මාත්‍රා 2 ගැනීමත් සමඟ)

පෙබරවාරි 28 වැනිදා වන විට චීනය එන්නත් මාත්‍රා මිලියන 53ක් දී තිබූ බව එරට මුල්පෙළේ වසංගත විශේෂඥයකු වන ෂොංග් නන්ෂාන් පවසා තිබිණි. ඒ වන විට අමෙරිකාව දී ඇති එන්නත් මාත්‍රා ගණන මිලියන 90ක් වූ අතර, බ්‍රිතාන්‍යයේ එය මිලියන 22කි. ලොව අධිකම ජනගහනය සිටින රට වශයෙන් චීනයට ඉතාමත් වේගයෙන් එන්නත්කරණ ඉලක්කවලට යාම පහසු නැත. එසේම වයිරසය පාලනය කිරීමේදී චීනය අත්කරගෙන ඇති සාර්ථකත්වය අනුව සෙසු රටවලට මෙන් හදිසි ඉලක්ක හඹායාමේ අවශ්‍යතාවක් ද චීනයට නොතිබිය හැකිය.

මේ වන විට එරටින් නව ආසාදිතයන් දෛනිකව වාර්තා වන්නේ තනි ඉලක්කමක අගයෙනි. ජන ජීවිතය හැකිතාක් දුරට සාමාන්‍ය අතට හැරී ඇති අතර, සමාජශීලී ජීවිතයක් ගත කිරීමට යළිත් අවස්ථාව උදා වී තිබේ. ඒ සමඟම වසංගත විශේෂඥයන් පෙන්වා දෙන්නේ, දීර්ඝකාලීන වශයෙන් ස්ථාවරත්වයක් ඇති වීම සඳහා ප්‍රතිශක්තිය ඉතාමත් වැදගත් බව සිහිතබා ගත යුතුය යනුවෙනි. ඒ සඳහා ජනගහනයෙන් 70% - 80%ක් පමණ එන්නත්කරණයට ලක් කළ යුතුය. චීනය මේ වන විට සිය එන්නත් භාවිත කරමින් සිටින්නේ රට තුළය. එන්නත දෙන්නේ අවස්ථා 4කටය. බහුල වශයෙන් භාවිත වන්නේ ෂිනෝෆාම් සහ ෂිනොවැක් එන්නත්ය.

දෙසැම්බර් මැදදී එන්නත්කරණ වැඩසටහන දියත් කළ චීනය 2020 වසර අවසානය වන විට ප්‍රමුඛතා කාණ්ඩවලට අයත් පිරිස ද ඇතුළුව මිලියන සංඛ්‍යාත පිරිසකට එන්නත දුන්නේය. එරට ප්‍රමුඛතා වයස් කාණ්ඩය අවුරුදු 18 – 59 ය. ස්වේච්ඡාවෙන් ඉදිරිපත් වී එන්නත ලබාගැනීමට හැකියාව ඇති අතර, සෞඛ්‍ය අංශ හා ජනමාධ්‍ය එන්නත ලබාගැනීමේ වැදගත්කම පිළිබඳ ජනතාවට සන්නිවේදනය කරමින් සිටී. වසර 2022 අග වන විට චීනය සිය එන්නත්කරණ ඉලක්කය සපුරාගනු ඇතැයි අපේක්ෂිතය. එය ජයගත යුතු ඉලක්කයක් වන්නේ මීළඟ ශීත සෘතු ඔලිම්පික් උළෙලේ සත්කාරකත්වය ද චීනය දරන බැවිනි. එසේම චීන ජාතිකයන්ට විදේශ රටවල සංචාරය කිරීමේදී අපහසුතාවන්ට ලක් නොවීම පිණිස ද එන්නත ලබා තිබීම ප්‍රයෝජනවත් වනු ඇති බව පැහැදිලි කර තිබේ. මේ සතියේදී චීනය ලොව පළමු වතාවට එන්නත් ගමන් බලපත්‍රයක් (Vaccine Passport) ද හඳුන්වා දුන්නේය. එය චීනයේ Wechat සමාජජාල යෙදවුම සමඟ සම්බන්ධවෙමින් ක්‍රියා කරයි. රට තුළ ඉල්ලුම සපුරාගැනීමට කටයුතු කරන අතර, ඉන්දුනීසියාව, බ්‍රසීලය, එක්සත් අරාබි එමීර් රාජ්‍යය වැනි රටවලට එන්නත් මාත්‍රා මිලියන 40ක් පමණ සැපයීමට ද චීනයට හැකි වී ඇත. ලොවපුරා රටවලට මාත්‍රා මිලියන 500ක් පමණ සැපයීමට චීනය එකඟවී සිටී. මෙම එන්නත් සඳහා වැඩිම ඉල්ලුමක් ඇත්තේ බ්‍රසීලය, චිලී, තුර්කිය, ඉන්දුනීසියාව වැනි රටවලිනි. බ්‍රසීලයේ තත්ත්වය මේ වන විට ඉතා අභියෝගාත්මකය. 2020 වසර අග වන විට චීනය එන්නත් මාත්‍රා මිලියන 600ක් නිපදවා තිබිණි. මේ වසරේ ඔවුන්ගේ ඉලක්කය මාත්‍රා බිලියනයකි. දැනට අනුමැතිය හිමි වී ඇති චීන එන්නත් 4 එකතුව මාත්‍රා බිලියන 2.4ක ඉලක්කයක් මේ වර්ෂය සඳහා තබාගෙන සිටී.

අමෙරිකා සෞඛ්‍ය බලධාරීන් නිර්දේශ කර ඇති පරිදි, එන්නත ලබාගත් තැනැත්තන්ට කුඩා කණ්ඩායමක් ලෙස ගෘහස්ථ වශයෙන් ඒකරාශිවීමේදී මුව ආවරණ නොමැතිව සිටීමට අවසර ඇත. සමාජ දුරස්ථභාවය ද එහිදී අදාළ නොවේ. එසේ වුවද තවමත් එන්නත් ලබානොගත් අය අතර සහ සමාජ ජීවිතයේදී ඔවුන් තවදුරටත්, එම සෞඛ්‍ය ආරක්ෂක මාර්ගෝපදේශ පිළිපැදිය යුතුය.




විදෙස් විත්ති විග්‍රහය

ලබන මාසයේ සිට ඉතාලියේ රෝමය සහ මිලානෝ අතර කොවිඩ්වලින් තොර (Covid Free) අධිවේගී දුම්රිය ධාවනය ඇරැඹීමට සැලසුම් කර ඇතැයි එරට දුම්රිය සේවයේ ප්‍රධානියා පවසා ඇත.

නෙදර්ලන්තය මාර්තු 31 වැනිදා දක්වා ඇඳිරිනීතිය දීර්ඝ කර ඇත්තේ එරට මහමැතිවරණය ද ලබන සතියට යෙදී ඇති පසුබිමකය.

වසරකින් කල්දැමූ ඔලිම්පික් උළෙළ ජපානයේදී ජූලි 23 අගෝස්තු 8 අතර පැවැත්වීමට නියමිතය. පැරාලිම්පික් උළෙළ යෙදී ඇත්තේ අගෝස්තු 24 සැප්තැම්බර් 5 දිනවලටය.

ජර්මනියෙන් වාර්තා වන ආසාදිතයන්ගේ වැඩිවීමක් පෙන්නුම් කරන බව පෙනෙන්නට ඇත. ඒ අතරවාරයේ මුව ආවරණ ගනුදෙනුවක් පිළිබඳ මතුව ඇති අපවාදයක් හමුවේ, එරට පාලක පක්ෂය වන ක්‍රිස්තියානි ප්‍රජාතන්ත්‍රවාදී සංගමයේ මන්ත්‍රීවරයකු වන නිකොලාස් ලොබෙල් ඉල්ලා අස්වී තිබේ.

ඉන්දියාව විසින් එන්නත් මාත්‍රා ලක්ෂ 5ක් කැනඩාවට දීමත් සමඟ අගමැති මෝදිට තුති පිදීමේ දැන්වීම් පුවරු ටොරන්ටෝ නගරයේ තැන තැන ප්‍රදර්ශනය කෙරෙමින් ඇත.

රුසියාව සිය එන්නත්කරණ වැඩපිළිවෙළ දියත් කළේ ජනවාරි මැදදීය. ස්පුට්නික් - V එන්නත නොමිලේ ලබාදෙන අතර ඒ වෙනුවෙන් කල්තබා ලියාපදිංචි වීමේ අවශ්‍යතාවක් නැත. එන්නත ගැනීම දිරිගැන්වීම සඳහා චොක්ලට් අයිස් පොප් එකක් ද හඳුන්වාදී තිබේ.


මොස්කව් නගරයේ රෝහල් 100ක එන්නත්කරණ වැඩසටහන ක්‍රියාත්මකය. ඊට අමතරව එන්නත් දෙන ස්ථාන ගණනාවක් ද පිහිටුවා ඇත. ඒ අතර, සාප්පු සංකීර්ණ, ඔපෙරා රඟහල් ආදිය ද තිබේ. එන්නත්කරණ වැඩසටහන් සඳහා ස්වේච්ඡාවෙන් දායකවන පිරිස්වල සහාය ද ලැබෙමින් පවතී.

ස්පුට්නික් - V එන්නත සඳහා යුරෝපා සංගමයේ අනුමැතිය ලබාගැනීමට රුසියාව මේ වන විට අයදුම්කර ඇත. යුරෝපා සංගමයට අයත් රටවල් අතරින් හංගේරියාව දැනටමත් එම එන්නත ලබාදෙමින් සිටී. තවත් රටවල් කිහිපයකම මෙම එන්නත ලබාගත හැකිය. The Lancet වාර්තා කළ පරිදි ස්පුට්නික් - V එන්නතේ ක්‍රියාකාරිත්වය 91.6%කි. මේ වසර තුළ මිලියන 68ක් දෙනා එන්නත් කිරීම රුසියාවේ ඉලක්කයයි. දැනට එරටින් දෛනිකව ආසාදිතයන් 15000ක් වැනි සංඛ්‍යාවක් වාර්තා වේ.

අප්‍රිකානු රටවල එන්නත්කරණ වැඩසටහන් ඇරැඹුණේ පෙබරවාරියේදීය. ඒ WHO කොවැක්ස් පහසුකම යටතේය. දකුණු අප්‍රිකාව ඇතුළු රටවල් 14ක මේ වන විට එන්නත්කරණ වැඩසටහන් ආරම්භ වී ඇත. නැතිනම්, එන්නත් ලැබී ඇති අතර, ඇරැඹීමට නියමිතය. එන්නත් නොලැබුණු රටවල් ද ගණනාවකි. ටැන්සානියාව, මැඩගස්කරය වැනි රටවලට එන්නත් ගැනීම සඳහා සැලසුමක් හෝ නොමැත. දිළිඳු රටවලට එන්නත් ගැනීම අභියෝගයක්ව තිබියදී ප්‍රංස ජනාධිපති එමානුවෙල් මැක්‍රන් පසුගියදා යෝජනා කළේ, යුරෝපයේ ධනවත් රටවල් සහ අමෙරිකාව ඔවුන් සතු අමතර එන්නත් අප්‍රිකාවට සපයාදිය යුතු බවය. පෙබරවාරි අග වන විට එක්සත් රාජධානියේ පුද්ගලයන් 100 දෙනකුගෙන් 31ක් ද අමෙරිකාවේ 100 දෙනකුගෙන් 22ක් ද එන්නත ලබා ගන්නා විට ආසියාවේ එය 100 දෙනකුගෙන් 2ක් සහ අප්‍රිකාවේ 0.3කි.

**ධම්මික සෙනෙවිරත්න**





# අවදානමකට සූදානම් වන නිදන කාමරයේ කාර්යාලය

එදවස සිහින හෝ හිතලු යැයි සැලකුණු බොහෝ දේ කොරෝනා වසංගතයත් සමඟ එළැඹි නව සාමාන්‍ය ජීවිතයේදී සැබෑ වී ඇත. උදාහරණයක් ලෙස කාර්යාලයට නොයා තම තමන්ගේ සුවපහසු ඇඳන් මත දිගාවී වර්චුවල් කාර්යාලයට පිවිසීම දැක්විය හැකිය. මින් වසර දෙකකට පෙරාතුව මෙවන් තත්ත්වයක් කිසිවකු යෝජනා කළ හොත් එය මහත් විහිළුවක් ලෙස පෙනෙන්නට ඉඩ තිබුණි. සූම් වැනි යෙදුම් හරහා වර්චුවල් මාදිලියෙන් සියලුම වැඩකටයුතු කිරීම අප වැනි රටක මිනිසුන්ට මහා විප්‍රකාරයක් ලෙස එදවස සිතෙන්නට ඉඩ තිබුණි. එහෙත් සියල්ල ඔළුවෙන් සිටවීමට ඒ මහා වසංගතයට හැකි වුණි. විද්‍යා ප්‍රබන්ධ මාදිලියේ කල්පනා සහසක් දැන් එදිනෙදා ජීවිතයේ සාමාන්‍ය දෑ බවට පරිවර්තනය වී ඇත. කාර්යාලය පැත්ත පළාතේ නොයමින් සියලු වැඩකටයුතු වර්චුවල් සිදු කරන කාර්යාල සේවකයන් දැන් අතිශය සුලබය. දැන් දුලබ ශාරීරිකව යම් ස්ථානයකට යෑමය. එහෙත් මේ අති උත්කර්ෂවත් වර්චුවල් ජීවිතය විසින් මිනිසාට අත්කර දෙන්නට යන අනාගතයේ හැඩයට ඒ තරම් සුබවාදී නොවන බවට මතුවන මතිමතාන්තර සුළුවෙන් තැකිය හැකි නොවේ. ඇඳේ සිට කාර්යාලයීය වැඩ කිරීමේ ආකර්ෂණය ඉක්මවා යන සෞඛ්‍ය ගැටලු ඉබි ගමනින් මිනිසුන් කරා පැමිණෙමින් ඇත.

මානසිකව සහ ශාරීරකව මේ ගැටලු මතු විය හැකි බවට එකී ක්ෂේත්‍රවල ප්‍රවීණයෝ අනතුරු හඟවා ඇත. 'වර්ක් ෆ්‍රොම් හෝම්' යන්න වෙනුවට තැනී ඇති නවතම යෙදුම 'වර්ක් ෆ්‍රොම් බෙඩ්' ය. එනම් නිවසේ සිට වැඩ කිරීමේ ක්‍රියාවලිය සයනයේ සිට වැඩ කිරීම දක්වා ක්‍රමිකව විතැන් වී ඇත. උදෑසන අවදි වීමට සිහි කැඳවීමේ එලාම් තබා නින්දට යාම, උදෑසනින් අවදිව, ඇඳ පැලඳගෙන කාර්යාලයට කඩිමුඩියේ පිටත්වීමේ නපුරු සිහිනයෙන් සදහටම තොර වීම එක්තරා අතකින් මහත් භාග්‍යයකි. දැන් කළ යුත්තේ පෙර අවදි වූවාට බොහෝ පසුව යම් වෙලාවක අවදිවීමත් යන්තමින් මුහුණ සෝදා ගැනීමත් පමණි. නැවත ඇඳට වැටී උකුළු පරිගණකය ක්‍රියාත්මක කිරීමෙන් නව සාමාන්‍යයේ කාර්යාලයට පිවිසිය හැකිය. මෙය කාර්යාල සේවකයන් විෂයෙහි පමණක් නොව, ඔන්ලයින් වෙළෙඳ ආයතන පවත්වාගෙන යන්නන් සම්බන්ධයෙන් ද එසේමය. 2020 නොවැම්බර්යේ දහසක පිරිසක් යොදාගෙන කළ සමීක්ෂණයකට අනුව 72% ක පිරිසක් වසංගත කාලය පුරාම තම රැකියා කටයුතු කර ඇත්තේ තමන්ගේ ඇඳේ සිටය. මේ තත්ත්වය 50% කින් වැඩි වී ඇත්තේ වසංගතය ඇරඹි කාලයේදීය. පැය 24 – 40 අතර කාලයක් ඔවුන් තමන්ගේ නිදන ඇඳේ සිට අදාළ සතිය පුරා වැඩ කර ඇත. මේ තත්ත්වය තරුණ සේවකයන් අතර වඩා වැඩිය. එංගලන්තයේ වයස 18 – 34 ත් කාණ්ඩයේ රැකියාවේ යෙදෙන්නන්ගෙන් බහුතරයක් මේසයක් සහ පුටුවක් භාවිතයට ගැනීමට අකමැත්ත පළ කර ඇත. ඔවුන්ගේ කැමැත්ත ස්වකීය නිදන ඇඳේ සිට කාර්යාල වැඩ කිරීමටය. එහෙත් වැඩිහිටියන් සම්බන්ධයෙන් මේ තත්ත්වය වෙනස්ය. ඔවුන්ගේ කැමැත්ත සාමාන්‍ය කාර්යාල පරිසරයක වැඩ කිරීමටය.


## වැරදි පුරුදු

එහෙත් නිදන ඇඳේ සිට වැඩ කිරීම යනු භෞතිකව මේසයකට, පුටුවකට කැමැති නැති වීමම නොවේ. ඊට ඔබ්බට ගිය වෙනත් සංකල්පීය වුවමනාවකි. නූතන සේවකයා යනු පහසුවෙන් වැඩ කිරීමේ වුවමනාවෙන් පෙළෙන්නෙකි. වඩාත් පහසු වටපිටාවක, අතිශය සුවපහසුව වැඩකටයුතු කිරීමේ වුවමනාවෙන් මේ අය පසු වෙයි. කාර්යාලය යනු කල් ඉකුත්ව ගිය සංකල්පයක් ලෙසත්, භෞතිකව පෙනී සිටීමේ ආශාවෙන් ඔවුන් ඈත්ව සිටීමත් මේ හැසිරීමට මූලිකව බලපාන්නට ඇත. මේ තත්ත්වය කෙසේද යත් #WorkFromBed නමින් ඉන්ස්ටග්‍රෑමයේ හෑෂ්ටැගයක් පවා ජනප්‍රිය වුණි. මේ හෑෂ්ටැගය යටතේ ලොව පුරා සයනයේ සිට වැඩ කරන්නන් දස දහස් ගණනින් ඡායාරූප එකතු කරන්නට විය. මින් බහුතරයක් තමන්ගේ රාත්‍රී පිජාමා ඇඳුමින් සැරසී, මුව පුරා සිනාසෙමින්, කෝපි කෝප්ප අත දරාගෙන සිටින්නෝය. අතොරක් ඡායාරූපවල මොවුන්ගේ උදෑසන ආහාර පවා ඇඳේ පසෙකය. එතැන මැවෙන්නේ උපරිම සුව පහසුවක් සහ නිදහසකි. සිහින සැබෑවීමකි. එහෙත් මේ උපරිම නිදහස පොලා පනින්නේ සෞඛ්‍යයට තර්ජන එල්ල වන තැනය. දැන් ඒවා ගැන අවධානය නොමැති වුවත් පසුකාලීනව හදිසියේ මතුව නැවත ක්ෂයව නොගොස් ස්ථිරසාරව මේ ගැටලු ඉතිරි විය හැකිය.

මානසිකව සහ ශාරීරිකව ඉතිරි වන මේ ගැටලුවලට විසඳුම් සෙවීමට උත්සුක වන කාලය වන විට ඔබ ප්‍රමාද වැඩි විය හැකිය. වැරැදි ඉරියවු, අක්‍රමවත් ආහාර පුරුදු, නින්ද හීන වීම, කිසිසේත්ම නිදා නොගැනීම , තත්‍ය ජීවිතය සහ අතත්‍ය ජීවිතය අතර වෙනස පැටලැවීම ආදී බොහෝ අනිසි දේ නොදැනුවත්ම සිදු විය හැකිය. ශාරීරික ගැටලු වැඩි කල් නොසඟවා සිටිය නොහැකි මුත් මානසික ගැටලු කාලාන්තරයක් මුළුල්ලේ සඟවා තබාගත හැකිය. පිළියම් සෙවීමට උත්සුක වන කාලය වන විට තත්ත්වය බරපතළ වී තිබිය හැකිය. නිවෙසේ සිට වැඩ කිරීම යනු දෙවියන් විසින් දුන් දායාදයක් හෝ දේව වරමක් නොවේ. එසේම අතොරක් සේවකයන් හට නිවෙසේ සිට වැඩ කිරීම කෙසේවත් කළ නොහැක. ඔවුන්ගේ වැඩබිම වර්චුවල් අවකාශයක පිහිටුවීමට නොහැකි අවස්ථා මේ සඳහා උදාහරණ ලෙස දැක්විය හැකිය. එවැනි වටපිටාවක ඔවුන්ට නිවෙසේ සිට වැඩ කිරීමේ වරප්‍රසාදය පවා ලබාගත නොහැක. එහිම අනෙක් අන්තය සලකා බැලූ විට තවත් සේවකයන් කොටසකට කාර්යාලයීය වැඩ සඳහා ලියන මේසයක්, පුටුවක් තබා ගත හැකි ඉඩක් ඇත්තේ නැත. ඉතාම කුඩා ඉඩක ජීවත් වන ඔවුන්ට අතිරේක කාර්යාලයීය ඉඩක් ඇත්තේම නැත. එවිට නිදන ඇඳ මත සිට වැඩ කිරීම හැර වෙනත් විකල්පයක් ඔවුන් සතුව නැත. මේ දෙයාකාර යථාර්ථය ඔබව ඔසොවා පොළොවේ ගසනවා ඇත. විශේෂඥ මතයට අනුව නිදන ඇඳට කාර්යාලය ගෙන යාම ඔබ විසින් නොකළ යුත්තකි. මිනිස් ශක්‍යතා සහ දුර්වලතා පිළිබඳ විශේෂඥයන්ට අනුව නිදන ඉරියවුවෙන් දීර්ඝ වේලාවක් කාර්යාලයීය වැඩ කිරීම සිරුරට අහිතකරය. නිතර ඉරියවු මාරු කිරීම සහ හැකි සෑම විටම ශරීරයේ විවිධ කොටස්වලට සහය වෙමින් ශරීරය හසුරුවා ගැනීම කළ යුතුය. එහෙත් එකම ඉරියවුවකින් දිගු වේලාවක් පසුවීමේදී මේ කිසිවක් සිදු නොවේ. මෑදු මතුපිටක සිටින විට බෙල්ල, ඉන සහ පසුපස බොහෝ වෙහෙසට පත් වේ. එක්සත් ජනපදයේ විශාලතම වෛද්‍ය පර්යේෂණ ආයතනයක් වන මායෝ සායනයේ සෞඛ්‍ය ආරක්ෂණ පද්ධති ඉංජිනේරු අධ්‍යක්ෂ සුසාන් හෝල්බෙක් පවසන්නේ "මේ කිසිවක් යෝග්‍ය නොවේ. ඔබ මේ වැඩ කිරීමට තෝරාගත් ආකාරයට කිසිම විදිහයකින් ඔබේ ශරීරය සහයක් නොදෙයි." කියාය.

## ප්‍රතිවිපාක

ඇයට අනුව මේ නරක පුරුද්දට වැඩිපුරම ඇබ්බැහි වීමට කැමැත්ත දක්වා ඇත්තේ තරුණ කණ්ඩායම්ය. මන්දයත් එහි අහිතකර බලපෑම දැන් දැන් ඔවුන්ට නොපෙනෙන බැවිනි. මේ පුරුද්ද විසින් මිනිස් සිරුරට ඇති කරන බලපෑම දැකිය හැක්කේ තවත් කාලයක් ඉක්ම ගිය පසුය. තරුණ කණ්ඩායම් අනාගත ව්‍යසන කෙරෙහි දක්වන ඇල්මැරුණ උනන්දුව මීට තවත් හේතුවකි. අනාගතයේ විය හැකි නපුරක් පිළිබඳ තැවීම මේ වයස් කාණ්ඩයේ සිරිත නොවේ. එහෙත් එහි ප්‍රතිඵල ලැබෙන විට අතීතයේ කළ වැරදි ආපසු හැරවිය තැනක කිසිවකු නොසිටනු ඇත. පසුගිය වසර පුරා නිදන ඇඳේ සිට කොපමණ පැය ගණනාවක් වැඩ කළා දැයි ගණනය කර බැලීම තුළින් ඉදිරියේදී අත්විඳින්නට සිදුවන බලපෑම අනුමාන කළ හැකි බව ඈ තවදුරටත් පවසයි. මහලු වයසට පත් වන විට මේ වැරදි ආපසු හැරවිය නොහැකි තරමට පරිවර්තනය විය හැකි බව ඇගේ මතයයි. රෝග ලක්ෂණ ලෙස සරල හිසරදයකින් පටන් ගෙන තවත් බරපතළව පැතිරිය හැකිය. එනම් සිරුරේ පිටුපස දීර්ඝ කාලීනව පවතින තද ගති ස්වාභාවයක් දැගත හැකිය. එය ආතරයිටීස් හෝ ගැබ්ගෙල පිළිකා ලෙස මේවා පසුකාලීනව හඳුනාගැනේ. "නරක පුරුද්දකට ඇබ්බැහිවීම අන් සෑම දෙයකටම වඩා භයානකය. හැකි මුල් අවස්ථාවේම ඉන් ගැලවෙන්න" යැයි හෝල්බෙක් අවවාද කරයි.



**රෝග ලක්ෂණ ලෙස සරල හිසරදයකින් පටන් ගෙන තවත් බරපතළව පැතිරිය හැකිය. එනම් සිරුරේ පිටුපස දීර්ඝ කාලීනව පවතින තද ගති ස්වාභාවයක් දැගත හැකිය.**

එනමුත් ඔබ වඩාත් හිතුවක්කාරී නම්, දිගටම නිදන ඇඳේ සිට වැඩ කිරීමට අවශ්‍ය නම් පුටුවක වාඩි වී සිටින්නේ යැයි මනසින් මවාගෙන ඇඳ මත ඒ ඉරියවුවෙන් සුළු වෙලාවක් හෝ සිටීමට උත්සාහ කරන්න. මේ සඳහා පළමුව යම් උදාසීන ඉරියවුවක් තෝරාගන්න. කොට්ටයක් පෙරළා ශරීරයේ පහළ කොටසට ඇලවීමේ ආධාරකයක් සේ තබා ගන්න. කොට්ටයක් ඔබේ දණහිසට යටින් තබාගෙන යතුරු පුවරුව දර්ශනයෙන් වෙන් කරන්න උත්සාහ ගන්න. හැකි නම් ස්ක්‍රීනය අක්ෂි මට්ටමින් හෝ ඊට ඉහළින් තබා ගන්න උත්සාහ ගන්න. ඔබ කුමක් කළත් යතුරු ලියනය කිරීමට බඩ මත වැතිරීමෙන් වළකින්න. එමඟින් ඔබේ ගෙල සහ වැලමිටට ලැබෙන්නේ නරක සත්කාරයකි. හැකි නම් රෙදි මදින බෝඩයක් උඩ හිටගෙන වැඩ කරන මේසයක් භාවිතයට ගැනීමට නිර්මාණශීලී වන්න.

වසරක් මුළුල්ලේ නිවෙසේ සිට වැඩ කිරීමෙන් වැරදි ඉරියවු මඟින් ශරීරයට අහිතකර බලපෑම් ඇති කිරීමට අමතරව කාර්යක්ෂමතාව සම්බන්ධයෙන් ද නොසිතන ගැටලු ඇති කරවයි. නින්ද සතුරකු බවට පත් කරවයි. නිදන ඇඳේ සුවපහසුව විසින් නින්දේ අවශ්‍යතාව ඔබේ මනසින් ඈත් කරවනු ලබයි. මන්දයත් දැනටමත් ඔබ සුවපහසුවෙන් පසුවන බවට මොළයට සංඥා ලැබී ඇති බැවිනි. මේ වැරදි සංඥා මඟින් නින්දේ වුවමනාව ක්ෂය කර දැමීම කනගාටුදායකය.

මේරිලන්ඩ් ජෝන්ස් හොප්කින්ස් විශ්වවිද්‍යාලයේ ස්නායු විද්‍යාව පිළිබඳ සහකාර මහාචාර්ය සහ නින්ද පිළිබඳ විශේෂඥ රේචල් සලාස්ට අනුව සයනය යනු කාර්යන් ත්‍රිත්වයක් වෙනුවෙන් වෙන් කර ඇති ස්ථානයකි. නින්දට, මෛථුනයට සහ ගිලන් වූ විට වැතිරීමට ඒ කාර්යන් ත්‍රිත්වයයි. මෙය ත්‍රිත්ව එස් සංකල්පය ලෙස හඳුන්වයි. "ඔබ වැඩි වේලාවක් ඇඳේ සිට රූපවාහිනිය නරඹන විට, ඇඳේ සිට වීඩියෝ ක්‍රීඩා කරන එනමුත් ඇඳේ නිදා නොගෙන සිටින විට ඔබේ මොළය ඉගෙන ගන්නේ අපට මේ ඕනෑම ක්‍රියාකාරකමක් අඳේ සිට කළ හැකි බවයි. මේ ආකාරයේ වැරදි පණිවිඩ හුවමාරුවෙන් අවසානයේ ඒවා නිල නොලත් කොන්දේසි සහ හැසිරීම් බවට පරිවර්තනය වේ." යැයි රේචල් සලාස් පවසයි. නින්දට නොයා ඇඳේ කල්ගත කිරීමේ නරක පසුකාලීනව කිසිසේත්ම නින්දට පිවිසිය නොහැකි රෝග කරා ඔබව ගෙන යාමට හැකිය. කොවිඩ් යුගය විසින් මිනිසාට ඉගැන්වූ යමක් ඇත්නම් ඒ සෞඛ්‍ය සම්පන්නව විසීම කෙතරම් විශාල භාග්‍යයක් දැයි කියාය. සෞඛ්‍ය පිළිබඳ තැවුල් සිතින් මාස්කගතව, නිතර අත් සෝදමින් ජීවත් වන ජනතාව නොදැනීම තවත් අනාගත රෝග රාශියකට විවෘතව ජීවත් වන බව වටහාගත යුතුය. ඒ වැටහීමෙන් අනාගත ව්‍යසන කිහිපයකින් ගැලවිය හැකිය.

බීබීසී ඇසුරෙනි

**කාංචනා අම්ලානි**




# වසංගතයට පසුව එන ඔලිම්පික් වසන්තය

කොවිඩ් වසංගතය හේතුවෙන් කල් දමන ලද 2020 තෝකියෝ ඔලිම්පික් උළෙළ මේ වසරේ ජූලි 23 වැනිදා සිට අගෝස්තු 8 වැනිදා දක්වා පවත්වන්නට අන්තර්ජාතික ඔලිම්පික් බලධාරීහු කටයුතු සංවිධානය කරති. ඒ අනුව ඔලිම්පික් උළෙළට සහභාගී වන පිරිස්වලට කොවිඩ් එන්නත ලබාදීම ආරම්භ කිරීමට සිදුව තිබේ. තරග වදින ඔලිම්පික් ක්‍රීඩකයන් එන්නත් කිරීමට අවශ්‍ය එන්නත් මාත්‍රා ලබාදීම සඳහා චීන ඔලිම්පික් කමිටුව පසුගිය දා ඉදිරිපත් වූයේ ය. 2020 පැරා ඔලිම්පික් උළෙළ ද මේ වසරේදී පැවැත්වීමට නියමිතව ඇත. එය අගෝස්තු 24 වැනිදා සිට සැප්තැම්බර් 5 වැනිදා දක්වා ජපානයේදී තෝකියෝහිදී පැවැත්වීමට සැලසුම් කර තිබේ. ඒ සඳහා සහභාගී වන ක්‍රීඩකයන්ට ද කොවිඩ් එන්නත ලබාදීම ආරම්භ කිරීමට සිදුව ඇත. මෙම ක්‍රීඩා උළෙල දෙකට සහභාගී වන සෙසු පිරිසට අවශ්‍ය එන්නත් ලබාදීමට අන්තර්ජාතික ඔලිම්පික් කමිටුව ක්‍රියාකරන බව එහි සභාපති තෝමස් බාච් කියා සිටියේ ය. ඔලිම්පික් සහ පැරා ඔලිම්පික් උළෙළවලට සහභාගී වන පිරිස්වලට තමන් වෙසෙන රටෙන් ම එම එන්නත ලබා ගැනීමට අවශ්‍ය පහසුකම් සලසා ඇති බව ද තෝමස් බාච් සඳහන් කර තිබිණ.

මේ අතර ශීත සෘතු ඔලිම්පික් උළෙළ චීනයේ බෙයිජිං නුවරදී ලබන වසරේදී පැවැත්වීමට තීරණය කර තිබේ. දැනට ප්‍රකාශයට පත් කර ඇති අන්දමට එය පැවැත්වීමට නියමිතව තිබෙන්නේ ලබන පෙබරවාරි මස 4 වැනිදා සිට 20 වැනිදා දක්වා ය. ශීත සෘතු ඔලිම්පික් උළෙලට සහභාගී වන ක්‍රීඩකයන්ට අවශ්‍ය එන්නත් මාත්‍රා ලබාදීමට ඉදිරිපත් වී සිටින්නේ ද චීන ඔලිම්පික් කමිටුවයි.

2020 තෝකියෝ ඔලිම්පික් උළෙළේ ගිනි සිළුව රැගෙන යෑම මේ මස 25 වැනිදා ආරම්භවීමට නියමිත බව තෝකියෝ ඔලිම්පික් උළෙළේ ප්‍රධානී සයිකෝ හෂිමොතෝ පවසයි. ජපානයට පැමිණි ඔලිම්පික් ක්‍රීඩා තරග නැරඹීම සඳහා ජාත්‍යන්තර ක්‍රීඩා ලෝලීන්ට අවස්ථාව සලසන්නේ ද යන්න පිළිබඳව ඉතා ඉක්මනින් තීරණය කළයුතු බව හෂිමොතෝ ක්‍රියා සිටී. එම තීරණය ගත යුත්තේ ගිනි සිළුව රැගෙන යෑම ආරම්භ කිරීමට පළමුව බව ද ඔහු පෙන්වා දෙයි. ඔහු එවැනි ප්‍රකාශයක් සිදු කළේ කොරෝනා වසංගතය හේතුවෙන් ජාත්‍යන්තර ක්‍රීඩා ලෝලීන්ට ඔලිම්පික් සහ පැරා ඔලිම්පික් තරග නැරඹීමට ඉඩ ලබා නොදිය යුතු බවට ජපාන රජය ගෙන ඇති තීරණය මුල් කරගෙන ය.

ගිනි සිළුව රැගෙන යෑමේ උත්සවය පවා ක්‍රීඩා ලෝලීන් ඒකරාශී කර නොගෙන සිදු කළයුතු බව ජපාන ක්‍රීඩා බලධාරීහු පවසති. ගිනි සිළුව රැගෙන යෑමේ කාර්යයට සහභාගී වන පිරිස සහ ආරාධිතයන් පමණක් එහි සිටි යුතු බවට මේ වනවිට තීරණය කර ඇති බව ක්යෝදෝ පුවත් ඒජන්සිය වාර්තා කරයි.

මෙවර ඔලිම්පික් ක්‍රීඩා උළෙළ සඳහා පමණක් ක්‍රීඩක ක්‍රීඩිකාවන් එකොළොස් දහසකට ආසන්න පිරිසක් සහභාගීවීමට නියමිතව ඇත. අන්තර්ජාතික ක්‍රීඩා ලෝලීන්ට ඔලිම්පික් ක්‍රීඩා උළෙළ නැරඹීමට අවස්ථාවක් ලබා නොදීම හේතුවෙන් හිස් වූ ක්‍රීඩාගාර ඉදිරියේ එම ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට තම හැකියාවන් විදහා දක්වන්නට සිදුවනු ඇත්ද යන ගැටලුව මතු තිබේ. ඇල්මැරුණු ප්‍රතිචාර, එම ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ උණුසුම් බව, ක්‍රීඩාශීලීත්වය මෙන්ම ධෛර්යය පවත්වා ගැනීමට බාධාවක් වන්නට ද ඉඩ ඇත.

ඔලිම්පික් ක්‍රීඩා නැරඹීම සඳහා අන්තර්ජාතික ක්‍රීඩා ලෝලීන්ට ජපානයට පැමිණීමට ඉඩ සැලසිය යුතු ද යන්න සම්බන්ධයෙන් ජපාන ජනයාගේ මත විමසීමක් ද සිදු කර තිබේ. ඉන් අනාවරණය වී තිබෙන්නේ අන්තර්ජාතික ක්‍රීඩා ලෝලීන් ජපානයට පැමිණෙනවාට ජපාන ජනයාගෙන් 77%කට ආසන්න පිරිසක් අකමැති බවකි. දකුණු කොරියාවේ ප්යොන්ග්චෑන්ග්හිදී 2018 වසරේ පැවැති ශීත සෘතු ඔලිම්පික් උළෙළ වෙනුවෙන් නිකුත් කළ ප්‍රවේශපත්වලින් 80%ක්ම මිල දී ගෙන තිබුණේ දේශීය ක්‍රීඩා ලෝලීන් බව වාර්තාවන්හි සඳහන් වේ. එම වාර්තාව දෙස බලන විට 2020 තෝකියෝ ඔලිම්පික් උළෙළ නරඹන්නට දේශීය ක්‍රීඩා ලෝලීන් හිඟ නොවනු ඇතැයි අනුමාන කළ හැකි ය. කෙසේ වුවත් 2018 ශීත සෘතු ඔලිම්පික් උළෙළ පැවැත්වුණේ වසංගත තත්ත්වයක් මධ්‍යයේ නොවන බව ද සැලකිල්ලට ගත යුතුව ඇත. කොරෝනා වසංගත තත්ත්වය යටතේ අන්තර්ජාතික ක්‍රීඩා ලෝලීන්ට පමණක් නොව දේශීය ක්‍රීඩා ලෝලීන්ටත් එකට ඒකරාශී වී ඔලිම්පික් තරග නැරඹීමේ අවදානමක් තිබෙන බව මෙහිදී අමතක කිරීම සුදුසු නැත.

තෝකියෝ ඔලිම්පික් උළෙළ සම්බන්ධයෙන් ඉදිරි පියවර තවදුරටත් සාකච්ඡා කිරීම සඳහා අන්තර් ජාතික ඔලිම්පික් කමිටුවේ විධායක මණ්ඩලය ලබන සතියේදී හමුවීමට නියමිතව ඇත. එවිට ගිනි සිළුව රැගෙන යෑමේ ආරම්භක උත්සවය සම්බන්ධයෙන් පවා ගෙන ඇති තීන්දු තීරණ තවදුරටත් වෙනස් වන්නට ඉඩ තිබේ.

මේ අතර ජපානයේ කොවිඩ් තත්ත්වය සම්බන්ධයෙන් ද වාර්තාවන් පළ වේ. එරට ජනගහනයෙන් 441 200කට කොරෝනා වයිරසය ආසාදනය වී ඇත. 8 300කට ආසන්න පිරිසක් කොවිඩ් නිසා ජීවිතක්ෂයට පත් ව සිටිති. කොරෝන එන්නත ලබාදීම ජපානයේ මේ වන විට තරමක් සෙමෙන් සිදුවන බව ද සඳහන් වේ. එන්නත් කිරීමේ වැඩසටහන ආරම්භ වීමෙන් පසු මේ වනතුරු එන්නත් කර තිබෙන්නේ 46 500කට ආසන්න පිරිසකට පමණි. එයින් වැඩි පිරිසක් සෞඛ්‍ය සේවයේ සිටින පිරිස් බව ද වාර්තාවන් පෙන්වා දෙයි.

**මංජුලා විජයරත්න**



# නි. ඇමැති නාලකට එරෙහි චෝදනා සාක්ෂි අනුව ප්‍රශ්න සහගතයි

## ජනාධිපති නීතිඥ කාලිංග

**රෝෂන් තුෂාර**

විනිමය සුරැකුම්පත් මණ්ඩලයේ මුදල් සාපරාධි සාවද්‍ය පරිහරණය කළේ යැයි සඳහන් කරමින් නියෝජ්‍ය ඇමැති ආචාර්ය නාලක ගොඩහේවා මහතා ඇතුළු පිරිසට පවරා ඇති නඩුවේ චෝදනා පැමිණිල්ලේ පළමු සාක්ෂිකාරිය දුන් සාක්ෂි අනුව ප්‍රශ්න සහගත වී ඇති බවත්, ඒ සම්බන්ධයෙන් නීතිපතිවරයා සිය ස්ථාවරය අධිකරණයට දැනුම් දීමට නියමිත බවත් ජනාධිපති නීතිඥ කාලිංග ඉන්ද්‍රතිස්ස මහතා කොළඹ මහාධිකරණය හමුවේ කරුණු දක්වමින් ඊයේ (12) පැවසීය. නාලක ගොඩහේවා නියෝජ්‍ය ඇමැතිවරයා ඇතුළු තිදෙනකුට එරෙහිව නීතිපතිවරයා පැවරූ නඩුව මහාධිකරණ විනිසුරු අමල් රණරාජා මහතා ඉදිරියේ කැඳවූ අවස්ථාවේ නීතිඥවරයා එසේ පැවසීය.

මේ නඩුව ප්‍රකාරව සිය සේවා දායක නියෝජ්‍ය ඇමැතිවරයාට පනවා ඇති විදෙස් තහනම තාවකාලිකව ඉවත් කරන ලෙසද ඉන්ද්‍රතිස්ස මහතා ඉල්ලා සිටියේය.

එම ඉල්ලීම අනුව නියෝජ්‍ය ඇමැති නාලක ගොඩහේවා මහතාගේ හා විත්තිකරුවකු ලෙස නම් කර ඇති ක්‍රීඩා අමාත්‍යාංශයේ සම්බන්ධීකරණ නිලධාරි රොනි ඉබ්‍රාහිම් මහතාට ඇප කොන්දේසි ප්‍රකාරව පනවා තිබූ විදෙස් ගමන් තහනම ලබන ජූනි 29 තෙක් තාවකාලිකව අත්හිටුවීමට විනිසුරුවරයා නියෝග කළේය. අදාළ නියෝගය ආගමන විගමන පාලකවරයාට දැනුම් දෙන ලෙසද දන්වා සිටියේය. අදාළ ගමන් බලපත්‍ර ශ්‍රී ලංකාවට පැමිණි වහාම අධිකරණයට බාර දෙන ලෙසද විනිසුරුවරයා දන්වා සිටියේය.

පාර්ලිමේන්තු මන්ත්‍රී නාමල් රාජපක්ෂ මහතාගේ සංකල්පයක් අනුව පිහිටුවූ තාරුණ්‍යයට හෙටක් සංවිධානයට දුන් විනිමය හා සුරැකුම් පත් කොමිසමේ රුපියල් ලක්ෂ පනහක මුදලක් සිලෝන් ප්‍රිමියර් ස්පෝර්ට් ලිමිටඩ් ආයතනයේ ගිණුමට දෙමින් සාපරාධි හා සාවද්‍ය පරිහණය කළේ යැයි චෝදනා කරමින් පැවරූ මේ නඩුවේ සෙසු විත්තිකරු ලෙස එම කොමිසමේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ලෙස කටයුතු කළ ධම්මික පෙරේරා නම් කර තිබිණි.

නීතිපතිවරයා වෙනුවෙන් ඊයේ දිනයේ රජයේ ජ්‍යෙෂ්ඨ අධි නීතිඥ වසන්ත පෙරේරා මහතා පෙනී සිටියේය. පැමිණිල්ලේ නීතිඥවරයා සඳහන් කරන පරිදි සාක්ෂි සම්බන්ධයෙන් උද්ගත තත්ත්වය පිළිබඳ තමන් දැනුවත් නොමැති බවත්. මේ නඩුව වෙනුවෙන් නියෝජ්‍ය සොලිසිටර් ජනරාල් අසාත් නවාවි මහතා පෙනී සිටි බවත් අධිනීතිඥවරයා කරුණු දක්වමින් පැවසීය.

දෙපාර්ශ්වයේ කරුණු සලකා බැලූ විනිසුරුවරයා විදෙස් තහනම තාවකාලිව ඉවත් කර නඩුව ජූනි 29 දින කැඳවන ලෙසට දන්වා සිටියේය.

# එන්නත් කළ සුව සේවකයන් ප්‍රතිදේහ පරීක්ෂාවකට

**සන්ධ්‍යා කරුණාරත්න**

කොවිඩ් - 19 වයිරසයට එරෙහි එන්නත ගත් සෞඛ්‍ය සේවකයන්ගේ සිරුර තුළ ප්‍රතිදේහ නිපදවී ඇති ආකාරය සම්බන්ධයෙන් පරීක්ෂාවක් කිරීම සඳහා රුධිර සාම්පල් ගැනීම මේ වන විට ආරම්භ කර ඇති බව ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ අසාත්මික හා ප්‍රතිශක්ති විද්‍යා හා සෛල ජෛව විද්‍යා ආයතනයේ අධ්‍යක්ෂ ආචාර්ය චන්දිම ජීවන්දර මහතා 'දිනමිණ'ට ඊයේ (11) ප්‍රකාශ කළේය.

සෞඛ්‍ය සේවකයන් 2,000කගේ රුධිර සාම්පල ගැනීම ආරම්භ කළ බවත් ඉදිරි දින දෙක තුන තුළදී එම සාම්පල් ගෙන අවසන් කරන බවත් ඒ මහතා කියා සිටියේය.

කොවිඩ් එන්නත දීමට පෙර මේ පුද්ගලයන් 2,000කගෙන් රුධිර සාම්පල් ගත් අතර එන්නත දී මාසයක් ගත වූ පසු එන්නත ශරීරය තුළ ක්‍රියා කර ඇති ආකාරය සම්බන්ධයෙන් විමසා බැලීමට පරීක්ෂණ කරන්නේ යැයිද ඒ මහතා කීය.

එන්නතක් දී දින 14ක් ගත වන විටදී එය ශරීරය තුළ ප්‍රතිදේහ නිෂ්පාදනය කරන බවත් මේ වන විට එන්නත දී දින 28ක් ගත වී ඇති අතර ප්‍රතිදේහ නිෂ්පාදනය වී ඇති ආකාරය සම්බන්ධයෙන් පරීක්ෂාවට ලක් කළ හැකි බවත් හෙතෙම පැවසීය.

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ අසාත්මික හා ප්‍රතිශක්ති විද්‍යා හා සෛල ජෛව විද්‍යා ආයතනය තුළ මේ පරීක්ෂණ කරන බවද ඒ මහතා ප්‍රකාශ කළේය.

# ශ්‍රී ලංකා ධජය සහිත පාපිස්නා සහ පාවහන් වෙළෙඳපොළේ

**සුභාෂිණී සේනානායක සහ රක්ෂණා ශ්‍රියන්ත**

ශ්‍රී ලංකාවේ ජාතික ධජය ඇතුළත් කර නිෂ්පාදනය කරන ලද පාපිස්නා වෙළෙඳ දැන්වීම සම්බන්ධයෙන් එම පාපිස්නා නිෂ්පාදනය කරනු ලබන චීන සමාගම සම්බන්ධ කර ගන්නා ලෙස විදේශ ලේකම් අද්මිරාල් මහාචාර්ය ජයනාත් කොළඹගේ, බීජිංහි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය වෙත දැනුම් දී තිබේ.

විදෙස් කටයුතු අමාත්‍යාංශය නිවේදනයක් නිකුත් කරමින් පවසන්නේ "ශ්‍රී ලංකාවේ ජාතික ධජය ඇතුළත් කර නිෂ්පාදනය කරන ලද, 'Sri Lanka Flag Non-Slip Doormat' ලෙසින් අන්තර්ජාලය මඟින් මිලදී ගැනීමට ඇති පාපිස්නාවක් පිළිබඳ ඇමසොන් වෙබ් අඩවියෙහි දැක්වෙන දැන්වීමක් සම්බන්ධයෙන් මෑතකදී සමාජ මාධ්‍යයන්හි වාර්තා පළ වී තිබේ" යනුවෙනි.

විදේශ ලේකම් අද්මිරාල් මහාචාර්ය ජයනාත් කොළඹගේ මහතා පැවසුවේ අදාළ නිෂ්පාදනය පිළිබඳ කොළඹ පිහිටි චීන තානාපති කාර්යාලයේ අවධානයටද යොමු කර ඇති බවය.

එමෙන්ම ඇමසොන්හි වෙළෙඳ ප්‍රචාරණ වෙබ් අඩවිය සමඟ මේ කාරණය පිළිබඳ පසු විපරමක් කරන ලෙසට වොෂිංටන් ඩී. සී. හි පිහිටි ශ්‍රී ලංකා තානාපති කාර්යාලයටද උපදෙස් දී තිබෙන බවද ඔහු පැවසීය.

අන්තර්ජාලය ඔස්සේ භාණ්ඩ අලෙවි කරන අන්තර්ජාතික වෙබ් අඩවියක් ඔස්සේ මෙරට ජාතික කොඩිය පිළිබිඹු වන ආකාරයෙන් පාපිසි හා සෙරෙප්පු අලෙවි කරන බවට පාරිභෝගික අධිකාරියට ඊයේ (12) පෙරවරුවේ පැමිණිල්ලක් ලැබී තිබිණි. මේ සිද්ධියට සෘජුව මැදිහත් වී අවශ්‍ය නීත්‍යානුකූල ක්‍රියාමාර්ග ගන්නා බව සමුපකාර සේවා, අලෙවි සංවර්ධන සහ පාරිභෝගික ආරක්ෂණ රාජ්‍ය ඇමැති ලසන්ත අලගියවන්න මහතා දිනමිණට ඊයේ (12) පැවසීය.

මේ වෙබ් අඩවිය ලෝකයේ බොහෝ රටවල කොඩිය පාපිස්නාවකට යොදා අලෙවි කරන බවට දැන ගන්නට ලැබී ඇති බවත් කුමන රටක් ඒ සඳහා ඉඩ දුන්නද මෙරට ජාතික කොඩිය එවැන්නක් සඳහා යොදා ගැනීමට ඉඩ නැති බව කී ඒ මහතා, විදෙස් කටයුතු අමාත්‍යාංශය, තානාපති කාර්යාලය හා අන්තර්ජාතික වෙළෙඳ සංවිධාන සමඟ සාකච්ඡා කර මේ වෙනුවෙන් ගත හැකි නීතිමය පියවර ගන්නා බවත් කීවේය.

# ජනවාරියේ සීනි-රසකැවිලි ආනයනයේ වැඩි වීමක්

මේ වසරේ ජනවාරි මාසය තුළ සීනි සහ රසකැවිලි ආනයනයේ ශීඝ්‍ර වර්ධනයක් සිදුව ඇති බව ශ්‍රී ලංකා මහ බැංකුව පවසයි.

ශ්‍රී ලංකා මහ බැංකුවේ ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් විදේශීය අංශයේ ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් නිකුත් කළ නවතම වාර්තාවට අනුව මේ වසරේ ජනවාරි මාසය තුළ සීනි සහ රසකැවිලි ආනයනය කිරීම සඳහා අමෙරිකානු ඩොලර් මිලියන 57.5ක් වැය කර තිබේ. 2020 වසරේ ජනවාරි මාසය තුළ සීනි සහ රසකැවිලි ආනයනය කිරීමට වැය වී ඇත්තේ අමෙරිකානු ඩොලර් මිලියන 20ක් වන අතර ඒ අනුව මේ වසරේ සියයට 186.9ක වර්ධනයක් පෙන්නුම් කරන බව මහ බැංකුව පෙන්වා දෙයි. මේ අතර 2020 වසරට සාපේක්ෂව 2021 වසරේ ජනවාරි මාසය තුළ ආහාර සහ පාන වර්ග ආනයනය සඳහා ගිය වියදමද සියයට 24.6ක වර්ධනයක් වාර්තා කර තිබේ.

මෙහිදී පොල්තෙල්, මිරිස් සහ පරිප්පු යන භාණ්ඩ ආනයනය ඉහළ ගොස් ඇති බව මහ බැංකුව පෙන්වා දෙයි.

# සා/පෙළ පිළිතුරු පත්‍ර ඇගයීම 27 දා ඇරඹේ

**සිතාරා සේනානි**

අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගයේ පිළිතුරු පත්‍ර ඇගයීම මේ මස 27 වැනිදා ආරම්භ කිරීමටත්, සෞන්දර්ය විෂයයන් සඳහා ප්‍රායෝගික පරීක්ෂණ මැයි මාසයේ ආරම්භ කිරීමටත් තීරණය කර ඇති බව අධ්‍යාපන ඇමැති මහාචාර්ය ජී. එල්. පීරිස් මහතා පවසයි.

සෞන්දර්ය විෂයයන්ට අදාළ ප්‍රායෝගික පරීක්ෂණ මැයි මාසයේ පැවැත් වීම නිසා මාර්තු සහ අප්‍රේල් මාසවල ඒ සඳහා සූදානම් වීමට දරුවන්ට අවස්ථාව ලැබෙන බවද ඇමැතිවරයා කියයි. එසේම ජූනි මාසයේ සාමාන්‍ය පෙළ විභාගයේ ප්‍රතිඵල නිකුත් කිරීමටත්, ජූලි මාසයේ උසස් පෙළ පන්ති ආරම්භ කිරීමටත් කටයුතු කරන බවද සඳහන් කරයි.

අ.පො.ස. සාමාන්‍ය පෙළ 2020 විභාගයේ අවසාන දිනය යෙදී තිබූ පසුගිය 10දා කෝට්ටේ ආනන්ද ශාස්ත්‍රාලයේ කළ නිරීක්ෂණයෙන් අනතුරුව අදහස් දක්වමින් ඇමැතිවරයා මේ බව සඳහන් කළේය.

# 20 නීතියට පටහැණියැයි ගොනු කළ පෙත්සම නිෂ්ප්‍රභයි

**නෙල්කා මැදගෙදර**

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 20 වැනි සංශෝධනය සම්මත කර ඇති ආකාරය නීතියට පටහැණි බවට ප්‍රකාශ කරන ලෙස ඉල්ලා ගොනු කර ඇති පෙත්සමක් ඊයේ (12) පෙත්සම්කරු විසින් ඉල්ලා අස් කර ගැනීම නිසා පංච පුද්ගල විනිසුරු මඬුල්ලක් විසින් එය නිෂ්ප්‍රභ කරන ලදි.

ගාමිණී අමරසේකර, යසන්ත කෝදාගොඩ, ඒ. එච්. එම්. ඩී. නවාස්, කුමුදුනී වික්‍රමසිංහ සහ ශිරාන් ගුණරත්න යන මහත්ම මහත්මීන් මේ පංච පුද්ගල විනිසුරු මඬුල්ල හමුවේ මේ පෙත්සම කැඳවනු ලැබිණි. එහිදී පෙත්සමෙහි ඇති අඩුපාඩු කිහිපයක් පිළිබඳ අවධානය යොමු කළ විනිසුරු මඬුල්ල ඒ පිළිබඳ පෙත්සම්කාර නාගානන්ද කොඩිතුවක්කු මහතාට පෙන්වා දෙන ලදි.

එම අඩුපාඩු හේතුවෙන් පෙත්සම ඉල්ලා අස් කර ගැනීමටත් නව පෙත්සමක් ගොනු කිරීමටත් පෙත්සම්කරු අධිකරණයෙන් අවසර ඉල්ලා සිටියේය.

විනිසුරු මඬුල්ල ඒ සඳහා අවසර දෙන ලදි.

විනිවිද පෙරමුණේ ලේකම් නාගානන්ද කොඩිතුවක්කු මහතා විසින් මේ පෙත්සම ඉදිරිපත් කර තිබිණි.

01 පිටුවෙන් ...

## නැ'හිර ජල ව්‍යාපෘතියට ...

මහා භාණ්ඩාගාරය විසින් එම ව්‍යාපෘතියට අවශ්‍ය ජීඅයි පයිප්ප සහ උපාංග ගෙන්වීමේ කාර්යය ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය වෙත පවරා තිබූ අතර ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය විසින් එය කොන්ත්‍රාත්තුවක් ලෙස ඇක්සස් ඉන්ටර්නැෂනල් (M/S Access International (Pvt) Ltd) ආයතනය වෙත දී තිබිණි.

එම භාණ්ඩ බදු නොගෙවා බදු ගුදම්ගත කිරීම සඳහා ශ්‍රී ලංකා රේගුව විසින් ඇක්සස් ඉන්ටර්නැෂනල් ආයතනය වෙත අවස්ථාව දී ඇති අතර ඒ සඳහා රේගු සටහන්කර (Cusdec) 08ක් නිකුත් කර තිබිණි. එහි භාණ්ඩ ගුදම්කර වටිනාකම අමෙරිකානු ඩොලර් 5,139,621ක් නමුත් එම භාණ්ඩ ගුදමෙන් නිදහස් කර ගැනීමේදී දේශීයව සැකසූ ඉන්වොයිස් භාවිත කර එහි වටිනාකම අමෙරිකානු ඩොලර් 6,350,364ක් ලෙස දක්වා ව්‍යාජ තොරතුරු සහිත සටහන්කර මගින් අමෙරිකානු ඩොලර් 1,207,098ක වටිනාකමක් ඇක්සස් ඉන්ටර්නැෂනල් ආයතනයට ගැනීමට ඉඩ සලසා දීම සම්බන්ධවද කමිටුවේ අවධානය යොමු විය.

එමෙන්ම ව්‍යාජ ඉන්වොයිස් සැකසීම, ව්‍යාජ තොරතුරු ඉදිරිපත් කර විදේශීය මෙන්ම දේශීය මුදල්ද අයථා ලෙස ගෙන තිබියදී මේ සම්බන්ධව විමර්ශනය කරන ලද ශ්‍රී ලංකා රේගුව එය ඇක්සස් ඉන්ටර්නැෂනල් ආයතනයේ තිබූ වරදක් නොවන සේ සලකා විමර්ශනය අවසන් කොට තිබීම රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේදී විමර්ශනයට ලක් විය.

මෙහිදී රේගු අධ්‍යක්ෂවරයා, මේ පිළිබඳ විමර්ශනය කිරීම සඳහා නව කමිටුවක් පත් කර ඇති බවත්, එහි වාර්තාව අප්‍රේල් 01 වැනිදාට පෙර ඉදිරිපත් කිරීමට හැකි බවත් සඳහන් කළේය.

නොරොච්චෝලේ තාප විදුලි බලාගාරය සඳහා අවශ්‍ය වන ගල් අඟුරු සැපයීමට රාජ්‍ය ආයතන 04ක (සී/ස නැව් සංස්ථාව සියයට දහයක් ලංකා විදුලි බල මණ්ඩලය සියයට හැටක්, ශ්‍රී ලංකා වරාය අධිකාරිය සියයට දහයක්, මහා භාණ්ඩාගාරය සියයට විස්සක කොටස් අයිතියෙන් යුත් Lanka Coal Company (Pvt) Ltd ආයතනය පිහිටුවා තිබිණි. එම ආයතනය විසින් 2016 දී ගල් අඟුරු ආනයනය කළ අවස්ථා 66කදී එකී ගල් අඟුරුවල CIF වටිනාකම පිළිබඳ නිවැරදි තොරතුරු අනාවරණය නොකිරීම හේතුවෙන් අඩුවෙන් අය කර ගෙන තිබූ රුපියල් මිලියන 187කට ආසන්න වැට් බද්ද සම්බන්ධයෙන් කෝපා කමිටුවේදී සාකච්ඡාවට ලක්විය.

මෙහිදී වැට් බදු නිවැරදිව ගණනය කර රේගු සටහන්වලට ඇතුළත් නොකිරීම නිසා අඩුවෙන් වැට් බදු ගෙවීම පිළිබඳ කළ රේගු විමර්ශනය මඟින් අඩුවෙන් ගණනය කරන ලද වැට් බද්ද වන රුපියල් මිලියන 205ක මුදල අතිරේක බද්දක් ලෙස අය කර ගන්නවා වෙනුවට දණ්ඩනයක් ලෙස අය කර ගෙන තිබීම නිසා එම දඩ මුදලින් 50%ක් හෙවත් රුපියල් මිලියන 102.5ක් නිලධාරීන්ට ත්‍යාග ලෙස ගෙවීමද, තවත් 20%ක් එනම් රුපියල් මිලියන 41ක් රේගු නිලධාරීන්ගේ සුබ සාධනය සඳහා වන කළමනාකරණ හා වන්දි මුදලට බැර වීමත්, රජයේ ආදායමට රුපියල් මිලියන 61.5ක් පමණක් බැර වීමත් කමිටුවේ අවධානයට ලක් විය.

මේ පිළිබඳ නැවත විමර්ශනයක් කොට වාර්තාව කාරක සභාව වෙත ඉදිරිපත් කරන ලෙස මහා භාණ්ඩාගාරයේ ලේකම්වරයාට කමිටු සභාපතිවරයා දැනුම් දුන්නේය. මෙවැනි අක්‍රමිකතා නොවීම පිණිස රේගු ආඥා පනත සංශෝධනය කිරීමේ අවශ්‍යතාවද මෙහිදී කමිටුව විසින් අවධාරණය කරන ලදි.

## පාස්කු කොමිසමේ ...

කොමිෂන් සභා වාර්තාවල වාරණය කිරීමට හෝ සැඟවීමට කිසිදු කරුණක් නොමැති බවත්, ජාතික ආරක්ෂාවට සම්බන්ධ කරුණු ඇතුළත් වෙළුම් 22ක් ජාතික ආරක්ෂක කවුන්සිලයේ අනුමැතියට යොමු කර තිබූ බැවින් එම නිර්දේශ ලැබෙන තෙක් බාරදීමට නොහැකි වූ බවත් පෙන්වා දුන් රෝහණධීර මහතා වෙළුම් බාරදීම කිසිසේත් ප්‍රමාද නොකළ බව පැවසීය.

කොමිෂන් සභා වාර්තාව අනුව වගඋත්තරකරුවන් හෝ සැකකරුවන් බවට නීතිපතිවරයා විසින් නම් කරන පුද්ගලයන් විදේශගතව හෝ රටින් පලා ගොස් ඇත්නම් මෙරටට ගෙන්වා ගැනීමට අවශ්‍ය රාජ්‍යතාන්ත්‍රික මැදිහත්වීම දීමට ජනාධිපතිවරයා ප්‍රමුඛ රජය කටයුතු කරන බවද, උද්ර්පන නීතිය යටතේ අවශ්‍ය ප්‍රතිපාදන සලසන බවද කීවේය.

කොමිෂන් සභාවේ වාර්තා පාර්ලිමේන්තුවට දුන්නා සේම මේ ජාතික ආරක්ෂාව සම්බන්ධ වෙළුම් නීතිපතිවරයාගේ නිර්දේශය මත පාර්ලිමේන්තුවට හෝ මහජනතාවට විවෘත කළ යුතුද යන්න තීරණය කරන බවත්, මේ රාජ්‍ය ආරක්ෂාව සම්බන්ධ වෙළුම් නඩු පැවරීමට නීතිපතිවරයාට යොමු කළ බවත් පෙන්වා දුන්නේය.

ඊයේ පස්වරුවේ පාස්කු කොමිසමේ සාක්ෂි ලේඛන ඇතුළත් වෙළුම් 22ක් නීතිපතිවරයාට බාරදීමෙන් පසු නීතිපති කාර්යාල පරිශ්‍රයේදී මාධ්‍යවේදීන් ඇසූ ප්‍රශ්නවලට පිළිතුරු දුන් රෝහණධීර මහතා මෙසේද පැවසීය.

පාස්කු ප්‍රහාර විමර්ශන ජනාධිපති කොමිසමේ වාර්තා ජනාධිපතිවරයාට ලැබුණේ පෙබරවාරි 01 දින. ඒ වගේම සිංහල පිටපත් ලැබුණේ පෙබරවාරි 15 දින ඒ ලැබුණු වහාම අපි කැබිනට් මණ්ඩලයට ඊට පසුව කතානායකවරයාට පාර්ලිමේන්තුවට යොමු කළා. පසුව නීතිපතිවරයාට දුන්නා. අවසන් වාර්තාව නමුත් එම කොමිසමේ සභාපතිවරයා හා සාමාජිකයන් නම් කළ ජාතික ආරක්ෂාව සම්බන්ධ වෙළුම් 22ක් අද දින බාර දීම කළා. මොකද මේවා නඩු ගොනු කිරීමට අවශ්‍යයයි. මේ නිසා ප්‍රමාදයක් වූයේ යැයි කියන්න බැහැ. මොකද සංවේදී තොරතුරු නිදහස් කිරීමේදී යම් කාර්ය පටිපාටියක් තියෙනවා. ජනාධිපතිවරයා විසින් ආරක්ෂක කවුන්සිලයට මේ වාර්තා යොමු කරලා නිර්දේශ අරගෙන නීතිපතිවරයාට බාර දීලා තියෙනවා. එහිදී මේ වාර්තාවල රහස්‍ය භාවය රකින්න කියලා. ආරක්ෂක කවුන්සිලය දැනුම් දීලා තියෙනවා. ඉතිං නීතිපතිවරයාගේ නිර්දේශය මත ඉදිරියට කටයුතු සිදු වේවි. මේ වාර්තාවේ වෙළුම් 87ක් තිබෙනවා. මීට පෙර වෙළුම් 65ක් නීතිපතිවරයාට දුන්නා. අද දින තව 22ක් බාර දුන්නා.

මේ කොමිසම පත් කළේ හිටපු ජනාධිපතිවරයා 2019 සැප්තැම්බර් 21 දින. පසුව නව රජය පත් වුණාට පසු වත්මන් ජනාධිපතිවරයාට හැකියාව තිබුණා පනත ප්‍රකාරව මේ කොමිසමේ සංයුතිය වෙනස් කරන්න. නමුත් අති උතුම් කාදිනල්තුමා ප්‍රමුඛ පාර්ශ්ව කියා තිබුණා තව දුරටත් ඒ ආකාරයෙන්ම ක්‍රියාත්මක විය යුතු බව. මා හිතන්නේ සාධනීය නිර්දේශ සමඟ හොඳ වාර්තාවක් කොමිසම දී තිබෙනවා. මේක අරගෙන ජාත්‍යන්තරයට යන්න ඕනා කියලා මම හිතන්නේ නැහැ. අපට මේ නීතිමය කටයුතු අපේ රටේම කරන්න පුළුවන්, නීතිය ක්‍රියාත්මක කිරීම ඇතුළු සාධනීය නිර්දේශ මෙහි තිබෙනවා.

මේ කොමිසමේ නිර්දේශ අනුව විශේෂ මහාධිකරණයක් පත් කර වැරදිකරුවන්ට දඬුවම් දිය යුතු බව පැවසෙනවා. දින පතා විභාග කළ යුතු බවද සඳහන් වෙනවා. මේ නිර්දේශ ක්‍රියාත්මක විය යුත්තේ කෙසේද යන්න නීතිපතිවරයාගේ අභිමතය පරිදි විය යුතුයි. ඊට අවශ්‍ය සියලු සහාය දීමට රජය හෝ ආණ්ඩුව පසුබට වන්නේ නැහැ. පාස්කු කොමිසම සම්බන්ධව පත් කළ අමාත්‍ය මණ්ඩල අනු කමිටුවේ ලේකම්වරයා ලෙස ක්‍රියා කරනවා. අද එය රැස් වෙනවා. එම කමිටුවෙන් පාස්කු නිර්දේශ අඩු කිරීමට හෝ වෙනස් කිරීමට කටයුතු කරන්නෙ නැහැ. සිදු වන්නේ නීතිපතිවරයා නීතිය ක්‍රියාත්මක කිරීමට කටයුතු කරනවා සේම මීට අදාළ යම් යම් රාජ්‍ය ආයතන තිබෙනවා. එම සම්බන්ධීකරණ කටයුතු මේ අමාත්‍ය මණ්ඩල අනුකමිටුවෙන් සිදු කරනවා පමණයි.

## සීනි ආනයනයෙන් ...

එස්. ආර්. ආටිගල මහතා මේ බව අවධාරණය කළේ ඊයේ (12) සවස මුදල් අමාත්‍යාංශයේ පැවැති විශේෂ මාධ්‍ය හමුවට එක් වෙමිනි. එහිදී වැඩි දුරටත් අදහස් දැක්වූ ලේකම්වරයා, " 2020 ඔක්තෝබර් 10 වැනිදා ආනයනික සීනි කිලෝවකින් අය කළ විශේෂ තීරු බද්ද රුපියල් 50 සිට ශත 25 දක්වා අඩු කිරීමට රජය තීරණය කළ බව කීවේය. එම තීරු බදු අඩුවීම කිලෝවකින් රුපියල් 49.75 වේ. මෙලෙස තීරුබදු අඩු කිරීමට මහා භාණ්ඩාගාරය තීන්දු කරනු ලැබුවේ කොළඹ වරායට සීනි කිලෝවක් රුපියල් 72ක මිලකට පැමිණීම නිසයි. එනමුත් අප රටේ වෙළෙඳපොළේ සීනි කිලෝවක් එම කාලයේ අලෙවි කළේ රුපියල් 140කටය. මෙලෙස ඉතා ඉහළ සීනි මිලක් පැවතීම හේතුවෙන් පාරිභෝගික ජනතාවට වන පීඩනය අවම කිරීමට සීනි සඳහා අය කළ විශේෂ තීරු බද්ද අඩු කළේය. ඒ අනුව තීරුබදු රහිතව සීනි කිලෝවක් රුපියල් 85කට දෙසැම්බර් වන විට ගෙන්වා ගත හැකිව තිබිණි. මේ නිසා දේශීය වෙළෙඳපොළේ රුපියල් 114කට වැනි අඩු මිලකට අලෙවි කිරීමට අවස්ථාව උදා විය. මේ වාසිදායක තත්ත්වය ගණන් නොබලා වසර 2020 ඔක්තෝබර් 10 සිට 2021-02-10 දක්වා මෙරටට ගෙන ආ මුළු සීනි තොගය සඳහා කිලෝ එකකට රුපියල් 49.75 බැගින් රජයට ආදායමක් අහිමි වූයේ යැයි ගණන් බලා කරනු ලබන විවේචනවල කිසිදු සත්‍යතාවයක් නැතැයි' ආටිගල මහතා විස්තර කළේය.

ලෝක වෙළෙඳපොළේ යම් යම් භාණ්ඩවල මිල ඉහළ යෑමක් පවතින අවස්ථාවල ඒවා මෙරටට ගෙන්වීමේදී අය කරන විශේෂ තීරු භාණ්ඩ බද්ද අඩු කිරීම පාරිභෝගික ජනතාවට සහන සැලසීමේ අරමුණින් ක්‍රියාත්මක කරන ක්‍රියාවලියක් බවද ලේකම්වරයා කීය.

මේ මාධ්‍ය හමුවට මුදල් අමාත්‍යාංශයේ සහ මහා භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරුන් වන ප්‍රියන්ත රත්නායක සහ සමන් ප්‍රනාන්දු මහත්වරුද එක්ව සිටියහ.

01 පිටුවෙන් ...

## මියන්මාරයට ආරාධනා කිරීම ...

එමඟින් තහවුරු වන්නේ වත්මන් මියන්මාර් පාලනය ශ්‍රී ලංකා රජය පිළිගෙන ඇති බව යැයි හෙතෙම කොළඹදී පෙරේදා (11) පැවති මාධ්‍ය හමුවකදී කීවේය.

“ප්‍රජාතන්ත්‍රවාදය විනාශ කරමින් මිලිටරිකරණයක් හරහා මියන්මාරයේ ඊනියා ආණ්ඩුවක් අව නීතියෙන් බිහි වුණ ආණ්ඩුවක් අද නිර්මාණය වෙලා තියෙනවා. වර්තමාන ශ්‍රී ලංකා ආණ්ඩුවේ විදේශ ඇමැතිවරයා මියන්මාරයේ වුණ මිලිටරිකරණ ඒකාධිපති වියරුව නොසලකා මිලිටරි ඊනියා ආණ්ඩුවකින් බිහි කරපු විදේශ ඇමැතිවරයාට ලිපියකින් ආරාධනා කරනවා බිම්ස්ටෙක් සමුළුවට සහභාගි වෙන්න කියලා. මේක අන්තර්ජාතික සබඳතා තුළ වෙන දෙයක් මම හිතන්නේ මේ රජයට අන්තර්ජාතික සබඳතා පිළිබඳ වැඩි දැනුමක් නොමැති තත්ත්වයක් තුළ මේ බරපතළ වරද ක්‍රියාත්මක කරලා තියෙන්නේ.“

## ප්‍රජාතන්ත්‍රවාදයට එන්නැයි ...

ප්‍රජාතන්ත්‍රවාදී ලෙස තේරී පත් වූ ජනාධිපති, රාජ්‍ය උපදේශක සහ පාර්ලිමේන්තුව යළි පිහිටුවීමේ අවශ්‍යතාව, බිම්ස්ටෙක් සමුළුවට සහභාගි වීමට නියමිත මියන්මාර නියෝජිත කණ්ඩායමේ අවධානය යොමු කරන්නැයි එම පක්ෂය ආණ්ඩුවෙන් ඉල්ලයි.

හමුදාව සහ විරෝධතාකරුවන් අතර වැඩි වන ප්‍රචණ්ඩත්වය මඟින් ථෙරවාදී බුදු දහම පිළිපදින ජාතියක් පිළිබිඹු නොවන බව අවධාරණය කරමින් ශ්‍රී ලංකාව මියන්මාරය සමඟ 4 වැනි සියවසේ සිට පවත්වන සමීප සම්බන්ධතාව උපයෝගි කර ගෙන අඛණ්ඩව වන ප්‍රචණ්ඩ ක්‍රියා වහාම නතර කිරීමට සහ නීත්‍යනුකූලව තේරී පත් වූ නිලධාරීන් නැවත ධුරයට පත් කිරීමට රජය දිගින් දිගටම බලපෑම් කළ යුතු බවත් එක්සත් ජාතික පක්ෂය පෙන්වා දෙයි.

## සීනි බදු අඩු කිරීමෙන් ...

රුපියල් පනහක් තෙක් පනවා තිබූ එම බදු මුදල ශත විසිපහක් තෙක් අඩු කිරීමේදී ලැබිය යුතු සහනය ජනතාවට නොලැබීමෙන් මූලික අයිතිවාසිකම් උල්ලංඝණය කර ඇතැයි පෙත්සමෙහි සඳහන් වේ. ඒ වෙනුවෙන් රුපියල් මිලියන පන්සියයක වන්දි මුදලක් එම සීනි ආනයනය කළ සමාගම ඇතුළු වගඋත්තරකරුවන් පස් දෙනකුගෙන් අය කර ගන්නා ලෙස නියෝග කරන්නැයිද පෙත්සම මඟින් ඉල්ලා ඇත.

අගමැති මහින්ද රාජපක්ෂ මහතා, මුදල් අමාත්‍යාංශ ලේකම් එස්. ආර්. ආටිගල, ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ සභාපති නුෂාඩ් පෙරේරා, පිරමීඩ් විල්මර් පෞද්ගලික සමාගම, එහි අධ්‍යක්ෂ සජත් මවුසූන්, ජනාධිපති ලේකම් ආචාර්ය පී. බී. ජයසුන්දර, පාරිභෝගික සේවා අධිකාරියේ සභාපති විශ්‍රාමික මේජර් ජෙනරාල් ශාන්ත දිසානායක, ජනාධිපතිවරයා වෙනුවෙන් නීතිපති සහ නීතිපතිවරයා මෙහි වගඋත්තරකරුවෝ වෙති.

## අසාද් සාලිට එරෙහිව ...

අසාත් සාලි මහතා කළ ප්‍රකාශය තුළින් ජාතීන් අතර අසමඟිය වර්ධනය වන බව කියමින් ඒ සම්බන්ධයෙන් වහාම පියවර ගත යුතු බව පවසමින් ත්‍රෛනිකායික භික්ෂු එකමුතුව මේ පැමිණිල්ල අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කරනු ලැබීය.

එක් අවස්ථාවක පමණක් නෙවෙයි. අවස්ථා ගණනාවකදී මේ රටේ නීතිය පිළිගන්නේ නැති බව අසාද් සාලි ප්‍රකාශ කළ බව එහිදී අදහස් දැක්වූ එම එකමුතුවේ කැඳවුම්කරු පස්සරමුල්ලේ පඤ්ඤාජෝති හිමි පැවසූහ.

අසාද් සාලි මේ නියෝජනය කරන්නේ අන්තවාදී සහරාන්ලාගේ කණ්ඩායමද?. තවත් කණ්ඩායමක් බිහි කිරීමේ අරමුණින් මේ අය කටයුතු කරනවාදැයි පැහැදිලි සැකයක් ඇති වන බවද උන්වහන්සේ කියා සිටියේය.

උන්වහන්සේ මේ බව කියා සිටියේ ඊයේ (12) අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ පැමිණිල්ල සිදු කිරීමෙන් අනතුරුව මාධ්‍යයට අදහස් දක්වමිනි.

# එන්නත විද මෙරටට එන අයට නිරෝධායන තීරණය සඳුදා

**සුභාෂිණී සේනානායක සහ රක්ෂණා ශ්‍රියන්ත**

කොවිඩ් මර්දන එන්නත් ගෙන මෙරටට පැමිණෙන ශ්‍රී ලාංකිකයන් නිවෙස් නිරෝධායනයට යොමු කිරීම සම්බන්ධයෙන් සෞඛ්‍ය බලධාරීන්ගෙන් කළ ඉල්ලීමට අවධානය යොමුව ඇති බවත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ලබන සඳුදා වන විට ඒ සම්බන්ධයෙන් තීරණයක් දෙනු ඇති බවත් කොවිඩ් 19 පැතිරීම වැළැක්වීමේ ජාතික ක්‍රියාන්විත මධ්‍යස්ථානයේ ප්‍රධානි යුද හමුදාපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා පැවසීය. කොවිඩ් 19 වයිරසයෙන් ආරක්ෂා වීමට ගන්නා එන්නත ගෙන මෙරටට පැමිණෙන විදේශිකයන් සහ ශ්‍රී ලාංකිකයන් සම්බන්ධයෙන් නිරෝධානයන කිරීම සම්බන්ධයෙන් තමන් කොවිඩ් වයිරස ව්‍යාප්තිය වැළැක්වීමේ කාර්ය සාධක රැස්වීමේදී සෞඛ්‍ය අංශ දැනුම්වත් කළ බවද කියා සිටියේය.

# ජාතික වෙළෙඳ ප්‍රතිපත්තියක් සකසන්න කමිටුවක්

**ස්වර්ණා විජේකෝන්**

නව ජාතික වෙළෙඳ ප්‍රතිපත්තියක් සැකසීම වෙනුවෙන් විද්වත් කමිටුවක් පත් කිරීමට වෙළඳ අමාත්‍යාංශය පියවර ගෙන තිබේ. එම කමිටුවේ සභාපතිවරයා ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසන් සභාවේ සභාපති සම්පත් අමරතුංග මහතා පත් කර තිබේ.

එම විද්වත් කමිටුවේ සභාපතිවරයා ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපති මහාචාර්ය සම්පත් අමරතුංග මහතා පත් කර ඇත.

නව ජාතික වෙළෙඳ ප්‍රතිපත්තිය සඳහා මහජන අදහස් ගැනීම ඉදිරි සති කිහිපය තුළ කෙරෙන බව වෙළෙඳ අමාත්‍යාංශ උපදේශක කාරක සභාවට පසුගිය 10දා සහභාගි වෙමින් වෙළෙඳ ඇමැති ආචාර්ය බන්දුල ගුණවර්ධන මහතා ප්‍රකාශ කළේය.

එමෙන්ම සමුපකාර ක්ෂේත්‍රයේ පවතින අඩුපාඩු මග හරවා ගැනීම සඳහාද සමුපකාර ප්‍රතිපත්තියක් සැකසෙන බවත්, එම කටයුතු කඩිනමින් අවසන් කෙරෙන බවත් ඇමැති බන්දුල ගුණවර්ධන මහතා වෙළෙඳ අමාත්‍යාංශ උපදේශක කාරක සභාවට දැනුම් දුන්නේය.

සතොස වෙළෙඳසල් අලුතින් ආරම්භ කිරීමේදී ශක්‍යතා අධ්‍යයනයක් කිරීමේ අවශ්‍යතාවද කාරක සභාවේදී මතු විය.

සතොස තුළ දූෂණ සහ අක්‍රමිකතා වීම පුරුද්දක් ලෙස පවතින අතර, සියලු වෙළෙඳසල් පරිගණකගත කිරීම මඟින් එම තත්ත්වය වෙනස් කළ හැකි බවද කාරක සභාවේදී සාකච්ඡා විය. සිදුව ඇති එම දූෂණ සහ අක්‍රමිකතා පිළිබඳ සෙවීමට අමාත්‍යාංශ මට්ටමින් පරීක්ෂණයක් කරන ලෙසද කාරක සභාවේදී සාකච්ඡා විය.

01 පිටුවෙන් ...

## කොළඹ රිමාන්ඩ් බන්ධනාගාරයේ ...

එහිදී Nokia TA 1174 බැටරිය සහිත කුඩා ජංගම දුරකථන 02ක්, Samsung බැටරි සහිත කුඩා ජංගම දුරකථන 03ක්, Hutch සිම් පත් 04ක්, Dialog සිම් පත් 03ක්, Airtel සිම් 04ක්, චාජර් කේබල් 01ක්, අමතර ජංගම දුරකථන බැටරි 02ක් සහ බැටරි චාජර් 02ක් සොයා ගෙන තිබේ. එමෙන්ම මීට අමතරව කතුරු 02ක්, දුම්කොළ කැබලි කිහිපයක්, කුඩා පන්දම්, යකඩ පතුරු 02ක්, පොඩි කුඩු පැකට් 21ක්, ලොකු කුඩු පැකට් 07ක්, හෙරොයින් යැයි සැක සහිත කුඩු වැනි යමක් බහාලූ පිත්තල පැහැති බහලුම් 01ක්ද සොයා ගෙන තිබේ. මේ පිළිබඳ තව දුරටත් විමර්ශන කටයුතු බන්ධනාගාර නිලධාරීන් විසින් මෙහෙයවනු ලබන අතර සොයා ගන්නා ලද භාණ්ඩ වැඩි දුර පරීක්ෂණ සඳහා බොරැල්ල පොලිසියට යොමු කරන බව බන්ධනාගාර කොමසාරිස් (පාලන හා පුනරුත්ථාපන) බන්ධනාගාර මාධ්‍ය ප්‍රකාශක චන්දන ඒකනායක මහතා කීය.

# මෙහෙම ගණන් හැදුවොත් අයවැයෙන් මිල වැඩි කළ හැම විටම වංචාවක් වෙලා!



## ශ්‍රීලපොපෙ පා.ම. එස්.බී. දිසානායක

**රක්ෂණා ශ්‍රියන්ත**

එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේ මහලේකම්වරියගේ ප්‍රකාශය ඇය ඉදිරියේම ප්‍රතික්ෂේප කර අවසන් බවත්, රටේ ස්වාධීනත්වය හා ස්වෛරීභාවය රැක ගනිමින් ඉදිරියටත් නොසැලී කටයුතු කරන බව පාර්ලිමේන්තු මන්ත්‍රී එස්.බී. දිසානායක මහතා කියා සිටියේය.

ඒ මහතා මේ බව පැවසුවේ ඊයේ (12දා) බත්තරමුල්ල නෙළුම් මාවතේ පිහිටි ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ පක්ෂ මූලස්ථානයේ පැවැති මාධ්‍ය හමුවට එක්වෙමිනි. පාර්ලිමේන්තු මන්ත්‍රී එස්.බී. දිසානායක මහතා වැඩිදුරටත් අදහස් දක්වමින් මෙසේ කීය.

මහා බැංකු වංචාවටත් වඩා විශාල වංචාවක් සීනිවලින් වුණා කියලා මේ දවස්වල මාධ්‍ය හරහා විශාල ප්‍රචාරයක් අරන් යනවා. මේක ගණන් හදන්නේ කොහොමද. හතළිස් නමයයි සත හැත්තෑ පහකින් සීනි අඩු කර, ඒ එක්කම ආපහු හතළිස් නමයයි සත හැත්තෑ පහ එකතු කර පරණ තැනට ගෙනාවා කියනවා. අද වෙනකන් එහෙම සීනි ගෙනැවිත් නැහැ. අදත් සත විසිපහයි සීනි වල බද්ද. මොකක්ද වංචාව කරේ. ඔහොම ගණන් හදනවානම් ලංකාවේ මිල අඩු කරපු හැම වෙලාවෙම ගණනක් හදල කියන්න පුළුවන්. රවී කරුණානායක මුදල් ඇමැතිව සිටි කාලේ සුමානෙකට යකඩ ටැක්ස් එක අඩු කර ආපහු වැඩි කළා. ඒ වෙලාවේ මට මතකයි මෛත්‍රීපාල ජනාධිපතිවරයා එයා හිටියේ මාලදිවයිනේද කොහෙදෝ එයාට කතා කරලා ඒක වෙනස් කරන්න කිව්වා. එතකොට බඩු ඇවිල්ලා.

මම කියන්න කැමැතියි ශතයකවත් වංචාවක් වෙලා නැහැ සත විසිපහට සීනි බැස්සුවා අදත් සත විසිපහයි. මම ඒක පැහැදිලි කරගන්න මුදල් අමාත්‍යංශයේ ලේකම් තුමාට කතා කරා නැහැ අදත් සත විසිපහයි. ලංකාවේ බඩු මිල අඩුවැඩි කරන කොට කිසියම් ලාභයක් ලබනවා. සිරතක් වශයෙන් හැමදාම අයවැයෙන් වැඩි කරන දෙයක් තමයි සිගරට් සහ අරක්කු මිල. 1994 අපි අරක්කු සිගරට් මිල අඩු කරා. ඒ වෙලාවෙ ලොකු අමාරුවක වැටුණා ස්ටොක් හදා ගත්තු අය. ඒ අඩු කරත් හේතුවක් ඇතිව ඒ වෙලාවේ. අරක්කුත් අඩු කරා බියරුත් අඩු කරා. හැමදාම සිරිතක් වශයෙන් අයවැය කාලයට අරක්කු සිගරට් ස්ටොක් එකක් අරගෙන හංගලා තියා ගන්නවා. තියාගෙන බජට් එකෙන් පස්සේ එළියට දානවා.

### සීනිවලින් සතයක වත් පාඩුවක් නැහැ

එහෙම මොකක්වත් මෙතන වෙලා නැහැ සත විසිපහකින් සීනි මිල අඩු කරා අදත් සත විසි පහයි මේක ටැක්ස් එක. මේක ඉදිරි කාලයේදී රුපියල් තිහකින් විතර අඩු වෙලා ඉදිරි කාලයේදී පාරිභෝගිකයාට එයි. කිසිම ආකාරයකින් වංචාවක් මේ රජය යටතේ සිදු වෙලා නැහැ.

පාස්කු ප්‍රහාරය කර තියෙන්නේ ගෝඨාභය රාජපක්ෂ ජනාධිපති වීමට කලින් සාමාන්‍ය පුද්ගලයකු විදියට ඉද්දී සහ බැසිල් රාජපක්ෂයි. මේ සම්බන්ධ කියන්න කැමැතියි මෙහෙම විහිලු සපයන්න හොද නැහැ. මේක විහිලුවක්. මේක ගැන ප්‍රකාශ කරපු අපේ අශෝක අබේසිංහ සිඅයිඩී එකට එයා ගිහිල්ල ඊයේ කිව්වේ ඒක එයා හිතුවෙ නැහැ. ඒක පුංචි ගෙදරක තිබ්බ සාකච්ඡාවක කරපු දෙයක්, ඒක ගැන එයා කනගාටු වෙනවා. එයාට මේ තොරතුරු කොහෙන්වත් ආවේ නැහැ කියලා. හැබැයි ඒක තුළ රටේ ජනාධිපතිවරයාට අපේ පක්ෂයේ ජාතික සංවිධායකවරයාට කරපු ඒ හානිය බරපතළයි කියන කාරණය මම කියන්න කැමැතියි. මිට වඩා දේශපාලනඥයෝ වගකීමෙන් කතා කරනවා නම් ඉතාම හොඳයි.

ජිනීවා යෝජනාව අපිට විරුද්ධව 1946 මානව හිමිකම් කොමිසම කියලා තමයි පටන් ගත්තේ. පස්සේ 2006දි තමයි මේක කවුන්සිලය වුණේ ලොකු පරමාර්ථත් එක්ක. මේ කවුන්සිලය පිළිබඳ අමෙරිකා එක්සත් ජනපදය කිව්වේ මේක ගඳ ගහන කුණු කකුස්සියක් කියලා.

මේ කවුන්සිල් එකේ සභාපති වෙනවා ගිය අවුරුද්දට ඉස්සෙල්ලා සෞදි ආරාබියාවේ රාජ්‍ය නියෝජිතයා. කොහොමද සභාපති වෙන්නේ බිලියනයක පරිත්‍යාගයක් කරනවා මානව හිමිකම් කවුන්සිලයට. සෞදි ආරාබියාව අදත් යේමනයට ඉස්පිරිතාලවලට, ඉස්කෝලවලට බෝම්බ ගහනවා මළ ගෙවල්වලට බෝම්බ ගහනවා අදත්. කවුද බෝම්බ ගහන්න උදව් කරන්නේ. එක්සත් රාජධානිය සහ මහා බ්‍රිතාන්‍ය ජර්මනියයි. කවුද අපිට විරුද්ධව මේ යෝජනාව ගේන්නේ. මලාවි රට ඇරෙන්න අනිත් සියලුම රටවල් නේටෝවට අටත් රටවල්. නේටෝව තමයි අරාබි වසන්තය ගෙනාවේ.

ලෝකයේ ඉතාම ප්‍රබල ධනවත් රටක් විදියට හිටපු ලිබියාව විනාශ කර දැම්මේ නේටෝවේ අයයි. ඒ වගේම තමයි ඉරාකයේ සදාම් හුසේන් මේ අය තරමක ඒකාධිපති නායකයෝ. ඒක ඇත්ත. හැබැයි ධනවත්, ශක්තිමත්, විශාල රටවල් සාමකාමී රටවල් විදියට තිබ්බා. අද මේවා කෑලි කෑලිවලට ගිහිල්ලා. අද ආරාබි වසන්තයට පින් සිද්ධ වෙන්න දහස් ගණනින් මුහුදට පැනලා යුරෝපාකරයට රිංගන්න බැලුවා.

මේ වන විට 3800ක් මහ මුහුදේ මැරිලා තියෙනවා. මානව හිමිකම් කවුන්සිලයට මේවා මොනවත් පේන්නෙ නැහැ. ප්‍රභාකරන් කැලේ ඉදගෙන ළමා සොල්දාදුන් අපේ රටේ හදන කොට කවුද මේ අයට මූලික උපදෙස් දුන්නේ ඇඩ්ලේ බාලසිංහම්. බොහොම නිදහසේ එයා එංගලන්තේ හිටියා. කවදාවත් මානව හිමිකම් කවුන්සිලය මේ ගැන හෙව්වෙ නැහැ යැයි පැවසීය.



# අප ළඟ හිටි ඩබල් ගේම්කාරයන් පාස්කු ප්‍රහාරයේ උප්පැන්නයට නම දාගන්න පොරකනවා

## එජාප මහලේකම් පාලිත රංගේ බණ්ඩාර

**ශිරෝමි අබයසිංහ සහ මැද කොළඹ සමූහ - ආරියරත්න ගනේගොඩ**

සීනි ජාවාරමෙන් රටටත්, මහජනතාවටත් නොව විල්මා සමාගමට පමණක් රුපියල් බිලියනයක අයුතු ලාභයක් ගැනීමට ආණ්ඩුව ඉඩ කඩ සලසා දුන් බව එක්සත් ජාතික පක්ෂයේ මහ ලේකම්, හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී පාලිත රංගේ බණ්ඩාර මහතා පැවසිය.

අනෙක් සමාගම් සීනි කිලෝවකට රුපියල් 50ක බද්දක් ගෙවද්දී, විල්මා සමාගමෙන් පමණක් නිශ්චිත කාලයකට සීනි කිලෝවකට සත විසි පහක් පමණක් බදු අය කිරීමෙන් දේශපාලන වංචනික ක්‍රියාවක් සිදු වී ඇති බවත් එමගින් ආණ්ඩුවේ කුමන හෝ නියෝජිතයකු මුදල් උපයා ගෙන ඇති බවත් රංගේ බණ්ඩාර මහතා කීය.

රංගේ බණ්ඩාර මහතා මේ බව සඳහන් කළේ සිරිකොත එක්සත් ජාතික මූලාස්ථානයේදී පසුගියදා පැවති මාධ්‍ය හමුවකදීය. එහිදී ඒ මහතා මෙසේද කීය.

රුපියල් බිලියන 15.9ක දැවැන්ත සීනි වංචාවක් සිදු වී තිබෙනවා. මේ පිළිබඳ අප අවස්ථා කිහිපයකදීම සඳහන් කළත් රජය හෝ ජනතාව ඒ පිළිබඳ ප්‍රතිචාර දැක්වුයේ නැහැ. රටටත් ජනතාවටත් නොව පෞද්ගලික අංශයේ ව්‍යාපාරිකයන්ට පමණක් හම්බ කර ගැනීමට මේ දැවැන්ත සීනි ජාවාරම නිසා හැකි වුණා. නිශ්චිත කාල පරිච්ඡේදයකට පමණක් සීනි කිලෝවක් සඳහා බද්ද සත විසි පහක් කිරීමෙන් විල්මා සමාගමට පමණක් රුපියල් බිලියන 16 ක අයුතු ලාභයක් ගැනීමට මෙම ආණ්ඩුව ඉඩකඩ සැලසුවා.

අනෙක් සමාගම්වලට සීනි ආනයනය කිරීමට සිදු වුණේ කිලෝවකට රුපියල් 50ක බද්දක් යටතේයි. ඒ අනුව විල්මා සමාගම කිලෝවකින් රුපියල් 49යි සත 75 ක අයුතු ලාභයක් ගත්තා. ඒ සඳහා ඉඩ දුන් වෙළෙඳ ඇමැති ප්‍රමුඛ ආණ්ඩුව මෙයට වගකිව යුතුයි. ඔවුන්ට දුන් බදු සහනය ජනතාවට ලැබුණේ නැහැ.

සීනි මිල අඩුවෙන් කිසිම වෙළෙඳපොළකින් ගන්න බැරි වුණා. විල්මා සමාගමට දුන් බදු සහනයෙන් ආණ්ඩුවේ කිසියම් හෝ නියෝජිතයකු මුදල් ගෙන තිබෙනවා. බදු සහන මුදල සම්පූර්ණයෙන්ම සමාගම ගත්තාද ආණ්ඩුව ගත්තාද නැතිනම් වෙළෙඳ ඇමැතිවරයා ගත්තාද කියා රටට හෙළි කළ යුතුයි.

බැඳුම්කරය ගැන කෑ ගසමින් ඉන් බිලියන 11ක අලාභයක් වු බව කියනවා. එම අලාභය පියවා ගැනීමට යහපාලන ආණ්ඩුව බිලියන 12ක මුදලක් මහා භාණ්ඩාගාරයේ රඳවා ගත්තා. ඒ නිසා අලාභයක් සිදු වුණේ නැහැ.

### සීනි බද්දේ රහ බැලූ අය හෙළි කර ගත යුතුයි

වසංගත තත්ත්වයෙන් රට බේරා ගැනීමට රජය පියවර ගත්තේ නැහැ. රජය සිදු කළේ කොරෝනා පාලනය නොව ව්‍යාප්ත කිරීමයි. ජනතාවට එන්නත දීම අද විහිළුවක් වී තිබෙනවා. මේ වසරේ අගෝස්තු වන විට රටේ ජනගහනයෙන් සියයට 70 කට එන්නත දී අවසන් කරන බව ආණ්ඩුව කිව්වත් මාර්තු වන විට එන්නත දී ඇත්තේ 7,24,278කට පමණයි. තව මාස දෙකකින් සියල්ලන්ටම දිය හැකිද? ඉරිදා සන්ඩේ ටයිම්ස් පුවත් පත ඉන්දියාවේ සේරම් ආයතනයෙන් ඇණවුම් කරන ලද එන්නත දීමට පමා වෙන බවත් එය අප්‍රේල් විය හැකි බවත් එම ආයතනය දැනුම් දී ඇතැයි වාර්තා කරනවා.

මියන්මාරය අර්බුදයකට ලක්ව තිබියදීත් එන්නත ඇණවුම් කිරීමට පියවර ගෙන තිබුණා. ජනවාරි මස වන විට එහි පළමු එන්නත් වාරය දුන්නා. ඒත් අපට ජනවාරි මාසය වන විට කර ගන්න බැරි වුණා ආණ්ඩුවේ නිදාශීලි බව නිසා. රාජ්‍ය ඖෂධ සංස්ථාව ගිවිසුම් අත්සන් කිරීමට පියවර නොගත්තේ ඇයි? කොරෝනා නිසා මිය යන අයගේ ජීවිතවලට වග කියන්නේ කව්ද? ගිවිසුම්වල සඳහන් වන්නේ මොනවාදැයි ආණ්ඩුව රටට හෙළි කළ යුතුයි. මෙතෙක් ගෙන්වා ඇත්තේ මාත්‍රා 12,64, 000ක් පමණයි. පළමු මාත්‍රාවේ ආරක්ෂාව ඇත්තේ සති 12ක් පමණයි.

දෙවැනි වටය විදීමට අවශ්‍ය එන්නත් තිබෙනවාද? ජනතාව මරණ මංචකයට ළං වෙනවා. ආණ්ඩුව පුරසාරම් දොඩමින් ගම සමඟ පිළිසඳරක් කියමින් පරිසරය විනාශ කරමින් ඉන්නවා. ජනතාවගේ ජීවිත සමඟ සෙල්ලම් නොකරන්නැයි අප ආණ්ඩුවට කියනවා. ජනතාවගේ ජීවිත සහ දේපළ ආරක්ෂා කිරීමට ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවෙන්ම ආණ්ඩුව බැඳී සිටිනවා.

69 ලක්ෂයක් මුලා කර ආණ්ඩුව ගත්තා. ආණ්ඩුව පවත්වා ගෙන යන්නේත් මුලාවෙන්. එයට එරෙහිව අප සමග පෙළ ගැසෙන්නැයි අප ජනතාවගෙන් ඉල්ලා සිටිනවා. මාධ්‍යවේදීන් ඇසූ ප්‍රශ්නවලට පිළිතුරු දෙමින් ඒ මහතා මෙසේ කීය.

ඩබල් ගේම් ගසමින් හිටපු ජනාධිපතිවරයා සමග ඇයි හොඳයිකම් කී අය අපේ පක්ෂයේ සිටියා. පාස්කු ප්‍රහාරය පිළිබඳ ඔවුන් දැන ගෙන සිටින්න ඇති. එහි වගකීම භාර ගැනීමට සුදානම් වන්නේ ඒ නිසා විය යුතුයි. ජනාධිපතිවරයා රටින් පිටව ගොස් තිබුණේ නියෝජ්‍ය ඇමැතිවරයාට වගකීම් පවරා නෙවෙයි. ප්‍රහාරයෙන් පසු තවත් ප්‍රහාර සිදු වීම වැළැක්වීමට අවශ්‍ය පියවර ගැනීමට හිටපු අගමැතිවරයාත් නියෝජ්‍ය ඇමැති රුවන් විජයවර්ධන මහතාත් පියවර ගත්තා. අපරාධකරුවන් නඩත්තු කළේ කවුරුන්දැයි සෙවීමට තිබුණා. මහ මොළකරුවන් පිළිබඳ සොයන්න තිබුණා. ජනාධිපති කොමිසම ඒ කිසිවක් සොයා නැහැ. ඔවුන් විමර්ශනය කර ඇත්තේ පාර්ලිමේන්තු තේරීම් කාරක සභාව සොයා බැලූ දේමයි. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට විමර්ශන පැවරුවේ නම් ඔවුන් සියල්ලම සොයා ගන්නවා. නීතිපතිවරයාට යවා ඇත්තේ කොමිසම් වාර්තාවේ වෙළුම් 22ක් අඩුවෙන් යැයි පැවසීය.

# සීනි බදු කොල්ලය බැඳුම්කරයට හපන්



## ජවිපෙ හිටපු පා.ම. සුනිල් හඳුන්නෙත්ති

**නදී මාණික්කගේ**

අවශ්‍ය තරම් සීනි තොග රටේ තිබියදී හදිසි අවශ්‍යතාවක් පැනනොනඟින වකවානුවක, පිටරටින් සීනි ගෙන්වා කෝටි 1595ක මූල්‍ය වංචා කළ අපරාධකරුවන් රටට හෙළිදරව් කළ යුතු අතර රජයට හා මහජනතාවට සිදුවූ පාඩුව අය කර ගත යුතු බව ශ්‍රේෂ්ඨාධිකරණයෙන් ඉල්ලා සිටිමින් ශ්‍රේෂ්ඨාධිකරණයට පැමිණිල්ලක් ගොනු කළ බව ජනතා විමුක්ති පෙරමුණෙහි දේශපාලන මණ්ඩල සභික සුනිල් හඳුන්නෙත්ති මහතා ඊයේ (12දා) ප්‍රකාශයක් නිකුත් කරමින් පැවසීය.

දූෂිතයන්ට හා හොරුන්ට දඬුවම් දෙන බවත් බැඳුම්කර වංචාවට අදාළ පුද්ගලයන් අත්අඩංගුවට ගන්නා බව කියමින් බලයට පැමිණි ආණ්ඩුවෙහි පාලන කාලය තුළ ඊටත් වඩා විශාල වංචාවක් සිදු වී තියෙන බව කීවේය.

විල්මා සමාගමට සීනි ගනුදෙනුව සඳහා තොරතුරු දීමක් සිදු කර ඇති බවට සැකයක් මතුවන බවත් ජනතාව පෙන්වමින් ගජ මිත්‍රයන්ට සීනි මංකොල්ලය සඳහා ඉඩ දී ඇති බවත් පැවසූ ඒ මහතා එකල වෙළෙඳපොළ වටිනාකම රුපියල් 118ක් වූ සීනි කිලෝවක් රුපියල් 84.50කට ජනතාවට මත සත විසි පහක බද්දක් අඩුකළද ඒ බදු අඩු කිරීම ජනතාවට නොලැබුණු බවත් මේ ජාවාරමට සම්බන්ධ වූ අය එම වාසිය ගත් බවත් පැවසුවේය.

සත විසි පහක බද්ද අඩු කරන ලද කාලසීමාව තුළ ලංකාවට සීනි නැවක්ම පැමිණ ඇති අතර සීනි මෙට්‍රික් ටොන් 3,25,000ක් ලංකාවට ගෙනැවිත් ඇති බවත් ඉන් සීනි මෙට්‍රික් ටොන් 125,000ක්ම ගෙන්වා ඇත්තේ විල්මා සමාගම බවත් හෙතෙම පෙන්වා දුන්නේය.

මේ ශත විසි පහේ බද්දට සීනි අඩුවූ අවස්ථාවෙහි ඒ සීනි රජයේ ආයතනයක් වන සතොසට විකුණා ඇති බවත් විල්මා සමාගම ගෙන ආ සීනි සතොසට විකුණා ඇත්තේ රුපියල් 120ක් වැනි මුදලකට බැවින් ජනතාවට රුපියල් 85ට සීනි දීමට නොහැකි වූ බවත් ඉන් සිදුවූ පාඩුව තවමත් ගණනය කර නොමැති බවත් හඳුන්නෙත්ති මහතා කියා සිටියේය.

අවම වශයෙන් මූලික පාඩුව වූ කෝටි 1595ක් හෝ රජයට අයකර ගත යුතු බවත් හිතාමතා වංචනික ලෙස දේශපාලනික බලය භාවිත කරමින් කරන ලද මෙම වංචාව අපරාධ ගණයේ වරදක් ලෙස සලකා බලා දඬුවම් දිය යුතු බවත් ජනවරමක් රැගෙන ආ මෙම ආණ්ඩුව තම ගජමිත්‍රයන් පෝෂණය කිරීම වරදක් ලෙස දකින බවත් හෙතෙම පැවසීය.



# ඇමැතීන් 4ක් හිටියට වෙච්ච දෙයක් නැහැ නිදහස් සෞඛ්‍යයක් දැන් නැහැ

## සජබ පා.ම. රාජිත සේනාරත්න

**පහන් විජේසේකර**

කෝටි 1590 සීනි වංචාව වගේම තවත් විශාල වංචා ක්‍රියාත්මක වෙන බවත්, ඒවා ඉදිරියේදී හෙළි කරන බවත්, විපක්ෂනායක කාර්යාලයේ පැවති මාධ්‍ය හමුවකදී සමගි ජනබලවේගයේ පාර්ලිමේන්තු මන්ත්‍රී රාජිත සේනාරත්න මහතා ඊයේ (12දා) ප්‍රකාශ කළේය. එහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ ඒ මහතා මෙසේ ද කීවේය.

අද රටේ ඖෂධ හිඟය විශාල ලෙස වැඩි වෙලා. ශල්‍යකර්ම ලේඛන අතුරුදන් වෙලා. ශල්‍යකර්ම කරන්න අවශ්‍ය උපකරණ රෝහල්වල නෑ. නිදහස් සෞඛ්‍යයක් දැන් නැහැ. රජයේ රෝහල්වල ඖෂධ නැහැ. ඒවා පිටින් ගන්න වෙලා කියලා ජාතික පුවත්පතක් සඳහන් කර තිබුණා. වෛද්‍ය සංගම්වලින් විමසීම් කළාම යහපාලන රජය කාලේ වගේ නිතරම ඖෂධ එන්නේ නැහැ කියනවා. වෛද්‍ය සැපයුම් අංශ අඩාල වෙලා. එමනිසා ඖෂධ හිඟයට පිළියමක් මේ රජයට නැහැ.

ඖෂධවලින් වැඩි ප්‍රමාණයක් පිළිකා ඖෂධයි. එම ඖෂධ 150ට වැඩිය තියෙනවා. ඒවා අනිවාර්ය ඖෂධ වෙනවා. පිළිකා රෝගී මවක් කියා සිටියා, එන්නත් දෙකක් මුදල්වලට ගත්තා අවසාන එක ගන්න මුදල් නෑ කියලා. එම ප්‍රමාදය නිසා පිළිකාව ඇඟ පුරා පැතිර තිබුණා. අද ඖෂධවල පාලන මිලක් නැහැ. අපේ කාලයට එය ක්‍රියාත්මක වුණා.

රුසියාවෙන් බාල බෙහෙත් ගෙනාව කියලා පසුගිය රජයට චෝදනා කළා. පුළුවන් නම් ඔප්පු කරලා පෙන්වන්න. එදා රුසියාවේ බාල බෙහෙත් කියලා අද රුසියාවෙම ස්පුට්නික් එන්නත ගෙන්වනවා. එදා නරකයි අද හොඳයි. එදා අපේ කාලයේ රෝගියාගේ නමට ඖෂධ ගෙන්වන ක්‍රමයක් තිබුණා ඒ ක්‍රමවේද කිසි දෙයක් අද නැහැ.

සෞඛ්‍ය අමාත්‍යාංශයට ඇමැතිවරු හතරක් ඉන්නවා ඒ හතරදෙනාම මම කරපු දේවල් කරන්න බැහැ. එක් අයකු මහාචාර්ය කෙනෙක්. අද සෞඛ්‍ය ක්ෂේත්‍රය පරිහානියට පත් වෙලා.

# උතුරේ සිංහල ඡන්ද වැඩි කර ගන්න ආණ්ඩුව ජිල්මාට් එකක් දානවා



## ඊපීආර්එල්එෆ් නායක සුරේෂ් ප්‍රේමචන්ද්‍රන්

**උතුරු පළාත් විශේෂ - රසුල දිල්හාර ගමගේ**

යාපනයේ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසම යටතේ තිබූ සියලු ඉඩම් පිළිබඳ ලියකියවිලි අනුරාධපුරයට මාරු කිරීම සඳහා රජය විසින් උතුරේ ඉඩම් බලහත්කාරයෙන් කොල්ල කෑමේ තවත් පියවරක් බව හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී, ඊපීආර්එල්එෆ් සංවිධානයේ නායක සුරේෂ් ප්‍රේමචන්ද්‍රන් මහතා පෙරේදා (11දා) කිළිනොච්චියේදී පැවසීය.

කිළිනොච්චියේ වැසියන් පිරිසකට ස්වයං රැකියා ආරම්භ කිරීමට ආධාර දීම පිණිස පැවැති රැස්වීමක් ඇමතූ හිටපු මන්ත්‍රීවරයා කියා සිටියේ යාපනය ඇතුළු උතුරු පළාතටම විදුලි බලය විසන්ධි වී තිබූ මහා රාත්‍රියක එම ලිපි ලේඛන අනුරාධපුරයට මාරු කිරීම ගැන සලකා බලන විට එම සැකය තවත් තහවුරු වන බවය.

රජය මීළඟ මහ මැතිවරණයට පෙර උතුරු පළාතේ සිංහල - බෞද්ධ ඡන්ද ප්‍රතිශතය ඉහළ නංවා ගැනීමේ විශාල වෙහෙසක් දරන බව කී හිටපු මන්ත්‍රීවරයා මේ සඳහා ඔවුන් සිදු කරන්නේ උතුරු පළාතේ දෙමළ වැසියන්ට අයත් ඉඩම්වල සිංහල ජනාවාස ඇති කිරීම බව පැවසීය.

උතුරේ ඉඩම් පිළිබඳ සියලු ලේඛන අනුරාධපුරයට රැගෙන යෑමෙන් එය වඩාත් පහසුවෙන් කළ හැකි නිසා රජය හමුදාවේ බලය යොදවා එම ලියකියවිලි අනුරාධපුරය වෙත මහ රෑ ගෙන ගිය බවද කියා සිටියේය.

ඉතාම ඉක්මනින් මේ පළාත්වල ඉඩම් බලෙන් අත්පත් කර ගැනීම සඳහා රජයේ නිලධාරීන් පැමිණෙන නිසා විශේෂයෙන්ම මුලතිව් හා වවුනියාව පළාත්වල දෙමළ ජනතාව තමන්ට අයත් ඉඩම් ගැන දැඩි විපරමකින් සිටින ලෙසද සුරේෂ් ප්‍රේමචන්ද්‍රන් හිටපු මන්ත්‍රීවරයා සඳහන් කළේය.

# පෙරහර කලාව සහ සංස්කෘතිය වෙනුවෙන් හීලෑ වූ අලි ඇතුන් ගහනයක් රටට අවශ්‍යයි

## ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ



පෙරහර කලාව සහ සංස්කෘතිය වෙනුවෙන් හීලෑ වූ අලි ඇතුන් ගහනයක් රටට අවශ්‍ය බව මා දැඩි සේ විශ්වාස කරන්නේ යැයි ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා ඊයේ (12) ප්‍රකාශ කෙළේය.

ජනාධිපතිවරයා මේ බව ප්‍රකාශ කෙළේ පෙරහර මංගල්‍ය සඳහා හීලෑ අලි ඇතුන්ගේ හිඟය පිළිබඳ මහා සංඝරත්නය සමඟ ජනාධිපති කාර්යාලයේ ඊයේ (12) පෙරවරුවේ පැවති සාකච්ඡාවේ දීය. හීලෑ අලි ඇතුන් අයිතිකරුවන්ගේ සංවිධානයේ නියෝජිතයෝ මේ අවස්ථාවට එක් වූහ.

හීලෑ අලි ඇතුන් නියාමනය සහ සංරක්ෂණය පිළිබඳ කොන්දේසි සැකසීමේදී හිමිකරුවන් සමඟ ද සාකච්ඡා කරන්නැයි ජනාධිපතිවරයා මෙහිදී අදාළ නිලධාරීන්ට උපදෙස් දුන්නේය.

හීලෑ අලි ඇතුන්ගේ හිඟය නිසා පෙරහර මංගල්‍ය පැවැත්වීමේ දී මතුව ඇති ගැටලු පිළිබඳ මෙහිදී ජනාධිපතිවරයාගේ අවධානයට යොමු විය. මෙම ගැටලුව විසඳීමට කෙටි කාලීන හා දීර්ඝ කාලීන වැඩපිළිවෙළක් අවශ්‍ය බව ද මහා සංඝරත්නය මෙහිදී අවධාරණය කළහ.

පෙරහර මංගල්‍යය අතීතයේ සිට පැවත එන දේශීය ආගමික හා සංස්කෘතික උරුමයකි. බෞද්ධ සංස්කෘතිකාංග සුරැකීමට මහා සංඝරත්නය සේම ආණ්ඩුව ද බැඳී සිටින බව ද උන්වහන්සේලා පෙන්වා දුන්හ.

ශ්‍රී දළදා මාළිගාවේ ඇසළ පෙරහර මංගල්‍යය ඇතුළු සෙසු ඓතිහාසික පෙරහර මංගල්‍යය සඳහා අවශ්‍ය හිලෑ අලි ඇතුන් සොයා ගැනීමට නොහැකි වීමෙන් මතුව ඇති ගැටලු මෙහිදී දීර්ඝ ලෙස සාකච්ඡාවට ලක් විය.

80 දශකය වන විට ශ්‍රී ලංකාවේ හීලෑ අලි ඇතුන්ගේ සංඛ්‍යාව 300 ත් 350 අතර පැවතිණි. දැන් එය 107 කි. ඉන් 80 ක් පමණ දැන් වයස අවුරුදු 50 ඉක්මවා සිටිති. පෙරහර සඳහා අලි ඇතුන්ගේ විශාල අඩුවක් පවතින බව අනාවරණය කෙරිණ.

පෙරහර චාරිකාවට සුදුසු අලියකු හෝ ඇතකු පුහුණු කිරීමට වසර 3 ක පමණ කාලයක් ගතවන බව හීලෑ අලි ඇතුන් හිමිකරුවෝ පෙන්වා දුන්හ.

අතීතයේ සිට සෑම රාජ්‍ය නායකයකුම වෙහෙර විහාරස්ථාන සඳහා අලි ඇතුන් පූජා කර තිබේ. මියන්මාරය, බුරුමය, තායිලන්තය වැනි රටවලින්ද රාජ්‍ය තාන්ත්‍රික පදනමින් විහාරස්ථාන සඳහා අලි ඇතුන් තෑගි කිරීම සම්ප්‍රදායයක්ව පවතින බව මහා සංඝරත්නය සඳහන් කළහ.

අලි ඇතුන් නඩත්තුව සහ රැකබලා ගැනීම මනාව කළයුතු බවත් ඔවුන් මිය ගිය පසු පාංශකූලය දීම, පින් අනුමෝදන් කිරීම වැනි සම්ප්‍රදායන් වර්තමානය දක්වාම පවතින බවත් උන්වහන්සේ පෙන්වා දුන්හ.

අස්ගිරි පාර්ශ්වයේ අනුනායක ආණමඩුවේ ධම්මදස්සී, තිස්සමහාරාම රජමහා විහාරාධිපති දේවාලේගම ධම්මසේන, කැලණිය රජමහා විහාරාධිපති මහාචාර්ය කොල්ලුපිටියේ මහින්ද සංඝරක්ඛිත, ගංගාරාම විහාරාධිකාරී ආචාර්ය කිරින්දේ අස්සජී ඇතුළු මහා සංඝරත්නය, ජනාධිපති ප්‍රධාන උපදේශක ලලිත් වීරතුංග, හීලෑ අලිඇතුන් අයිතිකරුවන්ගේ සංවිධානයේ සභාපති නිලංග දැල මහත්වරු සහ රේඛිය අමාත්‍යාංශ ලේකම්වරු ඇතුළු පිරිසක් මේ සාකච්ඡාවට එක් වූහ.

# අගමැති මහින්ද ග්‍රාමීය නිවාස ව්‍යාපෘතිවල ප්‍රගතිය විමසා බලයි





අගමැති මහින්ද රාජපක්ෂ මහතා ග්‍රාමීය නිවාස ව්‍යාපෘතිවල ප්‍රගතිය ඊයේ (12) විමසා බැලුවේය.

ග්‍රාමීය නිවාස සහ ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ විශේෂ ප්‍රගති සමාලෝචනයට එක්වෙමින් අගමැති මහින්ද රාජපක්ෂ මහතා මේ පිළිබඳ අවධානය යොමු කෙළේය.

බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශ ශ්‍රවණාගාරයේ දී මෙම විශේෂ ප්‍රගති සමාලෝචන රැස්වීම පැවැත්විණි.

'සැමට නිවෙසක් සහ තිරසර ඉදිකිරීම් කර්මාන්තයක්' තේමාවෙන් සිය රාජ්‍ය අමාත්‍යාංශය ඔස්සේ ක්‍රියාත්මක වැඩපිළිවෙළ පිළිබඳ ග්‍රාමීය නිවාස සහ ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය ඇමැති ඉන්දික අනුරුද්ධ මහතා මෙහිදී පැහැදිළි කෙළේය.

ග්‍රාමීය නිවාසවලට අමතරව ඉදිකිරීම් හා ගොඩනැගිලි කර්මාන්ත ක්ෂේත්‍රයේ මේ වනවිට පවතින ව්‍යාපෘති හා ඒවායේ ප්‍රගතිය අගමැති මහින්ද රාජපක්ෂ මහතාගේ අවධානයට ලක්විය.

'ඔබට ගෙයක්-රටට හෙටක්' ආධාර නිවාස වැඩසටහන යටතේ 2020 වසරේ දී ග්‍රාමීය නිවාස 6745ක වැඩ අවසන් කර ඇති අතර, ඒ වෙනුවෙන් ආණ්ඩුව රුපියල් මිලියන 5257ක් වැය කැර තිබේ.

මෙම ග්‍රාමීය නිවාස ව්‍යාපෘතිය යටතේ 2021 වසරේ නිවාස 14022ක් ඉදිකිරීමට නියමිතය. ඉන් 1917ක වැඩ මේ වනවිට ආරම්භ කැර ඇත.

මෙයට අමතරව මහා සංඝරත්නයේ දෙමාපියන් වෙනුවෙන් ක්‍රියාත්මක මිහිඳු නිවහන නව නිවාස ව්‍යාපෘතිය පිළිබඳ අගමැතිවරයා විමසා සිටියේය.

ඒ අනුව අදාළ ව්‍යාපෘතිය යටතේ නිවාස 2000ක් ඉදිකිරීමට නියමිත අතර, ඉන් නිවාස 50ක කටයුතු මේ වනවිට ආරම්භ කර ඇති බව නිලධාරිහු අගමැති මහින්ද රාජපක්ෂ මහතාට පෙන්වා දුන්හ. ජාතික නිවාස සංවර්ධන අධිකාරිය, ඕෂන් වීව් සංවර්ධන පුද්ගලික සමාගම, ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය, රජයේ කර්මාන්ත ශාලා දෙපාර්තමේන්තුව, ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාව, ගොඩනැගිලි ද්‍රව්‍ය දෙපාර්තමේන්තුව, රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව සහ ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය ඔස්සේ ක්‍රියාත්මක ව්‍යාපෘතිවල ප්‍රගතිය අගමැතිවරයා මෙහිදී විමසා බැලුවේය.

අගමැති කාර්ය මණ්ඩල ප්‍රධානී යෝෂිත රාජපක්ෂ, නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශයේ ලේකම් සිරිනිමල් පෙරේරා, අතිරේක ලේකම් ආචාර්ය එම්.එම්.එස්.බී. යාලේගම, රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම් ඉංජිනේරු කීර්ති රංජිත් අබේසිරිවර්ධන, අතිරේක ලේකම් පුෂ්පා එදිරිසිංහ, ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ සභාපති රේණුක පෙරේරා, රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ සභාපති ආර්. කළුපහන, ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාවේ සභාපති මහේන්ද්‍ර විජේසේකර මහත්වරුන් ඇතුළු රාජ්‍ය අමාත්‍යාංශයට අයත් ආයතනවල ප්‍රධානීහු ඇතුළු නිලධාරීහු රැසක් ද මෙම අවස්ථාවට එක්ව සිටියහ.

# අගමැති උපදේශකත්වයෙන් අනුරපුර මහල් නිවාස ව්‍යාපෘතියේ ඉදිකිරීම් අද ඇරැඹේ

කොළඹින් බැහැර ව ජීවත් වෙන නිවාස අහිමි හා නිවාස අවශ්‍ය ජන කොටස් සඳහා නිවාස ලබාදීමේ වැඩසටහන් මාලාව යටතේ මධ්‍යම පාන්තික ජනතාවට දැරිය හැකි මිලකට නිවාස ලබාදීමේ නව නිවාස ව්‍යාපෘතියක් නාගරික සංවර්ධන අධිකාරිය මඟින් අද (13) පෙ.ව. 10.00 ට අනුරාධපුර නගරයේදී ආරම්භ කරයි.

"සෞභාග්‍යයේ දැක්ම" ආණ්ඩුවේ ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුව ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගේ සහ නාගරික සංවර්ධන හා නිවාස ඇමැති, අගමැති මහින්ද රාජපක්ෂ මහතාගේ උපදේශකත්වයෙන් නාගරික සංවර්ධන, වෙරළ සංරක්ෂණ, අපද්‍රව්‍ය බැහැරලීම සහ ප්‍රජා පවිත්‍රතා කටයුතු රාජ්‍ය ඇමැති ආචාර්ය නාලක ගොඩහේවා මහතාගේ අධීක්ෂණයෙන් ක්‍රියාත්මක කෙරෙන මෙම නිවාස ව්‍යාපෘතිය මහල් 10 කින් සමන්විත වෙයි. අනුරාධපුරය, හයවන හරස් වීදිය, අභයපුර අංක 01 සඳහන් පරිශ්‍රයේ මෙය ඉදිකෙරෙන අතර එහි සිට අනුරාධපුර නගරයේ සියලු ස්ථානවලට පහසුවෙන් ගමන් කළ හැකි වන පරිදි මෙම නිවාස ව්‍යාපෘතිය ඉදිකෙරෙන ඉඩම පිහිටා ඇත.

මෙම නිවාස ඒකක ඉදිකිරීම ආරම්භ කිරීම ඉඩම් ඇමැති එස්.එම්. චන්ද්‍රසේන, නාගරික සංවර්ධන, වෙරළ සංරක්ෂණ, අපද්‍රව්‍ය බැහැරලීම සහ ප්‍රජා පවිත්‍රතා කටයුතු රාජ්‍ය ඇමැති ආචාර්ය නාලක ගොඩහේවා, සමෘද්ධි ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා, ව්‍යාපාර සංවර්ධන හා ඌණ උපයෝජන රාජ්‍ය සම්පත් සංවර්ධන රාජ්‍ය ඇමැති ශෙහාන් සේමසිංහ මහත්වරුන්ගේ ප්‍රධානත්වයෙන් කෙරේ.

නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශයේ ලේකම් සිරිනිමල් පෙරේරා, නාගරික සංවර්ධන අධිකාරියේ සභාපති, වරලත් වාස්තු විද්‍යාඥ හර්ෂාන් ද සිල්වා, නාගරික සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්, වරලත් නගර නිර්මාණ ශිල්පි ප්‍රසාද් රණවීර යන මහත්වරුන් සහ දේශපාලඥයන් ඇතුළු පිරිසක් ද මෙම අවස්ථාවට සහභාගී වීමට නියමිතයි.

මෙම නිවාස ව්‍යාපෘතිය යටතේ ඉදිවන නිවාස වර්ග දෙකකට අයත් වේ. ඉන් එක් වර්ගයක් වර්ග අඩි 900 කින් සමන්විතය. නිදන කාමර 03 ක්, මුළුතැන්ගෙයක්, නාන කාමර 03 ක්, ගබඩා කාමරයක් ඇතුළත් නිවාස 54 ක් මේ යටතේ ඉදිකෙරේ. දෙවැනි වර්ගයේ නිවාස වර්ග අඩි 700 කින් සමන්විත වෙයි. ඒයට නිදන කාමර 02 ක්, මුළුතැන්ගෙයක්, නාන කාමර 02 ක්, පොදු හිස් අවකාශයක් ද ඇතුළත් වෙයි. මේ යටතේ ඉදිවන නිවාස ගණන 81 කි.නිවාස ව්‍යාපෘතිය තුළ ඉදිකෙරෙණ සම්පූර්ණ නිවාස කරන 81 කි. වැඩ අරඹා, වසර 1 1/2 කින් වැඩ අවසන් කිරීමට නියමිත මෙම නිවාස ව්‍යාපෘතියේ වාහන 135 කින් යුත් නේවාසික රථගාලකින් සහ අමුත්තන්ගේ රථගාලකින් ද යුක්තයි. නිවාස ව්‍යාපෘති පරිශ්‍රයේ මුළු භූමි ප්‍රමාණය වර්ග අඩි 16, 700 කි. නිවසක විකුණුම් මිල රුපියල් මිලියන 10 ක අත්තිකාරම් මුදලක් පළමුව ගෙවා පදිංචි විය හැකි අතර, ගිවිස ගන්නා නිශ්චිත කාලයක් තුළ ඉතිරි මුදල් ගෙවීමෙන් පසු නිවෙසේ හිමිකම පවරා දීමට නියමිතයි.සතුට බිල්ඩර්ස් පුද්ගලික සමාගම මෙම නිවාස ඉදිකිරීමේ කොන්ත්‍රාත්කරු ලෙස කටයුතු කරයි. නිවාස ව්‍යාපෘතියේ උපදේශකවරු ලෙස ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව කටයුතු කරන අතර නාගරික සංවර්ධන අධිකාරිය නිවාස ව්‍යාපෘති ඉදිකිරීම මෙහෙයවයි. මෙහි සම්පූර්ණ ආයෝජන රුපියල් මිලියන 1,600 කි.

## ශ්‍රී ලංකාවේ විදුලි ජනනය පුනර්ජනනීය ප්‍රභවයන් වෙත යොමු වී තිබෙනවා

## ශ්‍රී ලංකාවේ මාලදිවයින් මහ කොමසාරිස්ට ඇමැති ඩලස් පැහැදිලි කරයි

දේශගුණික සාධකයන්ගෙන් ශ්‍රී ලංකාවේ විදුලිබල ක්ෂේත්‍රයට ලැබෙන පිටිවහලත් දේශගුණික තත්ත්වයන් පිළිබඳවත් විශේෂ සාකච්ඡාවක් විදුලිබල ඇමැති ඩලස් අලහප්පෙරුම සහ ශ්‍රී ලංකාවේ මාලදිවයින මහ කොමසාරිස් ඕමර් ඒ. රසාක් (Omer A.Razak) මහත්වරුන් අතර පසුගියදා පැවැත්විණි.

මෙම සාකච්ඡාව විදුලිබල අමාත්‍යාංශයේදී පැවැතිවිණි.

ශ්‍රී ලංකාවේ පවතින සමතුලිත කාලගුණික තත්ත්වයන් පිළිබඳව වසරේ එක් එක් කාලසීමාව තුළ කාලගුණික සහ දේශගුණික සාධකයන්ගේ විචල්‍යයන් පිළිබඳවත් විදුලිබල ඇමැතිවරයා දැක්වූ කරුණු කෙරෙහි අවධානය යොමුකළ මහ කොමසාරිස්වරයා, එම තත්ත්වයන් බොහෝ දුරට තම රට හා සමාන බව පැවසීය. එසේම, මෙම දේශගුණික තත්ත්වයන් විදුලිබල ක්ෂේත්‍රයේ උන්නතිය වෙනුවෙන් යොදාගත හැකි ආකාරය පිළිබඳ විදුලිබල ඇමැතිවරයා සමඟ දීර්ඝ වශයෙන් සාකච්ඡා කෙළේය.

ශ්‍රී ලංකාවේ විදුලිබල ක්ෂේත්‍රය සාම්ප්‍රදායිකත්වයෙන් ඔබ්බට යමින් මේ වනවිට පුනර්ජනනීය ප්‍රභවයන් වෙත යොමු වී ඇති බව පැවසූ විදුලිබල ඇමැති ඩලස් අලහප්පෙරුම මහතා, වියළි දේශගුණික තත්ත්වයන් ඉලක්ක කර ගනිමින් සූර්ය බලය මෙන්ම, සුළං බලය යොදා ගනිමින් විදුලිය නිපදවීමේ රටාවකට මේ වනවිට යොමු වී ඇති බවද පැවසීය. මෙරට විදුලි ඉල්ලුම අඛණ්ඩව, ගුණාත්මකව මෙන්ම, මිල අවම ආකාරයෙන් සපුරාලීමේ භාරධූර කර්තව්‍යය විෂය භාර ඇමැතිවරයා වශයෙන් තමන් වෙත පැවරී ඇති බවත්, ඒ වෙනුවෙන් මේ වනවිට සැලසුම් සහගත ආකාරයෙන් මිල අවම මෙන්ම අඛණ්ඩව ගුණාත්මක විදුලි සැපයුමක් ලබා ගත හැකි විවිධ දිශානතීන් හඹා යමින් සිටින බවත් වැඩිදුරටත් පැවසීය.

දකුණු ආසියාවේ පැය 24 පුරා විදුලිය සපයන රට බවට විරුදාවලි ලත් ශ්‍රී ලංකාවේ විදුලිබල ක්ෂේත්‍රය පිළිබඳ සතුට ට පත්වන බව පැවසූ මාලදිවයින් මහ කොමසාරිස්වරයා, විදුලිබල ඇමැතිවරයා වශයෙන් එහිලා ඉටු කරන සුවිශේෂ මෙහෙය පිළිබඳ ඩලස් අලහප්පෙරුම මහතාට කෘතඥතාව පළ කෙළේය.

නව ආණ්ඩුව යටතේ සංවර්ධනයේ මාවතට පිවිස සිටින ශ්‍රී ලංකාවට දක්වන ගෞරවයක් වශයෙන් මෙන්ම, මාලදිවයින සහ ශ්‍රී ලංකාව චිරාත් කාලයක් පවත්වා ගෙන එනු ලබන ද්වීපාර්ශ්වීය සබඳතා තවදුරත් තහවුරු කිරීම සඳහා ශ්‍රී ලංකාවේ විශ්‍රාමික වෛද්‍යවරුන් සහ හෙදියන් වෙනුවෙන් තම රටේ රැකියා අවස්ථා උදාකර දීමට කටයුතු කළ හැකි බවද පැවසීය.

# දරිද්‍රතාව තුරන් කිරීමේ මූලික කටයුත්තේදී ධීවර ජනතාවට ප්‍රමුඛස්ථානයක් දෙනවා

## බැසිල් රාජපක්ෂ

**බුද්ධිකා ඉඹුලාන**



මේ රටේ දරිද්‍රතාව තුරන් කිරීමේ මූලික කටයුත්තේ දී ආණ්ඩුව ධීවර ජනතාවට ප්‍රමුඛස්ථානයක් ලබා දෙන බවත් ඔවුන්ගේ දරිද්‍රතාවයන් තුරන් කිරීම සඳහා නව ආදායම් උත්පාදනය කිරීමේ වැඩසටහනක් සැලසුම් කර ඇති බවත් ආර්ථික පුනර්ජීවනය හා දරිද්‍රතාවය තුරන් කිරීම සඳහා වන ජනාධිපති කාර්යසාධක බළකායේ සභාපති බැසිල් රාජපක්ෂ මහතා පැවැසීය.

බැසිල් රාජපක්ෂ මහතා මෙම අදහස් පළ කෙළේ නවීකරණය කරන ලද පැලියගොඩ මත්ස්‍ය වෙළෙඳ සංකීර්ණය විවෘත කිරීමේ අවස්ථාවට ප්‍රධාන ආරාධිතයා ලෙස ඊයේ (12) එක් වෙමිනි.

තවදුරටත් බැසිල් රාජපක්ෂ මහතා මෙසේද පැවසීය.

ජනාධිපති කාර්ය සාධක බලකායේ ප්‍රධානම කටයුතු රාශියක් මෙම අමාත්‍යාංශය යටතේ සියලු දෙනාගේ සහයෝගයෙන් සහ ධිවර ප්‍රජාවගේ සහයෝගයෙන් ඉෂ්ට කර ගන්න ආණ්ඩුව අපේක්ෂා කරනවා. මේ රටේ ජනතාවගේ ආහාර සුරක්ෂිතතාවය, විශේෂයෙන්ම ප්‍රෝටීන් අවශ්‍යතාවය ඉෂ්ට කරන ප්‍රධානම ආහාරයක් වන මත්ස්‍ය සම්පත ආශ්‍රිත ධීවර කර්මාන්ත ක්ෂේත්‍රය දියුණු කිරීමට ආණ්ඩුව මෙවර දක්ෂ ඇමැතිවරයෙක් මෙන්ම තරුණ රාජ්‍ය ඇමැතිවරයකුට ධීවර අමාත්‍යාංශය භාර දී තිබෙනවා.

අද මේ පැලියගොඩ මත්ස්‍ය වෙළෙඳ සංකීර්ණය නැවත ආරම්භ කිරීම සුවිශේෂ අවස්ථාවක් ලෙස සලකනවා. අපි දන්නවා දැනට හරියටම අවුරුද්දකට පෙර ලෝක සෞඛ්‍ය සංවිධානය කොවිඩ් උවදුර ලෝක වසංගතයක් ලෙස නම් කළා. මේක සමස්ත ලෝකයකටම ඇති වෙච්ච වසංගතයක්.

අපි මේ ජීවත් වෙන හැම කෙනාටම තමුන්ගේ ජීවිත කාලය තුළ මුහුණ පාන්න වෙච්ච ලොකුම වසංගතය ලෙස සඳහන් කිරීම නිවැරදියි කියලා මම හිතනවා. ශ්‍රී ලංකාවටත් ඒ වසංගතයට මුහුණ දෙන්න වුණා. එකෙදි වැඩිම ආසාදිතයන් ප්‍රමාණයක් හඳුනා ගත්තේ මේ පැලියගොඩ ආශ්‍රිතවයි. ඒ කොවිඩ් උවදුරට ශ්‍රී ලංකාව සර්ථකව මුහුණ දුන්නා. ජනාධිපතිතුමාගේ නායකත්වය නිසා මේ වසංගතයට සාර්ථකව අපට මුහුණ දෙන්න හැකි වුණා. ලෝකයේ ඉතාම සාර්ථකව මුහුණ දීපු රටවල් අතරින් ප්‍රමුඛ පෙලේ රටක් බවට අප පත් වුණා. සෞඛ්‍ය බලධාරීන්, ආරක්ෂක අංශවල නිලධාරීන් ජනාධිපතිතුමාගේ නායකත්වයෙන් ගත්ත පියවර නිසා මේ අභියෝගයට අපි සාර්ථකව මුහුණ දුන්නා.

මේ පැලියගොඩ මත්ස්‍ය වෙළෙඳ සංකීර්ණය ආශ්‍රිතව තමයි දෙවැනි අවස්ථාවේ මේ වසංගතය පැතිර ගියේ. අද එම තත්ත්වයෙන් ගොඩ ඇවිල්ලා. අද අපිට එන්නත ලැබිලා. දැන් සාර්ථකව සියලු කටයුතු සිදු වෙනවා.

මම හිතන්නේ දිනපතා වාර්තා වන රෝගීන් සංඛ්‍යාව, ආසාධිතයන් සංඛ්‍යාව අඩු වෙන අවස්ථාවක මෙය අංග සම්පූර්ණව විවෘත කරන්න ලැබීම අපි ලද වාසනාවක් ලෙස සලකනවා. ඒ වගේම අපි මේ පැලියගොඩ මත්ස්‍ය වෙළෙඳ සංකීර්ණය කොතරම් මේ රටේ ධිවර ජනතාවට වැදගත් ද කියලා තෙරුණේ මෙය වසා දැමූ විටයි. ඒ කාලයේ මාළු කන අයටයි, මාළු අල්ලන අයටයි දෙගොල්ලටම තෙරුණා මෙතන වැදගත්කම. අපටත් තෙරුණා. අපි ඒ වේලාවේ බොහොම උත්සහ ගත්තා මේක ඉක්මණින්ම විවෘත කරන්න. ඒක විවෘත කිරීම අපි ප්‍රමාද වෙන කොට අපේ ඇමැතිතුමා ඇතුළු නිලධාරී මහත්වරු එක්ක කතා කරලා සෞඛ්‍ය අමාත්‍යාංශය එක්ක සාකච්ඡා කරලා තාවකාලිකව හරි මේ මත්ස්‍ය වෙළඳ පොළ ආරම්භ කරන්න තින්දු කරපු වේලාවේ එයට එකග වෙලා වෛද්‍ය උපදෙස් අනුව, ආරක්ෂක අංශවල උපදෙස් අනුව, එය කිරීම ගැන මේ සියලු ව්‍යාපාරික ප්‍රජාවට ,අපේ ආණ්ඩුවේ ප්‍රශංසාව හිමි වනවා.

ඒ වගේම එය තවදුරටත් සාර්ථක වෙන්න නම් අද අලුත්වැඩියා කර විවෘත වෙන මේ වෙළෙඳ සංකීර්ණය තුළින් සියලු පාරිභෝගිකයන්ගේත් ඒ වගේම ධීවර ජනතාවගේත් සුබ සිද්ධිය සඳහා ඔවුන්ගේ අවශ්‍යතාවයන් ඉෂ්ට කරන්න කටයුතු කරන්න කියලා මම ඉල්ලීමක් කරනවා. මහින්ද රාජපක්ෂ අගමැතිතුමා එදා ජනාධිපතිතුමා ලෙස කිව්වේ මෙම ස්ථානය එළවළු ඇතුළු සෑම අත්‍යවශ්‍ය ද්‍රව්‍යයක්ම මිලදී ගැනීමට හැකි මධ්‍යස්ථානයක් ලෙස ඉදි කරන්න බලාපොරොත්තු වෙන බවයි. දැන් ඒක ක්‍රමයෙන් ඉෂ්ට වෙමින් යනවා. නමුත් එය ප්‍රමාදයි. අවුරුද 10ක් ගිහින් තමයි ඒක කරන්න පුළුවන් වුණේ.

**ධීවර ඇමැති ඩග්ලස් දේවානන්දා මහතා -**

සෑම අයහපත් සිදුවීමක් තුළම යහපත් සිදුවීමක් තිබෙනවා යන ජන වහරේ පවතින්නා වු කීම සත්‍ය කරමින්, කොරෝනා වසංගතය නිසා වසා දැමීමට සිදු වු පැලියගොඩ මත්සය වෙළෙඳ සංකීර්ණය සම්පූර්ණයෙන් නවීකරණය කිරීමෙන් පසු විවෘත කිරීමට හැකි වුණා. පසුගිය ඔක්තෝබර් මස වසා දැමු මත්ස්‍ය වෙළෙඳ සංකීර්ණය ආරම්භ කිරීමෙන් පසු කිසිදු ප්‍රතිසංස්කරණයක් සිදු කළේ නැහැ.

කොවිඩ් වසංගතය, මේ රටේ සුනාමි උවදුරෙන් පසු ධීවර ක්ෂේත්‍රයට සිදු වු දැඩි හානියයි. ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගේ හා අගමැති මහින්ද රාජපක්ෂ මහතාගේ මග පෙන්වීම මත හා ආර්ථික පුනර්ජීවනය හා දරිද්‍රතාවය තුරන් කිරීම සඳහා වන ජනාධිපති කාර්යසාධක බළකායේ සභාපති බැසිල් රාජපක්ෂ මහතා ධීවර ක්ෂේත්‍රය නගා සිටුවීමට කැප වුණා. අගමැති මහින්ද රාජපක්ෂ මහතා ජනාධිපතිවරයාව සිටි අවධියේ ආරම්භ කළ මෙම මත්ස්‍ය වෙළෙඳ සංකීර්ණය පසුගිය පාලන සමයේ කිසිදු ප්‍රතිසංස්කරණයක් සිදු කළේ නැහැ. මෙය ප්‍රතිසංස්කරණය කිරීමට ලැබීම ධීවර ප්‍රජාවට අතිශය වැදගත් සිදුවීමක් . පසුගිය කොවිඩ් වසංගතය නිසා පීඩාවට පත් ධීවර ප්‍රජාව සහ ව්‍යාපාරිකයන්ගේ ව්‍යාපාරික කටයුතු හා සිය ජීවනෝපාය කඩා වැටුණු අතර ඔවුන් නගා සිටුවීමට ණය සහනාධාරයක් ලබා දීමට මා කටයුතු කර ගෙන යනවා.

ධීවර රාජ්‍ය ඇමැති කංචන විජේසේකර මහතා සහ ධීවර අමාත්‍යාංශයේ ලේකම් ඉන්දු රත්නායක, රාජ්‍ය අමාත්‍යාංශ ලේකම් ජයන්ත චන්ද්‍රසෝම, ධීවර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් සුසන්ත කහවත්ත මහත්වරු සභාව ඇමැතුහ. ඇමැති ප්‍රසන්න රණතුංග, රාජ්‍ය ඇමැතිවරුන් වන ප්‍රසන්න රණවීර, සිසිර ජයකොඩි මහත්වරු අවස්ථාවට සහභාගී වූහ.

**ජායාරූපය - චින්තක කුමාරසිංහ**



# ලෝක කුසලාන පාපන්දු සුදුසුකම් ලැබීමේ ආසියානු තරග මධ්‍යස්ථ ක්‍රීඩාංගණවල



## මැතිව්ස් ගෙදර එයි

බටහිර ඉන්දීය කොදෙව් සංචාරයට එක්ව සිටි හිටපු නායක ඇන්ජෙලෝ මැතිව්ස් තරගාවලිය අත්හැර යළි ශ්‍රී ලංකාව බලා පැමිණෙන බව ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය පවසයි.

පෞද්ගලික හේතුවක් මත මෙලෙස යළි පැමිණෙන මැතිව්ස් පළමු එක්දින තරගයෙන් පසුදින කොදෙව් දේශයෙන් පිටත්ව තිබේ.

පළමු තරගයේදී ලකුණු අතරට පිවිසීමට අසමත් වූ මැතිව්ස් කොදෙව්වන්ට එරෙහි විස්සයි20 තරගාවලියේ නායකයා ලෙස ද කටයුතු කළේය. ඒ විස්සයි20 නායකත්වයට පත් කළ දසුන් ශානකට වීසා ගැනීමේ ගැටලුවක් නිසා කණ්ඩායම සමඟ කොදෙව් දූපත් බලා පිටත් යෑමට නොහැකි වීම හේතුවෙනි. කෙසේ වෙතත් එම තරගාවලියේදී ද ලකුණු අතරට පිවිසීමට නොහැකි වූ ඔහු රැස් කළේ පිළිවෙළින් ලකුණු 5, 13 සහ 11ක් පමණි.

## ශ්‍රී ලංකා තරග 3ක් දකුණු කොරියාවේ



**ප්‍රින්ස් ගුණසේකර**

දෝහා කටාර්හි වසර 2022දී පැවැත්වෙන ලෝක කුසලාන පාපන්දු තරගාවලියට සුදුසුකම් ලැබීමේ ආසියානු කලාපයේ තරග සියල්ල මධ්‍යස්ථ ක්‍රීඩාංගණවල පැවැත්වීමට ආසියානු පාපන්දු සම්මේලනය තීරණය කරයි. ඒ අනුව ශ්‍රී ලංකාව සහභාගී වන දෙවැනි වටයේ ඉතිරි තරග සියල්ල දකුණු කොරියාවේ පැවැත්වීමට ආසියානු පාපන්දු සම්මේලනය සැලසුම් කර ඇත.

කොරෝනා අර්බුදය හේතුවෙන් ලෝක කුසලාන පාපන්දු තරගාවලියට සුදුසුකම් ලැබීමේ ආසියානු කලාපයේ දෙවැනි වටයේ තරග සියල්ල පසුගිය වසරේ නවතා දැමුණු ඉතිරි තරග සියල්ල ඒ ඒ කාණ්ඩවල තෝරාගත් ක්‍රීඩාංගණ කිහිපයකදී පැවැත්වීමට කටයුතු යොදා ඇත.

ශ්‍රී ලංකාව සහභාගී වන 'එච්' කාණ්ඩයේ උතුරු කොරියාව සමඟ තරගය ජූනි 3 වැනිදා පැවැත්වෙන අතර, ලෙබනන් සමඟ තරගය ජූනි 7 වැනිදා හා දකුණු කොරියාව සමඟ තරගය ජූනි 11 වැනිදා පැවැත්වීමට කටයුතු යොදා ඇත. උතුරු කොරියාව හා දකුණු කොරියාව අතර, තරගය ජූනි 7 වැනිදා පැවැත්වෙන අතර කලකට පසුව උතුරු කොරියාව දකුණු කොරියාවට පැමිණීම විශේෂත්වයකි. කෙසේ වුවද දකුණු කොරියාව කොරෝනා වසංගතයට කලින් උතුරු කොරියාවට පැමිණි තරගයකට සහභාගී වූ අතර, එහිදී දෙපිලම ගෝල් නොලබා ජය පරාජයෙන් තොරව තරගය නිමා කළේය.

ලෝක කුසලාන පාපන්දු තරගාවලියට සුදුසුකම් ලැබීමේ ආසියානු කලාපයේ ඉතිරි තරග පැවැත්වෙන ස්වාධීන ක්‍රීඩාංගණ වන්නේ චීනයේ ෂූෂෝයි, අල් ක්වේට් ක්‍රීඩාංගණය, බහරේන් ජාතික ක්‍රීඩාංගණය, සෞදි අරාබියේ ෆයිසාල් හුසේන් ජාත්‍යන්තර ක්‍රීඩාංගණය, කටාර් අල් ජනයොබ් ක්‍රීඩාංගණය, ජපානයේ ෆුකෝයුඩා ඩෙන්ෂි ක්‍රීඩාංගණය හා ඩුබායි අල් මැක්ටොයුම් ක්‍රීඩාංගණය වේ.

ශ්‍රී ලංකාව මෙතෙක් සහභාගි වූ තරග 5කින්ම පරාජයට පත්ව ඇති බැවින් ලෝක කුසලාන පාපන්දු තරගාවලියට සුදුසුකම් ලැබීමේ ආසියානු කලාපයේ තරග වටයනේ ඉවත් කළ ද ඉතිරි පාපන්දු තරග තුනට සහභාගි විය යුතුව ඇත. ශ්‍රී ලංකාව කොළඹදී පැවැති ටර්කිමෙනිස්තානය සමඟ තරගය ගෝල් 2-0කින් පරාජය වූ අතර, උතුරු කොරියාව සමඟ තරගය ගෝල් 1-0කින් පරාජයට පත් විය. දකුණු කොරියාවේදී පැවැති දකුණු කොරියාව සමඟ තරගය ගෝල් 8-0කින් පරාජයට පත්වූ අතර, කොළඹදී පැවැති ලෙබනනය සමඟ තරගය ගෝල 3-0කින් පරාජයට පත් විය. අසාගාබාද්හී පැවති ටර්කිමෙනිස්තානය සමඟ තරගය ගෝල් 2-0කින් පරාජය වීමත් සමඟ ලෝක කුසලාන පාපන්දු තරගාවලියට සුදුසුකම් ලැබීමේ ආසියානු කලාපයේ තරග කොරෝනා හේතුවෙන් තාවකාලිකව නැවැත්විණි.

## ශ්‍රී ලංකා - කොදෙව් තෙවැනි සටනත් රාත්‍රී 7ට

සංචාරක ශ්‍රී ලංකා ක්‍රිකට් කණ්ඩායම සහ බටහිර ඉන්දීය කොදෙව් කණ්ඩායම අතර හෙට (14) පැවැත්වීමට නියමිත තෙවැනි හා අවසන් එක්දින ක්‍රිකට් තරගයේ ආරම්භක වේලාව සංශෝධනය කර ඇතැයි කොදෙව් ක්‍රිකට් ආයතනය නිවේදනය කරයි.

මේ තරගය දිවා රාත්‍රි තරගයක් ලෙස මෙරට වේලාවෙන් රාත්‍රී 11ට ආරම්භ කිරීමට කලින් සැලසුම් කර තිබූ අතර, නව සංශෝධිත වේලාව අනුව එම තරගයත් අනෙක් තරග දෙක මෙන්ම මෙරට වේලාවෙන් රාත්‍රී 7.00ට ආරම්භ වීමට නියමිතය. එම තරගයත් ඇන්ටිගුවාහී ශ්‍රීමත් විවියන් රිචර්ඩ්ස් ක්‍රීඩාංගණයේ දී පැවැත්වීමට නියමිතය.

එක්දින තරගාවලියෙන් අනතුරුව දෙරට අතර තරග 2කින් සමන්විත ටෙස්ට් තරගාවලියේ තරග ආරම්භක වේලාව සංශෝධනය කර නැති අතර එම තරග මෙරට වේලාවෙන් රාත්‍රී 7.30ට ආරම්භ වෙයි.

## මාතලේ සභාපති කුසලාන පාපන්දු අවසන් සටන අද

**මාතලේ දිසා විශේෂ**
**අසෝක හිඳගොඩ**

මාතලේ පාපන්දු ලීගය සංවිධාන කරන සභාපති කුසලාන මාතලේ දිසා අන්තර් ක්‍රීඩා සමාජ පාපන්දු තරගාවලියේ අවසන් මහා තරග අද (13) පස්වරුවේ මාතලේ බර්ණාඩ් අලුවිහාරේ ක්‍රීඩාංගණයේදි පැවැත්වේ.

මාතලේ යූත් සහ උකුවෙල ගොල්මුන් කණ්ඩායම් මෙහිදී තරග වැදීමට නියමිතය.

ශ්‍රී ලංකා පාපන්දු සම්ලෙනයේ වෛද්‍ය මනිල් ප්‍රනාන්දු මහතාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වෙන මේ තරගාවලියේ විශේෂ ආරාධිතයන් ලෙස එම සම්මේලනයේ සභාපති අනුර ද සිල්වා සහ මුදල් අධ්‍යක්ෂ ආර්. පුවනේද්‍ර් යන මහත්වරුන් සහභාගි වීමට නියමිතව ඇතැයි මාතලේ පාපන්දු ලීගයේ සභාපති කේ.ආර්.එම්. හාරිස් මහතා 'දිනමිණ'ට පැවසීය.



නිපුන් ධනංජය

## අපරාජිත සීසීසී - එන්සීසී පෙරමුණ රැක ගනී

### රාගමට පහර දී යුද හමුදාවත් උඩට එයි

**නිරෝෂාන් ප්‍රියංකර**

ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය සංවිධාන කරන අන්තර් සමාජ විස්සයි20 ක්‍රිකට් තරගාවලියේ 8 වැනි දිනය නිමා වන විට අපරාජිත කණ්ඩායම් බවට පත් වෙමින් එම කාණ්ඩවල පෙරමුණ රැක ගැනීමට සීසීසී සහ එන්සීසී ක්‍රීඩා සමාජය සමත්ව සිටී.

තරගාවලියේ 'ඒ' කාණ්ඩයෙන් තරග වදින සීසීසී කණ්ඩායම ඊයේ සිය අඛණ්ඩ 5 වැනි ජය අත් කර ගත්තේ එස්එස්සී පිටියේදී බදුරලිය ක්‍රීඩා සමාජය ලකුණු 26කින් පරාජයට පත් කරමිනි.

එම තරගයේදී ලසිත් අබේරත්න සීසීසී පිලට දෙවැනි අර්ධ ශතකය එක් කළ අතර, බදුරලිය ඉනිම බිඳ දැමූ ළහිරු ගමගේ ලකුණු 13කට කඩුලු 4ක් දවා ගැනීමට සමත් විය.

එන්සීසී පිල 'බී' කාණ්ඩයේ පෙරමුණ රැක ගැනීමට සමත් වූයේ සීසීසී පිටියේ පැවැති තරගයෙන් කෝල්ට්ස් පිල කඩුලු 8කින් පරාජය කරමිනි. තරග 5කට එක් වූ එන්සීසී පිලත් අත් කර ගත් 5 වැනි ජය ලෙස මෙය සටහන් විය.

මේ අතර, රාගම ක්‍රීඩා සමාජය සමඟ ඊයේ පෙරවරුවේ පැවැති තරගයෙන් ලකුණු 31ක ජයක් හිමි කර ගත් ශ්‍රී ලංකා යුද හමුදා කණ්ඩායම 'ඩී' කාණ්ඩයේ පෙරමුණ ගැනීමට සමත් විය.

යුද හමුදාවට ප්‍රසාද ලකුණු 8ක් හිමිව ඇති අතර, තෙවැනි තැන පසුවන රාගම පිල සතුව ඇති ලකුණු සංඛ්‍යාව 6කි.

පී සරා ඕවල් පිටියේ පැවැති තරගයේදී යුද හමුදාවට ජය ගෙනා අසේල ගුණරත්න පිට පිට මේ තරගාවලියේ දෙවැනි අර්ධ ශතකය ලෙස ලකුණු 57ක් රැස් කිරීමට සමත් විය. මේ තරගයේ පළමු පෙළ විස්සයි20 පිටියට පිවිසි 21 හැවිරිදි ශෂික ඩිල්ෂාන් සහ ජනිත් සිල්වා යුද හමුදා පිල වෙනුවෙන් කඩුලු 2 බැගින් දවා ගත්හ.

හලාවත මේරියන්ස් පිල කඩුලු 7කින් පරාජය කිරීමට එස්එස්සී ක්‍රීඩා සමාජය සමත් වූයේ කෝල්ට්ස් පිටියේදීය. කෝල්ට්ස් පිටියේ පැවැති මේ තරගයේදී එස්එස්සී පිල වෙනුවෙන් නොදැවී ලකුණු 80ක් රැස් කිරීමට නිපුන් ධනංජය සමත් විය. පන්දු 56කින් ගොඩනැගුණු ඔහුගේ ඉනිම හතරේ පහර 2කින් සහ හයේ පහර 5කින් වර්ණවත් විය. 'සී' කාණ්ඩයේ පෙරමුණේ පසුවන එස්එස්සී පිල හිමිකරගත් සිව්වැනි ජය මෙයයි. මේ අතර, ඊයේ පැවැති සෙසු තරගවලින් ජයග්‍රහණ අත් කර ගැනීමට කැන්ඩි කස්ටම්, ලන්කන්, පොලිස් සහ පාණදුර ක්‍රීඩා සමාජ සමත් වූහ. එම කණ්ඩායමේ හමුවේ පිළිවෙළින් නුගේගොඩ, ඒස් කැපිටල් සහ කළුතර නාගරික සහ නාවික හමුදා ක්‍රීඩා සමාජය පරාජය පත් විය. තරග 4කට සහභාගි වූ කළුතර පිලට පිට පිට අත් වූ සිව්වැනි පරාජය මෙයයි.

සසිත් මනුරංග සහ විශ්ව විජේරත්න (කැන්ඩි) සහ කසුන් විදුර (හලාවත) ඊයේ තරගවලදී අර්ධ ශතක රැස් කිරීමට සමත් වූ අතර, ලන්කන් ක්‍රීඩා සමාජයේ ගීත් කුමාර කඩුලු 4ක් බිඳ දැමීමට සමත් විය.

නිමේෂ් විමුක්ති හා යොමේෂ් රණසිංහ (පාණදුර), විනෝද් පෙරේරා (නුගේගොඩ), සචිත්‍ර පතිරණ (කැන්ඩි), සුජාන් මයුර (පොලීසිය), ඉෂාන් ජයරත්න (රාගම), බුද්ධික සංජීව (බදුරලිය) සහ අශේන් ඩැනියෙල් (එන්සීසී) කඩුලු 3 බැගින් දවා ගනිමින් පන්දුවෙන් දස්කම් දැක් වූහ.

මේ තරගාවලියේ මූලික වටය යටතේ 'බී' සහ 'සී' කාණ්ඩයේ තරග අද (13) නිමාවට පත්වන අතර, 'ඒ' සහ 'ඩී' කාණ්ඩයේ මූලික වටයේ තරග හෙට (14) නිමාවට පත් වීමට නියමිතය.

## කින්නියා පාපන්දු අවසන් තරග ඉරිදා



ත්‍රිකුණාමලය කින්නියා පළාතේ ක්‍රීඩාලෝලීන්ට නව අත්දැකීමක් එක් කරමින් කින්නියා අල් අක්සා ජාතික පාසල සංවිධායන කරන 'අක්සාරියන් සුපර් ලීග්' (ASL) පාපන්දු තරගාවලියේ අවසන් තරග හෙට (14) පැවැත්වීමට නියමිතය.

නෙස්ලේ සමාගමේ 'මයිලෝ' අනුග්‍රාහකත්වයෙන් පැවැත්වෙන තරගාවලිය පෙරේදා (11) ආරම්භ වූ අතර, මේ තරගාවලියට කණ්ඩායම් 8ක් එක්ව සිටී.

අක්සාරියන් රේසිං ස්ටාර්ස්, අක්සාරියන් බ්ලැක් පැන්තර්ස්, අක්සාරියන් බ්ලූ ඊගල්ස්, අක්සාරියන් සුපර් කිංග්ස්, අක්සාරියන් වොරියර්ස්, අක්සාරියන් ජුපිටර්ස්, අක්සාරියන් සුපර් ෆයිටර්ස් සහ අක්සාරියන් සුපර් බෝයිස් ලෙස කණ්ඩායම් ඇතුළත් මේ තරගාවලියට ක්‍රීඩකයන් 300කට අධික සංඛ්‍යාවක් ක්‍රීඩා කරන බව තරග සංවිධායකයෝ පවසති.

## ශහිඩි ටෙස්ට් වාර්තා පොත අලුත් කරයි


අස්ගර් ඇෆ්ගන්

හෂ්මතුල්ලාහ් ශහිඩි

සංචාරක සිම්බාබ්වේ ක්‍රිකට් කණ්ඩායම සමඟ අබුඩාබියේ පැවැත්වෙන දෙවැනි ටෙස්ට් තරගයේදී ටෙස්ට් වාර්තා අතරට එක් වීමට ඇෆ්ගනිස්තානයේ හෂ්මතුල්ලාහ් ශහිඩි සමත් විය.

තරගයේ පළමුව පන්දුවට පහර දුන් ඇෆ්ගනිස්තාන ඉනිමේ මුල් කඩුලු 2 ලකුණු 56කට බිඳ වැටීමෙන් අනතුරුව පිටියට පිවිසි 26 හැවිරිදි ශහිඩි නොදැවී ලකුණු 200ක් රැස් කරමින් මෙලෙස වාර්තා අතරට එක් විය.

පන්දු 276කින් මංගල ටෙස්ට් ශතකය වාර්තා කළ ඔහු තවත් පන්දු 167කට මුහුණ දෙමින් ඉතිහාසගත ද්විත්ව ශතකයට හිමිකම් කීවේ හතරේ පහර 21කින් ඉනිම වර්ණවත් කර ගනිමිනි. මෙය ඉතිහාසයට එක් වූයේ ඇෆ්ගනිස්තානය වෙනුවෙන් පිතිකරුවකු රැස් කළ පළමු ද්විත්ව ශතකය ලෙසයි.

ශහිඩිට අනගි සහායක් දුන් නායක අස්ගර් ඇෆ්ගන් ද මංගල ටෙස්ට් ශතකය රැස් කරමින් වාර්තා කළ ලකුණු සංඛ්‍යාව 164කි. පන්දු 257කට මුහුණ දුන් ඔහු හතරේ පහර 14ක් සහ හයේ පහර 2ක් ඉනිමට එක් කර ගත්තේය.

මේ දෙදෙනා එක්ව සිව්වැනි කඩුල්ලට ලකුණු 307ක සබඳතාවක් ගොඩනැගූ අතර, එය ඇෆ්ගනිස්තාන ක්‍රීඩකයන් දෙදෙනකු විසින් ඕනෑම කඩුල්ලක් සඳහා එක් කළ ඉහළම සබඳතාව ද විය. මින් පෙර 2019 වසරේ අයර්ලන්තයට එරෙහිව දෙවැනි කඩුල්ලට ඉෂ්නුල්ලා සහ රහ්මාත් ෂාහ් එක් කර තිබූ ලකුණු 139 ඉහළම සබඳතාව ලෙස වාර්තා විය.

මේ සබඳතාව හේතුවෙන් ඇෆ්ගනිස්තානය කඩුලු 4ක් දැවී තිබියදී පළමු ඉනිම අත්හිටුවන විට රැස් කර සිටි ලකුණු සංඛ්‍යාව 545කි. 2018 වසරේ ජගත් ටෙස්ට් පිටියට පිවිසි ඇෆ්ගනිස්තානය ක්‍රීඩා කරන 6 වැනි ටෙස්ට් තරගය මෙයයි.

ඊයේ මේ තරගය තෙවැනි දිනයට නතර කරන විට ඉනිමක පරාජයෙන් ගැලවීමේ සටනක නිරතව සිටින සිම්බාබ්වේ පිල කිසිවකු නොදැවී ලකුණු 24ක් රැස් කර තිබිණි. සිම්බාබ්වේ පළමු ඉනිම ලකුණු 287කට සීමා වූ අතර, ඒ අනුව ඔවුන් ඇෆ්ගනිස්තාන පළමු ඉනිමට වඩා තවත් ලකුණු 234ක් පසුපසින් සිටිති.

## හෝල්ඩර්ගේ ඔටුන්න ගැලවේ



තුන් ඉරියව් ක්‍රීඩක ජේසන් හෝල්ඩර් බටහිර ඉන්දීය කොදෙව් ටෙස්ට් ක්‍රිකට් කණ්ඩායමේ නායකත්වයෙන් ඉවත් කිරීමට එරට තේරීම් කමිටුව පියවර ගෙන තිබේ.

ඔහු වෙනුවට නව නායකයා ලෙස ක්‍රෙග් බ්‍රැත්වෙයිට් පත් කර ඇති අතර, ඒ අනුව මේ මස 21 වැනිදා ආරම්භ වීමට නියමිත සංචාරක ශ්‍රී ලංකා කණ්ඩායම සමඟ තරග දෙකකින් සමන්විත ටෙස්ට් තරගාවලියේදී බ්‍රැත්වෙයිට් කණ්ඩායම මෙහෙයවීමට නියමිතය.

28 හැවිරිදි බ්‍රැත්වෙයිට් මින් පෙර ටෙස්ට් තරග 7කදී කොදෙව් පිල මෙහෙයවා ඇති අතර, අවසන් වරට පැවැති බංග්ලාදේශ තරග සංචාරයේදී ටෙස්ට් කණ්ඩායමට නායකත්වය දෙමින් එම තරගාවලිය 2-0ක ලෙස ජය ගැනීමට සමත් විය. කොරෝනා වසංගතය හේතුවෙන් ජේසන් ඇතුළු ජ්‍යෙෂ්ඨ ක්‍රීඩකයන් කිහිප දෙනකු මේ සංචාරයට එක් නොවූ බැවින් බ්‍රැත්වෙයිට්ට කණ්ඩායම මෙහෙයවීමේ වගකීම පැවරී තිබිණි.

අයිසීසී ටෙස්ට් ශ්‍රේණිගත කිරීම්වල තුන්ඉරියව් ක්‍රීඩකයන් අතර පෙරමුණ ගෙන සිටින 29 හැවිරිදි ජේසන් 2015 වසරේ ටෙස්ට් නායකත්වයට පත් වූ අතර, ඔහු තරග 37කදී කණ්ඩායම මෙහෙයවා ඇත. ඉන් තරග 11ක ජය කොදෙව්වන් සතු වෙද්දී තරග 21ක් පරාජයට පත්ව තිබේ. ජය පරාජයෙන් තොරව නිමා වී ඇති තරග සංඛ්‍යාව 5කි.

ජේසන් කණ්ඩායමේ නායකයා ලෙස දුන් සියලු දේ වෙනුවෙන් ස්තුතිවන්ත වන බවත් පැවසු කොදෙව් ක්‍රිකට් අධ්‍යක්ෂ ජිමී ඇඩම්ස් මහතා ජේසන් අවුරුදු පහහමාරක කාලය තුළ ක්‍රීඩාවේ ඉහළම සාරධර්ම ආරක්ෂා කරමින් ගෞරවාන්විතව නායකත්වය දුන් බවත්, ලොව ප්‍රමුඛ පෙළේ ටෙස්ට් තුන් ඉරියව් ක්‍රීඩකයා ලෙස සැවොම විශ්වාස කරන්නේ ජේසන්ට තවමත් කොදෙව් පිල වෙනුවෙන් විශාල කාර්ය භාරයක් පැවරී ඇති බවත්ය.

## එංගලන්ත ලෙජන්ඩ්ස් පිල දකුණු අප්‍රිකාවට පරදී

රෝඩ් සේෆ්ටි වර්ල්ඩ් සීරිස් ක්‍රිකට් තරගාවලියේ දකුණු අප්‍රිකානු ලෙජන්ඩ්ස් පිල සමඟ පැවැති 11 වැනි තරගයෙන් එංගලන්ත ලෙජන්ඩ්ස් පිලට කඩුලු 8ක පරාජයක් අත් විය.

මේ තරගාවලියේ එංගලන්ත පිලට හිමි වූ පළමු පරාජය මෙය වන අතර, දකුණු අප්‍රිකාව ලැබූ දෙවැනි ජයයි.

රායිපූර්හිදී පැවැති තරගයේ පළමුවෙන් පන්දුවට පහර දුන් එංගලන්ත පිල ඕවර 18.1කදී ලකුණු 121කට සීමා කළ දකුණු අප්‍රිකානු ක්‍රීඩකයන් පන්දු 42ක් ඉතිරිව තිබියදී ජය අත් කර ගත්තේ කඩුලු 2ක් පමණක් දැවී තිබියදීය.

දකුණු අප්‍රිකාව වෙනුවෙන් මෝර්න් වැන් වික් පන්දු 31කදී හතරේ පහර 6ක් සහ හයේ පහර 2ක් සමඟින් ලකුණු 46ක් රැස් කළ අතර, ඇල්විරෝ පීටර්සන් නොදැවී ලකුණු 31ක්, ඇන්ඩෘ පුටික් ලකුණු 22ක් සහ නායක ජොන්ටි රෝඩ්ස් පන්දු 7කින් ලකුණු 17ක් ඉනිමට එක් කළහ.

ඩැරන් මැඩි ලකුණු 25ක් රැස් කරමින් පළමුව පන්දුවට පහර දුන් එංගලන්ත ඉනිමේ වැඩිම ලකුණු ලාභියා විය. ක්‍රිස් ට්‍රම්ලෙට් 23ක් සහ නායක කෙවින් පීටර්සන් ලකුණු 21ක් රැස් කිරීමට සමත් විය.

පන්දු යැවීමේදී තන්ඩි ට්සබාලාලා ලකුණු 26කට කඩුලු 3ක් දවාගත් අතර, ඔහු තරගයේ වීරයා ලෙස නම් කෙරිණි.

# නාමල් උයනේ පංචාවාස විහාරාරාමයක් පැවති බවට සාධක තිබෙනවා



## ජාතික නාමල් උයනේ ප්‍රථම පුරාවිද්‍යා කැණීම් ඇරඹේ

### නාමල් උයන පුරාවිද්‍යා ව්‍යාපෘතියේ කළමනාකරු





**රත්නසිරි පතිරණ**

දකුණු ආසියාවේ විශාලම රෝස තිරිවාණා කඳුවැටිය සහිත ජාතික නාමල් උයනේ ප්‍රථම පුරාවිද්‍යා කැණීම් පෙරේදා (11) උදේ ජාතික උරුමයන් පිළිබඳ රාජ්‍ය ඇමැති විදුර වික්‍රමනායක මහතාගේ ප්‍රධානත්වයෙන් සිදු කෙරිණි. ජාතික නාමල් උයන නිර්මාතෘ වනවාසී රාහුල හිමියන්ගේ ඇරියුමින් එම කැණීම් ආරම්භ කිරීමේ උත්සවය මධ්‍යම සංස්කෘතික අරමුදල මගින් සංවිධාන කර තිබිණි.

ජාතික නාමල් උයනේ පිහිටි ගල් පාත්‍රය සහ ඉපැරණි දාගැබ අසල ප්‍රදේශයේ මේ කැණීම් ආරම්භ කෙරිණි. රෝස තිරිවානා කඳුවැටිය වසර මිලියන දසලක්ෂ පන්සිය පනහකට වැඩි ඉතිහාසයක් ඇති ජාතික උරුමයක් සේ සංරක්ෂණය වන පුරාවිද්‍යා බිමකි. පංචාවාස විහාරාරාමයක් මේ ස්ථානයේ තිබී ඇති බවත් ඊට අවශ්‍ය පොහොය ගෙයක්, බෝධියක්, දාගැබක් සහ විහාර මන්දිරයක් තිබූ බවට මෙහි සාධක තිබෙන බවත් ඒවා තහවුරු කර ගැනීම පියවරෙන් පියවර කැණීම් සිදු කරන බවත් නාමල් උයන පුරාවිද්‍යා ව්‍යාපෘතියේ කළමනාකරු චන්දන වීරසේන මහතා සඳහන් කළේය.


මතු පරපුර සඳහා මෙවැනි ජාතික උරුමයක් ආරක්ෂා කිරීමට අවශ්‍ය පියවර ගනිමින් දෙස් විදෙස් සංචාරකයන්ගේ ද අවධානය යොමු කිරීමට ඉදිරියටත් කටයුතු කරන බව සඳහන් කළ රාජ්‍ය ඇමැති විදුර වික්‍රමනායක මහතා ජාතික නාමල් උයන ජාතියට රැක දුන් මෙහි නිර්මාතෘ වනවාසී රාහුල හිමියන්ගේ මෙහෙවර අතිශයින්ම අගය කරන බව ද සඳහන් කළේය.

මේ උත්සව සභාවේදී නාමල් උයන නිර්මාතෘ වනවාසී රාහුල හිමියෝ මෙසේ කීහ.

'ගහකොළ ඇළ දොළ රැක ගනිමින් ස්වභාවධර්මය රැකගත්තේ නැත්නම් අපට පැවැත්මක් නෑ. ස්වභාවධර්මය විනාශ කරපු මිනිස්සුන්ට දැන් හැම පැත්තෙන්ම දඬුවම් ලැබෙනවා. මුළු ලෝකෙම ස්වභාවධර්මයේ දඬුවමට ලක් වෙලා. අපි කිසිකෙනෙකුට ඉන් බේරෙන්න බෑ. ඒ නිසා මම මේ රටේ සෑම පුරවැසියකුගෙන්ම ඉල්ලා සිටිනවා. නාමල් උයන නැමති ජාතික උරුමයත් එහි ඇති පුරාවිද්‍යා නටබුන් සියල්ල රැකගන්න එකතුවෙන්න කියා. ඒ සඳහා ජාති කුල මල ආගම් පක්ෂ පාට පසෙකලා ශ්‍රී ලාංකිකයන් විදියට එක මිටකට එක් වී මෙය රැකගන්නට පෙරට එන ලෙස තමන් වහන්සේ ආරාධනා කරන බව ද වැඩිදුරටත් පැවසූහ.

මධ්‍යම සංස්කෘතික අරමුදලේ අධ්‍යක්ෂ ජනරාල් මහාචාර්ය ගාමිණී රණසිංහ මහතා ඇතුළු නිලධාරීහු රැසක් මේ අවස්ථාවට එක් වූහ.

## අධිකරණ නායක ධුරයෙන් පිදුම් ලැබූ මහාචාර්ය අත්තංගනේ රතනපාල නායක හිමියෝ



*(ශ්‍රී ලංකා රාමඤ්ඤ මහා නිකායේ අධිකරණ නායක ධුරයට පත් මහාචාර්ය රාජකීය පණ්ඩිත අත්තංගනේ රතනපාල නායක හිමිට ඒ පිළිබඳ අක්තපත්‍ර ප්‍රදානය ඊයේ (12 ) සවස 4.00ට අනුරාධපුර රුවන්මැලි මහ සෑ මළුවේදී සිදු කෙරුණි. මේ ලිපිය ඒ නිමිත්තෙනි).*

වර්තමාන ශ්‍රී ලංකා රාමඤ්ඤ මහා නිකායේ අධිකරණ සංඝනායක මහාචාර්ය රාජකීය පණ්ඩිත අත්තංගනේ රතනපාල නායක හිමියෝ 1953 උපත ලබා 1968 වසරේ පැවිදිව 1974 උපසම්පදා භූමියට පත් වූහ. උන්වහන්සේගේ ආචාර්යයන් වහන්සේ වන්නේ කුලියාපිටිය දියකලමුල්ල ශ්‍රීපති පිරිවෙන් විහාරාධිපතිව වැඩ සිටි වෙරළුගම රතනජෝති සහ පණ්ඩිත මහවැව සුදස්සී හිමිවරුය.

1988 සිට ප්‍රාදේශීය සංඝ සභා (කලාවැව) ලේකම්වරයකු ලෙස ද, 1993 සිට වසර 27ක් කාරක සංඝ සභිකවරයකු වශයෙන් ද ජෙට්ඨානුවිජ්ජක (1993) වරයෙකු වශයෙන් ද උපරිමානුවිජ්ජක (2012) ව්‍යවස්ථා සම්පාදක (2000) මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් ද ප්‍රතිපත්ති සංවර්ධන සභා ලේඛක ශාසනික ගැටලු කළමනාකරණ කමිටුවේ ප්‍රධාන සංවිධායක නිකායාභිවෘද්ධිය සඳහා පත් කළ විවිධ කමිටුවල සාමාජිකයකු වශයෙන් ද අධිකරණ ලේඛකාධිකාරීන් වහන්සේ වශයෙන් ද නිකායාභිවෘද්ධියට හා ශාසන චිරස්ථිතියට අදාළව සුවිශාල සේවාවක් සිදු කොට ඇති උන්වහන්සේ විහාරස්ථාන 25ක් ඇති කොට ඒවායේ අනුශාසකත්වය දරමින් කටයුතු කරති. උපසම්පදා භික්ෂූන් වහන්සේ 50 නමක් ඇතුළු 120ක් පමණ ශිෂ්‍ය පිරිසක් ඇති කළ ආචාර්යවරයාණන් කෙනෙක් ද වෙති. එසේම සම්බුද්ධ ශාසනයටත්, ශ්‍රී ලංකා රාමඤ්ඤ මහා නිකායටත්, මනුෂ්‍ය සමාජයටත් සුවිශාල සේවාවක් සිදු කරන පූජ්‍යතර මහා ලේඛකාධිකාරීන් වහන්සේ ඇතුළු සම්භාවනීය පැවිදි සහෝදර පිරිසක් ද වෙති.

කුඩා කලම ප්‍රාචීන භාෂා ශාස්ත්‍ර හදාරා ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගමේ රාජකීය පණ්ඩිත උපාධිය (1976) ලබාගත් උන්වහන්සේ 1974 වර්ෂයේ පැවති උපසම්පදාපේක්ෂක පරීක්ෂණයෙන් ද 1978 පැවති නිකායේ ත්‍රිපිටක විශාරද පරීක්ෂණයෙන් ද ප්‍රථම ස්ථානය ලබා සමත්ව ඇත.

1978 බුද්ධ ශ්‍රාවක විශ්වවිද්‍යාලයේ පස් අවුරුදු පාඨමාලාව අවසන් කොට ත්‍රිපිටකවේදී (ගෞරව) උපාධිය පළමු පෙළ ප්‍රමුඛයාව සමත්ව ඇත. 1982 ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් ශාස්ත්‍රවේදී ගෞරව (බටහිර දර්ශනය) ප්‍රමුඛයා ලෙස ද 1985 කැලණිය විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍රපති පරීක්ෂණයෙන් ප්‍රමුඛයා ලෙස ද සමත්ව ඇත. පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ දර්ශන හා මනෝවිද්‍යා අධ්‍යයන අංශයේ ආගම් පිළිබඳ තුලනාත්මක අධ්‍යයනය, ශාස්ත්‍රපති පාඨමාලාව ද (1991-1993) හදාරා ඇති උන්වහන්සේ කොළඹ විශ්වවිද්‍යාලයේ නීතිය පිළිබඳ පාඨමාලාවක් ද හදාරා ඇත. අනුරාධපුර බුද්ධ ශ්‍රාවක භික්ෂු විශ්වවිද්‍යාලයේ දර්ශන අංශයේ කථිකාචාර්යවරයකු වශයෙන් 1983 වර්ෂයේ සිට කටයුතු කර ඇති උන්වහන්සේ, කොළඹ 10 ශ්‍රී ලංකා විද්‍යාලයේ ආචාර්යවරයකු වශයෙන් 1980-82 ද කටයුතු කර ඇත. එසේම උන්වහන්සේ රාජාංගණ ශ්‍රී සුදර්ශන මහ පිරිවෙනෙහි ප්‍රථම පරිවේණාධිපතීන් වහන්සේ ද (1983-1988) වෙති. අනතුරුව බුද්ධ ශ්‍රාවක ධර්ම පීඨ භික්ෂු විශ්වවිද්‍යාලයේ අංශාධිපති, මහාචාර්ය පීඨාධිපති, නිසි බලධාරී තනතුරු ද දරමින් විසි වසරක් භික්ෂු උසස් අධ්‍යාපනය වෙනුවෙන් කැප වී ක්‍රියා කොට ඇත. එසේම භික්ෂු විශ්වවිද්‍යාලයේ ප්‍රායෝගික බෞද්ධ අංශය ද සමාජ විද්‍යා හා තුලනාත්මක අධ්‍යයන අංශය ද භාරව කටයුතු කර ඇත.

නිකායේ පරියත්ති සංවර්ධන සභාව මගින් පවත්වන සියලු ත්‍රිපිටක පරීක්ෂණයන්ට පෙනී සිට ගෞරව සාමර්ථ්‍ය සහිතව ප්‍රථම ස්ථානය ලබා ඇති උන්වහන්සේ, විනයාචාර්ය, සද්ධර්මාචාර්ය, අභිධර්මාචාර්ය (ත්‍රිපිටකාචාර්ය) පරීක්ෂණ සඳහා ද 1977 වර්ෂයේ ද විනය විශාරද, සද්ධර්ම විශාරද, අභිධර්ම විශාරද (ත්‍රිපිටක විශාරද) පරීක්ෂණ සඳහා 1978 වර්ෂයේ ද පෙනී සිට ප්‍රථම පන්තියේ ප්‍රමුඛයාව ගෞරව සාමර්ථ්‍ය ලබා ඇත.

බුද්ධ ශ්‍රාවක ධර්ම පීඨ භික්ෂු විශ්වවිද්‍යාලයේ සනාතන සභා පාලක සභා ආදියෙහි ද කොළඹ විශ්වවිද්‍යාලයේ පාලක සභාවේ ද බුද්ධශාසන උපදේශක සභාව, ජනාධිපති උපදේශක බුද්ධි මණ්ඩල ආදියෙහි ද ප්‍රාචීන භාෂෝපකාර සමාගමේ කාරක සභාවේ ද කටයුතු කර ඇති උන්වහන්සේ ජාතික, ආගමික හා ශාසනික ගැටලුවලදී පුරෝගාමීව කටයුතු කරන කීර්තිධර නාහිමිපාණන් වහන්සේ නමකි. නිකාය මූලස්ථාන ගොඩනැඟීමේදී ද මූලිකව කටයුතු කළ උන්වහන්සේ, නිකාය මූලස්ථාන පාලක සභාවේ ලේකම් ධුරය ද දරති. එසේම නිකායේ ත්‍රිපිටක අධ්‍යාපන මණ්ඩලයේ ද ලේකම් ධුරය දරන උන්වහන්සේ නිකායේ ත්‍රිපිටක ධර්මාධ්‍යාපන ආයතනය ද පවත්වාගෙන යමින් සම්බුද්ධ ශාසනයට මහ මෙහෙවරක් සිදු කරති.

1988 වර්ෂයේ පටන් වසර 32ක් නිකායේ ක්‍රියාකාරී භික්ෂූන් වහන්සේ නමක වශයෙන් නිකායාභිවෘද්ධියට ද ශාසන චිරස්ථිතියට ද කටයුතු කර ඇති උන්වහන්සේ, ධර්ම විනයානුගත සංඝාධිකරණ පද්ධතියක් පවත්වාගෙන යමින් ශාසනික ගැටලු අවම කිරීමට සුවිශේෂ කැපවීමක් කළ ස්වාමීන් වහන්සේ නමකි. අධිකරණ ක්ෂේත්‍රයෙහි පුළුල් අත්දැකීම් සම්භාරයක් ඇති උන්වහන්සේ, ශ්‍රී ලංකා රාමඤ්ඤ මහා නිකායේ අධිකරණ සංඝනායක ධුරයට පත්ව සිටිති.

**තිලකරත්න ලියනපටබැඳි**

## ප්‍රවාහන ක්ෂේත්‍රයේ උන්නතියට මානව සම්පත් සංවර්ධන සැලැස්මක් නිර්මාණය කිරීමට යයි

**සුභාෂිණී සේනානායක**

මෙරට ප්‍රවාහන ක්ෂේත්‍රයේ අභිවෘද්ධිය සඳහා මානව සම්පත් සංවර්ධන සැලැස්මක් නිර්මාණය කිරීමට ප්‍රවාහන අමාත්‍යාංශය තීරණය කර තිබේ. ප්‍රවාහන අමාත්‍යාංශය, ප්‍රවාහන රාජ්‍ය අමාත්‍යාංශය හා ඊට අනුබද්ධිත ආයතන 07ක නිලධාරීන් එක්ව එම සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා මානව සම්පත් සංවර්ධන වැඩමුළු ආරම්භ කර ඇත.

මෙරට මඟී ජනතාවට ගුණාත්මක සේවාවක් ලබාදීම වෙනුවෙන් එම සැලැස්ම ක්‍රියාවට නංවන බව ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් නිලාන් මෙරෙන්ඩා මහතා සඳහන් කළ අතර දැනට අවස්ථා දෙකක දී මේ සම්බන්ධයෙන් සම්මන්ත්‍රණ මාලාවක් පැවැත්වූ බවත් කියා සිටියේය.

තව ඉදිරියට පවත්වා මාස 3ක් වගේ කාලයක දී මේ මානව සම්පත් සංවර්ධනය සැලැස්මක් අපි ප්‍රවාහන ක්ෂේත්‍රයට හඳුන්වා දෙනවා. මෙහිදී මූලිකත්වය ගන්නේ, රාජ්‍ය අමාත්‍යාංශ හා ප්‍රවාහන අමාත්‍යාංශයේ ලේකම් හා අතිරේක ලේකම්වරුන්. ඔවුන්ගේ සහභාගිත්වයෙන් මේ සම්මන්ත්‍රණ පැවැත්වෙනවා. ඊට අමතරව සියලුම ප්‍රවාහන අමාත්‍යාංශයට අනුබද්ධිත ආයතන 7ක සභාපතිවරුන්, ප්‍රධාන විධායක නිලධාරීන්, අධ්‍යක්ෂ ජනරාල්වරුන්ගේ හා මානව සම්පත් අංශ භාර ප්‍රධානීන්ගේ සහභාගිත්වයෙන් තමයි මේ වැඩමුළුව පවත්වන්නේ. මෙයින් බලාපොරොත්තු වෙන්නේ ගුණාත්මක සේවයක් ප්‍රවාහන ක්ෂේත්‍රයට ලබාදෙන්නයැයිද ඒ මහතා මේ සම්බන්ධයෙන් අදහස් දක්වමින් වැඩිදුරටත් කියා සිටියේය.

## සමස්ත ලංකා බෞද්ධ මහා සමුළුවේ සාකච්ඡාවක් හෙට

මෙරට නිදහස් සටනට අයෝමය ශක්තියක් වෙමින් ස්ථාපනය වී ශතකයකට වැඩි ගමන් මඟකදී ලක්දිව බෞද්ධ ජනතාවගේ සහ බුද්ධ ශාසනයේ උන්නතිය වෙනුවෙන් කටයුතු මෙහෙයවන සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනයේ ඉදිරි නියමුවන් තෝරාගැනීමේ නිලවරණය 2021 අප්‍රේල් මස 03 වැනි දින පැවැත්වීමට කටයුතු සංවිධාන වෙමින් පවතී.

මේ සම්බන්ධයෙන් ගම්පහ සහ අවට සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනයේ සාමාජික සාමාජිකාවන් දැනුම්වත් කිරීමේ සාකච්ඡා සභාවක් සම්මේලනයේ නියෝජ්‍ය සභාපති චන්ද්‍ර නිමල් වාකිෂ්ඨ මහතාගේ ප්‍රධානත්වයෙන් හෙට (14) ප.ව. 3.00ට ගම්පහ තරුණ බෞද්ධ සමිති ශාලාවේදී පැවැත්වේ.

## දේශීය ඇඟලුම් නිෂ්පාදන නිලධාරීන් පුහුණු කිරීමේ වැඩසටහනේ සමාරම්භයෙන්...

බතික් අත්යන්ත්‍ර රෙදි හා දේශීය ඇඟලුම් නිෂ්පාදන රාජ්‍ය අමාත්‍යාංශය හා ජාතික ආර්ථික සංවර්ධන අධිකාරිය එක්ව ව්‍යවසාය සංවර්ධන නිලධාරීන් පුහුණු කිරීමේ වැඩසටහනේ සමාරම්භය රාජ්‍ය ඇමැති දයාසිරි ජයසේකර මහතාගේ ප්‍රධානත්වයෙන් ඊයේ (12) ශ්‍රී ලංකා පදනම් ආයතනයේදී ආරම්භ විය.

රැකියා විරහිත ග්‍රාමීය පවුල්වල තරුණ තරුණියන් තෝරාගෙන එම පිරිස ව්‍යවසායකයන් ලෙස බලගැන්වීමේ අරමුණින් මේ පුහුණු වැඩසටහන ආරම්භ වේ. ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් මේ පිරිස තෝරාගෙන පුහුණු වැඩසටහන සිදුකිරීමට සැලසුම් කර ඇත.

එමෙන්ම වැඩසටහනේ සමාරම්භය අවසාන වීමෙන් පසු අමාත්‍යාංශ නිලධාරින් සමඟ මෙහි ඉදිරි වැඩ වැඩපිළිවෙළ ක්‍රියාත්මක කරන ආකාරයද ඇමැතිවරයා සාකච්ඡා කළේය.

**ඡායාරූප**
**දුෂ්මන්ත මායාදුන්න**









## මහා ශිව රාත්‍රී දිනය සමරමින්...

මහා ශිව රාත්‍රී දිනය නිමිත්තෙන් පෙරේදා (11) රාත්‍රියේ සෙල්ලකතරගම ගණදෙවි කෝවිලේ දී පූජා චාරිත්‍ර කළ අයුරු. මේ අවස්ථාවට ජනතාව සෞඛ්‍යාරක්ෂිතව සහභාගි වී සිටියහ.

**ඡායාරූප**
**සුලෝචන ගමගේ**

# පැලියගොඩ

| පැලියගොඩ එළවළු මිල | |
|---|---|
| | (කිලෝවක තොග මිල) රුපියල් |
| ගෝවා | 100 |
| බෝංචි | 150 |
| තක්කාලි | 120 |
| ලීක්ස් | 90 |
| කැරට් | 150 |
| වම්බටු | 60 |
| පිපිඤ්ඤා | 40 |
| අමු මිරිස් | 200 |
| මාළු මිරිස් | 220 |
| බණ්ඩක්කා | 80 |
| තළන බටු | 50 |
| දෙහි | 60 අතර |
| වට්ටක්කා | 80 |
| පතෝල | 80 |
| බීට් | 80 |
| දේශීය අර්තාපල් | 120 |
| ලොකු ලූනු | 70 |

| පැලියගොඩ පලතුරු මිල | |
|---|---|
| | (කිලෝවක තොග මිල) රුපියල් |
| අඹ අල්පොන්සෝ 1kg | 400-420-440 අතර |
| අඹ කර්තකොළම්බන් (ගෙඩි එකක්) | 110-120 අතර |
| ගස් ලබු (ගෙඩි එකක්) | 100-110 අතර |
| කෝලිකුට්ටු | 140-160 |
| ඇඹුල් කෙසෙල් | 30-40-90 අතර |
| දොඩම් | 140-160 |
| කොමඩු | 80-90-100 අතර |
| අන්නාසි | 100 - 110 අතර |
| කිලෝ පේර | 140-180 අතර |
| දොඩම් | 140-180 |
| දිවුල් | 250 |

# ජනතාවට සහනයක් දෙන්න රජය සීනි බදු අඩු කළත්

# සහනය ගියේ ජාවාරමුන්ගේ සාක්කුවලට

## පරිසර ඇමැති මහින්ද අමරවීර

**බුද්ධිකා ඉඹුලාන**

සීනි බදු අඩු කිරීමෙන් රජය බලාපොරොත්තු වුයේ මහජනතාවට සහනයක් සැලසීම වුවද අවසානයේ සිදු වූයේ මේ රටේ ප්‍රධාන පෙළේ ජාවාරම්කරුවන් පිරිසක් එම සහනය තමන්ගේ සාක්කුවට දමාගැනීමයැයි පරිසර ඇමැති මහින්ද අමරවීර මහතා පවසයි.

ජනතාවට එම වාසිය ලබාදීමට රජය අපොහොසත් වු බව පිළිගන්නා බවත් මේ වංචාව සම්බන්ධයෙන් සොයා බලා වැරැදිකරුවන්ට දඩුවම් ලබාදිය යුතුය යන ස්ථාවරයේ රජය සිටින බවත් ඇමැතිවරයා කියයි.

පරිසර ඇමැති මහින්ද අමරවීර මහතා ප්‍රමුඛ නිලධාරින් පිරිසක් පෙරේදා (11) පස්වරුවේ බෝගල මිනිරන් පතලේ කටයුතු සොයා බැලීමට එහි නිරීක්ෂණ චාරිකාවකට එක්වූ අවස්ථාවේදී ඇමැතිවරයා මේ අදහස් පළ කළේය.

අප රටේ ඛනිජ සම්පත් විශාල ප්‍රමාණයක් ඇතත් ඒවා බහුතරයක් අපනයනය කරනු ලබන්නේ අමුද්‍රව්‍ය වශයෙන් වීම නිසා ඉන් නිසි පරිදි ආදායමක් උපයා ගැනීමේ අවස්ථාව රටට අහිමි වී තිබෙනවා. හැම රජයක්ම මේ සඳහා යම් උත්සාහයක් දරා ඇතත් තවමත් අගය එකතු කළ නිෂ්පාදන වශයෙන් අපනයනය කිරීම අසීරුයි.එම නිසා රජයේ අරමුණ ඉදිරි කාලයේ අපේ රටේ සම්පත් විදේශ රටවලට අපනයනය කිරීමේ දී අමුද්‍රව්‍ය වශයෙන් නොව අගය එකතු කළ භාණ්ඩ වශයෙන් නිපදවා අපනයනය කිරීමයි. නිදසුනක් වශයෙන් බෙහෙත් පෙති ඇතුළු නිෂ්පාදන රැසක් සඳහා යොදා ගන්නා කැල්සයිට් මේ වනවිට විදේශ රටවලට අපනයනය කරන්නේ කිලෝවක් රුපියල් 3.50ක් වැනි මිලකටයි. නමුත් එම ඛනිජ සම්පත කැල්සියම් කාබනේට් පවුඩර් වශයෙන් අගය එකතු කළ නිෂ්පාදනයක් ලෙස අපනයනය කිරීමට බළන්ගොඩ ප්‍රදේශයේ කර්මාන්ත ශාලාවක් ඉදි කිරීමට තීරණය කර තිබෙනවා.ඒ අන්දමින් අපේ රටේ සියලු ඛනිජ සම්පත් අපනයනයේ දී අගය එකතු කළ නිෂ්පාදන වශයෙන් අපනයනය කිරීමට පියවර ගන්නා ලෙස ජනාධිපතිවරයා සියලු අමාත්‍යංශවලට උපදෙස් දී තිබෙනවා.



සීනි බද්ද අඩු කිරීම මගින් වංචාවක් සිදු වී යැයි පළවන අදහස් සම්බන්ධයෙන් අදහස් දැක්වූ ඇමැතිවරයා පැවැසුවේ රජය සීනි බද්ද අඩු කළේ මහජනතාවට සහන සැලසීමේ අරමුණින්. නමුත් එහි වාසිය ජනතාවට ගියේ නැහැ. මේ රටේ ප්‍රධාන පෙළේ ජාවාරම්කාරයන් පිරිසක් විසින් එම වාසිය තමන්ගේ සාක්කුවට දමාගෙන තිබෙන බව පෙනෙනවායි කීය.

මේ වාසිය ලබාදීමෙන් එමගින් කිසියම් මුදලක් දේශපාලනඥයෙක් අතට ගියා කියා මම හිතන්නේ නැහැ. සමහරු කියනවා මහබැංකු බැඳුම්කර ගිවිසුම මගින් සිදු කළ වංචාව හා මේ වංචාව සමානයි කියා. බැඳුම්කර වංචාව සම්බන්ධයෙන් මුලින්ම අල්ලස් හා දූෂණ කොමිසමට පැමිණිලි කළේ මම. ඒ 2015. මාර්තු මස 09 වැනිදින. ඊට පස්සේ තමයි අනිත් අය මේක අල්ලාගෙන ඉදිරියට ගියේ. ඒ වගේම මේ සීනි බදු සහනය ලබාදීම කළේ ජනතාවට සහනයක් දෙන්න. නමුත් සිදු වුණේ අපේක්ෂිත දෙය නොවේ. රජය එම පියවර ගත්තේ යහපත් චේතනාවෙන් මිස වංචා කිරීමේ චේතනාවකින් නොවෙයි.

ඒ නිසා බැඳුම්කර සිද්ධියයි, මේ සිද්ධියයි කිසිසේත්ම සමාන වෙන්නේ නැහැ. අපි හිතන්නේ මින් පසු මෙවැනි අඩුපාඩු නොවිය යුතුයි. ඒ වගේම වගකීම් පැහැර හැරපු අයත්, මේ වංචාව කළ ජාවාරම්කාරයන් සම්බන්ධවත් නීතිය ක්‍රියාත්මක විය යුතුයි කියා මම විශ්වාස කරනවායි ද ඇමැතිවරයා වැඩිදුරටත් කීය.

# මධ්‍යම සංස්කෘතික අරමුදලේ නව අධ්‍යක්ෂ ජනරාල් වැඩ භාර ගනී



**උපාලි කරුණාරත්න**

මධ්‍යම සංස්කෘතික අරමුදලේ නව අධ්‍යක්ෂ ජනරාල්වරයා ලෙස මහාචාර්ය ගාමිණී රණසිංහ මහතා වැඩ භාර ගනී. කොළඹ -07 බෞද්ධාලෝක මාවත, අංක 212 දරන ස්ථානයේ පිහිටුවා ඇති මධ්‍යම සංස්කෘතික අරමුදල ප්‍රධාන කාර්යාලයේදී පසුගියදා (10) පෙරවරුවේ නව අධ්‍යක්ෂ ජනරාල්වරයා වැඩ භාර ගෙන රාජකාරි ආරම්භ කළේය. බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු පිළිබඳ විෂය භාර ඇමැති, අගමැති මහින්ද රාජපක්ෂ මහතා විසින් මේ නව පත්වීම සිදු කර ඇති අතර එම අමාත්‍යාංශ ලේකම් මහාචාර්ය කපිල ගුණවර්ධන මහතා විසින් අදාළ පත්වීම භාර දෙන ලදී.

# ගමේ ජනතාව අපනයන කෘෂි නිෂ්පාදනයට එක් කර ගැනීම අපේක්ෂාවයි

## අක්කර කාලක ගෙවත්තකට ටී ජේ සී අඹ පැළ 25ක්

### රාජ්‍ය ඇමැති ඩී.වී. චානක හම්බන්තොටදී කියයි

**නුවන් කොඩිකාර**

ගෙවත්තේ අපනයනයට සුදුසු වගාවන් හඳුන්වා දෙමින් ග්‍රාමීය ජනතාව අපනයන කෘෂි නිෂ්පාදනයට එක් කර ගැනීම රජයේ අපේක්ෂාව බව ගුවන් සේවා හා අපනයන කලාප සංවර්ධන රාජ්‍ය ඇමැති ඩී.වී. චානක මහතා පැවසීය.

ඒ සඳහා අවශ්‍ය බීජ, පැළ, තාක්ෂණික උපදෙස් හා මඟ පෙන්වීම රජය විසින් නොමිලේ ලබාදෙන්නේයැයි "සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්තියට අනුව අපනයන කෘෂි කලාප ඇති කිරීමේ ජාතික වැඩසටහන හම්බන්තොට දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක කරමින් රාජ්‍ය ඇමැතිවරයා කීය.

මේ අනුව අක්කර කාලක ගෙවත්තක් සඳහා ටී.ජේ.සී. අඹ පැළ 25ක් ලබාදෙන අතර එමගින් වාර්ෂිකව රුපියල් ලක්ෂ පහක පමණ ආදායමක් අපේක්ෂා කෙරේ.

ප්‍රදේශයේ දේශගුණික තත්ත්වයන් අනුව සුදුසු, අපනයනය ඉලක්ක කර ගත් බෝග වගා කිරීම මේ වැඩ සටහන අනුව සිදු කරන අතර මෙමගින් ග්‍රාමීය ජනතාව ඒකරාශි කරමින් ජාතික හා අන්තර්ජාතික වෙළෙඳපොළ ඉලක්ක කරගත් නිෂ්පාදන සිදු කිරීමට අපේක්ෂිත බවත් හම්බන්තොට වරාය හා මත්තල ගුවන්තොටුපොළ ඉලක්ක කරගත් එළවළු හා පලතුරු අපනයන කලාප ඇතිකිරීමටත්, එමගින් මේ අස්වැන්න බාධාවකින් තොරව අන්තර්ජාතික වෙළෙඳපොළ කරා ප්‍රවාහනයටත් අවස්ථාව සැලසෙන බවත් චානක මහතා කීය.



වර්තමානයේ දළ ජාතික නිෂ්පාදිතයට අපනයන කෘෂිකාර්මික ක්ෂේත්‍රයෙන් 2% ක්ව පවතින දායකත්වය වර්ෂ 2025 දී 4% ක් දක්වා වැඩි කිරීම හා කෘෂි ව්‍යවසායකත්වය ප්‍රවර්ධනය කිරීම මේ ජාතික වැඩසටහනේ අරමුණ බව ඒ මහතා ප්‍රකාශ කළේය.

මෙහිදී වැඩිදුරටත් රාජ්‍ය ඇමැතිවරයා මෙසේද කීය.

2019 රුපියල් මිලියන 63000ක්ව තිබුණ අපනයන කෘෂි භෝග ආදායම අවුරුද්දක් තුළ රුපියල් මිලියන 73000 දක්වා වර්ධනය කරගන්න රජයට හැකියාව ලැබී තියෙනවා. අද වන විට තේ, පොල්, රබර් මත යැපුණු ලංකාවේ ආර්ථිකයට නව ජවයක් දෙන්න රජයට පුළුවන් වී තිබෙනවා.ඒ නිසා දැන් අපි අපේ කුළු බඩුවලට අමතරව අලුත් අපනයන නිෂ්පාදනයක් හඳුනාගෙන තියෙනවා. ඒ TJC අඹ. TJC අඹ කියන්නේ අපේ රටේ අපේම නිෂ්පාදනයක්. මේ අඹ අපනයනය සඳහාම සකස් කරපු වියළි කලාපයට ඉතාම උචිත ඉහළ ආදයමක් ගන්න පුළුවන් භෝගයක්.

මේ ප්‍රදේශයට TJC අඹ පැළ 100000ක අඹ කලාපයක් නිර්මාණය වෙනවා. ඔබේ වත්තට පැළ 25ක් ලබා දෙමින් පවුලේ ආර්ථිකය ශක්තිමත් කරන්නත් එයින් රටේ ජාතික ධනය නිර්මාණය කිරීමත් අපි බලාපොරොත්තු වෙනවා.ප්‍රධාන වැවිලි භෝග ආශ්‍රයෙන් ශ්‍රී ලාංකේය අපනයන ආදායමට විශාල දායකත්වයක් ලැබෙනවා. ඒ වගේම කෘෂි කලාපවල කුඩා වැවිලි භෝග හා අපනයනය ඉලක්ක කර ගත් භෝග වගාවෙන් ඉදිරි අනාගතයේදී සැලකිය යුතු මට්ටමේ අපනයන ආදායමක් රටට හිමිකර දීමට හැකියාව ලැබෙනවායිද කීය.

# නව ව්‍යවසායකයන්ට ආයෝජන සඳහා වැඩි වැඩියෙන් ණය මුදල් ප්‍රදානය කරන්න

## ශ්‍රී ලංකා මහ බැංකුව බැංකු පද්ධතියෙන් ඉල්ලයි

**ජයසිරි මුණසිංහ**

ජනතාවගේ ආර්ථික හැකියාව සහ ජීවනෝපාය වැඩි දියුණුවට බලපාන නිෂ්පාදන හා සේවා දිරිගන්වන නව ව්‍යවසායකයන්ට ආයෝජන සඳහා වැඩි වැඩියෙන් ණය මුදල් ප්‍රදානය කරන්නැයි ශ්‍රී ලංකා මහ බැංකුව මෙරට බැංකු පද්ධතියෙන් ඉල්ලීමක් කරයි.

මේ වන විට මූල්‍ය වෙළෙඳපොළේ ණය පොලී අනුපාතය අඩු වුවද ආර්ථිකයේ ඵලදායි අංශ දියුණුවට බැංකුවලින් දෙන ණය ප්‍රමාණයන්ගේ අඩුවක් පැවතීම පිළිබඳ අවධානය යොමු කිරීමෙන් පසු ශ්‍රී ලංකා මහ බැංකුව මේ ඉල්ලීම කර ඇත. ඒ අනුව අඩු මට්ටමක පවතින පොලී අනුපාත මධ්‍යයේ ක්ෂුද්‍ර කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් වෙත බැංකු මගින් ප්‍රමුඛතා අංශ සලකා බලා ණය ලබාදීමේ ඉලක්කය හඳුන්වාදීමේ සහ ආයෝජක විශ්වාසය වැඩි දියුණු කිරීම මගින් ණය සඳහා ඇති ඉල්ලුම ඉහළ නැංවීම අවශ්‍යතාව ශ්‍රී ලංකා මහ බැංකුව අවධාරණය කර සිටී.

මෙලෙස ක්‍රියා කිරීමෙන් ඉදිරියේදී පෞද්ගලික අංශය වෙත බැංකු හා මූල්‍ය ආයතන විසින් සපයන ණය ප්‍රමාණයන්හි වර්ධනයක් ඉදිරියේදී සිදුවනු ඇතැයි ශ්‍රී ලංකා මහ බැංකුව අපේක්ෂා කරයි. මීට අමතරව ආර්ථිකයේ දියුණුවට සහාය වන ඵලදායි අංශ වෙත ණය සැපයීමේදී ඇතිවන ගැටලු නිරාකරණය කිරීම සඳහා බැංකු ප්‍රජාව සහ අනිකුත් පාර්ශ්වකරුවන් සමඟ මේ වන විට සාකච්ඡා කරමින් පවතී.

මේ කරුණු අනාවරණය වූයේ කොළඹ කොටුව පිහිටි මහ බැංකු මූලස්ථානයේ ඉකුත්දා පැවැති විශේෂ මාධ්‍ය හමුවේදීය. මේ සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති සම්මානිත මහාචාර්ය දේශමාන්‍ය ඩබ්ලිව්.ඩී. ලක්ෂ්මන් මහතා ප්‍රමුඛ නියෝජ්‍ය අධිපතිවරු සඳහා දෙපාර්තමේන්තු ප්‍රධානීහු සහභාගි වී සිටියහ.

# චීන චිත්‍රපට උලෙළ අද ජාතික නාලිකාවෙන්



**රත්නසිරි පතිරණ**

චීන නව අවුරුද්ද වෙනුවෙන් චීන තානාපති කාර්යාලය ජාතික රූපවාහිනී සංස්ථාව එක්ව සංවිධාන කරන චීන චිත්‍රපට උලෙළ අද (13) දහවල් 1.00ට ජාතික නාලිකාව ඔස්සේ විකාශය කෙරේ. ඒ යටතේ අද (13) Operation Red Sea චිත්‍රපටය ප්‍රදර්ශනය කිරීමට නියමිතය.

# සිළුමිණේ නිශානි සිනමා රංගනයට පිවිසෙයි

ප්‍රවීණ චිත්‍රපට අධ්‍යක්ෂ ලාල් ප්‍රියදේව අධ්‍යක්ෂණය කළ සුනිල් ටී. ප්‍රනාන්දුගේ නිෂ්පාදනයක් වන සතුන් කතා කරන ප්‍රථම ළමා චිත්‍රපටය 'අපට සැදුණු අපේ ලෝකය' මේ දිනවල දිවයින පුරා සිනමා ශාලාවල තිරගත වේ.

ප්‍රකට නළු නිළියන් කීප දෙනෙකු හැරුණු විට මේ චිත්‍රපටයේ වැඩි පිරිසක් දායක වූයේ සිනමාවට අලුතින් හඳුන්වා දුන් නළු නිළියෝය. ලේක්හවුස් ආයතනයේ සිළුමිණ ජ්‍යෙෂ්ඨ මාධ්‍යවේදිනී නිශානි ලසිතා හේරත් බන්නැහැක මෙහි ගැමි චරිතයකට පණ පොවන අතර, ඇගේ දරු දෙදෙනා වන චමනී මනීෂා මධුභාෂිණී බන්නැහැක හා විමුක්ති සංජය සහන් ලෝචන බන්නැහැක මෙහි ළමා චරිතවලට ජීවය දෙති.

කොළඹ විශ්වවිද්‍යාලයේ ජනමාධ්‍ය උපාධිධාරිනියක වන නිශානි 2002 වසරේ හොඳම මාධ්‍යවේදිනිය ලෙස ජනාධිපති සම්මාන ශිෂ්‍යත්වය ලබමින් එංගලන්තයේ සංචාරය කළාය. ඇය 2003 වසරේ හොඳම වෘත්තීය කාන්තාව ලෙස කාන්තා හා වාණිජ මණ්ඩලයේ ඇගයීමටද ලක් වූවාය.

දයාරත්න රටගෙදරගේ 'දොළොස්මහේ අපි' තුසිත ජයවර්ධනගේ ඒකාංගික ටෙලිනාට්‍යයක හා වෙළෙඳ දැන්වීම් කීපයක ද රංගනයෙන් දායක වී ඇත. ගාමිණී ද සිල්වා මහතාගේ ශේක්ස්පියර් කේන්ද්‍රය හා එක්වෙමින් ජූලියස් සීසර් පුහුණුවීම්වල යෙදෙයි.

කොළඹ යශෝධරා විද්‍යාලයේ උසස් පෙළ වාණිජ අංශයේ ඉගෙනුම ලබන මධුභාෂිණී විද්‍යාලයීය කැරම්, නර්තන, බාලදක්ෂ, පිහිනුම් කණ්ඩායම්වල දක්ෂතා දක්වයි. කොළඹ අශෝක විද්‍යාලයේ ඉගෙනුම ලබන සහන් ලෝචන විද්‍යාලයේ නාට්‍ය කණ්ඩායමේ දීප්තිමත් ශිෂ්‍යයකු වන අතර, පාසල් ක්‍රිකට්, කරාතේ, බාලදක්ෂ, පිහිනුම් හා නව නිර්මාණ කවයේ සාමාජිකයෙකි.

හදිසි අනතුරකින් මවුපියන් අහිමිව මහවනය මැද හැදී වැඩුණු කුඩා දරුවකු වටා ගෙතුණු ත්‍රාසය, භීතිය, කුතුහලය සපිරි සිද්ධි දාමයකින් යුත් 'අපට සැදුණු අපේ ලෝකය' මංගල දර්ශනය පසුගියදා කොළඹ ලිබර්ටි සිනමා ශාලාවේදී චිත්‍රපට සංස්ථාවේ සභාපති ඇතුළු නළු නිළියන් හා විශාල පිරිසකගේ සහභාගිත්වයෙන් පැවැත්විණි.



'අපට සැදුණු අපේ ලෝකය චිත්‍රපටයේ'

මේ චිත්‍රපටයේ මේනක රාජපක්ෂ, නෙහාරා පීරිස්, කවීතා අංජලී, රජිත රොද්‍රිගු, රජීව් නානායක්කාර, සුනිල් හේරත්, වසන්ත දැරණියගල, කුවේට් කුමාරි, රාජ් මෙන්ඩිස් ඇතුළු විශාල පිරිසක් රංගනයෙන් දායක වෙති. නර්තන වින්‍යාසය බිගුනි නිසංකාගෙනි. මේ චිත්‍රපටයේ ප්‍රධාන ළමා චරිතයට ජීවය දෙන්නේ ළමා චිත්‍රපට කීපයක රංගනයෙන් දායක වී ඇති පංකජ චන්දෙව් ඉපලවත්තයි.

අධ්‍යක්ෂ ලාල් ප්‍රියදේවයන්ගේ බාල පුතු වන චන්දෙව් කොරතොට ශ්‍රී සෝමානන්ද මහා විද්‍යාලයේ ශිෂ්‍යයෙකි.

## ● නැකතට පැළයක්: ● අවබෝධතා ගිවිසුමටත් අත්සන්:

# ජාතික රුක් රෝපණ නැකතේදී පැළ සිටුවීමේ වැඩපිළිවෙළක්



**බුද්ධිකා ඉඹුලාන**

සිංහල හා හින්දු අලුත් අවුරුදු උත්සවයේ නැකැත්වලට සමගාමීව අප්‍රේල් මස 16 වැනි දින පෙරවරු 6.40ට යෙදෙන ජාතික රුක් රෝපණ නැකතේ දී රට පුරා ගෙවතුවල රුක්රෝපණය කිරීමේ වැඩපිළිවෙළක් ඇරඹීමට පරිසර අමාත්‍යාංශය කටයුතු යොදා තිබේ.

ඒ අනුව එකම මොහොතක දිවයින පුරා පිහිටි නිවාස සහිත ගෙවතු මිලියන 5.3ක පැළ රෝපණයට ජනතාව උනන්දු කරවීමට ඔවුන් දැනුම්වත් කිරීමේ වැඩසටහනක් ද ඇරඹීමට සැලසුම් කර තිබේ. මේ කටයුතු සඳහා නැකතට පැළයක් ජාතික රුක්රෝපණ වැඩපිළිවෙළ ඇරඹීමට අවශ්‍ය ප්‍රචාරක කටයුතුවලට සහයෝගය ලබාදීමට ජාතික නාලිකාව වන ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවත්, ඩයලොග් ආයතනයත් පරිසර අමාත්‍යාංශය සමඟ එක්විය.

මීට අදාළ අවබෝධතා ගිවිසුම්වලට අත්සන් තැබීම පසුගියදා(10 ) පරිසර අමාත්‍යාංශයේ දී ඇමැති මහින්ද අමරවීර මහතාගේ ප්‍රධානත්වයෙන් සිදු කෙරිණි.

පරිසර අමාත්‍යාංශය වෙනුවෙන් ලේකම් විශේෂඥ වෛද්‍ය අනිල් ජාසිංහ, ශ්‍රී ලංකා රූපවාහිනි සංස්ථාව වෙනුවෙන් සභාපති වෛද්‍ය නිහාල් ජයතිලක, ඩයලොග් සමාගම වෙනුවෙන් සමූහ අධ්‍යක්ෂ හර්ෂ සමරනායක මහත්වරු අත්සන් තැබූහ.

මෙහිදී නැකතට පැළයක් වැඩපිළිවෙළ සංකේතවත් කරමින් ඇමැතිවරයා විසින් මී පැළ කීපයක් අදාළ පාර්ශ්වකරුවන් වෙත ප්‍රදානය කරනු ලැබීය.

මෙහිදී ඇමැති මහින්ද අමරවීර මහතා කියා සිටියේ මේ නැකත ඉතා දුර්ලභ රුක්රෝපණ නැකතක් බව ජ්‍යොතිෂවේදීන් අවධාරණය කර ඇති බවයි.


දිවයිනේ ගෙවතු සහිත නිවාස මිලියන 5.3ක් තිබෙන අතර ඉන් අඩු තරමින් මිලියන 03කවත් පැළ රෝපණයට යොමු කරවා ගැනීම තම අරමුණ බව ද ඇමැතිවරයා කීය.

### ඩෙන්මාර්කය - නෝර්වේ - තායිලන්තය

# කොවිෂීල්ඩ් එන්නත්කරණය අත්හිටුවයි

## රුධිර කැටිගැසීම් වාර්තා වෙයි:



රුධිර කැටි ගැසීම් පිළිබඳ වාර්තා වීම හේතුවෙන් තායිලන්තය ඔක්ස්ෆර්ඩ් ඇස්ට්‍රාසෙනෙකා කොවිෂීල්ඩ් එන්නත ලබා ගැනීම ප්‍රමාද කර ඇත. එරට අගමැතිවරයා සිකුරාදා එන්නත ලබා ගැනීමෙන් රටේ එන්නත් කිරීමේ ක්‍රියාවලිය නතර කිරීමට නියමිතව තිබුණි. මෙය දැන් අවලංගු කර ඇත. ඩෙන්මාර්කය, නෝර්වේ ඇතුළු රටවල් ගණනාවක් මේ එන්නත් භාවිතය අත්හිටුවීමෙන් පසුව මේ ප්‍රමාදය පැමිණ තිබේ. යුරෝපීයයන් මිලියන 5 ක් පමණ දැනටමත් ඇස්ට්‍රාසෙනෙකා එන්නත ලබාගෙන ඇත. මේ සංඛ්‍යාවෙන් 30 ක් පමණ වාර්තා වී ඇත්තේ "ත්‍රොම්බොම්බොලික් සිදුවීම්" - හෝ රුධිර කැටි ගැසීම් වර්ධනය වීමෙනි. යුරෝපීය ඖෂධ ඒජන්සිය (ඊඑම්ඒ) බ්‍රහස්පතින්දා කියා සිටියේ, ඒ එන්නත මගින් රුධිර කැටි ගැසීම් ඇති බවට කිසිදු සාක්ෂියක් නොමැති බවයි. ඇස්ට්‍රාසෙනෙකා පැවසුවේ සායනික අත්හදා බැලීම්වල දී ඖෂධයේ ආරක්ෂාව පිළිබඳ පුළුල් ලෙස අධ්‍යයනය කර ඇති බවයි.



# චීන ඔලිම්පික් කමිටුව තරගකරුවන්ට එන්නත් මාත්‍රාවක් දෙයි

චීන ඔලිම්පික් කමිටුව ගිම්හාන ක්‍රීඩා සහ 2022 බීජිං හි පැවැත්වෙන ශීත ක්‍රීඩා උළෙළ සඳහා තරග කරන අයට කොවිඩ් එන්නත් මාත්‍රාවක් ලබා දී තිබේ. අන්තර්ජාතික ඔලිම්පික් කමිටුවේ (අයි.ඕ.සී.) සභාපති තෝමස් බැච් විසින් මේ පුවත ලබා දුන් අතර, ප්‍රමාද වූ ටෝකියෝ 2020 ජූලි 23 වනදා ආරම්භ වන බව බදාදා යළිත් කියා සිටියේය. "ඔලිම්පික් හා පැරාලිම්පික් කණ්ඩායම සඳහා මේ අතිරේක එන්නත් සඳහා අයි.ඕ.සී. විසින් මුදල් ගෙවනු ඇත. ශීත සෘතු ඔලිම්පික් උළෙළ පෙබරවාරි මාසයේ ආරම්භ වේ. මේ එක් එක් මාත්‍රාව සඳහා, අදාළ රටවල ජනගහනයට අනුපාතිකව ගත හැකි තවත් මාත්‍රාවන් දෙකක් සඳහා අයි.ඕ.සී. විසින් ගෙවනු ලබයි.

මේ අතර, එක්සත් ජනපද ඔලිම්පික් හා පැරාලිම්පික් කමිටුවේ ප්‍රධාන විධායක සාරා හර්ෂ්ලන්ඩ් පැවසුවේ අමෙරිකා එක්සත් ජනපදයේ ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට ඔවුන්ගේ අත්හදා බැලීම්වලට පෙර එන්නත් ලබා දිය හැකි බවයි.

"මලල ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ පුළුල් පදනමට අපි මුලින් සිතුවාට වඩා ඉක්මනින් එන්නත ලබා ගත හැකිය," ඇය පැවසුවාය. ජපානයේ පැවැත්වෙන ඔලිම්පික් උළෙළ නැරඹීමට විදේශීය ප්‍රේක්ෂකයන්ට ඉඩ දිය යුතුද යන්න පිළිබඳව කිසිදු තීරණයක් ගෙන නොමැති බව ටෝකියෝ 2020 ප්‍රධානී සයිකෝ හෂිමොටෝ බ්‍රහස්පතින්දා පැවසීය.



# එන්නත දුන්නොත් ජූලි වෙද්දී කොවිඩ්වලින් 'අමෙරිකාවට නිදහස' සලකුණු කළ හැකියි

## ජනාධිපති ජෝ බයිඩන්

මිනිසුන්ට ප්‍රතිශක්තිකරණ එන්නත් ලබා දුන්නොත් ජූලි 4 වැනිදින කොවිඩ් -19 වෙතින් අමෙරිකාවට "නිදහස සලකුණු" කළ හැකියැයි තමා බලාපොරොත්තු වන බව ජනාධිපති ජෝ බයිඩන් පවසා තිබේ. ජනාධිපති ලෙස සිය පළමු ප්‍රධාන දේශනයේදී බයිඩන් මහතා කියා සිටියේ මැයි 1 වන විට සියලුම වැඩිහිටියන් එන්නත් සඳහා සුදුසුකම් ලබාදෙන ලෙසට ප්‍රාන්තවලට නියෝග කරන බවයි. වර්තමාන පියවර වයස හෝ සෞඛ්‍ය තත්ත්වය අනුව මිනිසුන්ට ප්‍රමුඛත්වය දෙයි. ඔහුගේ කතාව පැමිණෙන්නේ වසංගතය වසංගතයක් ලෙස වර්ගීකරණය කළ දින සිටය. අමෙරිකානුවන් මිලියන භාගයක් මිය ගොස් ඇත. පසුගිය මාර්තු මාසයේදී එක්සත් ජනපදයේ සියලුම ප්‍රධාන ක්‍රීඩා උත්සව අවලංගු කරන ලද අතර ටොම් හැන්ක්ස් තමාට වයිරසය වැලඳී ඇති බව ප්‍රකාශ කළේය. එවකට ජනාධිපති ඩොනල්ඩ් ට්‍රම්ප් යුරෝපයේ සිට සංචාරය අත්හිටුවා ඇති අතර එක්සත් ජනපදය නැවත පාස්කු උත්සවයට විවෘත වනු ඇතැයි තමන් අපේක්ෂා කරන බව පැවසීය.

ජනාධිපති බයිඩන් සිය කතාවේදී කුඩා කණ්ඩායම්වලට නැවත එකතු විය හැකි දින දර්ශනයේ වැදගත් දිනයක් ද නිරීක්ෂණය කළේය. "අපි මෙය එකට කළහොත්, ජූලි 4 වන විට ඔබට, ඔබේ පවුලේ අයට සහ මිතුරන්ට ඔබේ පිටිපස්සේ එකට එකතු වී නිදහස් දිනය සැමරීමට හොඳ අවස්ථාවක් තිබේ" ඔහු පැවසීය. නිදහස් දිනය සැමරීමට පමණක් නොව "මේ වයිරසයෙන් නිදහස් වීම" ද රටට හැකි වනු ඇතැයි ඔහු වැඩිදුරටත් පැවසීය. එන්නත් ව්‍යාප්ත කිරීමේ සැලසුමේ කොටසක් ලෙස, මිනිසුන්ට ප්‍රතිශක්තිකරණය ලබා ගත හැකි ස්ථාන සංඛ්‍යාව පශු වෛද්‍යවරුන් හා දන්ත වෛද්‍යවරුන් සමඟ වැඩි කරනු ඇත. අඩු පහසුකම් සහිත ප්‍රජාවන්ට එන්නත් ලබාදීමට ජංගම ඒකක ප්‍රාදේශීය ප්‍රජාවන් වෙත ගමන් කරන බව ද ජනාධිපතිවරයා ප්‍රකාශ කළේය.

# ලෝකය දැන් උපරිම නිවුන් දරුවන් කරා ඇවිත්



## පර්යේෂකයෝ පෙන්වා දෙති

වෙන කවරදාකටත් වඩා නිවුන් දරුවන් බිහිවන නමුත් ලෝකය දැන් උපරිම නිවුන් දරුවන් කරා පැමිණ ඇති බව පර්යේෂකයෝ පවසති. ලොව පුරා සෑම වසරකම නිවුන් දරුවන් මිලියන 1.6 ක් පමණ උපත ලබන අතර සෑම දරුවන් 42 දෙනෙකුගෙන් එක් අයෙකු නිවුන් දරුවන් ලෙස උපත ලබයි. ප්‍රමාද වූ දරු ප්‍රසූතිය සහ IVF වැනි වෛද්‍ය ක්‍රමවේදයන් 1980 දශකයේ සිට නිවුන් දරු උපත් අනුපාතය තුනෙන් එකකින් ඉහළ



ගොස් තිබේ. එහෙත් ගැබ් ගැනීමකට එක් ළදරුවකු වෙත අවධානය යොමුවීම අවදානම් අඩු බැවින් එය මෙතැන් සිට පහළට බැස යා හැකිය.

හියුමන් රීප්‍රඩක්ෂන් නම් සඟරාවේ ගෝලීය දළ විශ්ලේෂණයකට අනුව, වසර 30 කට වැඩි කාලයක් තුළ සෑම කලාපයකම ද්විත්ව අනුපාත ඉහළ යෑම නිසා, ආසියාවේ 32% ක ඉහළ යාමක සිට උතුරු අමෙරිකාවේ 71% දක්වා ඉහළ යාම නිසා මේ උපරිමය ළඟා විය. පර්යේෂකයෝ 2010 සිට 2015 දක්වා රටවල් 165 කින් ද්විත්ව අනුපාත පිළිබඳ තොරතුරු රැස් කළ අතර ඒවා 1980 සිට 1985 දක්වා අනුපාත සමඟ සසඳති. දරු ප්‍රසූතිය දහසකට උපත ලැබූ නිවුන් දරුවන්ගේ සංඛ්‍යාව දැන් යුරෝපයේ සහ උතුරු අමෙරිකාවේ විශේෂයෙන් ඉහළ මට්ටමක පවතී. එහෙත් අප්‍රිකාවේ ද්විත්ව අනුපාතය සෑමවිටම ඉහළ මට්ටමක පවතින අතර පසුගිය වසර 30 තුළ බොහෝ දුරට වෙනස් වී නොමැත. එය ජනගහන වර්ධනය නිසා විය හැකියැයි විද්‍යාඥයෝ කියති.

# නෙදර්ලන්තයේ සත්වෝද්‍යානයක 'තෝර්' නම් සිංහයාට සැත්කමක්







## තෝර්ගේ ඩීඑන්ඒ ප්‍රමාණවත්

නෙදර්ලන්තයේ සත්වෝද්‍යානයක සිංහයකුට පසුගිය වසරේ පැටවුන් පස්දෙනෙකු ලැබීමෙන් පසු උඟව වාසෙත්තමි ශල්‍යකර්මයකට ලක් කර ඇත. තෝර් නම් 11 හැවිරිදි සිංහයා පැටවුන් දෙදෙනෙකු බිහි කළේය. පළමුවැන්නා නිවුන් දරුවන් බිහි කළ අතර දෙවැන්නාට තිදෙනෙක් සිටියහ. ලෝක වනජීවී අරමුදල පවසන්නේ පසුගිය වසර 20 තුළ වනාන්තරයේ සිංහ ගහණය 30-50% කින් අඩු වී ඇති බවයි. එහෙත් බ්‍රහස්පතින්දා සැත්කම සිදු කළ පශු වෛද්‍ය හෙන්ක් ලූටන් පැවසුවේ සත්වෝද්‍යානයට දැන් තෝර්ගේ ඩී.එන්.ඒ. ප්‍රමාණවත් බවයි. රොයිටර් පුවත් සේවයට අදහස් දක්වමින් ඔහු පැවසුවේ "අපට බොහෝ පැටවුන් සිටින අතර ජාන සංචිතය අධික ලෙස තදබදයට ලක්කර ගැනීමට අපට අවශ්‍ය නැත". වසර 35 කට පසු මම මෙහි පශු වෛද්‍යවරයකු ලෙස කටයුතු කළ පළමු අවස්ථාව මෙයයි. මම මේ මෙහෙයුම සිංහයන් මත සිදු කළායැයි ලූටන් මහතා කීවේය.

# MARKET PRICE

**පොල් සංවර්ධන අධිකාරිය විසින් ප්‍රකාශිත පොල් ද්‍රව්‍ය මිල ගණන්**
**ප්‍රකාශිත දිනය 2021-03-12**

**1. පොල් මිල**
(අ) වෙළෙඳ පොළ මිල ගණන් 2021.02.19-2021.02.25 (මූලාශ්‍රය - HARTI)

| | | තොග මිල | සිල්ලර මිල |
|---|---|---|---|
| ලොකු ප්‍රමාණය | ගෙඩියක මිල රු. | 85.00 - 90.00 | 90.00 - 120.00 |
| කුඩා ප්‍රමාණය | ගෙඩියක මිල රු. | 75.00 - 80.00 | 80.00 - 100.00 |

(ආ) පොල් සංවර්ධන අධිකාරියේ පොල් වෙන්දේසිය (කොළඹ) 24/09/2020
(කර්මාන්තයට යොදනු ලබන)
සාමාන්‍ය මිල ලෙලි ගසන (රු.ගෙඩි 1000ක්)
56,493.75 වි ඉදිරිපත් කළ ගෙඩි 707,125 විකුණු ගෙඩි 529,709
(ඇ) පොල් සංවර්ධන අධිකාරියේ ප්‍රාදේශීය පොල් වෙන්දේසිය (කුලියාපිටිය) – (2020/09/08)
සාමාන්‍ය මිල ලෙලි ගසන (රු./කි.ග්‍රෑ.01 ක් සඳහා
92-93 වි ඉදිරිපත් කළ ගෙඩි 195,481 විකුණු ගෙඩි 40,281
(ඈ) දේශීය ගොවිපොළ මිල රු/ගෙඩි 1000ක් (ලෙලි නොගසන)

| | රු/මෙ.ටො.1ක මිල (ලෙලි ගසන ලද) | |
|---|---|---|
| කුරුණෑගල දිස්ත්‍රික්කය | 50,000 -58,000 | 95,000 - 105,000 |
| පුත්තලම් දිස්ත්‍රික්කය | 50,000 -55,000 | 100,000 - 108,000 |
| ගම්පහ දිස්ත්‍රික්කය | 50,000 - 60,000 | 100,000 - 105,000 |
| හම්බන්තොට දිස්ත්‍රික්කය | 65,000 - 70,000 | 100,000 - 105,000 |

**2. කොප්පරා - දේශීය වෙළෙඳ පොළ මිල 12/03/2021**
කපන ලද කොප්පරා (රු./කි.ග්‍රෑ.250ක්) -
තෙල් සිඳින විශිෂ්ට අංක 1 කොප්පරා රු./කි.ග්‍රෑ.250ක්) 80,000
තෙල් සිඳින විශිෂ්ට අංක 2 කොප්පරා රු./කි.ග්‍රෑ.250ක්) 65,000
තෙල් සිඳින සාමාන්‍ය කොප්පරා රු./කි.ග්‍රෑ.250ක්)
කොප්පරා
පොල් සංවර්ධන අධිකාරියේ කොප්පරා වෙන්දේසිය (කොළඹ)
ඉදිරිපත් කළ කොප්පරා ප්‍රමාණය (කි.ග්‍රෑ.) -
විකුණු කොප්පරා ප්‍රමාණය (කි.ග්‍රෑ.) -
තෙල් සිඳින විශිෂ්ට අංක 1 කොප්පරා ඉහළ මිල (රු./කි.ග්‍රෑ. 250ක්)
තෙල් සිඳින විශිෂ්ට අංක 1 කොප්පරා සාමාන්‍ය මිල (රු./කි.ග්‍රෑ. 250ක්)
තෙල් සිඳින විශිෂ්ට අංක 1 කොප්පරා වෙළෙඳ පොළ මිල (රු./කි.ග්‍රෑ. 250ක්)
තෙල් සිඳින විශිෂ්ට අංක 2 සහ 3 කොප්පරා සාමාන්‍ය මිල(රු./කි.ග්‍රෑ. 250ක්)

**3. දිසිඳි පොල්**
සියුම් මධ්‍යම ශ්‍රී ලංකා (දේශීය) (රු./කි.ග්‍රෑ.1 ක්) 480 - 500සා
(රු./කි.ග්‍රෑ.1 ක්) 480 - 500 සා
ශ්‍රී ලංකා - නැව තෙක් මිල (රු./කි.ග්‍රෑ.1 ක්)

**4. පොල් තෙල් (තොග මිල)**
දේශීය මිල (රු./මෙ.ටො.1ක්) 480,000 - 515,000 සා
පිලිපීන් (මි.ර.ගැ/රොටඩෑම්) ඔයිල් වල්ඩ් (2021.03.04) (රු./මෙ.ටො.1ක්)309,301

**5. පුන්නක්කු** (රු./මෙ.ටො. 1ක්) 60,000 - 70,000 වි
**6. ගුදිරි කොහු** (රු/කි.ග්‍රෑ. 50ක්) 950 - 1,250 වි
**7. ඔමැට් කොහු** (රු/කි.ග්‍රෑ. 50ක්) 3,750 - 5,000 වි
**8. මිශ්‍ර කොහු** (රු/කි.ග්‍රෑ. 50ක්) 1,400 - 1,500 වි
**9. බ්‍රිස්ටල් කොහු බැමි 1** (රු/කි.ග්‍රෑ. 50ක්) 5,000 - 7,000 වි
**10. බ්‍රිස්ටල් කොහු බැමි 2** (රු/කි.ග්‍රෑ. 50ක්) 7,500 - 8,500 වි
**11. පොල් ලෙලි මිල** (18-02-2021)

| දිස්ත්‍රික්කය | පොල් ලෙලි 1000ක මිල (රුපියල්) |
|---|---|
| පුත්තලම | 4,500 - 5,000 |
| ගම්පහ | 4,500 - 5,000 |
| මාතර | 4,500 - 5,000 |
| කුරුණෑගල | 4,500 - 5,5 00 |

| | |
|---|---|
| තෙතමනය 50% | වැඩි පොල් ලෙලි (රු/කි.ග්‍රෑ. 1ක්) 7.00 |
| තෙතමනය 40% - 50% අතර | පොල් ලෙලි (රු/කි.ග්‍රෑ. 1ක්) 7.50 |
| තෙතමනය 30% - 40% අතර | පොල් ලෙලි (රු/කි.ග්‍රෑ. 1ක්) 8.50 |
| තෙතමනය 20% - 30% අතර | පොල් ලෙලි (රු/කි.ග්‍රෑ. 1ක්) 9.50 |
| තෙතමනය 10% - 20% අතර | පොල් ලෙලි (රු/කි.ග්‍රෑ. 1ක්) 10.50 |
| තෙතමනය 10% අඩු | පොල් ලෙලි (රු/කි.ග්‍රෑ. 1ක්) 13.00 |

**12. පොල් කටු** (රු/මෙ. ටො. 1ක්) 29,500 - 30,500 වි
**13. පොල් කටු අඟුරු** (2021-02-26 - 2021-03-04) (රු/මෙ.ටො. 1ක්) 110,000.00 වි
(තෙතමනය - 12%, අඟුරු කුඩු - 3%)
**14. පොල් ඉරටු** (රු./මෙ.ටො. 1ක්) 43,000 - 46,000 වි

**වි - විකුණුම් මිල** **සා - සාමාන්‍ය මිල**

## ඩෙටෝල් වෙතින් පුද්ගල ආරක්ෂණ කට්ටල 3,000ක පරිත්‍යාගයක්



කොවිඩ් මඩින සටනට දැක්වූ අඛණ්ඩ දායකත්වය තවත් පියවරක් ඉදිරියට ගෙන යමින්, රෙකිට් බෙන්කිසර් ලංකා සමාගමේ ඩෙටෝල් සන්නාමය විසින් මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ගේ ආරක්ෂාව වෙනුවෙන් පුද්ගල ආරක්ෂක කට්ටල 3,000 ක් පසුගියදා පරිත්‍යග කෙරිණි. මෙම පුද්ගල ආරක්ෂක කට්ටල තොගය පසුගියදා ඩෙටෝල් නියෝජිතයන් පිරිස විසින් සෞඛ්‍ය අමාත්‍යාංශයේදී නිල වශයෙන් බලධාරීන් වෙත ලබා දෙන ලදී.

(වමේ සිට දකුණට) සෞඛ්‍ය අමාත්‍යාංශයේ ආයතින සංවර්ධන අධ්‍යක්ෂිකා වෛද්‍ය තිළිනා වනිගසේකර, කොළඹ දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෛද්‍ය ඉන්දික ජාගොඩ, සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජෙනරාල් වෛද්‍ය අසේල ගුණවර්ධන, රෙකිට් බෙන්කිසර් ලංකා සමාගමේ ඩෙටෝල් නිෂ්පාදන සමූහ කළමනාකරු ටෙහාන් සමරසිංහ සහ එම සමාගමේ අලෙවි ප්‍රධානී ශමින්ද පෙරේරා යන මහත්ම මහත්මීන්.

## Centre for Global Education ඇරඹේ



ඉංජිනේරු හා තාක්ෂණික අධ්‍යාපනය සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම ආයතනය වන Sri Lanka Technological Campus (SLTC) මෑතකදී කොළඹ SLTC Trace Expert City හිදී Virtual ක්‍රමයට පවත්වන ලද විශේෂ උත්සවයකදී ඕස්ට්‍රේලියාවේ Deakin University සමඟ ඇති කර ගෙන ඇති හවුල්කාරීත්වය තව දුරටත් දීර්ඝ කිරීම සඳහා වන ගිවිසුමට අත්සන් තැබීය. Deakin විශ්වවිද්‍යාලය යනු උසස් තත්ත්වයේ හා ශිෂ්‍ය ශිෂ්‍යාවන් තෘප්තිමත් වන ආකාරයේ අධ්‍යාපනයක් දීම සම්බන්ධයෙන් ඕස්ට්‍රේලියාවේ ප්‍රමුඛතම විශ්වවිද්‍යාලයක් ලෙස සැලකේ.

මේ අවස්ථාවට සමගාමීව Centre for Global Education ආයතනය නිල වශයෙන් ආරම්භ කිරීමද කරන ලදි. මේ ආයතනය දේශීය ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට අන්තර්ජාතික තලයේ අධ්‍යාපනයක් සහ ඒ සඳහා අවශ්‍ය සම්පත් පිරිනමන මධ්‍යස්ථානයක් ලෙස ක්‍රියාත්මක වනු ඇත. හවුල්කාරීත්ව ගිවිසුම සඳහා Deakin University වෙනුවෙන් එහි නියෝජ්‍ය උපකුලපති (අන්තර්ජාතික සම්බන්ධතා) මහාචාර්ය ගැරී ස්මිත් විසින්ද, SLTC ආයතනය වෙනුවෙන් එහි නිර්මාතෘ - සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරී ඉංජිනේරු රංජිත් ජී. රුබසිංහ මහතා විසින්ද අත්සන් තැබිණි.

# රට වටා මිල ගණන්



| පහත රට එළවළු | නාරාහේන්පිට ආ. ම. සිල්ලර මිල රු. | රත්මලාන ආ. ම. සිල්ලර මිල රු. | වැලිසර. ආ. ම. සිල්ලර මිල රු. | මීගොඩ ආ. ම. තොග මිල රු. | තඹුත්තේගම ආ. ම. තොග මිල රු. | දඹුල්ල ආ. ම. තොග මිල රු | නුවරඑළිය ආ. ම. | මිල රුපියල් තොග මිල රු. |
|---|---|---|---|---|---|---|---|---|
| වට්ටක්කා | 120 | 140 | 120 | 90-100 | 80 | 70-80 | ගෝවා | 100 |
| අළු කෙසෙල් | 140 | 130 | 90 | 60 | 30-40 | 50-60 | කැරට් | 150 |
| පිපිඤ්ඤා | 80 | 90 | 60 | 40 - 50 | 20-25 | 20-22 | ලීක්ස් | 70 |
| වැටකොළු | 200 | 190 | 150 | 140 | 160 | 90-100 | රාබු | 60 |
| බණ්ඩක්කා | 120 | 110 | 110 | 90-100 | - | 70-80 | බීට්රූට් | 70 |
| කරවිල | 200 | 190 | 150 | 140 | 160 | 90-100 | අර්තාපල් | 90 |
| පතෝල | 120 | 110 | 110 | 70-80 | 110-130 | 50-60 | අර්තාපල් රතු | 120 |
| මාළු මිරිස් | 320 | 290 | 80 | 220-250 | 90 | 220-230 | නෝකෝල් | 120 |
| බටානා | 160 | 130 | 260 | 100 | 270 | 75-80 | බෙල්පෙපර් රතු | 80 |
| මුරුංගා | 600 | | - | | | | කහ | 900 |
| එළබටු | 140 | 130 | - | 60-80 | 80 | 50-60 | කොළ | 1000 |
| කැකිරි | 110 | 80 | 90 | 60 | 35-45 | 60-70 | බැසිල් | 500 |
| නෝකෝල් | 160 | 130 | 90 | 80 | 100 | 75-80 | චයිනීස් කැබේජ් | 330 |
| මඤ්ඤොක්කා | 80 | 80 | - | - | 30-40 | 30-35 | රෙඩ් කැබේජ් | 220 |
| බතල | 100 | - | 70 | - | 90-100 | 40-45 | සැල්දිරි | 550 |
| දඹල | 140 | 150 | 70 | 60 | 40-50 | 60-70 | කොත්ත මල්ලි කොළ | 170 |
| මැකරල් | 140 | 100 | 110 | 80 | 60 | 60-70 | අයිස්බර්ග් | 300 |
| **උඩරට එළවළු** | | | | | | | සලාද | 110 |
| බෝංචි | 240-260 | 190 | 180 | 120-160 | 140-160 | 130-135 | රතුසලාද | 550 |
| ගෝවා ගෙඩි | 160 | 140 | 160 | 120-130 | | 70-60 | මිංචි | 170 |
| කැරට් | 200 | 180 | 200 | 160-170 | 160-180 | 120-130 | පාස්ලි | 550 |
| ලීක්ස් | 140 | 130 | 120 | 90 | 85-90 | 100-130 | රූබා | 80 |
| රාබු | 120 | 100 | 60 | 60-80 | 90 | 20-25 | රෝස්මරි | 700 |
| තක්කාලි | 200 | 190 | 170 | 110 | - | 100-120 | බ්‍රොකෝලි | 1000 |
| බීට්රූට් | 140 | 130 | 120 | 80-90 | 80 | 75-80 | මල්ගෝවා | 850 |
| සලාද | 400 | 210 | 400 | - | 250-300 | 70-80 | රතුරාබු | 450 |
| ගෝවා කොළ | 140 | - | 120 | 20-30 | - | - | පැවර්ලි | 150 |
| **පලතුරු** | | | | | | | සුකිනි | 270 |
| අන්නාසි | 120-110 | 130 | 100 | 120 | 110 | 75-100 | කහ සුකිනි | 270 |
| ඇඹුල් කෙසෙල් | 120 | 100 | 70 | 70 | 20-50 | 60-65 | දිගරාබු | 220 |
| කෝලිකුට්ටු | 200 | 180 | 170 | 150 | 130-140 | 120-135 | තක්කාලි | 220 |
| සීනි කෙසෙල් | 130-120 | 120 | 90 | 80 | 30-60 | 60-65 | මාළුමිරිස් | 320 |
| ඇම්බුත් | 200 | 180 | 160 | - | - | - | | |
| ගස් ලබු (රෙඩ්ලේඩි) | - | 80 | 120 | - | - | - | | |
| ගස්ලබු | 140 | 100 | 120 | 110 | 60-100 | 70-80 | | |
| ඇපල් (ආනයනික) | 70-80 | 200 (1kg) | 70 | - | 30-65 | - | | |
| මිදි (දේශීය) | - | - | - | - | - | - | | |
| මිදි (ආනයනික රතු) | 1100 | 1200 | 900 | - | - | - | | |
| මිදි (ආනයනික කොළ) | 1000 | 1200 | 950 | - | - | - | | |
| **මස්** | | | | | | | | |
| කුකුළු මස්- අලුත් (සම රහිත) | - | 590 | 550 | - | - | - | | |
| කුකුළු මස් -ශීත කළ (සම සහිත) | - | 420 | 500 | - | - | - | | |
| **අනෙකුත්** | | | | | | | | |
| අමු මිරිස් | 280 | 290 | 210 | - | - | 180-200 | | |
| දෙහි | 160 | 190 | 90 | 60 | - | 75-80 | | |
| අමු ඉඟුරු | 240 | 330 | 50 | - | - | 170 | | |
| **සහල්** | | | | | | | | |
| රතු නාඩු | 96 | 110 | 106 | 98 | 95 | - | | |
| සුදු නාඩු | 96 | 105 | 93 | 94-96 | 95 | - | | |
| රතු කැකුළු | 93 | 98 | 95 | - | - | - | | |
| සුදු කැකුළු | 93 | 100 | 120 | 90-92 | 91-94 | - | | |
| සුදු කැකුළු සම්බා | 98 | 135 | 120 | - | - | - | | |
| තම්බපු කැකුළු සම්බා | 98 | 150 | - | 114-115 | - | - | | |
| කිරි සම්බා | 150 -160 | 155 | 160 | | | | | |

## දවසේ රාහු කාලය

මාර්තු 13 සෙනසුරාදා උදේ 09.19 - 10.50 රාත්‍රී 09.21 - 10.51 දක්වා



සුබසෙත ජ්‍යෙෂ්ඨ කර්තෘ ප්‍රවීණ ජ්‍යෝතිෂවේදී **අජිත් ධර්මසිරි**

## දින තත්ත්වය

කුම්භ රවි 29 භාග නවම් අව අමාවක තිථිය ලත් ශනි දින ඉර උදාව 06.08 ට ඉර බැසීම 06.22 ට පුවපුටුප නැකත දවස පුරාම යෙදී පවතී. අමාවක තිථිය සවස 03.55 ත් ගෙවී මැදින් පුර පෑලවිය තිථිය ලබා පවතී. සාධතී යෝගය යෙදේ, 07.56 න් ගෙවී ශුභ යෝගය ලබයි. චතුෂ් පාද කරණය අලුයම 03.26 න් ගෙවී නාග කරණය ලබා එය සවස 03.55 න් ගෙවී කිංස්තුංගකරණය ලබා පවතී.

## දවසේ කාල හෝරාව ගෙවී යන අයුරු

**උදේ**

06.18 සිට 07.18 දක්වා - සෙනසුරු හෝරාව
07.18 සිට 08.18 දක්වා - ගුරු හෝරාව
08.18 සිට 09.18 දක්වා - කුජ හෝරාව
09.18 සිට10.18 දක්වා - රවි හෝරාව
10.18 සිට11.18 දක්වා - සිකුරු හෝරාව
11.18 සිට12.18 දක්වා - බුධ හෝරාව

**සවස**

12.18 සිට 01.18 දක්වා - සඳු හෝරාව
01.18 සිට 02.18 දක්වා - සෙනසුරු හෝරාව
02.18 සිට 03.18 දක්වා - ගුරු හෝරාව
03.18 සිට 04.18 දක්වා - කුජ හෝරාව
04.18 සිට 05.18 දක්වා - රවි හෝරාව
05.18 සිට 06.18 දක්වා - සිකුරු හෝරාව

**රාත්‍රී**

06.18 සිට 07.18 දක්වා - බුධ හෝරාව
07.18 සිට 08.18 දක්වා - සඳු හෝරාව
08.18 සිට 09.18 දක්වා - සෙනසුරු හෝරාව
09.18 සිට 10.18 දක්වා - ගුරු හෝරාව
10.18 සිට11.18 දක්වා - කුජ හෝරාව
11.18 සිට12.18 දක්වා - රවි හෝරාව

**අලුයම**

12.18 සිට 01.18 දක්වා - සිකුරු හෝරාව
01.18 සිට 02.18 දක්වා - බුධ හෝරාව
02.18 සිට 03.18 දක්වා - සඳු හෝරාව
03.18 සිට 04.18 දක්වා - සෙනසුරු හෝරාව
04.18 සිට 05.18 දක්වා - ගුරු හෝරාව
05.18 සිට 06.18 දක්වා - කුජ හෝරාව

**බිළිඳා නාමය**

මෙදින දවස පුරාම පුවපුටුප නැකත යෙදී ඇති නිසා සෙ,සො,ද,දි අකුරු හා දිනයට අනුව හිමි ප,බ,හ,ම අකුරු මුල්කොට දරුවන්ට නම් තැබීම සුබයි.



අද සුබසෙත

## දවසේ ලග්න පලාපල

### මේෂ ලග්නය - ආර්ථිකය සුබවාදී වේ

මේෂ ලග්නයට අනුව ඔබට ආර්ථික දියුණුවක් පවතී. ලැබීම් අතින් යහපත්ය. තම එදිනෙදා කටයුතු ඉතා ලෙහෙසියෙන් කරගෙන යාමට හැකිවේ. රැකියා ස්ථානගත ගැටලු උවදුරු පැන නගින නමුත් ඒවා අවම කර ගැනීමට ඔබට වාසනාව මතු කරයි. දණහිස ආශ්‍රිත අපල ඇති කෙරේ. තම ඉදිරි සැලසුම්වලට බාධා කරන පිරිසක් නිසා කිසියම් සිත් රිදිල්ලකට හේතු විය හැක. අඹුසැමි ගැටලු අවම වන දිනයකි. හිතවතෙකුගේ හමුවීමක් අනාගත කටයුතු කෙරේ යහපත් බලපෑමක් ඇති කරයි. .

### වෘෂභ ලග්නය - භෞතික සම්පත් ලාභ

වෘෂභ ලග්නයට අනුව ඔබට කිසියම් භෞතික සම්පත් කෙරේ ලැබීම් ඇති දිනකි. වාහන ගනුදෙනුවකදී සැලකිලිමත් වන්න. නො එසේ නම් ඔබ රැවටීමකට හසුවීමට ඉඩ ඇති නිසාය. වාහනයක් වේවා ඉඩමක් නිවසක් පිළිබඳ ගනුදෙනුවකදී වුවද එසේ සැලකිලිමත් වීම සුබයි. තම ඥාති පාර්ශ්වයෙන් එල්ලවන විරෝධතා බහුල වුව ද තම පිරිසිදු බව නිවැරදි බව තහවුරු කිරීමට බොහෝ උපක්‍රම ඔබට ලැබෙන දිනයකි. උරහිසට අපලයි. නහරගත රෝග බහුල විය හැක.

### මිථුන ලග්නය - හදිසියේ එන ලිපියකින් සිතේ කණස්සල්ල

මිථුන ලග්නය හිමි ඔබට අද දින තම නිවසේ ආගමික කටයුත්තක් නිසා කාර්ය බහුල විය හැක. එක්කෝ එබඳු ආගමික කටයුත්තකට දුර බැහැරකට යාමට සිදුවනු ඇත. එහෙත් ඒවායේ නිසි පල ප්‍රයෝජන නො අඩුව ලැබෙන දිනයකි. පූජ්‍ය පක්ෂයේ පිළිගැනීමකට ලක්වේ. තම අභිවෘද්ධිය සඳහා සෙසු පිරිස් ඔබට අත් උදවු දෙන දිනයකි. හදිසියේ තමා වෙත එන ලිපියක් නිසා සිතට කරදර දෙන තත්ත්වයක් උදාවේ. ඒ තම බැංකුවකින් හෝ රක්ෂණ ආයතනයකින් විය හැක.

### කටක ලග්නය - යටපත් වූ ධනයක් යළි ලැබේ

කටක ලග්නයට අනුව අද දින ඔබගේ කේන්ද්‍රයේ චන්ද්‍රයා 08 ට පැමිණ ගත කරන කාලය තුළ කිසියම් ආර්ථික පාඩුවකට හේතු මතු කරයි. විවාහ ස්ථානගත මතභේද ආරවුල් ඇති විය හැකි. තුන්වන පාර්ශ්වයකින් උවදුරු පැමිණේ. සිතේ පවතින බලාපොරොත්තුවක් සුන් වන ලකුණු පෙනේ. තමා වචන ඉස්සර කර ගැනීම තුළ සතුරු පිරිස් නිර්මාණය වන දිනයකි. එහෙත් ඔබට හිමි විය යුතු ප්‍රතිලාභ අතර යටපත්ව තිබූ ධනයක් යළි ලැබෙන දිනයකි.

### සිංහ ලග්නය - මංගල යෝග සහිත වේ

සිංහ ලග්නයට අනුව අද ඔබට කිසියම් භෝජන සංග්‍රහයකට සහභාගි වීමට හැකිවන දිනයකි. පිටරටක හෝ දුර බැහැරකට ගොස් කාලයකට පසු පැමිණි අයකුගෙන් ඇරයුම් ලැබෙනු ඇත. ඒ නිසා තමාට ආර්ථික මෙන්ම ආධ්‍යාත්මික වශයෙන් ද ප්‍රයෝජනවත් දිනයකි. අවිවාහක අයට මංගල යෝජනා ද පැමිණේ. ඔබ තරුණ අයකු නම් ඔබට ආදරවන්තයකු හෝ ආදරවන්තියක පිළිබඳ තිබූ බලාපොරොත්තුව සපල වන දිනයකි. හිසේ පපුවේ සෙම ඇති වීමට ඉඩ ඇත.

### කන්‍යා ලග්නය - උදාසීන බව නිසා කටයුතු ගොඩගැසෙයි

කන්‍යා ලග්නයට අනුව අද ඔබට ගමෙන් හෝ නගරයෙන් දුර බැහැරකට යාමට සිදුවේ. ඒ නිසාම ශාරීරික පීඩා දැනෙන දිනයකි. තම වෙහෙසකාරී තත්ත්වය නිසා උදාසීන බව හා කම්මැලිකම වැනි කරුණු නිසා කටයුතු හකුළුවා තබනු ඇත. ඒ නිසාම රාජකාරි ගොඩගැසී තව තවත් මානසික අසහනය දලුලන දිනයකි. ඒ අනුව නිසි වේලාවට කටයුතු නිම කිරීමට හා වැඩ එකතුවීමට ඉඩ නොදී කටයුතු කිරීමට වග බලාගන්න. යටි බඩට අසුබයි. ආහාර පාන පිළිබඳ සැලකිලිමත් වන්න.

### තුලා ලග්නය - ව්‍යාපාරික දියුණුව

තුලා ලග්නයට අනුව අද දින තම ව්‍යාපාරික දියුණුව හා වෙහෙසෙන තරමට ප්‍රතිඵල ලැබෙන දිනයකි. තම කටයුතු පහසු කර ගැනීමට පැමිණෙන පිරිස බහුල වේ. එසේම තමා නව ආයෝජන කෙරේ නව සැලසුම් ගොඩනගන දිනයකි. ඒ වෙනුවෙන් තම ව්‍යාපාරික කටයුත්තට අලුත් සාමාජික සාමාජිකාවන් පිරිසක් එක්කර ගැනීමට අවස්ථාව උදාවේ. ඒ වෙනුවෙන් ඔබට අවශ්‍ය ප්‍රතිපාදන හා මිල මුදල් ලැබෙන දිනයකි.

### වෘශ්චික ලග්නය - වාහන, ඉඩම් හා නිවාස හිමිකම්

වෘශ්චික ලග්නයට අනුව අද දින ඔබට ඉතා සුබවාදී දිනයකි. වාහන, ඉඩම් හා නිවාස හිමිකම මෙන්ම රැකියාගත අභිවෘද්ධිය මතු කෙරේ. තම දේපළකට කිසියම් දෙවන පාර්ශ්වයක් විසින් බලපෑම් කරනු ඇත. නීතිමය ගැටලු මෙන්ම විවිධ තර්ජන ගර්ජන එල්ල වනු ඇත. එහෙත් වැඩි පිරිසක් තමාගේ පාර්ශ්වයට සහයෝගය දැක්වීම තුළ එබඳු ගැටලු විසඳා ගැනීමට ඔබට හැකිය. පපුවේ සෙම ගතිය නිසා ශ්වසන අපහසුතා පැන නගින දිනයකි.

### ධනු ලග්නය - පරණ දේ විකුණා ආදායම් ලබයි

ධනු ලග්නයට අනුව පරණ වූ බඩු භාණ්ඩ අලෙවි කර ඉතා උසස් ආදායම් ලද හැකි දිනයකි. තවද පරණ නිවසක් අලුත්වැඩියා කිරීමක් හෝ මිල දී ගැනීමක් සිදුවේ. ඔබට මහපොළොවෙන් ලැබෙන වස්තු සම්පත් බහුල වන දිනයක් නිසා මැණික් හෑරීම් වැනි කටයුතුවලදී උසස් ප්‍රතිඵල උදාකර දෙන දිනයකි. උගුරේ ආසාදිත තත්ත්වයක් නිසා පීඩා විඳීමට සිදුවනු ඇත. තම දේපළකට කිසියම් පිරිසකගේ බාධා කිරීම් වැඩි වීමකට ඉඩ ඇත.

### මකර ලග්නය - යුගදිවියට බාධා

මකර ලග්නය හිමි ඔබට අද දින ජලාශ්‍රිත කටයුතු කෙරෙන් උවදුරු පෙන්වයි. දුර බැහැර ගමන් යෙදෙන අතර, එබඳු ස්ථානවල නුහුරු නුපුරුදු ජලාශ, වැව් , අමුණු , ගංගා ආශ්‍රිත මහ සයුර ආශ්‍රිත ජල ක්‍රීඩා, ස්නානය කිරීම් සුබ නැත. කෙසේ නමුදු තුනටිය ආශ්‍රිතව ද අසුබ පල කෙරේ. විවාහ ස්ථානගත ගැටලු මතු කෙරෙන අතර සතුරු බලවේග ක්‍රියාත්මක වීම නිසා තම විශ්වාසය පළුදු වන අතර යුගදිවියට එය බලපාන තත්ත්වයකි.

### කුම්භ ලග්නය - සතුට රජයන දිනක්

කුම්භ ලග්නය හිමි ඔබට අද දින ඉතා සතුටින් තම කටයුතු කරගෙන යාමට අධිෂ්ඨානය ලැබෙන දිනයකි. උත්සාහයේ තරමට ප්‍රතිඵල ලැබේ. අත්හැර දමා තිබූ කටයුත්තක් යළි ආරම්භ කිරීමට උනන්දු වන අතර, අධ්‍යාපනික ජයග්‍රහණ කීපයක් නිසා සමාජයේ කැපී පෙනෙන තත්ත්වයකට පත්වේ. රැකියාගත කාර්යබහුලතාව නිසා ශාරීරික වශයෙන් අපහසුතා දැනෙන අතර, සුපරික්ෂාකාරී නොවුවහොත් තම සුළු සුළු වැරදි නිසා සතුරු බලවේග ක්‍රියාත්මක වන දිනයක් ද වන්නට පුළුවන.

### මීන ලග්නය - විදේශ ආයෝජන

මීන ලග්නය හිමි ඔබට අද දින පිට රටකට යාමට වාසනාව හෝ පිටරටක සිට පැමිණෙන අයකු නිසා කාර්ය බහුල වන දිනයකි. එහෙත් ඔබට ආර්ථික ප්‍රතිලාභ ලැබේ. තම ව්‍යාපාර වේවා වෙනත් ආදායම් මාර්ගයක් වේවා වැඩි දියුණු කර ගැනීමට පියවර ගන්නා දිනයකි. පාදයේ වළලුකර ආශ්‍රිත උවදුරු පවතින අතර, ඒවා අවම කර ගැනීම් ඉතා සිහි කල්පනාවෙන් කටයුතු කරන්න. විදේශ ආයෝජනයකට ඔබට මග පෑදෙන අතර, තම ළඟ ඥාති මිත්‍රාදීන්ගෙන් ද ඒ සඳහා සහයෝගය ලැබෙනු ඇත.



# කාන්තාවනට නිසි ගෞරවයක් ඕනෑ කර තිබේ

"රටකි, දැයකි, ලොවකි" යන්න තේමා කරගත් අන්තර්ජාතික කාන්තා දිනය පසුගිය අටවැනි දින ඉතාමත් උත්කර්ෂවත් අන්දමින් සමරනු ලැබීය. නමුත් එම සැමරීමේ උණුසුම යන්නට ප්‍රථම කාන්තාවන්ට සිදුවන අගතීන් පිළිබඳ වාර්තාකරණයන් සුලබව දැකිය හැක. "අහසින් අඩක් දරා සිටින්නේ කාන්තාවයි" යන චීන කියමන අර්තවත් කරමින් වර්තමාන ලෝකය තුළ කාන්තාව ඉතා පුළුල් පරාසයක හිඳ පවත්නා වැඩ සමුදායන් රැසක් අන්තර්ගත විශාල චරිත රාශියකට පණ පොවමින් සිටී. මෙවැනි කියමන් උපුටා ගැනීම් හරහා සමාජයට දෙන්නා වූ පණිවුඩය නම් මවක ලෙස ස්ත්‍රියකට සමාජයෙන් හිමිවන ගරුත්වයයි. සමාජය තුළ විවිධ වයස් අවධීන් හරහා ස්ත්‍රිය විවිධ චරිත රඟ දක්වයි.

එනම් දැරියක, යෞවනියක, තරුණියක, බිරිඳක, මවක හා මිත්තණියක යන චරිත හරහා ය. එම සෑම අවධියකදීම කාන්තාවට විඳින්නට සිදුවන ගැහැට සුළුපටු නොවේ. කාන්තාව තම පවුල වෙනුවෙන්, සමාජය වෙනුවෙන් කරන ලද හෝ කරමින් පවතින කර්තව්‍යයන් උදෙසා පෙරළා ඇයට හිමි ගරුත්වය, වටිනාකම හා සෙනෙහස ලැබෙනවා ද යන්න ගැටලු සහගතය. ශ්‍රී ලංකාව තුළ පීතෘ මූලික සමාජ පද්ධතියක් නිර්මාණය වී තිබුණ ද කාන්තාවට ලැබිය යුතු ගරුත්වය අතීතයේ සිට ස්ථාපිතව තිබුණේ යුරෝපයේ කාන්තාව මුල් කරගනිමින් ස්ත්‍රීවාදය හෙවත් feminism ආරම්භ වීමට බොහෝ කලකට පෙරය. යුරෝපයේ ස්ත්‍රීවාදී අරගල කිහිපයක් ඇති වූ අතර දහනවවන හා විසිවන සියවසේ මුල් භාගයේදී සිදු වූ පළමු රැල්ල ප්‍රධාන වශයෙන් සැලකිලිමත් වූයේ කාන්තාවන්ගේ ඡන්ද අයිතිය පිළිබඳවය. දෙවන රැල්ල තුළින් සමාන නෛතික හා සමාජ අයිතිවාසිකම් සඳහා වන කාන්තා විමුක්ති ව්‍යාපාර පිළිබඳ අවධානය යොමු කරනු ලැබීය. ස්ත්‍රීත්වය මෙන්ම ලිංගභේදය හේතුකර ගනිමින් සමාජය තුළ ස්ත්‍රියට වෙන් වූ වැඩ කොටසක් පවතී. මේ වැඩ කොටස නිර්මාණය වී ඇත්තේ විවිධ දුර්මත චාරිත්‍ර හා විවිධ පිරිස් තුළ කාලයක් තිස්සේ පැවති ආකල්ප හේතුවෙනි.

කාන්තාව සම්බන්ධයෙන් බොහෝදෙනා සාකච්ඡා කරනු ලබන මාතෘකා නම් ලිංගික හිංසනය, ආගමික පරිසරය තුළින් කාන්තාව අගතියට ලක්වීම, ගෘහස්ථ කාන්තා හිංසනය, කාන්තාව හා අභියෝග හා කාන්තාවගේ දේශපාලන සහභාගිත්වය වැනි දෑ ය. නමුත් අවධානය අඩු වන්නා වූ සහ බොහොමයක් පිරිස් කතා නොකරන මාතෘකාවක් හෙවත් යටපත් කරනු ලබන මාතෘකාවක් නම් ආයතනික වැඩ පරිසරය තුළ කාන්තාවට සිදුවන අගතීන්ය. කාන්තාවට සිදුවන බොහොමයක් හිංසන, පෙළීම් හඳුනාගත හැකි ප්‍රධාන ක්ෂේත්‍රයක් වන්නේ ආයතනික වැඩ පරිසරයයි. කනගාටුවට කරුණක් නම් මේ පිළිබඳ සමාජ කතිකාවක් නිර්මාණය වී නොතිබීමය. පවරණ අධික වැඩ ප්‍රමාණය, තනතුරට නුසුදුසු වැඩ පැවරීම, ආයතන පද්ධතිය තුළ නිර්මාණය වී තිබෙන අයිතීන් නොලැබීම, සමස්ත රාජ්‍ය හා පෞද්ගලික සේවයේ කාන්තාවන්ට හිමිව තිබෙන්නා වූ විවිධ වරප්‍රසාද අහිමි කිරීම යනාදිය ප්‍රධාන වේ.



ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
**නිලූකා ප්‍රියදර්ශනී**
දේශපාලන විද්‍යා අධ්‍යයනාංශය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

1979 දී එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මහා මණ්ඩලය විසින් සම්මත කරන ලද කාන්තාවන්ට එරෙහි සියලු ආකාරයේ වෙනස්කම් කිරීම් තුරන් කිරීමේ සම්මුතිය (CEDAW) මේ කාරණාවලදී ඉතා වැදගත් වේ. බොහෝ අවස්ථාවලදී කාන්තාවන් සඳහා වන අන්තර්ජාතික අයිතිවාසිකම් පිළිබඳ පනතක් ලෙස එම සම්මුතිය විග්‍රහ කෙරේ. මේ සම්මුතියේ 5 වැනි වගන්තියෙන් නිරූපණය වන්නේ කාන්තාවන්ට එරෙහිව පවත්නා දුර්මත හා ලේබල් අහෝසි කරමු යන්නය. මේ සම්මුතිය පිළිගන්නා රාජ්‍යයන් සෑම ආකාරයකින්ම කාන්තාවන්ට වෙනස්කොට සැලකීම අවසන් කිරීම සඳහා පියවර මාලාවන් ගැනීමට ප්‍රමුඛ වී සිටිය යුතුය. ඒ සඳහා ස්ත්‍රීන් හා පුරුෂයන්ගේ සමානාත්මතාවය පිළිබඳ මූලධර්මය ඔවුන්ගේ නීති පද්ධතියට ඇතුළත් කිරීම, සියලු වෙනස්කොට සැලකීමේ නීති අහෝසි කිරීම සහ කාන්තාවන්ට වෙනස්කොට සැලකීම තහනම් කරන සුදුසු නීති සම්මත කිරීම, වෙනස්කොට සැලකීමට එරෙහිව කාන්තාවන්ගේ ආරක්ෂාව ඵලදායීව සහතික කිරීම සඳහා විනිශ්චය සභා සහ වෙනත් රාජ්‍ය ආයතන පිහිටුවීම සහ පුද්ගලයන්, සංවිධාන හෝ ව්‍යවසායන් විසින් කාන්තාවන්ට එරෙහි සියලු වෙනස්කම් කිරීම් ඉවත් කිරීම සහතික කිරීම යනාදී කරුණු කාන්තාවන්ට එරෙහි සියලු ආකාරයේ වෙනස් කිරීම් තුරන් කිරීමේ සම්මුතිය තුළ අන්තර්ගත වේ. ඉහතින් අඩංගු බොහොමයක් ප්‍රතිපත්තීන් ශ්‍රී ලංකාව තුළ ස්ථාපිතව පැවැතියත් ප්‍රායෝගික ක්‍රියාදාමය තුළ කාන්තාව වෙනස්කම්වලට භාජනය වීම ඍජුවම දැකගත හැකි ශෝචනීය කාරණාවකි. කාන්තා අයිතීන් පමණක් නොව අනෙක් බොහෝ දෙනෙකුගේ අයිතීන් සුරක්ෂා කිරීම උදෙසා නීති හා ආයතන ස්ථාපිතව පැවැතියත් ඒවා ප්‍රායෝගික තලය තුළ අකර්මන්‍යව තිබේ නම් එවැනි පොත් සරසන්නා වූ නීති හා ආයතනවලින් ඵලක් නොමැත. එමඟින් තවදුරටත් සිදුවන්නේ කාන්තාව අගතියට පත් වීමත්, අන්තර්ජාතිකව එකඟ වූ සම්මුතීන් විහිළුවක් බවට පරිවර්තනය වීමත් පමණක්ය.

ඉහතින් සඳහන් කළ පරිදි ලංකාවේ කාන්තාවන් සෑම රාජකාරි කොටසකදීම වෙනස්කම්වලට පාත්‍රවන අතර විවිධ හිංසනයන්ට ද නතුවේ. එමඟින් බොහොමයක් දෙනා මාතෘකා කර නොගන්නා ක්ෂේත්‍රයක් නම් ආයතනික වැඩ පරිසරය හරහා කාන්තාවට සිදුවන හිංසනයන්ය. ආයතනික වැඩ පරිසරය තුළ කාන්තාවන්ට සිදුවන වෙනස්කම්, පීඩන, අනිසි වැඩ පැවරීම්, ආයතන ප්‍රධානීන්ගේ තර්ජනාත්මක අභිනයන්ට හසුවීම යනාදිය ශ්‍රී ලංකාව තුළ ඉතා සුලබ දෙයක් වේ. නමුත් ශෝචනීය කරුණ වන්නේ එවැනි අගතීන් සුලබ වුවත් වාර්තාකරණයන් සහ තම අයිතීන් වෙනුවෙන් පෙනී සිටීමට කාන්තාව පසුබට වීමයි. එවැනි පසුබටවීම් හා නිහඬවීම්වලින් ප්‍රයෝජන ගන්නා ආයතනයන්හි විවිධ මට්ටම්වල උසස් නිලධාරීන් ඇයගේ දුර්වලතාවයන් හඳුනාගෙන එය උත්තේජනයක් කරගනිමින් ඇය කෙරෙහි අධික වැඩ කොටසක් පැවරීම්, විවිධාකාරයේ හිරිහැර කිරීම්වල නිරත වේ.

මෙසේ කාන්තාවට සිදුවන හිරිහැර මත කාන්තාවන් නිහඬවීමට බලපාන හේතු සාධක ගණනාවක් පවතී. ආයතන ප්‍රධානීන් සමඟ ගැටීමේදී තම පෞද්ගලික ජීවිතය කෙරෙහි බලපෑම් ඇතිවේ යැයි පවතින බිය, තම ගෘහය තුළ ආර්ථිකය පරිපාලනය කරන එකම තැනැත්තිය හෝ කොටසක් ලෙස කාන්තාව නියෝජනය වීම තුළ වෘත්තිය නැතිවේ යැයි හෝ වෘත්තීය අත්හැරීමට සිදුවේ යැයි පවතින බිය. මේ තත්ත්වය සාමාන්‍යය තනතුරු වල සිටින කාන්තාවන්ගේ සිට සමාජයේ යම් පිළිගැනීමක් පවත්නා තනතුරුවල සිටින කාන්තාවන්ට ද සමාන ලෙස සිදුවන කාරණාවන් ලෙසට හඳුන්වා දුන්නාට වරදක් නොමැත. සමාජය තුළ, ආයතනය තුළ තමන්ට හිමි වී තිබෙන තත්ත්වය හා ආයතනයේ ඉහළ ප්‍රධානීන්ට ගැටලු වාර්තා කිරීමේදී ඇති වන අපහසුතා මත ඕනෑම තරාතිරමක වෘත්තීන්හි නිරත වන්නා වූ කාන්තාවන් තම අයිතීන් වෙනුවෙන් ඉදිරිපත් නොවී නිහඬ වන්නා වූ හා පසුබට වන්නා වූ ප්‍රවණතාවයක් පැවතීම සාධාරණය.

කාන්තාව ආයතනික පරිසරය තුල ඇඳිය යුතු ඇඳුමේ සිට කළ යුතු කාර්යයන් පිළිබඳ එකඟතාවයක් පවතී. බොහෝ පෞද්ගලික ආයතනයන්හි කාන්තාවන්ට නිළ ඇඳුමට සමාන ඇඳුමක් නම් කිරීම තුළින් ආයතනික ප්‍රධානීන් බලාපොරොත්තු වන එක් ප්‍රධාන කරුණක් වන්නේ තම ආයතනය පිළිබඳ සමාජය තුළ උසස් ප්‍රතිරූපයක් ගොඩනගා ගැනීමය. එහිදී යම් දුරකට හෝ කාන්තාව අගතියට පත් වනවා ද යන්න පිළිබඳ සොයා බැලීමක් නොමැත. මෙය හුදෙක්ම වාණිජ අරමුණක්ම පමණි. ආයතනික පරිසරය තුළ තම ආයතනයේ වාණිජ අරමුණු මුදුන් පමුණුවා ගැනීම උදෙසා කාන්තාව අපහසුතාවයන්ට පත්වන ආකාරයේ ක්‍රමවේදයන් භාවිතා කිරීම කෙතරම් දුරට සාධාරණීකරණය කළ හැකි ද යන්න ගැටලුවකි. සමහර ආයතනවල කාන්තාවන්ට ලබා දී තිබෙන නිල ඇඳුම හේතුවෙන් ඇය ලේබල් වී සිටීමත් සමාජ පරිසරයන් තුළ ඇය දැඩි අපහසුතාවයට පත්වීමත් සාමාන්‍යකරණයට ලක්වූවකි.

මේ තත්ත්වය උසස් අධ්‍යාපනයක් ලැබීමෙන් අනතුරුව ලැබෙන උසස් ගනයෙහිලා සම්මත වෘත්තීන්වලට අදාළ නොමැති නමුත් උසස් තනතුරුවලට හිමිවන ගෞරවය මෙන්ම වටිනාකම හා සමානවම සමාජය තුළින් වෙන්කොට සැලකීමක් කනිෂ්ඨ පෙළේ තනතුරුවලට සිදුවන බව සමාජය තුළින් දැකිය හැක. ආයතනික වැඩ පරිසරය තුළ පවත්නා තවත් ගැටලුවක් වන්නේ කාන්තාව ලිංගික පීඩනයකට ලක්වීමයි. ඍජුවම අතවරයකට ලක් නොවූව ද යම් යම් ප්‍රකාශන සිදුවීම් හරහා කාන්තාව ලිංගික වශයෙන් බලවත් අගතියකට පත්වන බව නොරහසකි. එය එදිනෙදා විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍යයන්හි නිරන්තරව වාර්තා වන කාරණාවක් වන අතරම, එය වෙනමම කතා කළ යුතු දීරඝතම මාතෘකාවකි.

කාන්තාව යනු ස්වභාවයෙන්ම දුර්වල චරිතයක්ය යන මතය බොහොමයක් දෙනා අතර මුල්බැසගත් වැරදි මතයක් වන හෙයින් එවැනි දුර්මත කරණකොටගෙන ඇය පීඩාවට පත් කිරීම සඳහා බොහොමයක් ආයතනගත පිරිස් උත්සුක වනු දැකිය හැක. බොහොමයක් ආයතනයන්හි කාන්තාවන් සුළුතරයක් වන අතර බහුතරය පුරුෂ පාර්ශ්වයයි. කාන්තාවකගේ රැකියා ස්ථානයේ සිටින පුරුෂ වෘත්තීය සගයින් සියලු දෙනා නැතත් ස්වල්ප පිරිසක් හෝ ඇයට ගරු කරන්නේ හෝ ඇයගේ මඟ පෙන්වීම් පිළිගැනීමට කැමති නැත. එම පුරුෂ පාර්ශ්වය අපේක්ෂා කරනු ලබන්නේ කාන්තාවගේ උසස්වීම් අහිමිවීම්, වැටුප් අවමවීම් නැතහොත් පුරුෂ වෘත්තීය සගයින්ට සාපේක්ෂව වේතන අවමවීම් යනාදියයි. එමෙන්ම කාන්තාවන් උසස් අධ්‍යාපනයන්හි නිරත වන්නේ නම් කෙසේ හෝ එය විනාශ කිරීමේ අභිප්‍රාය මූලික කරගනී. ඔවුන් තවදුරටත් අපේක්ෂා කරනු ලබන්නේ කාන්තාව අපහාස විඳිමින් ආයතනය තුළ අසරණවීමේ ස්වරූපයයි. මෙවැනි සිදුවීම් ඕනෑම ආයතනයක දැකිය හැකි අතරම බහුතර පුරුෂ වෘත්තීය සගයින් කාන්තාවන්ට සිදු කරනු ලබන අගති ක්‍රියාවන් ඒ ඒ ආයතනයන්හි ස්වරූපය මත වෙනස්වේ.

පෙත්සම්, නිර්නාමික ලිපි, කැලෑ පත්තර යනු ආයතනයක් තුළ කාන්තාවගේ කැපී පෙනෙන කර්තව්‍යයන්, සේවයන් විනාශ කරනු ලබන මෙන්ම කාන්තාව විසින් අසීරුවෙන් ගොඩනගාගත් තත්ත්වයන් විනාශ කරන මාධ්‍යයකි. කාන්තාවකගේ ගමන නවතාලීම සඳහා ආයතන වැඩ පරිසරය තුළ ඕනෑම දෙයක් කිරීමට සමත් පිරිසක් සිටී. මෙහි ප්‍රධානතම දෙය නම් මෙවැනි ක්‍රියා සඳහා පුරුෂ පාර්ශ්වය පමණක් නොව කාන්තාවන් ද තවත් කාන්තාවක අගතියට පත් කිරීමට සහභාගි වීමයි. විවාහයෙන් වෙන්ව සිටින කාන්තාවන් ආයතනය තුළ සිටී නම් ඇයට ආයතනික පරිසරය තුළ මුහුණ දීමට සිදුවන්නා වූ තත්ත්වය ශ්‍රී ලාංකේය සමාජය තුළ ඉතා පිළිකුල් සහගතය. සියලුම ආයතන ප්‍රධානීන් නැතත් බොහෝ ආයතනයන්හි මුල්පුටුව පහළ තනතුරු මෙන්ම කාන්තාව පෙළීමේ අවියක් බවට පත්කරගෙන තිබෙන අයුරු මෑත කාලීන ආයතනගත සංසිද්ධීන් ඔස්සේ දැකිය හැක.

එමෙන්ම සමහර තරගකාරී තනතුරුවලට කාන්තාවන්ගේ කරමතින් පත්වී එම තනතුරම අවියක් කරගනිමින් කාන්තාව අගතියට පත් කිරීම් පවතී. මෙහිදී සාකච්ඡාවට බඳුන් කළ යුතුම ඛේදජනක සිද්ධිය වන්නේ කාන්තා ආයතන ප්‍රධානියෙක් යටතේ අත්වන ශෝකජනක තත්ත්වයයි. කාන්තාවක්, කාන්තාවන් උදෙසා ආරක්ෂණයක් වෙනවාය යන්න කෙනකුට තර්ක කළ හැකිය. නමුත් එය හුදු මනෝ මූලික ඉතා දුර්ලභ ගනයේ දෙයක් ලෙස මෙහිදී කියා පෑවාට වරදක් නොමැත. පුරුෂ ආයතන ප්‍රධානියෙක් යටතේ සිටිනවාට වඩා අගතිදායක තත්ත්වයක් කාන්තා ආයතන ප්‍රධානියෙක් යටතේ සිදු වන බව දැක්විය හැක. එය අද සමාජය තුළ කාන්තාව සඟවන හා යටපත් කරනු ලබන නීරස මාතෘකාවකි. ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා ස්ත්‍රීන්ට තිබෙන්නා වූ අනාගත අභියෝගයන් පිළිබඳ වේදිකා මස්තකයන්ට ප්‍රාප්තව බෙරිහන් දෙනු ලබන බොහොමයක් ආයතන ප්‍රධානවරියන් වේදිකාවෙන් පිටුපස සිට සැලසුම්කරනු ලබන්නේ තවත් කාන්තාවක් හිංසනයට හා පීඩාවට පාත්‍ර කරන්නේ කෙසේ ද යන්නයි.

1979 කාන්තාවන්ට එරෙහි සියලු ආකාරයේ වෙනස්කම් කිරීම් තුරන් කිරීමේ සම්මුතියේ අඩංගු එකඟවීම් පදනම් කරගනිමින් ශ්‍රී ලංකාවේ සාමාන්‍ය නීතියට බොහොමයක් දෑ අන්තර්ගතකර තිබුණාට කිසිඳු ඵලක් නොමැත. කාන්තාවන් අගතියට ලක්වනවා ද යන්න නිරීක්ෂනය කිරීම සඳහා මෙන්ම කාන්තාවන්ට කරුණු වාර්තා කිරීම සඳහා ස්වාධීන ආයතනික යාන්ත්‍රණයක් නොවීම එහි පවත්නා ප්‍රධානම ගැටලුවයි. ඒ අනුව, දැනට ස්ථාපිතව පවත්නා ආයතනයන් පිළිබඳ කිසිඳු අයුරකින් සෑහීමකට පත්විය නොහැක. මන්ද ප්‍රායෝගික තත්ත්වය නම් ආයතනික වැඩ පරිසරය තුළ කාන්තාව ඉතා ශෝචනීය ලෙස අගතියට පත්වීමයි. ජාත්‍යන්තර කාන්තා දිනය නිමිත්තෙන් ඇයව අගයාලීම සඳහා විවිධ උත්සව මූලික වී තිබුණාට ඵලක් නොමැත. කාන්තා දිනයක් නම් කළ පමණින් කාන්තාව සුරක්ෂිත වන්නේ ද නැත. සැබැවින්ම කාන්තාවට අවශ්‍ය වන්නේ ඇයට නිසි වටිනාකම හා ගරුත්වයයි.

# දහම් සරසවිය උසස් ඩිප්ලෝමාවට දේශකවරුන් බඳවා ගැනීමට අයදුම්පත් කැඳවයි

**උපාලි කරුණාරත්න**

දහම් සරසවිය උසස් ඩිප්ලෝමා පාඨමාලාවට දේශකවරුන් බඳවා ගැනීමට අයදුම්පත් මෙම දිනවල කැඳවන බවත් මෙම 17 දිනට පෙර අයදුම්පත් යොමුකළ යුතු බවත් බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල් සුනන්ද කාරියප්පෙරුම මහතා සඳහන් කරයි.

මේ පිළිබඳ වැඩි විස්තර www.dba.gov.lk වෙබ් අඩවියෙන් ලබාගත හැක. 2021/ 2022 සඳහා දේශකවරුන් බඳවා ගැනෙන අතර මෙම පාඨමාලාව දිස්ත්‍රික් මට්ටමින් පැවැත්වීමට කටයුතු සංවිධානය කර තිබේ.

බෞද්ධ දර්ශනය, බෞද්ධ ශිෂ්ටාචාරය, බෞද්ධ සංස්කෘතිය, පාලි භාෂාව සම්බන්ධ උපාධියක් හෝ ප්‍රාචීන පණ්ඩිත විභාගය සමත් ඉගැන්වීම සම්බන්ධව වසරක පළපුරුද්ද මේ සඳහා සුදුසුකම් සේ සලකණු ලැබේ. බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව හා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය ඒකාබද්ධව මෙම ඩිප්ලෝමා පාඨමාලාව මෙහෙයවනු ලබයි.


**පළාත් සභා හා පළාත් පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය**

**JICA ආයතනය විසින් අරමුදල් සපයනු ලබන, නැගී එන කලාපවල ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිය (RIDEP)**

**(ණය අරමුදල් අංක - SL - P116)**

**ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ඒකකය, උතුරු පළාත**

**ලංසු සඳහා ආරාධනයයි**

**ලංසු සඳහා ආරාධනා අංක - SL-P116/RIDEP/NP/PIU/WS & AW/2021/06**

01. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙත ජපාන ජාත්‍යන්තර සහයෝගීතා නියෝජිතායතනය වෙතින්, නැගී එන කලාපවල ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතියෙහි පිරිවැය සඳහා ණය මුදලක් ලැබී ඇති අතර, ඉන් කොටසක්, පහතින් විස්තර කොට ඇති කොන්ත්‍රාත් යටතේ වන සුදුසුකම්ලත් ගෙවීම් සඳහා යෙදවීමට අපේක්ෂිතය.
   01. උතුරු පළාතේ වව්නියා දිස්ත්‍රික්කයේ පූදිය වේලාර් සින්නකුලම් උපව්‍යාපෘතියෙහි ජල සම්පාදන පද්ධතිය ඉදිකිරීම
   **(කොන්ත්‍රාත් අංකය - SL-P116/NP/WS/2020/01)**
   02. උතුරු පළාතේ, කිලිනොච්චි දිස්ත්‍රික්කයේ කරච්චි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, සිවනගර් - උරුතිරපුරම් සිවන්කෝවිල් ජලාපවහන ඇල මාර්ගය හා පුදුමුරිප්පු සෝලයිනගර් - සිවනගර් ජලාපවහන ඇලමාර්ගය පුනරුත්ථාපය කිරීමේ කටයුතු
   **(කොන්ත්‍රාත් අංකය - SL-P116/NP/AW/2020/05)**
02. මෙම ලංසුකරණය, ජපාන ODA ණය අරමුදල් යටතේ ප්‍රසම්පාදන සඳහා අදාළ වන මාර්ගෝපදේශ ප්‍රකාරව වූ ක්‍රියාපටිපාටිය තුළින් පවත්වනු ලබන අතර, ණය ගිවිසුමේ නිර්වචනය කොට ඇති පරිදි සුදුසුකම්ලත් ප්‍රභව රටවල සියලුම ලංසුකරුවන් හට විවෘතය.
03. ඒ අනුව, උතුරු පළාත් සභාව වෙනුවෙන්, පළාත් ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින්, පහත සඳහන් ජල සම්පාදන පද්ධති හා වාරිමාර්ග පද්ධති ඇතුළත් ඉහතින් විස්තර සඳහන් කොන්ත්‍රාත් සඳහා සුදුසුකම්ලත් ලංසුකරුවන් වෙතින් මුද්‍රා තැබූ ලංසු කැඳවනු ලැබේ.
   01. **කොන්ත්‍රාත් අංකය : SL-P116/NP/WS/2020/01**
   අදාළ කාර්යන්ට නිෂ්පාදන කුහර (Bore) ළිං 02 ක්, ආශ්‍රිත සිවිල් වැඩ සහ සම්ප්‍රේෂණ හා බෙදාහැරීම් නළ ජාල ඉදිකිරීම හා යාන්ත්‍රිකව දිවෙන ක්ලෝරිනේටර් ඇතුළත්ව අර්ධ ස්වයංක්‍රීය විද්‍යුත් - යාන්ත්‍රික උපාංග සපයා ස්ථාපිත කිරීම ඇතුළත් වේ.
   02. **කොන්ත්‍රාත් අංකය : SL-P116/NP/AW/2020/05**
   අදාළ කාර්යයට, ඇල ඉවුර සකස් කිරීම හා ඇල ස්ථරයේ රැඳී මඩ ආදිය ඉවත් කිරීම, රියමංකඩ ඉදිකිරීම, සේවා මාර්ග වැඩිදියුණු කිරීම හා පෝෂක ඇල මාර්ගය ඉදිකිරීම, ආදි කටයුතු අයත්වේ.

**සටහන I**

කොන්ත්‍රාත් ප්‍රදානයට සලකා බැලීම සඳහා ලංසු ලේඛනයන්හි ඉස්මතු කොට දක්වා ඇති සුදුසුකම් නිර්ණායක සමහරක් පහතින් වගුගත කොට ඇත.

| කොන්ත්‍රාත් අංකය | SL-P116/NP/WS/2020/01 | SL-P116/NP/AW/2020/05 |
|---|---|---|
| ආපසු නොගෙවන ගාස්තු | ශ්‍රී ලංකා රුපියල් 8,000.00 | ශ්‍රී ලංකා රුපියල් 7.500.00 |
| ලංසු ඇපකරය | ශ්‍රී ලංකා රුපියල් මිලියන 0.6 (2021.08.30 දින දක්වා වලංගු) | ශ්‍රී ලංකා රුපියල් මිලියන 0.5 (2021.08.30 දින දක්වා වලංගු) |
| සීඩා ලියාපදිංචිය | සීඩා ශ්‍රේණි C 4 හෝ C 5 - ජල හා මලාපවහන ක්ෂේත්‍රය | සීඩා ශ්‍රේණි C 4 හා C 5 - වාරිමාර්ග ජලාපවහන වැනල |
| මූල්‍ය තත්ත්වය | පසුගිය වසර 7 තුළ පවත්වාගත් වාර්ෂික ඉදිකිරීම් පිරිවැටුමේ අවම සාමාන්‍ය ශ්‍රී ලංකා රුපියල් මිලියන 70 ක් විය යුතුය. | පසුගිය වසර 3 තුළ පවත්වා ගත් වාර්ෂික ඉදිකිරීම් පිරිවැටුමේ සාමාන්‍යය ශ්‍රී ලංකා රුපියල් මිලියන 50 ක් විය යුතුය. |
| මූල්‍ය සම්පත් | තිබිය යුතු අවම ද්‍රවශීල වත්කම් හෝ ණය පහසුකම් ප්‍රමාණය අවම වශයෙන් ශ්‍රී ලංකා රුපියල් මිලියන 10 ක් විය යුතුය. | තිබිය යුතු ද්‍රවශීල වත්කම් හෝ ණය පහසුකම් ප්‍රමාණය අවම වශයෙන් ශ්‍රී ලංකා රුපියල් මිලියන 11 ක් විය යුතුය. |
| ඉදිකිරීම් පළපුරුද්ද | පසුගිය වසර තුළ අවම වශයෙන් පහත සඳහන් මූලිකාංග සාර්ථකව සම්පූර්ණ කොට තිබිය යුතුය. 1) අවම වශයෙන් කි.මී. 15 ක් දුරට uPVC හෝ සමාන ස්වභාවයේ නළ සපයා එලීමේ අවම වශයෙන් කොන්ත්‍රාත් එකක් ඉටු කොට තිබීම. 2) ව්‍යුහමය සිවිල් වැඩ, ගබඩා මූලිකාංග, උපයෝගිතා ගොඩනැගිලි වැඩ හා යකඩ / සිමෙන්ති යෙදූ උන්නති ජල කුළුණු ඇතුළත් අවම වශයෙන් එක් කොන්ත්‍රාත්තුවක් ඉටු කොට තිබීම. | සමාන කොන්ත්‍රාත් අවම වශයෙන් එකක්, පසුගිය වසර 7 තුළ සාර්ථකව සම්පූර්ණ කොට තිබීම. |
| පෙර ලංසු හමුවේ හා වැඩ බිම් චාරිකාවේ දිනය හා වේලාව | 2021.03.25 දින පෙරවරු 10.00 අදාළ වැඩ බිම් චාරිකාව, පෙර - ලංසු හමුවට පසුව වහාම සංවිධානය කෙරෙනු ඇත. | 2021.03.25 දින පෙරවරු 11.00 අදාළ වැඩ බිම් චාරිකාව, පෙර ලංසු හමුවට පසුව වහාම සංවිධානය කෙරෙනු ඇත. |
| පෙර - ලංසු හමුව පැවැත්වෙන ස්ථානය | ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ඒකකය, අංක 225, කෙලින් වීදිය, යාපනය. | |

**සටහන II :**

බද්ධ ව්‍යාපාර සඳහා අදාළ සීඩා ලියාපදිංචි අවශ්‍යතා සඳහා කරුණාකර, සුදුසුකම් හා නිපුණතා නිර්ණායකයන්හි උප වගන්ති 2.1.4 වෙත යොමු වන්න.

04. ලංසුකරුවන්හට උපදෙස් හා පොදු කොන්ත්‍රාත් කොන්දේසිවල විධිවිධාන, සුළු වැඩ ප්‍රසම්පාදනය සඳහා වන ජපාන ODI ණය අරමුදල් යටතේ වන සම්මත ලංසු ලේඛනයන්හි ඇතුළත් විධිවිධානම වේ.
05. උනන්දුවක් දක්වන ලංසුකරුවන්හට අවශ්‍ය වැඩිදුර විස්තර ලබාගැනීමත්, ලංසු ලේඛන පරීක්ෂා කොට බැලීමත්, යාපනය කෙලින් වීදියේ, අංක 225, උතුරු පළාතේ, ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ඒකකයෙහි කාර්යාලයේදී කළ හැක. දුරකථනය. 021-2214278, ෆැක්ස් - 021-2214277, ඊමේල් - ridepnp@gmail.com
06. උනන්දුවක් දක්වන ලංසුකරුවන්හට, යාපනය, කෙලින් වීදියේ, අංක 225, ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ඒකකය වෙත ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන් සම්පූර්ණ ලංසු ලේඛන කට්ටලයක් මිලදී ගත හැක. ලංසු, 2021.03.15 දින සිට 2021.04.05 දින දක්වා, සාමාන්‍ය රාජකාරී දිනවල, පෙරවරු 9.00 හා පස්වරු 3.00 අතර කාලය තුළ, නිකුත් කරනු ලැබේ.
07. ලංසු, ප්‍රධාන ලේකම් කාර්යාලය, උතුරු පළාත් සභාව, 01 වන මහල, නුවර පාර, කයිතඩි, යාපනය යන ලිපිනය වෙත, 2021.04.06 දින පස්වරු 2.00 ට පෙර ලැබීමට සැලැස්විය යුතුය. සියලුම ලංසු සමග ඉහත වගුවේ සඳහන් පරිදි වූ වටිනාකමට ලංසු ඇපකරයක් බැගින් තිබිය යුතුය. අදාළ ලංසු ඇපකරයේ ආකෘතිය, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ලියාපදිංචි කොට අනුමත කළ වාණිජ බැංකුව කින් ලබාගත් කොන්දේසි විරහිත ඇපකරයක් ලෙස විය යුතුය.
08. අදාළ භාර ගැනීමේ කාලය අවසන් වූ වහාම 2021.04.06 දින පස්වරු 2.00 ට යාපනය, කයිතඩි හි නුවර පාරේ 01 වන මහලේ උතුරු පළාත් සභාවේ ප්‍රධාන ලේකම් කාර්යාලයේදී පැමිණ සිටීමට කැමැත්තක් දක්වන ලංසුකරුවන්ගේ නියෝජිතයන්ගේ ඉදිරියේ ලැබී ඇති ලංසු විවෘත කරනු ලැබේ.

**ප්‍රධාන ලේකම්,**
**සභාපති, පළාත් ප්‍රසම්පාදන කමිටුව,**
**ප්‍රධාන ලේකම් කාර්යාලය - උතුරු පළාත් සභාව,**
**01 වන මහල, නුවර පාර, කයිතඩි, යාපනය.**
**දුරකථනය - +94 212220843, ෆැක්ස් - +94 212220841**
**ඊමේල් : chiefsecnpc@gmail.com**
**දිනය : 2021.03.10**


# යුද සමයේ වළලා ඇති බෝම්බ සම්පූර්ණයෙන් ඉවත් කළහොත් ඇතැම් රාජ්‍ය නොවන සංවිධානවලට පැවැත්මක් නෑ

## රාජ්‍ය ඇමැති ඉන්දික අනුරුද්ධ

**උපාලි කරුණාරත්න**

යුද සමයේදී රට තුළ වළලා ඇති බිම් බෝම්බ සම්පූර්ණයෙන්ම ඉවත් කළහොත් ඇතැම් රාජ්‍ය නොවන සංවිධානවලට මෙරට තුළ පැවැත්මක් නැති බව ග්‍රාමීය නිවාස හා ඉදිකිරීම් සහ ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය ඇමැති ඉන්දික අනුරුද්ධ මහතා රාජ්‍ය නොවන සංවිධානවලට චෝදනාවක් එල්ල කරයි.

ඇමැතිවරයා එසේ ප්‍රකාශ කළේ, ඔබට ගෙයක් - රටට හෙටක් ජාතික නිවාස වැඩසටහන යටතේ ගම්පහ දිස්ත්‍රික්කයේ, දිවුලපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ, පරගොඩ දකුණ ප්‍රදේශයේ පදිංචි කථනාබාධිත (ගොළු) පවුලකට නව නිවසක් ලබා දීමේ අවස්ථාවට පසුගියදා (10) සහභාගි වෙමිනි.



මෙම පවුලේ ආච්චි, සීයා, මව, පියා සහ දරු දෙදෙනා උපතින්ම කථනාබාධිත (ගොළු) වන අතර ඔවුන් විසින් තමන්ට නව නිවසක් ලබා දීම පිළිබඳව ඇමැතිවරයාට සහ රජයට මෙහිදී සිය ස්තූතිය පුද කරන ලදී.

වැඩිදුරටත් අදහස් දැක්වූ ඉන්දික අනුරුද්ධ රාජ්‍ය ඇමැතිවරයා-

යුද සමයේදී රට තුළ වළලා ඇති බිම් බෝම්බ සම්පූර්ණයෙන්ම ඉවත් කළහොත් ඇතැම් රාජ්‍ය නොවන සංවිධානවලට මෙරට තුළ පැවැත්මක් නොමැති වන නිසා එම සංවිධාන විසින් බිම් බෝම්බ නොමැති ප්‍රදේශවල බිම්බෝම්බ වළලමින් ඔවුන්ගේ ව්‍යාපාර හා පැවැත්ම තහවුරු කර ගැනීමට කටයුතු කරමින් සිටිනවා. උතුරු නැගෙනහිර ප්‍රදේශවල නැවත පදිංචි කිරීමේ කටයුතු නිවාස අමාත්‍යාංශය හරහා සිදු වන හෙයින් ඒ පිළිබඳ තොරතුරු අපට දැන ගන්නට ලැබී තිබෙනවා. ලෝකයේ ඕනෑම රටක රාජ්‍ය නොවන සංවිධාන පවතින්නේ ඔවුන් ක්‍රියාත්මක කරන ව්‍යාපෘති අනුවයි. ඇතැම් සංවිධාන මෙරට ජාතීන් අතර ඇන කොටා ගැනීමට කටයුතු කර ඔවුන්ගේ ව්‍යාපාර පවත්වා ගෙන යාමට ක්‍රියා කරනවා.

මෙම අවස්ථාවට ප්‍රදේශීය දේශපාලනඥයන් සහ රාජ්‍ය නිලධාරීන් ඇතුළු විශාල පිරිසක් සහභාගි වූහ.

# අසාද් සාලි වහාම අත්අඩංගුවට ගන්න

## බෙංගමුවේ නාලක හිමි

**සුභාෂිණී සේනානායක සහ උපාලි කරුණාරත්න**

ජාතික සමගි පෙරමුණේ නායක අසාද් සාලි මහතා අත්අඩංගුවට ගැනීමට වහාම පියවර ගත යුතු බව ජාතික සංවිධාන සම්මේලනයේ සභාපති බෙංගමුවේ නාලක හිමියෝ අවධාරණය කරති

අසාද් සාලි මහතා සිදු කළ ප්‍රකාශය සම්බන්ධයෙන් වහාම ඔහුට එරෙහිව විධිමත් විමර්ශනයක් සිදුකළ යුතු බවද උනවහන්සේ පෙන්වා දෙති.

ජාතික සංවිධාන සම්මේලනයේ සභාපති ය බෙංගමුවේ නාලක හිමියෝ කොළඹ පැවති මාධ්‍ය හමුවකට එක් වෙමින් මෙම අදහස් පළ කළහ.

එහදි වැඩිදුරටත් අදහස් දැක්වූ උන්වහන්සේ මෙසේද කීවේය.

අසාද් සාලි මහතා සිදු කර තිබෙන්නේ බලවත් ප්‍රකාශයක්. රජය මේ වෙනුවෙන් නිහඬව නොසිටිය යුතුයි. බොහොම පැහැදිලිව කියන්නේ මෙයා ගැන අපරාධ විමර්ශන අංශය යොදවලා පරීක්ෂණයක් කරන්න කියලයි, මේ වගේ ප්‍රකාශවලට දඬුවම් දෙන්න ඕනේ. අසාද් සාලි මහතා අවධාරණය කළේ මුස්ලිම් අය මුස්ලිම් නීතිය යටතේ මේ රටේ කටයුතු කරන්න ඕනේ කියන එක. එහෙම ඉඩ දෙන්න බැනේ. අපි ආදර්ශයට ගන්න ඕනේ මේ අවස්ථාවේ රුසියාවේ ජනාධිපති පුටින් මහතා සිදු කළ ප්‍රකාශය . ඔහු මුස්ලිම් අයට කිව්වා ඔයගොල්ලෝ ආවේ අපි කියලා නෙමෙයි කියලා බව. ඔයගොල්ලන්ගේ උවමනාවට මෙහාට ආවනම් මෙහෙ තියෙන නීති රීතියට සංස්කෘතියට යටත්ව ඉන්න ඕනේ නැත්නම් යන්න පුළුවන් කියල පුටින් මහතා කියා තිබුණා. ඒ වගේ තමයි අසාද් සාලිටත් කියන්න තියෙන්නේ මේ රටේ නීතියට යටත්ව කටයුතු කරනවා මිසක් මුස්ලිම් නීතියක් අටවාගෙන මෙහෙ කටයුතු කරන්න ඒ අයට අයිතියක් නෑ කියන එක. එහෙම බෑ. ඒක වැරදියි. අසාද් සාලි වගේ අය මේ රටේ ජීවත් වුණාට කමක් නෑ. මට කියන්න බෑ ජීවත්වෙන්න එපා කියලා. මේ රටේ ඉපදුන කෙනෙක් නේ. හැබැයි ඒ අයට අවශ්‍ය විදියේ නීති සම්මත කරගෙන ඒවා අනුව කටයුතු කරන්න ඉඩදෙන්න බෑ. ඒක රටට අහිතකරයි. ඒ වගේ කටයුතු කරන්න ගියාම ආණ්ඩුව නීතිය ක්‍රියාත්මක කරන්නේ නැතිනම් සාමාන්‍ය මිනිස්සු නීතිය අතට ගන්න ඉඩ තියෙනවා. යැයි උන්වහන්සේ වැඩිදුරටත් කියා සිටියහ.

# එජාප ප්‍රතිසංස්කරණ වැඩසටහනේ දෙවන අදියර මේ මස අගදී

**ශිරෝමි අබයසිංහ**

එක්සත් ජාතික පක්ෂයේ දෙවන ප්‍රතිසංවිධාන වැඩසටහන මාර්තු මස අවසන් සතියේ ආරම්භ කිරීමට නියමිතය.

මෙම වැඩසටහන සඳහා පසුගිය 09 දා පැවති පක්ෂයේ කෘත්‍යාධිකාරී මණ්ඩලයේ අනුමැතියද හිමිව තිබේ.

පළමු වැඩසටහන යටතේ දිවයින පුරා දිස්ත්‍රික් මට්ටමින් ගොස් ජනතාව දැනුම්වත් කර පක්ෂය හැර ගිය පිරිස් සහ අලුතින් සාමාජිකයන් බඳවා ගැනීම සිදු කෙරිණි.

පක්ෂයේ නියෝජ්‍ය නායක රුවන් විජයවර්ධන සහ මහ ලේකම් පාලිත රංගේ බණ්ඩාර මහත්වරුන් ඇතුළු පිරිස රට වටා ගොස් ප්‍රතිසංවිධාන කටයුතු සිදු කරන අතර මේ පිළිබඳව පක්ෂයේ නායක හිටපු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහතාගේ ප්‍රශංසාව කෘත්‍යාධිකාරී මණ්ඩල රැස්වීමේදී පළ කර තිබේ.

සමථයකට පත් කරගත හැකි, සියලු නොමග ගිය පාක්ෂිකයන් යළි එකතු කර ගැනීම සඳහා සියලු සැලසුම් සකස් කර ඇති අතර ඉදිරි මාස දෙක තුළ බඳවා ගැනීම් අවසන් කිරීමටද නියමිතය.

ඉකුත් මහ මැතිවරණ සමයේ පක්ෂයේ තීන්දුවට පිටින් වෙනත් පක්ෂයකට සහාය දැක්වීමට ගොස් සිටි පළාත් පාලන ආයතන නියෝජිතයන් 15 දෙනෙකුට සමාව දී පක්ෂයට එකතු කරගත යුතු බවට පක්ෂ සභාපති වජිර අබේවර්ධන ඉදිරිපත් කළ යෝජනාව කෘත්‍යාධිකාරි මණ්ඩලය අනුමත කළේය.

ඉන්පසු පක්ෂය හැරදා ගිය නැවත පක්ෂයට ඒක් වූ පළාත් පාලන ආයතන නියෝජිතයන් 44 දෙනෙකුගේ නම් ගම් සහිත වාර්තාවක් මහලේකම් රංගේ බණ්ඩාර මහතා කෘත්‍යාධිකාරී මණ්ඩලයට ඉදිරිපත් කළේය. එසේම විනය පරීක්ෂණ පැවැත්වූ 18 දෙනෙකු පක්ෂයෙන් නෙරපා හැරීමට කෘත්‍යාධිකාරි මණ්ඩල අනුමැතිය හිමිවිය.

එක්සත් ජාතික පක්ෂ නව සංවිධායක ජාලය ශක්තිමත් කිරීම වෙනුවෙන් මැතිවරණ කොට්ඨාශ සංවිධායකවරුන් තෝරා පත් කර ගැනීම උදෙසා කමිටුවක් පත් කිරීමට ද පක්ෂ නායක රනිල් වික්‍රමසිංහමහතා පියවර ගෙන ඇති අතර ඒ අනුව පක්ෂ සංවිධායක ධුර සඳහා ඉල්ලුම් කිරීමට අවස්ථාව ලබා දෙනු ඇත.

# යතුරුපැදිකරුවන් දැනුම්වත් කිරීමේ වැඩපිළිවෙළක්

**සුභාෂිණී සේනානායක**

යතුරුපැදි භාවිතයේදි හිස් ආවරණයක් පැලැඳීමේ ඇති වැදගත්කම පිළිබඳව යතුරුපැදිකරුවන් දැනුම්වත් කිරිමේ දීප ව්‍යාප්ත වැඩ පිළිවෙළක් ප්‍රවාහන අමාත්‍යාංශය විසින් ආරම්භ කර තිබේ.

ශීඝ්‍රයෙන් ඉහළ යන රථවාහන අනතුරු සඳහා වැඩි වශයෙන් මුහුණ දෙන පාර්ශ්වකරුවන් වන්නේ යතුරුපැදි ධාවකයන් බැවින් යතුරුපැදි ධාවකයන් ඉලක්ක කර ගනිමින් යතුරුපැදි ධාවනය කළ යුතු ආකාරය සහ යතුරුපැදි භාවිතයෙදි ප්‍රමිතියෙන් යුතු හිස් ආවරණයක් පැලැඳීමේ ඇති වැදගත්කම පිළිබඳව දැනුවත් කිරීම සඳහා මේ වැඩසටහන් දීප ව්‍යාප්තව ආරම්භ කර තිබේ.

මේ වැඩසටහනක් පාරිභෝගික සේවා අධිකාරිය සමග එක්ව පැවැත්වීමට මාර්ග ආරක්ෂාව පිළිබද ජාතික සභාව කටයුතු සුදානම් කර ඇත.

එහි සමාරම්භක අවස්ථාව ප්‍රවාහන අමාත්‍ය ගාමිණී ලොකුගේ මහතා සහ සමුපකාර සේවා අලෙවි සංවර්ධන හා පාරිභෝගික ආරක්ෂණ රාජ්‍ය අමාත්‍ය ලසන්ත අලගියවන්න මහතාගේ ප්‍රධානත්වයෙන් ලබන සදුදා (15) පෙ.ව. 9.00ට ගාලුමුවදොර පිටියේ වන් ගෝල් ෆේ On සංකීර්ණය ඉදිරිපිටදි ආරම්භ කෙරේ.

මේ වැඩසටහන දීප ව්‍යාප්තව ද පැවැත්වීමට කටයුතු යොදා තිබේ.

අමිල ප්‍රභාත් වනසිංහ - අනුරාධපුර අතිරේක

# නිධානයකින් ගත් රත්‍රං යැයි පවසා රන් බෝල තොගයක් විකුණන්න හදලා



නිධානයකින් ගත් රත්‍රං යැයි පවසා රන් බෝල ග්‍රෑම් පනහක් (50) පමණ හෝමාගම සිට පැමිණි පිරිසකට අලෙවි කිරීමට සුදානම්වූ පුද්ගලයන් දෙදෙනකු එම රන් බෝල තොගය සමග අත් අඩංගුවට ගැනීමට අනුරාධපුර පොලිස් කොට්ඨාස අපරාධ විමර්ශන ඒකකයේ නිලධාරීන් (11)සමත් විය.

රුපියල් ලක්ෂ දෙකක පමණ මුදලකට මෙම රන්ත්‍රං යැයි පවසන බෝල තොගය අලෙවි කිරීමට සැලසුම් කර තිබේ. ලැබුණු තොරතුරක් මත අනුරාධපුර විජයපුර ගල්පොත්ත පාරේ ප්‍රදේශයේ සැඟවී සිට කළ වැටලීමකදී මෙම රන් බෝල සමග සැකකරුවන් දෙදෙනා අත් අඩංගුවට ගෙන ඇත.

මෙම සැකකරුවන් දෙදෙනා විජයපුර ප්‍රදේශයේ පදිංචි කරුවන් වන අතර ප්‍රසිද්ධ මරංචි කරුවන් දෙදෙනකු බවද පොලිසිය පැවසීය .

මෙම රන් මිලදී ගැනීමට හෝමාගම සිට මෝටර් රථයකින් පුද්ගලයන් හතර දෙනකු පැමිණ ඇත. ඔවුන් රන් බෝල පරීක්ෂා කිරීමෙන් අනතුරුව ඒවා ලබාගෙන සැකකරුවන්ට මුදල් ගෙවීමට සුදානම් වන අවස්ථාවේදීම ඔවුන් දෙදෙනා අත් අඩංගුවට ගැනීමට පොලිසියට හැකි වී තිබේ.අත් අඩංගුවට ගත් සැකකරුවන් පරීක්ෂා කිරීමේදී ඔවුන් සතුව තිබූ රන් බෝල අසුහයක් සොයාගත් බවද පොලිසිය පැවසීය .

අත් අඩංගුවට ගත් රන් බෝල ව්‍යාජ ඒවාද යන්න මෙතෙක් අනාවරණය කරගෙන නැති අතර ඒ පිළිබඳව පුරාවිද්‍යාත්මක වාර්තාවක් කැඳවීමට නියමිතය. අත් අඩංගුවට ගත් සැකකරුවන් දෙදෙනා අධිකරණයට ඉදිරිපත් කිරීමට නියමිතව තිබිණි.

අනුරාධපුර කොට්ඨාසය භාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි කේ.එල්.ගීගනගේ මහතාගේ උපදෙස් මත අනුරාධපුර කොට්ඨාස අපරාධ විමර්ශන ඒකකයේ ස්ථානාධිපති ප්‍ර.පො.ප. බණ්ඩාර විජේකෝන් මහතාගේ අධීක්ෂණය යටතේ අපරාධ විමර්ශන කොට්ඨාසයේ බුද්ධි ඒකකයේ ස්ථානාධිපති පො.ප. ආර් .එම්.එස් .පී .රත්නායක , පො.සැ.61406 නිශාන් ,පො.කො.68419 ඉලංගසිංහ ,71544 සමන්, 75572 රත්නායක යන නිලධාරීන් මෙම වැටලීම සිදු කර සිද්ධිය සම්බන්ධ වැඩිදුරටත් පරීක්ෂණ සිදු කරයි.

එන්.පී.රාජදොරේ - රත්නපුර විශේෂ

# පාරිභෝගික අධිකාරියෙන් රත්නපුරේ වැටලීම් 41ක්

පාරිභෝගික අධිකාරියේ රත්නපුර දිස්ත්‍රික් ඒකකයේ නිලධාරීන් විසින් මේ 2021 වසරේ ජනවාරි මාසය තුළදී සිදුකළ වැටලීම් මඟින් පාරිභෝගික නීති උල්ලංඝණයකළ වෙළෙඳුන් 41 දෙනෙකුට විරුද්ධව නඩු පවරා දඩ වශයෙන් එක්ලක්ෂ හැට පන්දහසක මුදලක් රජයට අයකරදී ඇතැයි පාරිභෝගික අධිකාරියේ රත්නපුර දිස්ත්‍රික් ඒකකයේ නිලධාරියකු පැවසීය. රත්නපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පිහිටුවා ඇති පාරිභෝගික අධිකාරියේ රත්නපුර දිස්ත්‍රික් ඒකකය දිස්ත්‍රික් ලේකම් මාලනී ලොකු පෝතාගම මහත්මියගේ උපදෙස් අනුව 2020 වසර තුළදී පාරිභෝගික නීති උල්ලංඝණය කළ වෙළෙඳුන්ට නඩු පැවරීමෙන් ලක්‍ෂ 25ක මුදලක් දඩ වශයෙන් රජයට අය කරදී තිබේ.

පාරිභෝගික අධිකාරියේ රත්නපුර දිස්ත්‍රික් ඒකකයේ ප්‍රධානී උදය නාමල්ගම,මහතා ඇතුළු විමර්ෂණ නිලධාරීන් වැටලීම්වලට සහභාගිවී තිබේ.

කරල්ලියද්ද සමූහ - කේ. විජේසිරි නිශ්ශංක

# වුඩ්සයිඩ් වැව පිළිසකර කර දෙන්නැයි ගොවීහු ඉල්ලති

තෙල්දෙනිය මැදදුම්බර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මිරියගොල්ල වසමේ පිහිටි වුඩ්සයිඩ් වැව පිළිසකර කර දෙන ලෙස ගම්මාන රැසක වී වගාව කරන ගොවීහු බලධාරීන්ගෙන් ඉල්ලති.

වුඩ්සයිඩ් වැවේ වැව් ජලයෙන් ගම්මාන රැසක ගොවීන් විශාල පිරිසක් යල මහ දෙකන්නයේ වී වගාව කරන අතර මෙම වැවේ වැව් ජලය නිසි ලෙස ලබා නොදීම නිසා තම වගාවන්ට අවශ්‍ය ජලය නිසි ලෙස නොලැබෙන බවත් එම ගොවි ජනතාව පවසති.

ගොවීන්ට අවශ්‍ය පරිදි ජලය ලබා දීමට නම් මෙම වැව කඩිනමින් පිළිසකර කරන ලෙසත් එම ගොවි ජනතාව බලධාරින් ගෙන් වැඩිදුරටත් ඉල්ලති.



රසුල දිල්හාර ගමගේ - උතුරු පළාත් විශේෂ

# වසර 34 කට පසුව මුලතිව් ගණදෙවි කෝවිලේ විශේෂ පොංගල් පූජාවක්

වසර 34 කට පසුව මුලතිව් කුරුදුමලේ විහාරාසන්නයේ පිහිටි ගණදෙවි කෝවිලේ මහා ශිව රාත්‍රී දිනය නිමිත්තෙන් විශේෂ පොංගල් පූජාවක් 11 දා පවත්වා තිබේ.

ඔවුන්ට එම කෝවිලේ විශේෂ පොංගල් පූජාව පැවැත්වීමට හැකි වී ඇත්තේ කුරුදුමලේ විහාරාසන්නයේ ආරම්භ කොට ඇති පුරා විද්‍යා කැණීම් සඳහා ශ්‍රී ලංකා යුද හමුදාවේ පිරිසක් ආරක්ෂාව සපයා දීම නිසා ඔවුන්ගේ ආරක්ෂාව යටතේය.

පළාතේ හින්දු බැතිමතුන් පොංගල් පූජාව පවත්වා කිරිබත් පිස එම ස්ථානයේ සිට ඒවා භුක්ති විද මහා ශිව රාත්‍රී දිනය සමරා තිබේ.

ඒ.ටී.එම්.ගුණානන්ද - ත්‍රිකුණාමලය විශේෂ

# ගෝන මස් තොගයක් ප්‍රවාහනය කරද්දී අත්අඩංගුවට

හබරණ සිට කන්තලේ දෙසට ධාවනය වූ ටිපර් රථයකින් ගෝන මස් තොගයක් ප්‍රවාහනය කරද්දී (11) පස්වරුවේ රියැදුරු, රිය සහයක සමඟ අත්අඩංගුවට ගැනීමට අග්බෝපුර පොලිසිය සමත්වූහ.

පොලිසියට ලද තොරතුරකට අනුව යුධ හමුදාව හා පොලිසිය ඒකාබද්ධව අග්බෝපුර මාර්ග බාධකයේදී ටිපර් රථය නවතා පරීක්ෂා කළ අවස්ථාවේ පොහොර උර දෙකක බහා තිබූ කිලෝ ග්‍රෑම් 50ක බරැති මෙම ගෝන



මස් තොගය අත්අඩංගුවට ගැනීමට හැකිවිය.

අග්බෝපුර පොලිස් ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂකඩී.එම්.ජී.ඩී.දහම්පත් මහතාගේ මෙහෙය විම මත සැරයන් (28339) ධර්මකීර්ති මාර්ග බාධක රාජකාරියේ නියුතු කොස්තාපල්වරුන් වන (91694) කුලරත්න, (37896) කුමාර , සිවිල් ආරක්ෂක භට (020260) පීරිස් යන නිලධාරින් සමඟ රාජකාරියේ නියුතු යුධ හමුදා භටයන් එක්ව මෙම වැටලීම සිදුකර තිබේ.

කිතුල් උතුවෙන් පටවා ගත් මෙම ගෝන මස් තොගය කන්තලේට රැගෙන එමින් සිටියදී මෙලෙස අත්අඩංගුවට පත් වී තිබේ.සැකකරුවන් ගෝන මස් සමඟ කන්තලේ අධිකරණයට ඉදිරිපත් කිරීමට නියමිතය.

ගයාන් සංජය

# ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි සුදත් මාසිංහ වැඩ භාර ගනී



ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි සුදත් මාසිංහ මහතා මඩකලපුව කොට්ඨාසය භාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරිවරයා වශයෙන් පසුගියදා (10) වැඩ භාර ගන්නා ලදි.

සුදත් මාසිංහ මහතා වසර 32 කට වැඩි සේවා කාලයක් සම්පූර්ණ කර ඇති අතර කොට්ඨාස භාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරිවරයකු වශයෙන් බණ්ඩාරවෙල, රත්නපුර හා මහනුවර යන කොට්ඨාසවල සේවය කර තිබේ. ඒ මහතා පන්නිපිටිය ධර්මපාල විද්‍යාලයෙන් අධ්‍යාපනය හදාරා ඇත.

කල්පිටිය සමූහ

# හොරෙන් කැනඩා යන්න ගිය පිරිසෙන් එක් අයෙක් හිටපු කොටි සාමාජිකයෙක්

නීතිවිරෝධීව මුහුදු මඟින් කැනඩා බලා යෑමේ අරමුණින්,කල්පිටිය කුරක්කන් හේන ප්‍රදේශයේ ධීවර වාඩියක රැඳී සිටියදී 11 දින අත්අඩංගුවට ගත් 24 දෙනකුගෙන් සමන්විත කණ්ඩායමේ එක් සැකකරුවෙකු කල්පිටියේ මීට පෙර පදිංචිව සිට අයකු බවත්,පසුව මොහු එල්ටීටීඊ සංවිධානයේ සාමාජිකයකු වශයෙන් ක්‍රියාකළ අයකු,බවත් මූලික විමර්ශනවලින් අනාවරණය වූ බැව් කල්පිටිය පොලිසිය පවසයි.එම සංවිධානය තුළ මොහු,අම්බූ නමින් පෙනී සිට ඇතැ යි වාර්තා වේ.

මේ වන විට මෙම පුද්ගලයාගෙන්,රාජ්‍ය බුද්ධි සේවය ප්‍රකාශ ලබාගෙන ඇති අතර අපරාධ පරීක්ෂණ දෙපාර්තුමේන්තුවෙන් ද ප්‍රශ්න කිරීමට නියමිතය.

ආගමන විගමන පනත උල්ලංඝණය කිරීම යටතේ පොලිස් අත් අඩංගුවේ පසුවන සැකකරුවන් පුත්තලම මහෙස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමට නියමිත බැව්,කල්පිටිය පොලිස් ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක එම්.මව්ශාන් මහතා පවසයි.

ජගත් ජනප්‍රිය - ගඟ ඉහළ සමූහ

# කිසිම රාජ්‍ය ආයතනයක දූෂිතයෝ තියා ගන්නේ නෑ



"දේශපාලන ඉතිහාසයේ මත්කුඩු, පාතලය, මැරකම් නැති කරනා එකම රාජ්‍ය නායකයා ලෙස ජනපති ගෝඨාභය රාජපක්ෂ මහතා ඉතිහාසගත වෙනවා. සියලු දෙනා අත්අඩංගුවට ගනිමින් අනාගත පරපුර රැකගන්න එතුමා ගෙනයන වැඩපිළිවෙළට ජාති, ආගම් භේද අමතක කර සහාය දිය යුතු" යැයි

මහනුවර දිස්ත්‍රික් නායක කෘෂිකර්ම ඇමැති මහින්දානන්ද අලුත්ගමගේ මහතා පැවසීය.

ඒ මහතා මෙසේ පැවසුවේ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණට වසර 04ක් පිරීම නිමිත්තෙන් සංවිධානය කර තිබූ ආසන බල මණ්ඩල රැස්වීම් මාලාවේ උඩුනුවර ආසන බල මණ්ඩල රැස්වීම හා හදබිම අධිකාරි මඟින් දිළිඳු පවුල්වලට කුකුළු පැටවුන් බෙදා දීමේ උත්සවය දවුලගල සමුපකාර ශාලාවේ පැවති අවස්ථාවේදීය.

එහිදී තවදුරටත් අදහස් දක්වමින් මහින්දානන්ද මහතා මෙසේ පැවසීය.



"රාජ්‍ය ආයතනවල දූෂණ වංචා නැවැත්වීමට එතුමා පියවර ගන්නවා. එයට අමතරව මම වී අලෙවි මණ්ඩලය, කෘෂිකර්ම අමාත්‍යාංශය, පොහොර සංස්ථාවේ දූෂිතයන්ට දඬුවම් දී අයින් කර තිබෙනවා. අපි කිසිම රාජ්‍ය ආයතනයක දූෂිතයන් තියාගන්න පියවර ගන්නේ නෑ. අපි කැමති ජනතාව සමඟ ඉන්න. ජනතාව සමඟ ජීවත් වන්න. නමුත් අද රටේ තිබෙනා තත්ත්වය අනුව අපට එයට සහභාගි විය නොහැකියි. නමුත් අප ජනතාව වෙනුවෙන් ඉටු කළ යුතු යුතුකම් ඉෂ්ට කරනවා. අපගේ පළමු චේතනාව රටේ ජනතා ජීවත් කරවීමයි. එයට අපි මුල්තැන දෙනවා."

මෙහිදී අදහස් දක්වමින් උඩුනුවර නව ආසන සංවිධායක පාර්ලිමේන්තු මන්ත්‍රී මහාචාර්ය රංජිත් බණ්ඩාර මහතා මෙසේ පැවසීය."මම උඩුනුවරට ආවේ ජනතාව නඟාසිටුවන්නයි. ජනතා ප්‍රශ්නවලට පිළිතුරු දෙන්නයි. මාව බෙදා ගන්න ලෑස්ති වෙන්න එපා. මම පළමුව ගියේ ආසනයේ විහාරස්ථානවල නායක හිමිවරු මුණගැහෙන්න. මම උඩුනුවරට ආවට පසු කැම ගන්නේ විහාරස්ථානවලින්. මම ආසනයේ සියලුම ගම්මානවලට නිවාසවලට එනවා. අප පක්ෂය පටන් ගන්නකොට කිසිම පළාත් පාලන ආයතනයක් අපට තිබුණේ නෑ. අප පාර්ලිමේන්තුවේ එකාබද්ධ විපක්ෂ කණ්ඩායම ලෙස සිටගෙන උණු වතුර බෝතලේට තේ කහට දාගෙන ගිහින් තමයි මේ පක්ෂය පටන්ගත්තේ. අපි ඒ අවස්ථාවේ පළමුව තීරණය කළේ රටේ ආරක්ෂාව. දෙවනුව තරුණ තරුණියන්ගේ රැකියා ප්‍රශ්න."

මේ අවස්ථාවට උඩුනුවර ශාසනාරක්ෂක බල මණ්ඩලයේ ලේඛාධිකාරී පූජ්‍ය ගලහා සිරිශාන්ත හිමි, උඩුනුවර අධිකරණ සංඝනායක මීවතුරේ ධම්මකීර්ති හිමි ඇතුළු මහා සංඝරත්නය, ග්‍රාමීය කුඹුරු වාරිමාර්ග රාජ්‍ය ඇමැති අනුරාධ ජයරත්න, පාර්ලිමේන්තු මන්ත්‍රී රංජිත් රාජපක්ෂ, උඩුනුවර ප්‍රාදේශීය සභා පොදුජන පෙරමුණේ මන්ත්‍රීවරු, හිටපු පළාත් සභා මන්ත්‍රීවරු, කඳුරට ජාතික සවිබල පදනමේ සභාපති ගුප්ත විද්‍යා සංගීත විශාරද හිටපු ආචාර්ය ජගත් කුමාර යාපා, ලසික පියරත්න ආනන්ද හා විජේසුන්දර යන මහත්වරුන් ඇතුළු නිලධාරීහු සහභාගි වී සිටියහ.







මාතලේ දිස්ත්‍රික් සමූහ

# දඹුල්ල මූලික රෝහලට බෙහෙත් ගන්න එන රෝගීන්ට ආපහු යන්න වෙලා

දඹුල්ල මූලික රෝහල වෙත විශේෂයෙන් වෛද්‍ය සායන සඳහා දිනපතා පැමිණෙන සිය ගණන් රෝගීන්ට මෙම ස්ථානයෙහි පවතින අවිධිමත් තත්ත්වය නිසා දැඩි අපහසුතාවකට මුහුණපෑමට නිරන්තරයෙන් සිදුවන නමුත් මෙම තත්ත්වය මගහැරවීමට රෝහල් කළමනාකාරිත්වයට මෙතෙක් නොහැකිවීම ජනතාවගේ දැඩි අප්‍රසාදයට හේතුවී ඇත.

මෙම වෛද්‍ය සායන සඳහා දුරබැහැර පෙදෙස්වල සිට බොහෝ රෝගීන් පැමිණෙන අතර ඇතමුන් සායනවලට පෙරදිනයේ පැමිණ කොතනක හෝ අගුපිලක රැඳීසිට ප්‍රතිකාර සඳහා නියමිත වේලාවට පැමිණීම සාමාන්‍ය දෙයක් බවට පත්ව තිබේ. නමුත් ඇතැම් අවස්ථාවලදි වෛද්‍යවරුන් හමුවීම සඳහා අංක ලබාගැනීමට නොහැකිවීමෙන් මොවුනට හිස් අතින් යෑමට සිදුවන අවස්ථාද එමට ඇත.

එපමණක් නොව මෙම වෛද්‍ය සායන පවත්වන ස්ථානය එම කාර්ය සඳහා කිසිසේත්ම ප්‍රමාණවත් නොවන බැවින් මෙහි රෝගීන්ගේ තදබදයද ඉතා උග්‍ර අතට පත්ව තිබේ. එමෙන්ම වෛද්‍යවරයාගේ පරීක්ෂාවට ලක්වීමෙන් පසු අවශ්‍ය ඖෂධ ලබාගැනීමටද පැය දෙකතුනක කාලයක් පෝලිමේ ගතකිරීමට මෙම අසරණ රෝගින්ට සිදුවේ.තවද වෛද්‍යසායන සඳහා පැමිණෙන රෝගීන්ගෙන් බහුතරය වයස්ගත පුද්ගලයන්වන බැවින් බොහෝ අවස්ථාවලදී පැය දෙකතුන එකම ඉරියව්වෙන් පෝලිමේ රැඳී සිටීම නිසා ඇතමුන් සිහිසුන්ව ඇද වැටෙන අවස්ථාද දක්නට හැකිය.



දිනමිණ දසත - දස අත ම එක තැන

කුමාරි දිසානායක - ඉබ්බාගමුව සමූහ

# කුරුණෑගලින් වී කිලෝ ලක්ෂ දෙකක් මිලට අරන්

සහතික මිලට වී මිලදී ගැනීමේ වැඩසටහන යටතේ මහ කන්නයේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ වී කිලෝ දෙලක්ෂ දාහත්දාහක් මිලදී ගෙන ඇති බව වී අලෙවි මණ්ඩලයේ දිස්ත්‍රික් කළමනාකරු රසික මෙරංග මහතා පැවැසීය.නියමිත සහතික කළ මිල ගණන් යටතේ සම්බා වී කිලෝවක් රු. 54 .00ක මිලකට ද නාඩු වී කිලෝවක් රුපියල් 52.00ක මිලට ද මිලදී ගැනේ. කුරුණෑගල දිස්ත්‍රික්කයේ නිකවැරටිය, මා එළිය, මහව, ගැට්ටුවාන, වරාවැව, මීගලෑව, කිතලව සහ ගල්ගමුව යන වී මිලදී ගැනීමේ මධ්‍යස්ථානවල දී මේ වන විට වී මිලදී ගැනේ. මෙවර මහ කන්නයේ වී මිලදී ගැනීමේ වැඩසටහනේදී දිස්ත්‍රික්කයෙන් වී මෙට්‍රික් ටොන් 20000ක් මිලදී ගැනීමට බලාපොරොත්තු වන බව ද මෙරංග මහතා කීය. කුරුණෑගල දිස්ත්‍රික්කයේ සුළු හා මධ්‍ය පරිමාණ වී මෝල් හිමියන් හරහා ද වී මිලදී ගැනීම ද මේ වන විට ආරම්භ කර ඇති අතර දිස්ත්‍රික්කයේ දිවුල්ලෑගොඩ,නිකවැරටිය,නාගොල්ලාගම,නාගොල්ලාගම පොතුවැව,අඹන්පොළ,මහව, කුඹුක්ගැටේ, රස්නායකපුර, නිකවැරටිය, බොරලුවැව සහ මීගලෑව යන මධ්‍යස්ථාන 1 ක් මේ සඳහා සූදානම් කර ඇති අතර මෙහි දී නියමිත ප්‍රමිතියෙන් යුතු නාඩු වී කිලෝවක් රු. 50.00ක මිලකට ද තෙත සහිත නාඩු කිලෝවක් රු.44 .00 මිලකට ද නියමිත ප්‍රමිතියෙන් යුතු කීර සම්බා වී කිලෝවක් රු. 52 .00ක මිලට ද තෙත සහිත කීරි සම්බා වී කිලෝවක් රු.46 .00 මිලකට ද මෙහිදී මිලදී ගැනේ. මේ යටතේ මේ වන විට වී කිලෝ 9977ක් මිලදී ගෙන ඇති බව ජාතික පොහොර ලේකම් කාර්යාලයේ සහකාර අධ්‍යක්ෂ එච්.ඩී. සී . සම්පත් මහතා කීවේය.එසේම පොහොර සහනාධාරය ලබා දීම සඳහා කුඹුරු හෙක්ටයාර 1කට වැඩි වී ගොවීන්ගෙන් වී කිලෝ 1000ක් ද හෙක්ටයාර 1. 1/2 - 2 අතර ගොවීන්ගෙන් වී කිලෝ 1500ක් ද අනිවාර්යයෙන් වී අලෙවි මණ්ඩලයට ලබා දියයුතු බවට ගෙන තිබූ තීරණය අවලංගු කර ඇති බව ද සම්පත් මහතා කියා සිටියේය.

ඩබ්ලිව් රෝහණ - බුලත්කොහුපිටිය සමූහ

## විදුලි බලාගාරයක වේල්ලකින් ගුරුගොඩ ඔය අවට පරිසරයට හානි



ගුරුගොඩ ඔයෙහි මොරොන්තොට, හුණුගල වත්ත ප්‍රදේශයේ පෞද්ගලික විදුලි බලාගාරයක් මඟින් 2007 වර්ෂයේ පමණ ඉදිකර ඇති වේල්ල මඟින් ගුරුගොඩ ඔය ආශ්‍රිතව පාරිසරික ගැටලු රාශියක් මේ වනවිට පැන නැඟ තිබෙන බවට චෝදනා කරමින් ගුරුගොඩඔය නිම්න,ජීවිත,දේපල සුරැකීමේ සංවිධානය විසින් සංවිධායන කළ උද්ඝෝෂණයක් මොරොන්තොට නගරයේ දී පැවැත්විණි.කෑගල්ල,බුලත්කොහුපිටිය මාර්ගය හරස් කරමින් විරෝධතාව පැවැති අතර ඒම ස්ථානය හරහා යෑමට පැමිණි නියෝජ්‍ය කථානායක රංජිත් සියඹලාපිටිය මහතාගේ රථයද මේ නිසා ආපසු හරවා අරන්දර දෙසට ගියේය.මේ අවස්ථාවට මොරොන්තොට,හාල්මැස්ස,ගුරුල්ලවල,කොහෙල්වත්ත,ගොඩිගමුව ආදී ප්‍රදේශවල ජනතාව සහභාගි වී සිටියහ.

# ජන පොත

## සාම විනිසුරු පදවි ලබති



බියගම මැතිවරණ බල ප්‍රදේශයේ මාකොළ දකුණ සිරිමංගල පාර අංක 150, දරණ ස්ථානයේ පදිංචි උප පොලිස් පරීක්ෂක එම්. සුජීව පතිනාගොඩ මහතා මුළු දිවයිනටම සාම විනිසුරුවරයෙකු ලෙස පත් කරනු ලැබ ඇත.දැනට සපුගස්කන්ද පොලිස් ස්ථානයට අනුයුක්තව රාජකාරියේ නියුතු මලිත සුජීව ජානක පතිනාගොඩ මහතා පොලිස් මූලස්ථානයේ පර්යේෂණ සහ සංවර්ධන කොට්ඨාසයේ නිලධාරියකු ලෙස කටයුතු කරනු ලබයි. වර්ෂ 1985 සිට ත්‍රිකුණාමලය, අම්පාර, වව්නියාව ඇතුළු පොලිස් ස්ථාන රැසක සේවය කිරීමෙන් අනතුරුව බස්නාහිර පළාතේ පැලියගොඩ පොලිස් බල ප්‍රදේශවල රාජකාරියට එක්වූ හෙතෙම කැලණිය ධර්මාලෝක මධ්‍ය මහා විද්‍යාලයේ ආදි ශිෂ්‍යයෙකි.

**බියගම විශේෂ රංජිත් අම්පිටියාවත්ත**



මාකොළ ගුණරතන මාවත අංක 327/17 ස්ථානයේ පදිංචි රූපා ජයවීර මහත්මිය මුළු දිවයිනටම සාමදාන විනිශ්චයකාරවරියක ලෙස මහර මහේස්ත්‍රාත් ඩී.ඒ. රුවන් පතිරණ මහතා ඉදිරියේ පසුගියදා දිවුරුම් දෙනු ලැබුවාය.ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ විද්‍යාවේදී ව්‍යාපාර පරිපාලන විද්‍යා විශේෂ උපාධිධාරිනියක වන රූපා ජයවීර මහත්මිය ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේදීම පරිපාලන මූල්‍ය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමා හා රාජ්‍ය මූල්‍ය කළමනාකාරණය පිළිබද ඩිප්ලෝමා ධාරිනියකද වේ. ප්‍රදේශයේ ප්‍රසිද්ධ සමාජ සේවිකාවක ලෙසද මාකොළ රාජ්‍ය විශ්‍රාමික සංගමයේ හා මාකොළ 'විරිය' වැඩිහිටි සංවිධානයේ භාණ්ඩාගාරික ලෙසද ගජබා මාවත සුබ සාධක සංගමයේ ගිණුම් පරීක්ෂක ලෙසද සමාජ මෙහෙවරක යෙදෙන ජනප්‍රියම සමාජ සේවිකාවකි.

**බියගම විශේෂ**

## තනතුරු ලබයි



කළුතර බෝම්බුවල තොටගේ සමන් චමින්ද ජයවර්ධන මහතා 2021/01/05 දින සිට බලපැවැත්වෙන පරිදි දහම් පාසල් පිරිවෙන් හා භික්ෂු අධ්‍යාපන රාජ්‍ය ආමාත්‍යාංශය යටතේ වූ සමස්ථ ලංකා සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (පිරිවෙන් සිංහල) තනතුර සඳහා පත්වීම් ලැබ ඇත. ඒ මහතා කළුතර බෝම්බුවල ශ්‍රී සුබෝධිරාජාරාම මූල මහා විහාර ශ්‍රී දස්සනසාර ධර්මායතන පිරිවෙන් වසර 18ක කාලයක් සිංහල විෂය භාර ආචාර්යවරයා ලෙසද වසර 10ක කාලයක් කළුතර දිස්ත්‍රික් සිංහල විෂය ගුරු උපදේශක ලෙසද තනතුරු හොබවමින් කටයුතු කර ඇත.

**නිමල් වීරසේන - මතුගම මධ්‍යම**

## විශ්‍රාම ලබයි



වැලිවේරිය නරංවල නො. 122/11/1 ස්ථානයේ පදිංචි ශාස්ත්‍රපති සෝමසිරි එදිරිසිංහ මහතා වසර 40ක ගුරු සේවයෙන් පසුගියදා විශ්‍රාම ලැබීය. කොළඹ විශ්වවිද්‍යාලයෙන් ශාස්ත්‍රවේදී උපාධියද, අධ්‍යාපන ඩිප්ලෝමාව ද බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයෙන් බෞද්ධ දර්ශනය පශ්චාත් ඩිප්ලෝමාද ඇක්වයිනාස් විද්‍යාලයෙන් ඉංග්‍රීසි ඩිප්ලෝමාව ද ලබා ඇත. වෙහෙරහේන විද්‍යායතනයෙන් ගුරු සේවාව ආරම්භ කර ඇඹිලිපිටිය කුඩාබුත්ගමුව, බේරුවල, කොටුවිල සේදවත්ත සිද්ධාර්ථ මධ්‍ය විද්‍යාලය, කැලණිය මහා විද්‍යාලය, යබරළුව කණිෂ්ඨ බියගම මධ්‍ය මහා විද්‍යාලයේ හා වර්තමානයේ සපුගස්කන්ද මහා විද්‍යාලයේ සේවයේ නියුතු වී සිටියේය

**බියගම විශේෂ**

දයාරත්න බණ්ඩාර - කෑගල්ල දිස්ත්‍රික් සමූහ

## කෑගල්ලේ සංචාරක කර්මාන්තයට යාන්ත්‍රණයක් ඕනෑ

දිස්ත්‍රික් ලේකම්



කෑගල්ල දිස්ත්‍රික්කයේ ඉඩම් අත්පත් කර ගැනීම් හා පරිසර ආශ්‍රිත ගැටලු සම්බන්ධයෙන් නිලධාරීන්ගේ අවධානය යොමු කිරීම පෙරදැරි කරගත් කමිටු රැස්වීම පසුගියදා කෑගල්ල දිස්ත්‍රික් ලේකම් මහින්ද එස්. වීරසූරිය මහතාගේ ප්‍රධානත්වයෙන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලීය ශ්‍රවණාගාරයේ දී පැවැත්විණි.

මෙම කමිටු රැස්වීමේ දී පසුගිය කමිටු වාර්තාවේ පසු විපරම, තරුණ ව්‍යවසායකයන් සඳහා ඉඩම් ලබා දීම, ජාතික ඉඩම් පරිහරණ සමීක්ෂණය හා ඉඩම් පරීක්ෂණ ඇතුළු කරුණු ගණනාවක් පිළිබඳ අවධානය යොමු කෙරිණි. එසේම දිස්ත්‍රික්කයේ ඇති පරිසර ගැටලු හඳුනා ගැනීම හා ඒවාට විසඳුම් ලබා දීම, එම ගැටලු හා විසඳුම් අදාළ ආයතනවලට යොමු කිරීම, පරිසර අමාත්‍යාංශය මඟින් සිදු කරනු ලබන වැඩසටහන් දිස්ත්‍රික් මට්ටමින් ක්‍රියාත්මක කිරීමට සහාය ලබා දීම සම්බන්ධව මෙහි දී වැඩිදුරටත් සාකච්ඡා කෙරිණි. දිස්ත්‍රික් ලේකම් මහින්ද එස්. වීරසූරිය මහතා මෙහි දී සඳහන් කළේ කෑගල්ල දිස්ත්‍රික්කයේ සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය වෙනුවෙන් පළාත පාලන ආයතන, ප්‍රාදේශීය සභා හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ඒකාබද්ධ යාන්ත්‍රණයක් ඇති කිරීම ඉතා වැදගත් බවය. ඒ ඔස්සේ තම දිස්ත්‍රික්කය තුළින් සංචාරක ව්‍යාපාරයේ සංවර්ධනය හරහා ජාතික ආර්ථිකයට වැඩි දායකත්වයක් ලබා දීමේ සම්පත් හා උරුමයන් පවතින බවත් ප්‍රවේශ මාර්ග සංවර්ධනය කිරීමේ අවශ්‍යත ඉටු කර ගැනීමට කටයුතු කිරීම අතිශය වැදගත් අවශ්‍යතාවක් වන බවද මෙහිදී පෙන්වා දෙන ලදී. දිස්ත්‍රික්කයේ ඉඩම් පරිහරණ ගැටලු සහ පාරිසරික ගැටලු කඩිනමින් විසඳීම සඳහා අදාළ අංශ හා නිලධාරීන්ගේ අවධානය යොමු කිරීමට කටයුතු කිරීම මෙහිදී වැදගත් වන බවද පැවැසීය. දිසාපතිවරයා මෙහි දි වැඩිදුරටත් සඳහන් කළේ දැනට රජයේ සංචාරක නිකේතනයක් නොමැති එකම දිස්ත්‍රික්කය තම දිස්ත්‍රිකක්යය බවත් එම අවශ්‍යතාව ඉටු කර ගැනීමට යෝජනා තමන් මේ වන විටත් අදාළ අංශවලට යොමු කර ඇති බවත්ය.

අයි.එම්.වී.සී. ගුණසේකර - ඇල්පිටිය සමූහ

## අවිත්තාව පාලමේ ලොරි රථයක් පෙරළිලා

ඇල්පිටිය අවිත්තාව ප්‍රධාන මාර්ගයේ නාලාන්දා කනිෂ්ඨ විද්‍යාලය ආසන්නයේ පිහිටි පාලම මතදී පසුගියදා (09) සවස ලොරි රථයක් පෙරළීමෙන් එම ලොරි රථයට බරපතළ අලාභහානි සිදුවී ඇතැයි ඇල්පිටිය පොලීසිය පවසයි. එම ලොරි රථයේ රියැදුරා සහ සහායකයා දිවි ගලවාගෙන ඇති බවද පොලීසිය කියයි.

මෙය පෞද්ගලික ආයතනයකට අයත් සිමෙන්ති කලවම් කරන යන්ත්‍රයක් සහිත ලොරි රථයකි. අනතුරෙන් කිසිවෙකුටත් තුවාලයක් සිදුවී නොමැත.

විජිත සල්ගාදු - අකුරැස්ස මධ්‍යම විශේෂ

## පෙර පාසල් ගුරුවරියන්ට සංස්කෘතික වැඩසටහනක්



අතුරලිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් සියලුම පූර්ව ළමා විය සංවර්ධන මධ්‍යස්ථානවල ගුරු මහත්මීන් සඳහා විශේෂ වැඩසටහනක් අතුරලිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලීය ශ්‍රවණාගාරයේදී පැවැත්විණි. අපෙන් ගිලිහිණු අපේකම, ගිලිහී ගිය සංස්කෘතිය, ජන ගී, ජන නැටුම්,ජන ක්‍රීඩා, ඉපැරණි යාතු කර්ම ආදී විෂයයන් අලලා විශේෂ වැඩසටහනක් මාලිම්බඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සංවර්ධන නිලධාරී ප්‍රවීණ නාට්‍ය රචක සහ නිෂ්පාදක ජී.යූ. ළහිරු කාංචන මහතා විසින් පවත්වන ලදි. ඒ මහතා මෙහිදී අවධාරණය කර සිටියේ බටහිරින් එන ඕනෑම දෙයක් පිළිගැනීමට සැදී පැහැදී සිටින අපේ රටේ ජනතාවට අපේකම මගහැරී තිබීම බලවත් ඛේදවාචකයක් බවයි. එබැවින් ඒ මගහැරී ඇති අපේකම අනාගත පරපුරට සිහිපත් කර දෙමින් අපේ සංස්කෘතිය ආරක්ෂා කරගැනීම අප කාගේත් යුතුකම මෙන්ම යුගයේ අවශ්‍යතාවක් බවත් පෙර පාසල් දරුවන්ගේ සිට අපේකම දරුවන්ගේ සිත් තුළට කාවැද්දීමට ගුරු භවතුන් කටයුතු කළ යුතුව ඇතැයිද සඳහන් කළේය.

අනුරාධ ප්‍රියදර්ශන - කරන්දෙනිය සමූහ

## උපතින්ම රෝගී දියණියන් දෙන්නත් එක්ක බෙන්තොට මවක් අපා දුකේ

### කන්න බොන්න-ඉන්න හිටින්නවත් තැනක් නෑ



බෙන්තොට කහගල්ල පදිංචි රම්‍යා ගුණසිරි මහත්මිය සැමියාත් නොමැතිව තමන්ට සිටින මන්ද මානසික වැඩිමහල් දියණිය හා කොඳු ඇට පෙළේ විකෘතියෙන් පෙළෙන බාල දියණිය සමඟ ගෙවන ජීවිතය කටුකය.කර්කශය. රම්‍යාගේ දියණියන් දෙදෙනාම මෙසේ ආබාධවලින් පෙළීමට පටන් ගෙන ඇත්තේ ඔවුන්ගේ උත්පත්තියත් සමඟමය. ඔවුන් කුඩා කාලයේ බලා හදා ගැනීමට සිය සැමියා සිටියත් ඔවුන් සියලු දෙනාම තනිකර අසරණ කර ඔහු මියගොස් මේ වනවිට සිවු වසරක්ම ගතවී ගොසිනි.

සැමියා නොමැතිව ආබාධවලින් පෙළෙන මේ දියණියන් දෙදෙනා රක්ෂා කිරීමට ඇයට රක්ෂාවක් නොමැති වීමෙන් ඔවුන් මුහුණ දී තිබෙන බරපතළ ගැටලු හා ප්‍රශ්න එමටය.

මේ ප්‍රශ්නවලින් හා ගැටලුවලින් පෙළෙන ඔවුන් තිදෙනාගේම ජීවිතය රැඳී පවතිනුයේ අසල්වැසියන්ගේ උදව් උපකාර මතය. අසල්වාසීන් යම් හෙයකින් මේ අසරණයන් තිදෙනාට පිටුපෑවහොත් ඔවුනට මෙලොව තව දුරටත් ජීවත් වනවාද නැද්ද යන්න පවා තීරණය කිරීමටද අසීරුය.

මේ අසරණයන් තිදෙනාට වැටී සිටීමට ඔවුනම කියා නිවෙසක් නැත. දැනට සිටින්නේ අනුන්ගේ තැනකය. එයද විකුණා ඇති බවද පැවසේ.යම් හෙයකින් මේ අහිංසකනේට මේ නිවසෙන් පිටමං වෙන්න සිදුවුවහොත් වැටෙන්නේ කබලෙන් ලිපටය. ඇඩි අසරණ තත්වයට පත්ව සිටින රම්‍යාගේ වැඩිමහල් දියණිය ඉරේශා මධුෂානිය. ඇය තිස් හැවිරිදිය. මන්ද මානසිකත්වයෙන් පෙළෙනුයේ ඇයයි. සචිනි ශශිකලා රම්‍යාගේ බාල දියණියයි.ඇය දහ අට වන වියේ පසුවෙයි. කොඳු ඇටය විකෘති වීමේ රෝගී තත්ත්වයෙන් පෙළෙනුයේද ඇයයි. ඇයට කතාබහ කිරීමේ හැකියාව ද නොමැත.

ආබාධ සහිත මේ දරුවන් දෙදෙනා නිසා රම්‍යාට කුලී වැඩකටවත් යෑමට නොහැකිව තිබේ.ජීවිතයේ අන්ත අසරණ තත්ත්වයට පත්වී සිටින රම්‍යලාට යම් පිහිටක් විය හැකි අයෙක් හෝ ආයතනයක් වේනම් මේ ඒ සඳහා මහඟු අවස්ථාවකි.

ඒ. පි. දයාචන්ද්‍ර - ඌරුබොක්ක විශේෂ

## පුහුල්හේනකන්ද ගමට පන්සලක් නෑ

### දහම්පාසල පවත්වන්නේ පාසලේ





මාතර පස්ගොඩ ප්‍රාදේශීය ශාසනාරක්ෂක බල මණ්ඩලයේ කැකුන්දෙණිය පුහුල්හේනකන්ද ශ්‍රී ධර්ම විජය දහම් පාසලේ දරුවන් සියයකට වැඩි පිරිසක් දහම් අධ්‍යාපනය ලබන අතර දරුවන්ට දහම් දැනුම ලබාදීම සඳහා ගුරු මණ්ඩලය 09 දෙනෙකු සිටියි.ශ්‍රී ධර්ම විජය දහම් පාසලේ ප්‍රධානාචාර්ය ලෙස කටයුතු කරනු ලබන්නේ ටී.ඒ.සරත් මහතාය.පළමු ශ්‍රේණියේ සිට දහම් පාසල් අවසාන ශ්‍රේණිය දක්වා පන්ති පවත්වන අතර පුහුල්හේනකන්ද කනිෂ්ඨ විද්‍යාලයේ දහම් පාසල පවත්වාගෙන යනු ලබයි.පුහුල්හේනකන්ද ගම්මානයට විහාරස්ථානයක් නොමැති අතර ඒ හේතුවෙන් විද්‍යාලයේ දහම් පාසල පවත්වාගෙන යෑමට සිදුව ඇත.ප්‍රධාන මාර්ගයේ සිට කිලෝමීටර 2.5ක් පමණ දුරක් රක්ෂිතය හරහා පුහුල්හේනකන්ද ගම්මානයට යායුතුය.පුහුල්හේනකන්ද ගම්මානයේ ජනතාවට වෙළෙඳසලකට ඒම සඳහා කිලෝමීටර 2.5 ක දුරක් ගෙවා කැකුන්දෙණිය ප්‍රදේශයට පැමිණිය යුතුය.රක්ෂිත වනාන්තරවලින් වටවූ මෙම ගම්මානය හුදෙකලාව පිහිටි ගමක ලක්ෂණ දක්නට ඇති අතර කිසිම රාජ්‍ය සේවකයෙක් පුහුල්හේනකන්ද ගම්මානයේ නොමැති අතර දහම් පාසලට පැමිණෙන දරුවන්ගේ මවුපියෝ කුලී වැඩ කර හෝ තේ ආදායමෙන් ජීවත්වන පිරිසකි. දහසකුත් අඩුපාඩු මැද පවත්වාගෙන යනු ලබන පුහුල්හේනකන්ද ශ්‍රී ධර්ම විජය දහම් පාසල කොයි මොහොතක වසා දමන්නට සිදුවේද යන්න සැකයෙන් පවත්වාගෙන යෑමට සිදුව ඇති අතර එයට හේතුව පුහුල්හේනකන්ද කණිෂ්ඨ විද්‍යාලයේ දහම් පාසල පැවැත්වීම තහනම් කළ හොත් මවුපියන්ට සිදුවනුයේ දරුවන්ට දහම් අධ්‍යාපනය ලබාදීම නතර කිරීම පමණකි.නැතිනම් කිලෝමීටර 04ක දුරක් ගෙවා පට්ටිගලට පන්සලේ හෝ බෙරලපනාතර පන්සලේ තිබෙන දහම් පාසලට තම දරුවන් යැවිය යුතුය.දරුවන්ට හෝ ගුරුවරුන්ට කිසිම පහසුකමක් නොමැතිව දැඩි දුෂ්කරතා මැද පුහුල්හේනකන්ද ශ්‍රී ධර්ම විජය දහම් පාසල පවත්වාගෙන යන අතර පුහුල්හේනකන්ද කනිෂ්ඨ විද්‍යාලයේ තිබෙන ගොඩනැගිලි පහසුකම්ද දහම් පාසල පවත්වාගෙන යෑම සඳහා ප්‍රමාණවත් නොවේ.පුහුල්හේනකන්ද ගම්වාසීන්ගේ සහ දහම් පාසලේ ගුරුවරුන්ගේ ඉල්ලීම මත ඌරුබොක්ක පොලීසිය මැදිහත්වී ගොඩනැගිල්ලක් ඉදිකිරීමට 2019 මාර්තු 27 දින ත්‍රිපිටකාභි වන්දනා වැඩසටහන යටතේ අත්තිවාරම් දැමීය.පැවැති රජය වෙනස් වීමත් සමඟම ත්‍රිපිටකාභි වන්දනා වැඩසටහන ක්‍රියාත්මක නොවීම හේතුවෙන් එම ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා අත්තිවාරම් දැමූ ස්ථානය වල් බිහිවී ඇත.අත්තිවාරම් දැමූ ගොඩනැල්ල ඉදි කර දෙන ලෙසට බලධාරීන්ගෙන් අවස්ථා ගණනාවකදීම ඉල්ලා සිටියත් එය ඉල්ලීම්වලට පමණක් සීමාවී ඇති බවට මවුපියෝ චෝදනා කරති.එබැවින් මේ ගොඩනැගිල්ල ඉදි කර දීමට කවුරුන් හෝ දායකත්වය දක්වන්නේ නම් එය ශාසනයට පමණක් නොව දරුවන් වෙනුවෙන් කරන ආයෝජනයකි.

2021 මාර්තු 13 සෙනසුරාදා කොළඹ ඩී. ආර්. විජයවර්ධන මාවතේ අංක 35 දරණ ස්ථානයේ පිහිටි ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.

දිනමිණ
සදුතතික පත්තර තාරුණ්‍යය

# යොවුන් ජනතා

2021 මාර්තු 13 සෙනසුරාදා



චිත්‍රය - භාග්‍යා මදනසිංහ

PAGE 03




අලි එළවන පුංචි කෙල්ල

PAGE 05




හරියට USEකරමු



PAGE 08

රූපයට ලස්සන ගෙන එන ආයුර්වේද වෛද්‍යවරිය



# අපි ඔබ ඉලක්ක කරන්නෙමු

**යොවුන් හදවත් තුළ අර්ථවත් අකුරු නවාතැනක් වීම අප පුවත්පතෙහි මූලික අරමුණයි. තරුණයන් ඉලක්කගත කර ගනිමින්, හරසුන් දේ බලෙන් ඇගේ ගැසීම වෙනුවට අරුත්බර දේ ආදරයෙන් වැලඳ ගන්නා මාවතක් සැකසීම අපේ බලාපොරොත්තුවයි. ඕනෑම නිපැයුමක රඳා පැවැත්ම වෙනුවෙන් ඔවුන් ඉලක්ක ගත කරන්නේ ද තරුණ පරපුරයි. අපේ ඉලක්කය ද ඔබයි. ඔබේ ගමනට හරි මඟ සලකුණු පෙන්වීමට හැකි නම් අපේ ජයග්‍රහණය එයයි.**

එන්න, අපි හරි පාරක් හදමු

**සංස්කරණය - රජිත බස්නායක**

younjanatha@lakehouse.lk

**'යොවුන් ජනතා', දිනමිණ**
**අංක 35**
**ලේක් හවුස්**
**ඩී. ආර්. විජයවර්ධන මාවත**
**කොළඹ 10**

**යොවුන් ජනතා මුල් කවරය හැඩගැන්වීමට ඔබේ නිර්මාණයත්**
younjanatha@lakehouse.lk
**ලිපිනයට යොමු කරන්න**



## සම තැන කුමට ගරු කළ හැකි නම් මිනිසත්කමට?

**විධත්වය සෑමවිටම ලෝකය ඉදිරියට ගමන් කරවයි. ඒ නිසාම මේ ලෝකය තුළ ස්වභාවධර්මයා විසින් ගැහැනු පිරිමි ලෙස මනුෂ්‍යයන් වර්ග දෙකක් ලෙස නිර්මාණය කර තිබෙනවා. මනුෂ්‍යයන් පමණක් නොවෙයි සත්ත්ව ලෝකය තුළද පිරිමි සතුන් සහ ගැහැනු සතුන් වශයෙන් කොටස් දෙකක් සිටිනවා. පිරිමියා සහ ගැහැනිය ස්වභාවයෙන්ම ජීව විද්‍යාත්මක වෙනස්කම් සහිතව නිර්මාණය වී තිබෙනවා.**

ගල් යුගයේ සිට නූතන ඩිජිටල් යුගය දක්වා සමාජ පරිණාමයේදී කාන්තාවගේ භූමිකාව ක්‍රමයෙන් වෙනස් වී ඇති බව දක්නට ලැබේ. ගල් යුගයේ සිට මිනිසාගේ පරිණාමයේදී දඩයම් කිරීම පිරිමියා විසිනුත් දරුවන් බලා ගැනීම ගැහැනුන් විසිනුත් ආදී වශයෙනුත්, පසුව මිනිසුන් ශිෂ්ටාචාරගත වීමෙන් පසුවත් ගැහැනිය ඉටු කළ කාර්යයන් මෙන්ම පිරිමියා විසින් ඉටු කළ කාර්යයන්වල දිගුවක් තමයි අද දක්වා මේ පැමිණෙමින් තිබෙන්නේ. ඒ අනුව හැඩගැස්වුණු ශාරීරික ලක්ෂණ සහ මානසික ලක්ෂණ අද වන විටත් වෙන් වෙන් වශයෙන් ඔවුන් තුළ දක්නට ලැබෙනවා.

පෙර සඳහන් කළ පරිදිම මෙම ගැහැනු පිරිමි වශයෙන් තිබෙන වෙනස්කම් අලංකාරයි. ගැහැනියට කළ හැකි සියල්ල පිරිමියාට කළ නොහැකියි. පිරිමියාට කළ හැකි සියල්ල ගැහැනියට කළ නොහැකියි. ඒ වගේම ගැහැනු පිරිමි දෙවර්ගයටම කළ හැකි දේ සහ ගැහැනු පිරිමි එකතු වී කළ හැකි දේ තිබෙනවා. ඒ හේතුවෙන් තමයි පිරිමි සහ ගැහැනු ලෙස කොටස් දෙකක් ස්වභාවධර්මයා විසින් නිර්මාණය කර තිබෙන්නේ. කාන්තාවන්ට සමතැන දීම හෝ නිසි තැන දීම ගැන මේ කාලය තුළ වැඩි වැඩියෙන් කතාබහ කරන්නේ පසුගිය 8 වැනිදාට යෙදී තිබුණු කාන්තා දිනය හේතුවෙන්. ස්ත්‍රීවාදීන්, ස්ත්‍රීන්ගේ අයිතීන් ගැන මේ කාලය තුළ නිතර කතා බහට ලක් වෙනවා. ගැහැනිය සම්බන්ධයෙන් අපරදිග රටවල් දරන මතය පෙරදිග රටවල්වල් දරන මතයට සාපේක්ෂව වෙනස් වුවත්, අතීතයේ පැවති මිථ්‍යා මත දැන් දැන් අභාවයට යමින් ගැහැනිය සම්බන්ධයෙන් ප්‍රතිගාමී අදහසක් මතු වෙමින් තිබෙනවා. එය යහපත් ප්‍රවණතාවක්.

එහෙත් සමාජය තුළ පීඩනයට පත් වෙන්නේ ගැහැනිය පමණ ද කියන එක බොහෝ දෙනා මතුකරන ගැටලුවක්. පීඩාවට පත් වෙන ගැහැනු වගේම පීඩාවට පත්වන පිරිමිත් සමාජය තුළ සිටිනවා. සරල උදාහරණයක් ගතහොත් බස් රථයක ගමන් කරනා විට වුවත් ශාරීරික අපහසුතාවකින් පෙළෙන පිරිමියකුට පාපුවරුවේ ගමන් ගැනීමට සිදු වනවා. ඒ ඔහු පිරිමියෙක් වීම හේතුවෙන්. එමෙන්ම නිවස තුළදී වුවත් පීඩාවට පත්වන පිරිමින් සිටිනවා. රාජකාරියේදී වේවා බාහිර සමාජයේදී වේවා ගැහැනු අයට හිමි වරප්‍රසාද නිසාම පීඩාවට පත්වන බොහෝ පිරිමින් සිටිනවා. පිරිමියෙක් වීම නිසාම සංවේදනයන් දරා ඉවසාගෙන සිටිය යුතු වීම යන්න පවා විශාල වශයෙන් පීඩනයට පත්වීමක්. ඇත්තටම ඔවුන් පිළිබඳ කතා කිරීමට කිසි අයකු ඉදිරිපත් වන්නේ නැහැ.

මේ කරුණු පිළිබඳ සලකා බලන විට ගැටලුවක් වී ඇත්තේ ගැහැනු පිරිමි ලිංගභේදය කොටගත් ගැටලුවක් නොවේ. අනෙකාගේ අයිතීන් සුරක්ෂා කිරීමට සහ මනුෂ්‍යයන් ලෙස සංවේදී නොවීම යන ගැටලුවයි. ප්‍රාථමික මනුෂ්‍ය ගති ලක්ෂණ අහිමි වී ගොස් තිබීමයි.

මේ සමාජයට අහිමිව ගිය ළතෙත් බව සහ යහපැවත්ම ගොඩනැඟිය හැක්කේ ද කාන්තාවන්ටයි. සමාජය තුළ අම්මාවරුන් ලෙස, සහෝදරියන් ලෙස, ගුරුවරියන් ලෙස ඔබ ඔබේ දරුවාට, සහෝදරයාට, ශිෂ්‍යයාට, මනුෂ්‍යත්වයේ නාමයෙන් අනෙකාට ගරු කිරීමට, අනෙකාගේ අයිතීන් ආරක්ෂා කිරීමට උගන්වනවා නම් දිනක ඔබ අපේක්ෂා කරන ගෞරවය ඔබ වෙත ළඟා වේවි. ඔබ ඔබේ ගැහැනු හෝ පිරිමි දරුවාට තමන්ගේ වැඩ තනියම කර ගැනීමට උගන්වනවා නම් ඔබ අපේක්ෂා කරන ස්ත්‍රී අයිතිවාසිකම් මෙන්ම පිරිමි අයිතීන් ද සුරැකෙනවා ඇත.

පෙර කී පරිදිම ස්වභාවයෙන්ම ලැබෙන ජීව විද්‍යාත්මක වෙනස්කම් අභියෝගයට ලක් කරමින් ගැහැනු හෝ පිරිමි වශයෙන් සම තැන ඉල්ලීම වෙනුවට පොදුවේ මනුෂ්‍යත්වට ගරු කිරීමට හා ගැහැනු හෝ පිරිමි හෝ වේවා අනෙකාගේ අයිතීන් සුරැකීමට සමාජය පුරුදු පුහුණු කිරීම මඟින් සෑම දෙනාටම සමානාත්මකව සලකන සෑම දෙනාටම පහසුවෙන් ජීවත් විය හැකි සාධාරණ යහපත් සමාජයක් ගොඩනඟා ගන්න හැකි වනු ඇත.

**කුශාන්ති අනුරාධා බණ්ඩාර**

---

# Sex කියන්නේ මැජික් නෙවෙයි

**ලිංගිකත්වය. මොකක්ද මේ ලිංගිකත්වය කියල කියන්නෙ. අපේ සමාජයේ මිනිස්සු අපේ සංස්කෘතිය කියාගෙන, අපේකම කියාගෙන, සංවරකම කියාගෙන, හැදියාව කියාගෙන, ලිංගිකත්වය කියන දේ කතා කරන්න හරිම ලජ්ජාවක් මැළිකමක් දක්වනවා.**

අම්මල තාත්තලා දරුවො ඉන්න තැන මේ වගෙ මාතෘකා කතා කරන එක පවා හුගාක් අඩුවෙලා තියෙනවා. නමුත් ලිංගිකත්වය අමුතු දෙයක් ද? නැහැ, මේ ලිංගිකත්වය කියන්නෙත් සමාජයේ සිදු වන සාමාන්‍ය සිදුවීමක් නේද?

මේක ගැන තමාගෙ දරුවට කියා දෙන්න ලැජ්ජ මව්පියන් ඕනෙ තරම් අපි දැකල තියනවා. ඒත් වෙන්න ඕනෙ මොකක්ද ?

අද සමාජයේ මේ ලිංගික දැනුවත්කමක් නැති නිසා නොදැන ලිංගික අපචාරවලට ලක්වන ගැහැනු දරුවො වගේම පිරිමි දරුවොත් බහුතරයක් ඉන්නවා. දියණිය සමඟ ලිංගිකත්වය කියන දේ මවුපියන් විසින් කතා කළ යුතුයි. ඒක අමුතු දෙයක් නෙවේ. ඒවට නිසි කලක් එන බව ඔවුන්ට වැටහෙන්න ඕන. පුතෙක්ට උනත් මේ දේවල් කියා දෙන්න වුවමනායි. දරුවන්ව ලිංගිකව ඩැහැගන්න හුගාක් පිරිසක් බලන් ඉන්නවා. සමවයස්කාර ආදරයට ගිහින් වරද්ද ගන්න දරුවො ඉන්නවා. ඒ විතරක් නෙවේ, විවිධ මාර්ගවලින් දරුවන්ව ඩැහැගන්න මඟබලන අයත් හුගාක් මේ සමාජේ ඉන්නවා. නිකමට හිතන්න බස් එකක ගෑනු ළමයෙක්ට විතරක් නෙවේ පිරිමි ළමයෙක්ටවත් යන්න බැරි මට්ටමට සමාජය හරිම විකෘති තත්ත්වයට පත්වෙලා තියෙනවා.

නරකම කරුණ තමා විරුද්ධ ලිංගික ආකර්ෂණය නිසා සිදු වන අපචාර වගේම සමලිංගික ආකර්ෂණය නිසා ඇති වන ලිංගික අපචාරත් බහුල වීම. ලංකාව තුළ සමාජ රෝග වැඩීම ප්‍රමාණයක් බෝවීම සිදු වන්නෙ සමලිංගික ක්‍රියාකාරකම් නිසා කියල මේ වන විට හොයාගෙන තියෙනවා. දරුවන්ට මේ දේවල් ගැන ලොකු අදහසක් දැනුමක් නෑ නේද? මවුපියන් ඒ සම්බන්ධයෙන් සිතිය යුතුමයි.

ලිංගිකත්වය අමුතු දෙයක් කළොත් තමයි දරුවො ඒ දේවල් අත්හදා බැලීමේ ඉඩකඩ වැඩි වෙන්නෙ. ඒ දේවල් සාමාන්‍ය තත්වයක් විදියට දැනෙන්න දරුවන් සමඟ කතා කළහොත් දරුවන් දන්නව මේ වගේ දේවල් සමාජය තුළ සිදු වෙන බව.

'පුතේ ලිංගික ආකර්ෂණය කියන්නෙ මෙන්න මේකයි. ඒ ඒ වයසට, කාලයට ඒක සාමාන්‍ය දෙයක්. අපිට පුළුවන් ගැටලුවක් නම් ඒ ගැන ඔයාට උදවු කරන්න. එහෙම දෙයක් දරුවෙක්ට කියලා දීලා අනවශ්‍ය ගැටලු නොවෙන්න වැඩ කරන්න කියල දෙන එකයි කළ යුත්තේ. ලංකාවෙ අධ්‍යාපන ක්‍රමේ බලන්නකො ප්‍රජනනය කියල පාඩමක් තියෙනව නවයෙ පන්තියේ ඔයාලටත් මතක ඇති. ඉතින් ගුරුවරයෙකුගෙ වගකීම නේද මේ ලිංගික අධ්‍යාපනය දරුවන්ට දෙන එක. නමුත් මේක වෙන්නෙ බොහොම අල්පයක් පාසල්වල ගුරුවරු අතින් විතරයි. හුගාක් ගුරුවරු ලැජ්ජයි ලිංගිකත්වය ගැන දරුවන්ට කියල දෙන්න. 'ළමයි මේ පාඩම නම් මට කරන්න බෑ ඔයාල ඒක කියෝගන්න කියල කියන ගුරුවරු ලංකාවෙ රජයේ පාසැල්වල ඉන්නව'. ඇයි බැරි ඇයි ලැජ්ජ මේ දේවල් කියා දෙන්න. මේවා දරුවන්ට අමුතු විශේෂ දෙයක් බවට පත් කරන එකට ගුරුවරුත් වගකියන්න ඕනෙ.

වෙන්න ඕනෙ කුමක්ද?

ලිංගිකත්වය අමුතු මැජික් එකක් උනහම තමයි දරුවො ඒ ගැන අධ්‍යයනය කරන්න යන්නෙ. එයාලට නිසි ලිංගික දැනුමක් දුන්න නම් ඔවුන් ලිංගික අපචාරවලට ලක් වෙන තත්වය හුගාක් අඩු වේවි කියලයි හිතෙන්නෙ

දරුවන් සමඟ කතා කළ යුතු බෙදාගත යුතු ලිංගිකත්වය රහසක් ලෙස තබාගෙන පසුව දුක්වෙන තැනට පත් නොවී ඔවුන්ට ඒ දේවල් හරි හැටි කියා දෙමු.

හිතන්නට අවසරයි ඔබට යළිත්....

**ශක්ති සංකල්ප**

# අලි එළවන පුංචි කෙල්ල





## සුහාරා දුලකලී රත්තොට

අප රටේ බොහෝ ප්‍රදේශවල කෘෂිකර්මය මුල් වූ ආර්ථික රටාවක් පවත්නා අතර, බොහෝ පිරිසකගේ ජීවනෝපාය බවට පත් වී ඇත්තේ ගොවිතැනය. ඇතැම් මිනිසුන් හිතුමතේට කැලෑ එළිපෙහෙළි කරමින් හේන් වගා කිරීමට පුරුදුවීමෙන් වන සතුන්ට ඔවුන්ගේ වාසස්ථාන අහිමිව ගොසිනි. වැඩි වශයෙන් වන අලින් ගම් වැදීම නිතර අසන්නට ලැබෙනා දෙයක් බවට පත් වී ඇති අතර, රිළවුන්, වඳුරන් ආදි සතුන්ගෙන් ද වගාවලට මෙන්ම නිවෙස්වලට ද බොහෝ හානි සිදු වේ.

මෙවැනි වූ සතුන්ගෙන් සිදුවන හානි බොහොමයකට වගකිවයුත්තා වන්නේ ද මිනිසාමය. සතුන්ට අයිති වනය මිනිසා අයිතිකරගන්නේ නම් සතුන් මිනිසුන් වාසය කරනා ගම්වලට පැමිණෙනවා හැර වෙන කුමක් කරන්න ද? අලි පලවා හැරීම සඳහා අතීතයේ පටන් විවිධ ක්‍රමෝපායන් භාවිතයට ගැනුන ද අලි වැට වැඩි වශයෙන් භාවිත විය. එය ද අද වන විට විවිධ වූ හේතු නිසාවෙන් අක්‍රිය මට්ටමකට පත් වී තිබේ. එසේ නම් වන සතුන්ට ද හානියක් නොවනා අයුරින් මිනිසා කටයුතු කිරීමට වගබලාගත යුතුය. එසේත් නැතිනම් ගම්වදිනා වන සතුන්ට හානියක් නොවනා අයුරින් පන්නා දැමීමට වනජීවී නිලධාරීන් මෙන්ම ගම්මුන් ද ක්‍රියා කළ යුතුය.

මෙවැනි වූ බොහෝ ගැටලුවලින් පෙළෙනා ගම්මුන්ට තමන්ට සිදුවන්නා වූ වන සතුන්ගෙන් වන හානි වළකාලන්නට උපකරණයක් නිපදවීමට මෙවර අ.පො.ස. සා.පෙළ සිසුවියක් සමත් වී තිබේ. අප පසුගිය කලාපවලින් සිසුන්ගේ නව නිෂ්පාදන බොහොමයක විස්තර ඔබ වෙත ගෙන ආ අතර, මෙවර "යොවුන් ජනතා" අතිරේකය තුළින් සිසුවියකගේ නව නිෂ්පාදනයක් පිළිබඳ විස්තර ගෙන එන්නෙමු.

ඇය නමින් කේ. ආර්. සුහාරා දුලකලී රත්තොටය. ඉගෙනුම ලබන්නේ ගම්පහ යශෝදරා දේවි බාලිකා විද්‍යාලයේය. ඇය විසින් නිර්මාණය කරන ලද නව නිෂ්පාදනය වන්නේ Sound sensitive switch උපකරණයයි.

මේ ඇය නිපදවූ නව නිපැයුම පිළිබඳ විස්තර කළ අයුරුයි.

"Sound sensitive switch කියන උපකරණය භාවිතයෙන් අද කාලෙට අවශ්‍ය වෙන බොහෝ දෑ නිර්මාණය කරන්න පුළුවන්. නිවෙසක ආරක්ෂාවට, වන සතුන්ට හානියක් නොවනා අයුරින් ඔවුන්ව පලවා හැරීමට ආදි දේ සඳහා විශේෂයෙන් මෙය වැදගත්. මම අට ශ්‍රේණියේ සිටම පාසලේ නව නිපැයුම් සංගමයේ සාමාජිකාවක්. ඇත්තටම කුඩා කල සිටම එම සංගමයට සම්බන්ධ වුණු නිසයි අද මේ වගේ නිෂ්පාදනයක් කරන්න මට පුළුවන් වුණේ. Sound sensitive switch එකෙන් වෙන්නෙ අපේ අත හෝ යම් කෙනකුගේ අතක් මේ උපකරණය ආසන්නයට ආවම ශබ්දයක් නිකුත් වෙන එක. මේක සතුන් පලවා හරින උපකරණයක් විදියටත් භාවිත කරන්න පුළුවන්. විශේෂයෙන්ම අලි, වඳුරෝ, රිළවු වගේ සත්තුන්ගෙන් වන වගා හානිය වළක්වාගන්නත් මේ උපකරණයෙන් පුළුවන්."

"අලි මීමැස්සන්ගෙ ශබ්දයට බයයි කියනවා, ඒ නිසා මම මේ දවස්වල ඒ පිළිබඳ අධ්‍යයනයක් සිදු කරනවා ඒ දේ ඇත්තද කියලා බලන්න. එහෙම අලි මී මැස්සන්ගෙ ශබ්දයට බයයි නම් Sound sensitive switch එකට මීමැසි ශබ්දය යොදාගන්න පුළුවන්. ඒ වගේම රිළවුන්ටත් මේ අයුරින් Sound sensitive switch භාවිතයෙන් ශබ්දය යොදාගෙන උන්ව පලවා හරින්න පුළුවන්. ඒත් රිළවු ගොඩක් ඉක්මනට යම් යම් ශබ්දවලට හුරුවීමක් වෙන නිසා ටික කාලෙකින් ශබ්ද රටාව වෙනස් කරන්න ඕනෑ. ඒ වගේම මේ Sound sensitive switch එකට අවශ්‍ය ශබ්දය නිපදවන උපකරණත් අපේ රටේ ගන්න නෑ. පිටරටින් තමයි ගෙන්නන්නෙ. මෙමඟින් මම බලාපොරොත්තු වෙන්නෙ වන සතුන්ට හානියක් සිදු නොවෙනා විදිහට උන්ව පලවා හරින්න උපකරණ හැදීමටයි. අද කාලෙ ගොඩක් නිවුස්වලත් අහන්න ලැබෙනව නිතරම වන අලි වුණත් මිනිස්සුන්ගෙ ක්‍රියාකාරකම් හේතුවෙන් මරණයට ලක්වෙන බව. ඇත්තටම මිනිස්සු තමයි ඔවුන්ගේ වාසස්ථාන අයිති කරගෙන උන් ගම්වදිනා තැනට පත් කරගන්නේ. ඒ නිසා අපි උන්ට හානියක් නොවෙන විදිහට පලවා හරින්න වගබලාගත යුතුයි."

"මේ උපකරණය හදන්න මට ගොඩක් උදවු කළේ මගේ මාමා. එයා තමයි අවශ්‍ය හැම වෙලාවකදිම මට Sound sensitive switch එක නිර්මාණය කරන්න උදවු කළේ. ඒ වගේම මෙවැනි නිර්මාණයක් කරන්න වගේම ඒ නිර්මාණයෙන් ජයග්‍රහණ රැසක් දිනාගන්න අප පාසලේ නිව නිපැයුම් සංගමය භාර සහකාර විදුහල්පති තරංග දුනුආරච්චි ගුරුතුමා තමයි හයියක් වුණේ. තරංග සර් නැත්නම් මං අද මේ වගේ නිර්මාණ සිදු කරන තැනක නෑ. හැම වෙලාවෙම මට වගේම අපේ පාසලේ නව නිපැයුම් සංගමයේ සාමාජිකාවන්ට සර්ගෙන් ලැබෙන්නේ ලොකු හයියක්, දිරි ගැන්වීමක්. ඒ වගේම අම්ම තාත්ත, පවුලේ හැමෝමත් මට මේ නව නිපැයුමට සහයෝගය දුන්නා. මට Sound sensitive switch නිපැයුමට ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ තාක්ෂණ පීඨ ශිෂ්‍ය සංගමය මඟින් පැවැත්වූ සවිස්කාර කියන තරගයෙන් දෙවන ස්ථානයත්, කැලණිය විශ්වවිද්‍යාලයේ තරගයකින් රන් පදක්කමකුත් හිමි වුණා. මගේ බලාපොරොත්තුව තවත් මෙවැනිම වූ නිෂ්පාදන පාසලේ අධ්‍යයන කටයුතුත් සමඟම කරන්නයි."

පාසල් යන වයසේ පසුවන මෙවැනි ශිෂ්‍යාවන් අප රටට සම්පතකි. ඔවුන් කුඩා කල සිටම සිතන්නේ වැඩිහිටි අයකු හෝ උත්තර සෙවීමට වෙහෙසක් නොගන්නා ප්‍රශ්නවලට පිළිතුරුය. අමාත්‍යාංශ නමින් වෙන් වී තිබුණ ද වන සතුන් ගම්වලට වැදීම වැළැක්වීමට තවමත් හරියම් විසඳුමක් නැති අවධියක ඇය විසින් ගෙන ඇති උත්සාහය අප අගය කළ යුතුමය. අගය කර පමණක් නොනැවතී ඇයට අවැසි උපකාර කරමින් ඉන් රටට වැඩක් ගන්නා අයුරින් මෙවැනි උපකරණ නවීකරණය කර ප්‍රායෝගිකව භාවිත කිරීම බලධාරීන්ගේ යුතුකමකි.

ගයාන් සංජය

# මව් කිරිවල ණය ගෙවෙන්න ගැහැනියකට ගරු කරන්න

ලොව ඇති දරා ගත නොහැකි ලොකුම වේදනාව පිරිමියෙකු වදන්න ගැහැනියකුට දරා ගන්න වෙනවා. ඒ වේදනාව මේ ලොව කිසිම පිරිමියෙකුට දරා ගන්නවා තියා ඒ ගැන හිතන්නවත් ඔවුන් කැමති නැහැ. ඒ තරමට පිරිමියා ගැහැනිය තරම් ශක්තිමත් නෑ. දරුවකු වදන්න දදරන වේදනාව දරා ගන්න හැටි සියසින් දුටුවොත් කිසිම දවසක ගැහැනියකගේ නිරුවතට ඔබ අප සැවොම අවමන් නොකරාවි.

දරුවකු පිළිසිඳ ගත් දිනයේ පටන් මව විඳින්නා වූ දුක් කන්දරාව මෙපමණයි කියා නිම කළ නොහැක. දස මසක් ළමයෙක් තම කුස දරාගෙන කන්න, බොන්න, අඳින්න පලඳින්න, ඇවිදින්න, නිදාගන්න මේ සියල්ල කැප කරලා මෙලොව පා තබන්න ඉන්න කිරි කැටියව සුරකිනවා. දස මාසයක් යන තුරුම කිසිම මොහොතකම ඇයගේ කය සැහැල්ලුවෙන් නැත. නිතරම කකුල් වේදනාවන්, කකුල් ඉදිමීම්, කොන්දෙ කැක්කුම්, නහර ගැට ගැහීම්, වමනය මේ සියල්ල ඇය විඳගන්නේ තම දරු සෙනෙහසින්. මෙහෙම අනේක දුක් විඳ දරාගෙන පසුව ප්‍රසූතියේ දී විඳින මහ වේදනාව කිසිම දිනක පිරිමියෙකුට විඳිය හැක්කක් කියා ඔබ සිතනවාද?

ප්‍රසූත වේදනාවෙන් කෑ ගහන අවසාන තත්ත්පර ටිකේ කිරි කැටියගේ හිස එළියට එන්න ඉඩ මදි වුනාම කතුරකින් කපා මාර්ගයේ ඉඩ වැඩි කරද්දී ඒ වේදනාව ගැහැනිය කෙසේ දරා ගන්න ඇත් ද? ඒ ගැන හිතන මොහොතේ ඔබට දැනෙන දේ අමුතුවෙන් කියාපෑමට උවමනා කාරණාවක් නොවේ.

කිරි කැටියා මෙලොව එළිය දැකලා පැටියා අඬනකම් අම්මා කෙනෙක් බලාගෙන ඉන්න ජීවිතයේ එකම දවස එදින පමණයි. ඒ හැඬුම සමඟ මවගේ මුවට එන පිවිතුරු සිනහව ලොව කිසිම සිනහවකට, සතුටකට සම කළ නොහැකිය. එතැන් පටන් කිරි කැටියාගේ කඳුළු දැකීමට අකමැති මව තරම් කෙනෙකු මේ මිහිපිට නොමැත. මෙය අරුමයක් නොව එයයි ලෝක ස්වභාවය.

එහෙම ගැහැනියගේ වේදනාව මතින් උපදින පිරිමියා ගැහැනිය දෙස බලන්නේ බඩුවක්, කෑල්ලක් කොටින්ම කිව්වොත් පිරිමින්ගේ ආශාවන්ට සෙල්ලම් කරන සෙල්ලම් භාණ්ඩයක් මෙනි. මතක තියා ගන්න තමන්ගේ අම්මා, සහෝදරිය, පෙම්වතිය, බිරිය පමණක් නොව හැම ගැහැනියක්ම අම්මා කෙනෙක් බව. තමන්ගේ මව ඔබව බිහි කරන්න විඳපු වේදනාව ඒ ගැහැනියත් විඳින බව.

වේදනාවන් හිර කරන් ඇවිද ගන්න බැරිව ඔබ මම එළියට දාපු අම්මා වගේම තවත් ගැහැනියකගේ ශරීරයේ අඟ පසඟ දිහා බලලා අන්න මචන් පට්ට කෑල්ලක් කියන තරමට අද සමාජයේ ජීවත් වන ඇතැම් පිරිමින්ගේ සිත් ජරා ජීර්ණ වෙලා. ආදරවන්තයින්ගේ දිනයට තමන්ගේ සහෝදරිය වගේ ඉන්න ගැහැනු ළමයි රූම් ගානේ ඇරන් ගිහින් තත්ත්පර කිහිපයකට කාම ආශාව හිස මත තියාගෙන ගැහැනියගේ නමට කැලලක් එකතු කරන්න ඇතැම් පිරිමි දෙපාරක් නොසිතයි.

කටෙන් කිරි සුවඳ යන්නත් කලින් මල් කැකුළු කෙලෙසන අසත් පුරුෂයින් ජීවත් වන සමාජයක් මේක. අනේ අපොයි කියා වාවගන්න බැරි තරම් අපරාධ වන දූෂිත සමාජයක් වෙලා අද. මේ මොහොතේ අප කළ යුත්තේ කුමක්ද? සිතට ගන්න අද පටන් හැම ගැහැනියකටම වචනයෙන්, ක්‍රියාවෙන්, සිතුවිල්ලෙන්, ගෞරව කරන්න. එවිට මුළු මහත් සමාජයක් ඔබට ගෞරව කරාවි.

ගැහැනියව නිතරම තමන්ගේ කෙල්ල, තමන්ගේ බිරිය, තමන්ගේ අම්මට මෙන් ගෞරව කරන්න, සලකන්න, ආදරය කරන්න, ආරක්ෂා කරන්න. ගැහැනියකගේ පිරිසිදුකමට ඇඟිල්ල දික් කරන බොහෝ පිරිමින්ගේ පිරිසිදුකම මනින්නට දණ්ඩක් තිබුණා නම් අද බොහෝ පිරිමි අනාථය.

පිරිමිකම යනු ගැහැනියක් නිරුවත් කිරීම නොව ලොවට ජීවය දෙන ගැහැනියට ගෞරවය දැක්වීම සහ ආරක්ෂා කිරීම බව සිහි තබා ගන්න. එවිට ඔබ නමින් ඔබේ මව හෙළූ ලේවලට, වින්ද විලි රුදාවලට සහ පෙව් මව් කිරි වලට ණය ගෙවේවි.

එච්.එම්. චමිල්කා හර්ෂණී
ජනසන්නිවේදන අධ්‍යයන අංශය
කැලණිය විශ්වවිද්‍යාලය.

# තරණය

කාමරය පුරා බැඳුණු මකුළු දැල්වල කුමක් හෝ අරමුණක් පසුපස හඹා ගිය පුංචි පුංචි මැසි මදුරුවන් පැටලී සිටී. මාස ගණනකට ඉහත දී සෙල්වා විසින් කඩා ඉවත් කළ මකුළු දැල්වල පාරවල් බිත්තියේ තැනින් තැන තැවරී පැල්ලම් හිට තිබේ. බිත්තියේ ලෑලි කෑලි කිහිපයක් ගසා තට්ටු තට්ටු ආකාරයෙන් සෙල්වාට කියා සකස් කරගත් මගේ පුංචි පුස්තකාලයේ පොත් හරහා කළු කූඹීන් පෝලිමට ගමන් කරති. ඒවා මත දූවිලි බැඳී ඇති ආකාරයකි. ඇඳෙහි උඩුබැලි අතට ඇල වී සිටියත් ඇඳ ඇතිරිල්ලේ තුනී නොවූ දවසෙන් දවස ඉක්මවා යන පුසුඹ දරාගෙන ඉන්නවා ඇරෙන්නට කරන්නට දෙයක් නැත. දොර මුල්ලට වන්නට තබා තිබූ ඉස්කිරීමේ රෙදි ඔහේ එල්ලීගෙන මගේ දිහා බලා සිටියද ඇගේ දැවටී සිටින නිල් පාට කොටු සරම දැන් නම් ගුරු පාටට හැරෙමින් කාරං ගඳ ගසමින් තිබේ. පෙර දවසක සිතුවම් කළ චිත්‍ර කිහිපයක් බිත්තියේ එල්ලී එදා ආකාරයෙන්ම උන්හිටි තැන්වලම ලැග සිටී. මගේ ඇඳට ඉදිරියෙන් එල්ලා තිබුණේ මගේ ජීවිතේ මා වඩාත්ම ප්‍රිය කළ නාරංගල කඳු මුදුණේ සිතුවමකි. එය මගේ ජීවිතයේ බරපතළම සටහන තැබූ සිතුවමයි. කොඳු ඇට පේළිය කෙළින් කර නැගිට ගන්නට හැකි වුණත් නැවතත් ඒ පැත්තවත් බලන්නට මා නොසිතනු නො අනුමානය. නමුත් සිතින් නිතරම අනුස්මරණය කරන්නට මගේ සිත පුරුදු වී සිටී.

කාමරයට පිටතින් දවස පුරාම ඇසෙන්නේ නොතේරෙන භාෂාවකි. පැය 24න් පැය දහයක් දොළහක් දමිල භාෂාවෙන් කෑගහන රූපවාහිනියේ ශබ්දය ඇසුණත් ඉන් එක වචනයක්වත් තේරුම් ගන්නට මට නොහැකිය. මගේ ව්‍යාපාරික කටයුතු කළ මේසය පුරාම නාවර තැවරී තිබෙනු පෙනේ. ඒ හැමදාමත් සෙල්වා ගෙනැවිත් තබන තේ කෝප්පයේ අඩියේ තැවරුණු සීනි දැමූ තේ පැල්ලම් නිසාත් බත් පිඟානෙන් වැටෙන බත් ඇට දෙක තුන දින ගණනාවක් තිස්සේ මේසය මත තිබීම නිසාත් ය. ඒ නිසාම කූඹීන් නිතරම මේසය උන්ගේ හෝටලය කරගෙන තිබුණා විය හැකිය. මගේ තනිය මකන උන් වෙනුවෙන් ඇතැම් වෙලාවට මම බත් ඇට කිහිපයක් මේසය උඩින් තබමි. උන් ඇවිත් බත් ඇටෙන් ඇටේ දැඩි වෙහෙසකින් උසුලාගෙන යන අයුරු මා බලා සිටින්නේ ආසාවෙනි.

දින, සති ඇවෑමෙන් මම උන් සමඟ කතා කරන්නට පුරුදු වීමි. උන්ට නොතේරුණත් මම ඇඳේ වැතිරී ගෙනම මේසය මතට අත තියා අතට ගොඩවන කුහුඹුවන් ඇඟිලි තුඩුවලට මාරු කරමින් ඔවුන් සමඟ සෙල්ලම් කරමි. උන් එක්කම මහ හයියෙන් සිනාසුණෙමි. ඒත් දවසේ වැටුපට මා බලාගන්නට ගෙනත් දමා සිටි සෙල්වාට ඉන්දියානු දමිළ කතා හා චිත්‍රපට හැරෙන්නට වෙන කිසිවක් ඇසෙන්නට නැතැයි මා සිතුවද 'දැන් මනුස්සයගෙ ඔළුවත් අවුල් වගේ මාත්තයා. වෙලාවට තනියේ ඉනා වෙනවා. තනියේ කතා කියනවා. ඒම තමා ඉතිං...' ලෙස අම්මාගේ නෑදෑ සහෝදරයකු ආ විට සෙල්වා ඔහු සමඟ කියනු ඇසීමෙන් මට තේරුම් ගියේ සෙල්වාට මගේ කෙරුවාවල් ඇසෙන බවයි.

මට තේරෙන වයසට ආ විටම අම්මාත් මාත් අතහැර තාත්තා වෙනම පවුල් ජීවිතයකට කොටුවීමෙන් පසු අම්මාට උරුමයෙන් ලැබුණු මෙම විසල් නිවෙසේ තනි දරුවා ලෙස මා හැදුණේ අභිමානයෙනි. අම්මාගේ ව්‍යාපාරික කටයුතු තුළ කුඩා කාලයේ සිටම මම කොටස්කරුවෙක් වීමි. මගේ මිතුරන් එකම පැලැන්තියක උන් විය. අම්මා හදිසි හෘදයාබාධයකින් මේ විසල් නිවෙස තුළ මාව අතැර යන්නට පෙර නිවාඩුවකට මගේ මිතුරන් සමඟ ජීවිතයේ වැඩිම වාර ගණනක් නැඟ තිබූ නාරංගල කන්ද නැඟීම අද මා මේ ඉන්න තත්ත්වයට පත්කළ ඛේදජනක තත්පර කිහිපය මා වෙත ගෙන ආ සුන්දරම වටපිටාවයි.

වඩාත් ගැඹුරු ප්‍රපාතයක් නොවූවත් මගේ හොඳම මිතුරාගේ විහිළුවකින් පය තැබූ ගල ලිස්සා ගොස් ගලක කොන්ද හිස ගලක වැදීමෙන් මා එක්තැන් වී දැන් අවුරුද්දක් ගතවී ගොසිනි. අම්මාගේ මරණයෙන් පසු නෑදෑ වර්ගයා ගෙට ගොඩ වූයේ ඉඳහිට ය. එසේ ගෙට ගොඩවන්නේද මගේ හුස්ම නතර වී ඇත්දැයි බලන්නට විය යුතුය. මමත් සමඟ එකට මහ ඉහළින් සාජ්ජ දැමූ, සවාරි ගැසූ එක මිතුරකුවත් අම්මාගේ මරණයේදී දුටු බවට මතකයක් නැත. අම්මාගේ ව්‍යාපාරය ද අම්මාගේ එකම සහෝදරයාගේ ව්‍යාපාරයට බද්ධ විය. සතියකට වරක් මාගේ සෞඛ්‍ය තත්ත්වය පරීක්ෂා කිරීමට පැමිණි පවුලේ දොස්තර මහත්තයා ද නෑදෑ වර්ගයාගේ වුවමනාවට මඟ ඇරියා විය යුතුය. ඉතිරි වූයේ ඔවුන් විසින්ම ගෙදර වතුපිටි බලා කියා ගන්නට ගෙනත් දැමූ සෙල්වා පමණකි.

මා පිරිසිදුව තබා ගැනීමට සෙල්වා උනන්දු නොවීය. කරපන් ය කියලා කියන්නටත් බියක් මට ඇති වූයේ මෙම විශාල ගෙදර නොතේරෙන භාෂාවකින් හෝ පාළු මකන්නට සිටියේ සෙල්වා පමණක් නිසාය. හැමදාමත් සෙල්වා උදේට විවෘත කරන ජනේලයෙන් දළදා මාලිගාව රත්තරන් පාටින් දිලිසෙනු පෙනුණත් කොන්ද කෙළින් කර ගන්නට මට තවම වාසනාවක් නැත. ලී පරාල දකින හැම වෙලාවකදීම වැල් පටකින් ගෙල සිර කර ගැනීමට මට සිතෙයි. ඒත් කුහුඹුවන් ගැන මට දුක සිතෙයි. ඇරත් කොහොම නැගිට ගන්ටද?

මට තේරෙන වයසට ආ විටම අම්මාත් මාත් අතහැර තාත්තා වෙනම පවුල් ජීවිතයකට කොටුවීමෙන් පසු අම්මාට උරුමයෙන් ලැබුණු මෙම විසල් නිවෙසේ තනි දරුවා ලෙස මා හැදුණේ අභිමානයෙනි. අම්මාගේ ව්‍යාපාරික කටයුතු තුළ කුඩා කාලයේ සිටම මම කොටස්කරුවෙක් වීමි.

'නෑ තවත් තේරුමක් නෑ... මොකටද මේ ජීවිතය තවත්?... මම මේක ඉවරයක් කරනවා...'

මම තදින්ම මරණයේ අරමුණට පිවිසුණෙමි. තව දුරටත් ජීවිතය අල්ලාගෙන සිටීමට කුහුඹුවන් ගාවා ගැනීම ගැන ස්වයං ලැජ්ජාවක් මට ඇතිවිය. දෑතේ වීරියෙන් මේසය තදින්ම අල්ලාගෙන ඇඳ දිගේ ඇදී මේසයට කිට්ටු වී කකුල් දෙක බිම තියා සිමෙන්ති පොළොවේ සීතල පතුල් දිගේ ඇඟ පුරා දුවන්නට ඉඩ හැරියෙමි. නොතේරෙන භාෂාවෙන් සෙල්වාගේ චිත්‍රපට පෙට්ටිය මහා හයියෙන් කෑ ගසයි. රෝද පුටුව පැත්තකට තල්ලු කර මේසයට වාරු වී ඇඳෙහි එළා තිබූ ඇතිරිල්ල ගැලවී එන සේ ඇද කකුල් දෙකට බර දී සිට ගත්තෙමි. වේදනාව තව තවත් ඇඟ පුරා ඇවිළෙද්දී නැවත වරක් ඇඳට වාරු නොවෙන්නට සිතුවෙමි. වහලයේ ලී පරාලයත්, ඇඳ ඇතිරිල්ලත් දෙස බැලුවෙමි. මා කරන්නට යන දේ පිළිබඳ අමන හැඟීමක් මට දැනෙන්නට විය. අරමුණ සැණෙකින් වෙනස් විය. ඇඳ ඇතිරිල්ල පැත්තකට වීසි කළෙමි.

'ඇයි මම මෙච්චර දවස් නැගිට්ටේ නැත්තෙ. ඇයි මම නැගිට්ටේ නැත්තෙ.' මම මහ හයියෙන් කෑ ගැසුවෙමි. රූපවාහිනිය කෑගැහිල්ල නැවතිණි. සෙල්වා දොර රෙද්ද ඇත් කර බියෙන් මෙන් එබී බලන්නට විය.

'මම නැගිට්ට සෙල්වා... යකෝ මම නැගිට්ටා... තොපිට පේනවද මම නැගිට්ටා...' සෙල්වාටත් මේසය මත සිටි කූඹීන්ටත් මම කෑ ගසා කීවෙමි.

'මේක මහ අපූරු තරණයක්' මට සිතෙන්නට විය. මම තවත් පියවරක් ඉදිරියට තැබුවෙමි.

■ ශශී විජේරත්න








# හරියට USE කරමු

සංවර්ධනය, නවීනත්වය හඹා යන ලෝකයට සමාජ මාධ්‍ය කියන්නේ නැතුවම බැරි දෙයක්. ෆේස්බුක්, ට්විටර්, වට්ස්ඇප්, ඉමෝ, ස්නැප්චැට් කියන්නේ සමාජ මාධ්‍යවලට උදාහරණ කීපයක්. මේ අතුරින් ෆේස්බුක් තමයි ජනප්‍රියම සමාජ මාධ්‍ය මාදිලිය. පුද්ගලයන් සමඟ අදහස් බෙදාගන්න, තොරතුරු හුවමාරු කරගන්න, ඡායාරූප, වීඩියෝ ආදිය බෙදාගන්න වගේම ව්‍යාපාර කටයුතු සඳහා සමාජ මාධ්‍ය විශාල පිටිවහලක් වෙනවා.



සමාජ මාධ්‍ය ඕනෑම වයස් කාණ්ඩයක ගැහැනු පිරිමි භේදයකින් තොරව, ජාති භේදයකින් තොරව ඕනෑම කෙනෙකුට පහසුවෙන් භාවිත කරන්න පුළුවන්. මෙන්න මේ කියන කාරණාව හින්දම මේ වෙද්දී බොහෝ ගැටලු මතුවෙලා තියෙනවා. අදහස්, තොරතුරු, දැනුම හුවමාරු කරගන්නවා වෙනුවට අද වෙද්දී එකිනෙකාට මඩ ප්‍රහාර එල්ල කරගන්න, විවේචනය කරන්න, චෝදනා කරන්න, අපහාස කරන්න වගේ පහත් ක්‍රියාවන් සඳහා සමාජ මාධ්‍ය භාවිත කිරීම සුලබ සිදුවීමක්. මේ තත්ත්වය බහුලව දකින්න පුළුවන් කාල සීමාවක් විදියට මැතිවරණ කාල සීමාව කැපී පෙනෙනවා. ඒ විතරක් නෙවෙයි ජනප්‍රිය චරිත ඒ කියන්නේ ගායක ගායිකාවන්, නළු නිළියන් වැනි ජනප්‍රිය පුද්ගලයින් අළලා සිදු කරන අපහාස සමාජ මාධ්‍ය තුළ නිරන්තරයෙන් සංසරණය වෙනවා. ඒ වගේම විශ්වවිද්‍යාල ශිෂ්‍ය ප්‍රජාව අරමුණු කරගෙන තවත් නොයෙක් ආකාරයේ මඩ ප්‍රහාර සමාජ මාධ්‍ය හරහා එල්ල වෙනවා. එහෙම නැත්නම් ප්‍රසිද්ධ පුද්ගලයකුගේ ඡායාරූපයක් විකෘති කරල අපහාස කිරීමත් ඒ තුළින් විනෝදයක් ලැබීමත් අද වෙනකොට රැල්ලක් බවට පත්වෙලා.

මේ කියන කාරණාවලට මුහුණු පොතෙහි පිටු (pages) මූලිකවම හේතුවක් වෙලා තියෙනවා. ෆේස්බුක් පේජ් මගින් නිර්මාණය කරන පෝස්ටු මුහුණු පොතේ පමණක් නෙවෙයි වට්ස්ඇප් ස්ටේටස්, ඉමෝ ස්ටෝරි, වයිබර් ආදී සෑම සමාජ මාධ්‍යකම සංසරණය වීම විශේෂත්වයක්. වට්ස්ඇප් ස්ටේටස් දැමීම කියන්නෙත් ජනප්‍රිය වුණ රැල්ලක්. අදහස් බෙදා ගැනීම විතරක් නෙවෙයි සමාජ මාධ්‍ය මගින් අතිශය පෞද්ගලික තොරතුරු, පවුල් ප්‍රශ්න, ආදර සබඳතා, ආදරය අහිමි වූ බව පවසා අත් කපාගෙන සංවේදී ඡායාරූප දැමීම, වීඩියෝ පට බෙදා ගැනීම, නිරුවත ප්‍රදර්ශනය කිරීමත්, හෝටල් හෝ කෑම කඩ ආදියට ගොස් කෑම කන ඡායාරූප ප්‍රදර්ශනය කිරීම, යන එන සියලුම ගමන් බිමන් සහ කරන කියන සියලුම වැඩ කටයුතු සමාජ මාධ්‍ය තුළින් ඉදිරිපත් කිරීම ආදී ඇතැම් ක්‍රියාවන් නිසා පුද්ගලයින් සමාජයක් ඉදිරියේ හෑල්ලු වීම, පෞරුෂයට හානිවීම, ලැජ්ජාවට පත් වීම හා විහිළුවක් බවට පත්වීම නිරායාසයෙන්ම වෙනවා. ඒ විතරක් නෙවෙයි ජනප්‍රිය පුද්ගලයින්ගේ පවුල් පසුබිම, පවුල් ආරවුල්, විවාහය, දික්කසාදය, ඇඳුම් පැලඳුම් පිළිබඳව උවමනාවටත් වඩා උනන්දු වීම හා විවේචනය, පරුෂ වචනයෙන් අදහස් දැක්වීම ආදිය ශ්‍රී ලංකාව තුළ බහුලව දක්නට ලැබෙන පහත් ක්‍රියාවන්.

මෙවැනි ක්‍රියා ඇතැම් විට නොදැනුවත්ව කරන අය මෙන්ම කෙනෙකුට අපහාස කිරීමේ අරමුණින් ම ප්‍රචාරය කරන පුද්ගලයින් සමාජය තුළ දක්නට ලැබෙනවා. බොහෝවිට අනවබෝධය හෝ පහත් මානසිකත්වය මෙවන් ක්‍රියාවලට මූලිකම හේතුවක්. සමාජ මාධ්‍ය මඟින් සිද්ධ වෙන්න ඕන මේ දේවල් ද? ඇත්තටම සමාජ මාධ්‍ය භාවිත කරන්නේ මොකට ද? කියන කාරණාව සමාජ මාධ්‍ය පරිශීලකයින් විදිහට හැමෝම අවබෝධයෙන් ක්‍රියා කරන්න ඕන. සමාජ මාධ්‍ය භාවිත කරන්න වයස් භේදයක් අධ්‍යාපන මට්ටමක් නැති වීම නිසා පාසල් යන කුඩා දරුවන් පවා නොතේරුම්කමත්, අනවබෝධයත් හේතුවෙන් විවිධ නුසුදුසු ඡායාරූප හා අදහස් සමාජ මාධ්‍ය තුළ බෙදා ගැනීම දක්නට ලැබෙනවා. කාන්තාවන් විලසට පිරිමි පාර්ශ්වය ව්‍යාජ ගිණුම් සාදා කාන්තාවන් රැවටීම, නන්නාඳුනන අයට කෙටි පණිවුඩ යවා ඇමතුම් මගින් නිතර නිතර කරදර කිරීම, ලිංගික අල්ලස් ඉල්ලීම, තර්ජනය කිරීම වැනි බොහෝ වැරදි ක්‍රියාවන් වළක්වා ගැනීමට සමාජ මාධ්‍ය නිවැරදිව පරිහරණය කිරීම අනිවාර්යෙන්ම කළ යුතුයි. මුහුණු පොතට මිතුරන් ඇතුළත් කර ගැනීමේදී තමන් හොඳින් දන්නා කියන අයව එක්කර ගැනීම මගින් ගැටලු බොහොමයක් අඩුවෙනවා. නන්නාදුනන පුද්ගලයින්ගෙන් ඇමතුම් පණිවිඩ අනවශ්‍ය ලෙස එනව නම් අවහිර (blok) කිරීමක් සිද්ධ කරන්න පුළුවන්. ඒ වගේම මුහුණ පොතට ඡායාරූප එකතු කිරීමේදී ඡායාරූප තවත් කෙනෙකුට ලබා නොගැනීමට (profile picture guard) දැමිය හැකියි. ඒ වගේම තනිව, සම්පූර්ණ පින්තූර සමාජ මාධ්‍ය හරහා බෙදාගැනීමේදී කාන්තාවන් වඩාත් සැලකිලිමත් විය යුතුයි.

සමාජ මාධ්‍ය අත්‍යවශ්‍ය කාරණාවලට විතරක් යොදවා ගත්තොත් ගැටලු බොහොමයක් අවම කරගන්න පුළුවන්. කාර්යයන් පහසු කරගැනීම සහ කාලය ඉතිරි කිරීමට සමාජ මාධ්‍ය කියන්නේ ඇත්තටම වැදගත් භාවිතාවක්. whatsapp business app වැනි සමාජ මාධ්‍ය මාදිලි තුළින් ව්‍යාපාර කටයුතු සාර්ථකව කර ගැනීමට ගනුදෙනු කිරීමට පාරිභෝගිකයින් සමඟ තොරතුරු අදහස් බෙදා ගැනීමට විශාල රුකුලක් වෙනවා. රැකියා ස්ථානයේ රැස්වීම්, අධ්‍යාපන වැඩසටහන්, සම්මන්ත්‍රණ ආදියට තැනින් තැනට යාමට වැය වන ගමන් වියදම් හා කාලය නාස්තිය වෙනුවට සමාජ මාධ්‍ය මගින් තත්පර කිහිපයක් ඇතුළත සියලුම දේවල් තමා වෙත ළඟා කරගන්න පුළුවන්. අත්‍යවශ්‍ය සටහන්, ඡායාරූප ආදිය ලෝකේ ඕනෑම තැනක සිට ඉතා ඉක්මනින් ගෙන්වා ගැනීමටත් පුළුවන්. නෑදෑයින්, මිතුරන් නිතර නිතර බලන්න යන්න බැරි වුණත් වීඩියෝ ඇමතුම් මගින් සමීපව ගනුදෙනු කරන්න හැකියාවක් ලැබිලා තියෙනවා. අනුන්ට අපහාසයක් නොවන විදිහට සහ තමාගේ පෞද්ගලිකත්වයට හානි නොවන අයුරින් සමාජ මාධ්‍ය භාවිත කිරීම තුළ තමන්ටත් අනුන්ටත් හිරිහැරයක් නොවී කාර්යක්ෂම සේවාවක් සපයා ගැනීමට සමාජ මාධ්‍ය කියන්නේ විශාල සේවාවක්.

■ චමෝදි පෙරේරා
ජනසන්නිවේදන අධ්‍යනාංශය
කැලණිය විශ්වවිද්‍යාලය

# ගුණධර්ම පිරිහී ගිය සමාජයක අපි

ගුණධර්ම වූකලි මිනිසා හට ජීවිතය නම් වූ යාත්‍රාව නිවැරදි වූද යහපත් වූද මාර්ගයක් ඔස්සේ යාත්‍රා කිරීමට උපකාරි වන්නා වූ දෙයකි. ගුණධර්ම කිසිවිටකත් මිල මුදල්, බලය තුළින් උපයාගත නොහැකිය. මිනිස් ජීවිතය තුළ කිසිම සොරසතුරෙකුට ගත නොහැකි එකම ආභරණය වන්නේද ගුණධර්මය. එය සෑම මිනිසකු සතුව අනිවාර්යයෙන් පැවතිය යුතු දෙයකි. නමුදු වර්තමාන සමාජය තුළ ජීවත් වන මිනිසුන් තුළ ගුණධර්ම පවතින්නේ ද යන්න පිළිබඳව ඇත්තේ ගැටලුවකි. කුඩා කල සිටම ගුණධර්ම තම මාපියන්ගෙන් ද පාසල හා දහම් පාසල තුළින් ද ඉගෙන ගනු ලබන අතර, එය වැඩිහිටි වියට ගිය පසු ගුණධර්ම අමතක වන්නේ ඇයි දැයි පිළිබඳ ඇත්තේ ගැටලුවකි.

වර්තමාන සමාජය තුළ බොහෝ අසන්නට දකින්නට ලැබෙනුයේ ප්‍රචණ්ඩකාරී සිදුවීම්ය. මිනිසා තුළ ගුණධර්ම ක්‍රමක් ක්‍රමයෙන් පිරිහී යන්නට පටන්ගෙන ඇත. විශේෂයෙන් මේ දින ප්‍රචණ්ඩකාරී බොහෝ සිදුවීම් රැසක් සිදු විය. පුංචි දරුවන් හට කුරිරු ලෙස පහරදීම්, සියදිවි නසා ගැනීම්, මිනී මැරුම් වැනි පුවත් නිතර අසන්නට දකින්නට ලැබෙන්නේ මිනිසුන්ගේ ගුණධර්මවල ප්‍රමාණය ඉස්මතු කරමිනි. මෙවන් ප්‍රචණ්ඩකාරී කුරිරු සිදුවීම් වර්තමානය තුළ නව රැල්ලක් බවට පත්ව ඇත.

බොහෝ මිනිසුන් පුරුදු වී ඇත්තේ ප්‍රශ්න හමුවේ පලා යාමටය. ඒ සඳහා තම ජීවිතය නසා ගැනීමට පෙලඹේ. මේ දිනවල රට තුළ බොහෝදෙනෙකු කතා කරනුයේ වේල්ල වීදියේ බෑගයකින් හමු වූ කාන්තා මළසිරුර පිළිබඳය. එම මිනීමැරුම කළ වරදකරු ද සියදිවි නසා ගෙන ඇත. ඔහු කළ වරදින් පලායාමට තම ජීවිතය නසා ගත්ත ද ඔහුගේ බිරිඳ දූදරුවන් සමාජයට මුහුණ දිය යුතුය. සමාජය තුළින් එල්ල වන ගැරහුම්වලට ද ලක්වීමට සිදුව ඇත. එක් වරදක් තුළින් මිනිස් ජීවිත කීයක් නම් අසරණ වනවා ද දුක්විඳිනවා ද යන්න මෙයින් තේරුම්ගත හැකිය. මිනිසුන් තුළ ගුණධර්ම තිබුණේ නම් මෙවන් දෑ සිදු නොවනු ඇත. තමා ජීවත් විය යුත්තේ කිසිවකුට හිංසාවක් පීඩනයක් නොවන අයුරිනි. වර්තමානයේ දක්නට නොලැබෙන්නේ ද එයය. සෑමවිටම තම ආගමදහමට අනුව ජීවිතය ගෙවීමට උත්සහ කළ යුතුය. එවිට ජීවිතය නිවැරදි මාර්ගය ඔස්සේ ගෙනයා හැකිය. නැතහොත් සිදු වන්නේ තම වැරදි තුළින් තම ජීවිතය මෙන්ම අන් අයගේ ජීවිත ද දුකට ඇද දැමීමය. ජීවිත කාලය පුරා පසුතැවිලිවීමට වඩා ගුණධර්මවලින් පූර්ණ වූ මිනිසකු ලෙස ජීවත්වීම ඔබට මෙන්ම ඔබේ ආදරණීයයන්ට ද යහපත් වූවකි.

■ නවෝදා වීරසිංහ
නැගෙනහිර විශ්වවිද්‍යාලය

## ඉස්කෝලේ ආදරය

රෙජිස්ට්‍රාර් වුණේ කවුද
දන්නේ නෑ අපි තවම
ලියවුණේ කෙළවරම
මේසෙ අපෙ නම් දෙකම
ලොකු සර් වෙලා මම
ආවෙ ඊයේ හවස
ගත වෙලා හරියටම
වසර තිස් හතරක්ම
ගියා මම වටයක්ම
"පරණ නෑ එකක්වත්
ඔක්කොම අලුත් මේස"
මතක් වුණා එකවරම
බැන්දෙ නැහැ අපි තවම......

**චතුර කවින්ද්‍ර**

## සුහදයාණෙනි!

පන්හිඳක තුඩ අගට
දහස් සිතුවිලි අරන්
කොඳ සිසිල කැටි කරන්
ඔබ ඇවිත් දුර ඉඳන්
හිත අරන් ළඟ තියන්
පිරිමදියි සෙනෙහසින්
තනා ඉණමං තුටින්
සිනාසෙයි හදවතින්
වසරකට එක දොහක්
අවැසි නැහැ මල් මිටක්
උපන් දින සැමරුමට
කුමට ආසිරි කදක්
සුහදයාණෙනි ඔබයි
සංසාර පවනැල්ල
මට නිතින් තනි රකින
සෙනෙහසේ සෙවණැල්ල

**දම්මිණී ප්‍රේමචන්ද්‍ර ෆොන්සේකා**

ඔබේ කවි නිර්මාණ පහත ලිපිනයට යොමු කරන්න
'යොවුන් ජනතා', දිනමිණ
අංක 35, ලේක්හවුස්, ඩී.ආර්. විජයවර්ධන මාවත, කොළඹ 10.
younjanatha@lakehouse.lk

## නුඹ,

සඳක් මෙන් නැග ආ
මගේ සිත් අහසට
තරු පවා හිනැහුණා
උමතුවී උණුසුම්ව
අන්ධකාරය මැදින්

අතරමැද දිළිහුණු
කදෝකිම් එළි රටා
මැදහත්ව හෙමිහිට
එදා වාගෙම ළඟින් හිඳ
අද වුණත් කියන්නෙම
ශේෂ වුණු හීනයක් නුඹ මට ......

**ලීමා උක්වත්ත**

## පිරිමි හදවත

ඉවසුමක් නොමැති රාගය
පිරිමි හදවත සසල කෙරුවත්
තන පුඩුවක පහස ලබනා
සිඟිති කැකුළක් දුටුව මොහොතක
ඔහුගේ හිස ඉවත යනුයේ
බොර දියක් හෝ නිසල වීමෙන්
කුසට දිය බිඳක් ලැබෙන සේ
රාගයෙන් තොර ධර්මයෙන් වැඩි
විටක පිරිමි හද
රන් කඳක් සේ ඉස්තරම් බැව් නොවෙද?

**රිෂානි රවීනා**
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය





## කුවේණිය....

කුඹ ගහක් පේනකොට
මුහුදු රැල්ලට උඩින්
හිත කිවුවෙ නෑ
ඒ එන්නෙ හෙවණැල්ල කියලා
මම පාඩුවේ හිටියෙ ඒකයි
මතකයි ද ඔයාට

හැමදාම මම වියන රෙද්දෙ
දුවනකොට ඒ ඇස්
පැටලුණා මගෙ ඇඟිලි
අනවසරයෙන්මයි එදත්
පෙරමුණ ගත්තෙ ඔයා
එදත් මං ඉවසුවා
මගෙ ගෑනුකමට

නිදිකුම්බා පැළයක් වගේ
නිදාගෙන තිබුණෙ මගෙ හිත
හීන නොදැක්කට
හිතක රැජිනක් වෙන්න
බොරු නෙවෙයි මේ ඇත්ත

හැමදේම අමතක ඔයාට
එදා මං ගියාට පස්සෙ
වම් උරහිසට පහළින්
වෙනදා නැති වේදනාවක්
නිතරම දැනෙනවා ලු නේද

අවුරුදු තිස් අටකට පස්සෙත්
ඔයා මැරුණෙ
අපේ දරුවො දෙන්නගෙ
තාත්තා විදිහට කියලා
ඉතිහාසය පොතේ තියෙනවා
මම දැක්කා විජය

**අසන්ති කරුණානායක**

## මනුස්ස මල්

පිපී කටු මත හිනැහියන් මල්
දුහුල් සුළඟට පාවි පාවී
සුවඳ විහිදා බිමට නැමියන්
කටු පොකුරු මැද පේවි පේවී

හීන් පිනි බිඳු වැටෙන විටකදී
හිතින් නොහඬන් නැහැවි නෑවී
පරව යන දා පෙති අතැර බිම
මතක තිබියන් ගෑවි ගෑවී

හුඟක් තුරු හිස් මුදුන් තිබුණත්
ඇතැම් මල් වල සුවඳ තැවරී
පොළොව සිඹිනා හුඟක් මල් මයි
තිබුණෙ හිත් යට නැවති නැවතී...

මිනිස් සුවඳැති මලක් පිපුණම
හඳවතේ මැද සැදී පැහැදී
පයට පෑගී ගියත් කම්නැත
තුරු මුදුන්වල නොයා පර වී..

**මදුෂානි වීදිගේ**

## ළාම ළා කොළ දුහුල් සළුව

ඉතින් මෙතුවක්
මා ඔය හිතේ
ඇඳි සිතුවම්වල
පාට සළු
ලෙහාගෙන
අරං යන්නම්.....

රැගෙන ගොස්
ඒ පාට සළු
ගඟ දියේ
සෝදා හරින්නම්

තවත් දවසක
අයෙක් ඇවිදින්
ආයෙමත් ඔය හිතේ
තවරයි
පලඳවයි
හැඩ බලයි
නෙක වර්ණ
කසී සළු ....

ඒත් මියෙන තුරු
රැක ගන්න
ඔය හිතේ
මා ඇන්ඳූ
ළාම ළා කොළ
දුහුල් සළුව.....

**වජිර කුමාරසිංහ**

## අම්මා

මොළකැටි අල්ල උඩ දියගැට ඉකි බින්දා
වැරහැලි කඩ රෙද්ද දහදිය රස වින්දා
නිවන් පුරය ගව් ගානක් දුර හින්දා
අම්මට මගේ දුක නොපෙනෙනවද මන්දා

හේනයි කුඹුරු යායයි මගෙ පදිංචිය
සමහර දාට මගෙ නිවහන පළංචිය
කෑමට කාඩ් හොද්දට ලුණු කරිංචිය
පාසල ගුරු ගෙදර පැන්සල තහංචිය

කන් බෙර කුඩම්මගෙ කට දිග පළල දනී
තට්ටම් රතු වෙලා වේවැල් සිහිල දැනී
මගේ සිනා කළු ඉංගිරියාවෙ ඇනී
සොහොන් කාලි ඇගෙ සිරුරට ප්‍රලය වුණී

පියා ළඟදී සිරි සරසවි වර ලද්ද
නිළියකි කුඩම්මා දෙරණත පර සිද්ධ
අනිත් වෙලාවට ගෙයි කඩු පොලු යුද්ධ
අම්මේ නිවන් පුරයේ මට ඉඩ නැද්ද

පිඟන් තුනක බත් මේසෙට පිය මැන්නා
දවසක් එතෙන්ටම තඩි බළලෙක් පැන්නා
එයින් දෙකක බත් යට සැඟවී ඉන්නා
බිත්තර දෙකක් අඬ අඬ ඉවතට පැන්නා

කිවිසුම් හඬ පවා මලයගෙ නගාගේ
දුටුවේ කුඩම්මා විලසිනි වියෝගේ
දරුණු රැදා ගත වැකුණත් මෙමාගේ
කඳුළු පොදක් නැත නෙත්වල එයාගේ

රහසින් කුඩම්මගෙ කන ඇතුළෙන් රිංගා
කැත්තයි උදැල්ලයි දොර මුල්ලේ හංගා
පිහිනා නිවන් සමුදුර වෙත යන ගංගා
අම්මේ ඔබ සොයා එමි හසරැලි නංගා

**ලක්ෂාන් සමීර**



# රියැලිටියේ රියැලිටිය

රියැලිටි තරු, රියැලිටි වැඩසටහන් ලංකාවේ බොහෝ දෙනකුට හුරුපුරුදු වචනයක්. ඒක ගැන අටුවා ටීකා ටිප්පණි කියන්න අවශ්‍ය වෙන්නෙ නෑ. තුරුණු ශක්තිවලින් ආරම්භ වෙන ලාංකික රියැලිටි කලාව පසු කාලීනව පෞද්ගලික රූපවාහිනී නාලිකා හරහා ලංකාවම උන්මාදයක් ලෙසින් වැලඳ ගන්නවා. වත්මනේ ලාංකික කලා ක්ෂේත්‍රයේ හිණිපෙත්ත මත සිටින අතිදක්ෂ ගායක ගායිකාවන් වගේම සමහර අවස්ථාවලදී ජයග්‍රහණය නොකෙරුවත් දක්ෂ නිර්මාණකරුවන් වුණු අය පවා බිහි වෙන්නෙ රියැලිටි වේදිකාවලින්.

එහෙත් බොහෝ අවස්ථාවලදී ඔවුන් සොයායන්නේ ගායන තරු පමණයි. එමගින් බොහෝ නවකයන්ට අවස්ථාවන් ලැබුණ ද මාස් මීඩියා ඇතුළේ තවමත් ලංකාවෙ රියැලිටි වැඩසටහන් තියෙන්නේ ගෝත්‍රිකව හිරවෙලා. කිසි විටකත් වෙනස් දෙයක් කිරීමට උත්සාහ කරන්නෙ නැහැ. රියැලිටි සංකල්පය යනු බොහෝ පරාසයක් පුරා විහිදී යන සංකීර්ණ ක්‍රියාවලියක්. නමුත් ලාංකේය මාධ්‍ය ආයතන එය වෙනසක් කිරීමට උත්සාහ නොකර තවමත් සුපිරි ගී තරුව කියන රාමුව ඇතුළෙ හිරවෙලා සිටින බවක් දැක ගන්නට පුළුවන්. යම් රියැලිටි වැඩසටහනක එක් සමයක ජයග්‍රාහකයන් ටික කලකින් සෙවීමට පවා අපහසුයි. හතු පිපෙන්නා සේ රියැලිටි වැඩසටහන් නිර්මාණය කරමින් සුපිරි තරු සොයා යද්දී බොහෝවිට වාණිජ අරමුණු හේතුවෙන් එහි ගුණාත්මක භාවය පවා අඩු වෙන අවස්ථා දක්නට පුළුවන්. මෙවැනි ආකාරයට බොහෝ රියැලිටි තරු බිහිවීමත් සමග සමහර තරුවලට රැඳී සිටීමේ විශාල ගැටලුවකට මුහුණ දෙන්නට සිදු වෙනවා. අන්න ඒ හේතුව නිසා සමහර අවස්ථාවන්වලදී සමහර නාලිකාවන් තමන්ගෙ සුපිරි තරු රැකගන්න නැවත නැවත ඔවුන් මිනිස්සුන්ගෙ හිත්වලට කා වද්දනවා. හරියට වෙළෙඳ දැන්වීමක් නැවත නැවත ප්‍රචාරය කරන ආකාරයෙන්. ගීත ගැයීමට හැකි සුපිරි තරු රංගනයට, නිවේදනයට එන්නෙ අන්න ඒ විදිහට. ඒ අවස්ථාවන්වලදී රංගනය, නිවේදනය වැනි දේවල් හදාරපු අයට බොහෝවිට අසාධාරණයක් වෙන්න තියෙන ඉඩකඩ ඉහළයි.

අනෙක් කරුණ වන්නෙ මෙම රියැලිටි වේදිකාවන්වලින් නිර්මාණය කරන්නෙ සැබෑම දක්ෂ තරුවක් ද යන්නත් බොහෝ අවස්ථාවන්වලදී ප්‍රේක්ෂකයන් මුහුණ දෙන ගැටලුවක්. මෙහිදී තරග විනිශ්චය සඳහා විනිශ්චය මණ්ඩලයක් සිටිය ද බොහෝ අවස්ථාවන්වලදී ජයග්‍රාහකයා තෝරගන්නෙ කෙටි පණිවිඩ මාර්ගයෙන්. මෙන්න මේ හේතුව නිසා නියම දක්ෂයාගේ අවස්ථාවන් අහිමි වී වැඩිපුර ප්‍රවර්ධන කරන ලද තරගකරුවාට අවස්ථාව හිමිවන අයුරක් දක්නට පුළුවන්. ජයග්‍රහණය සඳහා විශාල ප්‍රවර්ධනයක් සිදු කරන තරගකරුවන් සිටින අවස්ථාවන්වලදී දුප්පත් සැබෑ දක්ෂ තරගකරුවන්ට විශාල අසාධාරණයක් සිදුවීමටත් ඉඩ තිබෙනවා. මෙන්න මේ කෙටි පණිවිඩ ඡන්ද සඳහා පවතින අධික තරගය නිසාවෙන් සාධාරණ මෙන්ම අසාධාරණ ක්‍රමවලින් පවා තමන්ගේ ජයග්‍රහණය වෙනුවෙන් කටයුතු කරන තරගකරුවන් දකින්නටත් පුළුවන්. ඉතා කෙටි කලකින් සිම්පත් විශාල ප්‍රමාණයක් යොදාගෙන කෙටි පණිවිඩ යැවිය හැකි යන්ත්‍ර පවා නිර්මාණය වෙන්නෙ මෙන්න මේ කියන්නා වූ අධික තරගකාරී තත්ත්වය හේතුවෙන්.

> නාසා ආයතනයේ කාර්ය මණ්ඩලයේ 5%ක් ලාංකිකයන් සිටිද්දී, පේටන් බලපත්‍ර බොහෝ ප්‍රමාණයක් ලාංකිකයන් ලබා ගනිද්දී එයින් ප්‍රයෝජනයක් ගන්නට බොහෝ දෙනකුට වුවමනාවක් නෑ. බොහෝ දක්ෂ නව නිර්මාණකරුවන්ට නිසි අවස්ථාව නොලැබීම නිසා රට හැර යනවා වගේම නැවත නිර්මාණයන් කිරීම පවා අත්හැර දමන්නට ඔවුන්ට සිදු වෙනවා.

දියුණු වෙමින් පවතින රටක් විදිහට සහ බොහෝ වෙනස් ආකාරයට සිතනා මිනිසුන් සිටින රටක තවදුරටත් සුපිරි ගී තරුව තේරීම අවශ්‍යය ද කියන ගැටලුව පැන නඟිනවා. තාක්ෂණය සමග ඉදිරියට යන ලෝකයක ගායන තරුවලින් පමණක් ලෝකය ජය ගන්නට හැකි වෙනවා යැයි සිතීම විහිළුවක්. වර්තමානයේ බොහෝ නව නිර්මාණකරුවන් නිර්මාණ වෙනුවෙන් සිරබත් කන සමාජයක එවැනි දෙයක් බලාපොරොත්තුව විය හැකි නොවූව ද වගකිවයුතු මාධ්‍ය ආයතන විදිහට එක සීමාවකට පමණක් කොටු නොවී බොහෝ ක්ෂේත්‍රවල දක්ෂයන් සොයා යා යුතුය.

ලාංකීයයන් යනු ඉතා ඉහළ බුද්ධි මට්ටමක් සහිත, වෙනස් දේවල් සිදු කරන්නා වූ ජාතියක් ලෙස අතීතයේ සිටම ලොව ප්‍රකට කරුණක්. නාසා ආයතනයේ කාර්ය මණ්ඩලයේ 5%ක් ලාංකිකයන් සිටිද්දී, පේටන් බලපත්‍ර බොහෝ ප්‍රමාණයක් ලාංකිකයන් ලබා ගනිද්දී එයින් ප්‍රයෝජනයක් ගන්නට බොහෝදෙනෙකුට වුවමනාවක් නෑ. බොහෝ දක්ෂ නව නිර්මාණකරුවන්ට නිසි අවස්ථාවන් නොලැබීම නිසා රට හැර යනවා වගේම නැවත නිර්මාණ කිරීම පවා අත්හැර දමන්නට ඔවුන්ට සිදු වෙනවා. පසුගිය දිනක පස්වලින් වැලි වෙන් කර ගැනීමේ යන්ත්‍රයක් නිර්මාණය කළ නිර්මාණකරුට ලැබුණු ත්‍යාගය වනුයේ ඒ වෙනුවෙන් උසාවි ගොස් දඩ ගෙවීමටය. කෙසේ වුවද මාධ්‍ය ආයතන වර්තමානයේදී සුපිරි ගී තරුව තෝරා අවසන් කළ යුතු අතර, ඒ වෙනුවට නව නිර්මාණකරුවන්, ව්‍යවසායකයන්, සැබෑ ගැටලු විසඳන්නන් සොයා ඔවුන් තරු බවට පත් කළ යුතු කාලය එළඹ ඇත. ඒසේ නොවුණහොත් තවත් බොහෝ කාලයක් යනතුරු ශ්‍රී ලංකාව දියුණු වෙමින් පවතින රටක් ලෙසට සහ වසර දෙදහස් පන්සියයක අතීතය ගැන පුරසාරම් දොඩමින් සිටිය හැක. අසූව දශකයේ ආසියාවේ ඉහළම සංවර්ධන වේගයක් හිමි ලංකාව ආදර්ශයට ගනිමින් ගොඩනගන ලද සිංගප්පූරුව කෙසේ වෙතත් ඉතා දුප්පත් රාජ්‍යයක් ලෙස ප්‍රසිද්ධ ඉතියෝපියාව පවා මේ වන විට ලංකාව පසුකොට ගොස් හමාරය. දැන්වත් ලාංකිකයන් වෙනස් දේවල් කිරීමට උත්සාහ කළ යුතුය; ලෝකයට අවශ්‍ය දේවල් නිර්මාණය කිරීමට උත්සාහ කළ යුතුය.

**ක්‍රිෂාන් ගයන්ත වීරගේ**
**ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය**




**මාර්තු 06**

අද පොඩි වැඩකට කොච්චිකඩේට ගියා. බස් එකකට කියලා නැග්ගෙ පාරෙ යන කෆීර් කරත්තෙකට ද කියලත් හිතුනා. වංගු කෙළින් කරලා කානු උඩින් දාලා බ්‍රේක් අමතක කරලා ඇක්සලේටරේ ලෙල්ලටම පාගලා ඒ පැත්තටයි මේ පැත්තටයි පැද්දි පැද්දි ගියපු බස් එකේ හිටපු මට අපායයි දිව්‍ය ලෝකෙයි මාරුවෙන් මාරුවට පෙනුනා. ඒ මදිවට බහින තැන ළංවෙද්දි කොන්දොස්තර "ඉක්මනට බහින්න" කියලා ගිරිය කඩාගෙන කෑගහද්දී ඩ්‍රයිවර් මාමා බ්‍රේක් එකත් එක්කම ඇක්සලේටරේ පාගලා මාව හෝල්ට් එකෙන් විසිකරගෙන යන්න ගියා.

**මාර්තු 07**

අලුත් බලාපොරොත්තු ගොඩක් හිතේ පුරෝගෙන දවස පටන් ගත්තා. අලුත් ප්‍රබන්ධ කතාවක් ලියන්න පටන් ගත්තා. විශේෂයක් නෑ ඉතින් දවස ඔහේ අනුභව කරලා දැම්මා.

**මාර්තු 08**

අද උදෙන්ම අම්මගෙ මවුත් එලාම් එක හරි සද්දෙන් වදිනවා. එතකොටයි මතක් වුණේ අද නංගිගෙ උපන් දිනේ කියලා. අම්මා කිරිබතුත් හදලා. අපි ඉතින් කේක් කපලා පොඩි සප්‍රයිස් එකක් දීලා බඩ පැළෙන්නම කිරිබත් කෑවා. කාලා අත හෝදගන්න හම්බවුණේ නෑ හවිං 700ක් විතර යන්න පටන් ගත්තා. අන්තිමට හවිං නවතිද්දි නහයට බ්‍රේක් නෑ. පුදුම සනීපයක් නහයට දැනෙන්නෙ දැන්.

**මාර්තු 09**

කොරෝනාවලට ආරක්ෂාවක් විදිහට බෙහෙත් පෙත්තක් හදන්නෙ නැතිව එන්නතක් හඳුන්වලා දුන්නෙ ඇයි දෙයියනේ... දවසෙම කල්පනා කළේ ඕක ගැන. බේතක් විදිනවා කියනකොට මට හිතෙන්නෙම මාව පණ පිටින් කැරට් වගේ පෙති පෙතිවලට කපනවා කියලා. ටීවී එකේ බේත් විදිනවා පෙන්නද්දිත් මට විදිනවා වගේ දැනෙන්නෙ. ඇයි දෙයියනේ ඉන්ජෙක්ෂන් කටු මේ තරම් කුරිරු වුණේ...

**මාර්තු 10**

අද මගේ හිත වේදනාවෙන් පිරවෙච්ච දවසක්. අල්මාරියෙන් මොකක්ද සද්දයක් ඇහුනා. අල්මාරිය ඇරලා බලද්දි ටීෂර්ට් බ්ලවුස් ඔක්කෝම එකතු වෙලා "අනේ අපිට ඔයාව දාලා යන්න බෑ... ඔයාගෙන් අපිව වෙන් කරන්නෙපා" කිය කිය හොඳටම අඬනවා. "ඇඳුම් ටික ඔක්කොම නංගිට දෙන්න තමයි වෙන්නෙ" කියලා මං ඊයෙ රෑ කියපු කතාව එයාලට ඇහිල ද කොහෙද... පවු... එක්කො මං ටිකක් ඩයට් කරලා බලනවා එයාලගෙ ඉල්ලීම ඉෂ්ට කරන්න පුළුවන් ද කියලා...

**මාර්තු 11**

මේ මාසෙ විභාගයක් තියෙනවා කියලා මතක් වුණේ හීනෙන් වගේ. කොරෝනා කියලා කම්මැලිකමට පැත්තකට දාලා තිබ්බ මොළේ මළකඩ බැඳිලා. ආයෙ පාඩම් කරන්න නම් අලුත් මොළයක් කෙසේ වෙතත් second Hand මොළයක්වත් ගන්න වෙනවා. ටොෆි කන්න එකතු කරපු කාසිවලින් මොළයක් ගත්තොත් ආයෙ සෑහෙන කාලයක් ඉන්න වෙනවා ටොෆි කන්න. ඒ හින්දා කෝකටත් කියලා මං මළකඩ අයින් වෙයිද බලන්න මොළේට භූමිතෙල් ටිකක් දාලා තිබ්බා.

**මාර්තු 12**

"ජීවිතේ කියන්නෙ අභියෝගයක් දුකක් කියලා නොහිතන කෙනෙක් නැති තරම්. අපි කැමති වුණත් නැතත් සංසාරෙ කරපු කුසල අකුසල අනුව ලැබෙන ප්‍රතිවිපාක එක්ක ජීවිතේ ඉස්සරහට යන්නම වෙනවා. ඒ දේවල් මගහරින්න බැරි වුණත් අපිට සිද්ධ වෙනවා ඒ දේවල් කෙරෙහි සිත පිහිටුවාගෙන අමාරුවෙන් හරි අපේ ගමන යන්න. මොන බාධක ආවත් ලියන එක නවත්තන්න එපා. ඒ හැකියාව දවසින් දවස දියුණු කරගන්න."

**නුවන්ති හංසිනී උත්පලා**
**සඳලංකාව**

**'යෞවුන් ජනතා' දිනමිණ**
**ලේක් හවුස්, අංක 35, ඩී.ආර්. විජයවර්ධන මාවත, කොළඹ 10.**
younjanatha@lakehouse.lk

අපි හැමෝම කැමතියි තමන්ගේ රූපය ලස්සනට තියාගන්න. ඒ වෙනුවෙන් බොහෝ දෙනකු රූපලාවණ්‍ය මඟින් විසඳුම් සොයන යුගයක් තමයි මේ ගත කරන්නේ. ඉතිං දේශීය අමුද්‍රව්‍ය තුළින් රූපලාවණ්‍යයට විසඳුම් දුන් තරුණියක ගැනයි 'යොවුන් ජනතා' අද මේ කතාබහ.



# රූපයට ලස්සන ගෙන එන

## ආයුර්වේද වෛද්‍යවරිය

ඇයගේ නම ඉරේශා දිලරුක්ෂි. අම්මයි, තාත්තයි, නංගියි එක්ක ඉරේශගේ පදිංචිය අම්බලන්තොට. හම්බන්තොට ප්‍රාථමික විද්‍යාලය, හම්බන්තොට ථෙරපුත්ත ප්‍රාථමික විද්‍යාලය හා ථෙරපුත්ත ජාතික පාසලෙන් අධ්‍යාපනය හමාර කළ ඇය කොළඹ විශ්වවිද්‍යාලයේ දේශීය වෛද්‍ය පීඨයේ විද්‍යාර්ථයෙක්.

බටහිර වෛද්‍ය විද්‍යාවට ප්‍රවිෂ්ට වීමට වරම් නොලැබුණත් පුංචිකාලේ ඉදන්ම වෙද නළාවට ආසා කිරීම මත ඇය ආයුර්වේද වෛද්‍ය ක්‍රමය තෝරාගත් බව පැවසුවා. එහිදී විශ්වවිද්‍යාලයේ නම්නීකරණ කාලය තුළදී ආයුර්වේද වෛද්‍ය කමල් පෙරේරා මහතාගේ දේශනයට අනුව ඇය තුළින් හැංගිලා තිබුණු ආයුර්වේදය පිළිබඳ ශක්තිය එළියට පැමිණි බව ඇය මතක් කළා. ඒ අනුව වසර ගණනාවක් යනතුරු පුස්තකාලයේ ඖෂධ නිෂ්පාදනය පිළිබඳව පොත්පත් හා ඖෂධ අමුද්‍රව්‍ය රැගෙන ගොස් සරල ඖෂධ නිෂ්පාදනය කර තමන්ව විශ්වාස කරන පුද්ගලයන්ගේ ඇතැම් රෝග සඳහා ප්‍රතිකාර කරන බවත් ඒ හරහා ඔවුන් සුව වීමෙන් එය ඇයගේ ජීවිතයේ හැරවුම් ලක්ෂ්‍යය වූ බවත් මතක් කළා. පසුව තම පියාගේ රෝගාතුර වීම මත ඇති වූ ආර්ථික අපහසුතාවට පිළියමක් වශයෙන් ඇය ආයුර්වේද ආයතනයක් ආරම්භ කරනු ලබන්නේ. තමන්ගේ උත්සාහයෙන්, තනිව ආරම්භ කළ මෙම ආයතනය අද වනවිට 10 දෙනෙකුට රැකියා ලබා දෙන ආයතනයක් වශයෙන් සියලු නිෂ්පාදන සම්බන්ධ පර්යේෂණ සහතික හා ව්‍යාපාරයක් සහතික කිරීම වෙනුවෙන් සියලු නීතිමය සහතික සහිතව වර්ධනය කරන්නට ඇය හැකි වූ බව මතක් කළේ ඉතාමත් සතුටින්.

පුද්ගලයාගේ බාහිර පෙනුම, අභ්‍යන්තර නිරෝගී බව හා මානසික සුවතාව ස්භාවධර්මය භාවිතයෙන් ඔප් නැංවීම අරමුණු කරගනිමින් මේවන විට ඇයගේ නිෂ්පාදන අතර පහත නිෂ්පාදන සුවිශේෂී වෙනවා.

facewash වෙනුවට භාවිතා කළ හැකි, virgin coconut oil හා තල තෙල් base එක ලෙස යොදා ගනිමින් පර්යේෂණාත්මක වට්ටෝරුවලින් නිෂ්පාදිත සබන් වර්ග 6ක් නිෂ්පාදනය කරන්නට ඇය සමත්ව තිබෙනවා.



එමෙන්ම ජාතික තරුණ සේවා සභාව විසින් පවත්වන ලද, startup 2020 තරගාවලියෙන් ජයග්‍රහණද ගැනීමට ඉරේශාට හැකියාව ලැබූ බව ඇය මතක්කළා.

ඉරේශාගේ මේ දක්වා වූ ගමන තුළ ඇයට අතහිතදුන් බොහෝ පිරිසක් ඉන්නවලු. ඒ අතරින් අම්මා තාත්තා ඇතුළු පවුලේ සියලුදෙනාටත්, ඇයව විවාහ ගිවිසගැනීමට සිටින ඉන්දික පුෂ්පකුමාර, විශ්වවිද්‍යාලයේ හා පාසලේ සියලුම ගුරුදෙමාපියන්ටත්, ගුරුහරුකම් ලබාදුන් සියලුම වෛද්‍ය ආචාර්යවරුන්ටත්, සෑම කාර්යයකටම සහායදෙන යහළුමිත්‍රාදීන් ඇතුළුව වචනයකින් හරි සහයෝගය ලබාදුන් සියලුම දෙනාටත් හදවතින්ම ස්තූතිවන්ත වන බව මතක් කළා.

ඉදිරියේදී ආහාර අපතේ යෑමට විසඳුමක් ලෙස ඖෂධයක් ආහාරයක් ලෙස ලබාදෙන්නටත්, මානසික සුවතාවට සංගීතයෙන් ප්‍රතිකාරයක් නුදුරේදීම ලබාදීමට සූදානම් බව ඇය පැවසුවා.

අවසාන වශයෙන් අනාගත තාරුණ්‍යයට රූපලාවණ්‍යය තුළින් ඇය මෙන්න මෙහෙම පණිවිඩයක් දුන්නා.

"රූපලාවණ්‍යය වනාහි, හුදෙක්, පුද්ගල බාහිර සුන්දරත්වය ඔප් නංවන එක් සාධකයක් පමණයි. සිත් අභ්‍යන්තර සුන්දරත්වය පවත්වාගන්නා නිතැතින්ම සුන්දර චරිතයක් වේ. ප්‍රෞඪ රජාධානී සහිත ඔසු උයන් සපිරි අභිමානවත් ශ්‍රී ලාංකික ඉතිහාසයක් හිමි අපගේ ඖෂධවලට වටිනාකමක් ලබා දී කෘත්‍රිම රසායනික ද්‍රව්‍යවලින් බැහැරව ස්වභාවිකත්වය විඳීමට ශ්‍රී ලාංකික සියලු දෙනාට ආරාධනා කරමි. හම් පිළිකාවලින් තොර, ස්වභාවිකත්වය වැලඳගත්, අනාගතයකට ආසිරි පතමි.

අවසාන වශයෙන් මේ ටික පැවසිය යුතුයි.

"මහන්සි වෙන්න ඕනේ කාලෙදී හාන්සි වෙලා හිටියොත් හාන්සි වෙන්න ඕනේ කාලෙදි මහන්සි වෙන්න වෙනවා."

"තමන්ට තරගෙ තියෙන්නේ තමන් සමඟ මිසක් අනෙක් අය සමඟ නෙවෙයි"

"හැම කෙනාටම උරුම timeline & timeperiod එකක් තියෙනවා. ඒකේ ගමන් කරන්න. අනෙක් අයගේ timeline දිහා බල බල විඳවන්න එපා"

"කිසිම මොහොතක නිකම් ඉන්න එපා, අලුත් යමක් ගැන හිතන්න අත්හදා බලන්න. ජීවිතය දිනන්න."

ආහාර අපතේ යෑමට විසඳුමක් ලෙස ඖෂධයක් ආහාරයක් ලෙස ලබාදෙන්නටත්, මානසික සුවතාවට සංගීතයෙන් ප්‍රතිකාරයක් නුදුරේදීම ලබාදීමට සූදානම්.

■ කවි විජේසූරිය

# හුස්ම ගන්න රීති

නීතියකුත් රීතියකුත් අතර වෙනසක් ඇති බව දන්නා අප නීති කඩකළොත් නීතියෙන්ම දඬුවම් ලැබෙනා බව හොඳින්ම දන්නා කරුණකි. එහෙත් රීතිය කඩකළත් එසේ ඍජු දඬුවම් නොලැබෙන බව ද හොඳින්ම දනී. නීති පිළිබඳ අප යම් තරමක අවබෝධයකින් සිටි නමුත් රීති පිළිබඳ අප දක්වන සැලකිල්ල යම් මට්ටමක හෝ පවතින්නේ අඩු වශයෙනි. රීතියක් පවතින්නේ ජන ජීවිතයේ යහපතටයි. එය කඩ කළා කියා කවුරුත් දඬුවම් දීමට බැඳී නොසිටී. නමුත් එය අප සමාජයේ යහපැවැත්මට වඩාත් වැදගත් වන්නකි. පුද්ගලයාගෙන් පුද්ගලයාට ගත හොත් තමන්ටම හිමි වුණ අනන්‍යතාවයක් පවතී. සියලු දෙනා මහපොළොවේ පය ගසා ජීවත්වන එකම වාතය ආශ්වාස කරන මිනිසුන් වුවද අභ්‍යන්තරිකව දරන අදහස් සිතුවිලිවලින්, අහස හා පොළොව සේ එකිනෙකා අතර ලොකු වෙනසක් පවතී. එමනිසා අප විසින් අපහටම රීතින් ගොඩනගා ගත යුතු අතර එම රීතින් ද අහස පොළොව සේ එකින් එකට වෙනස්වීමේ හැකියාවක් පවතී. එක් අයකුට ගැළපෙන රීතියක් තවත් අයකුට කිසිසේත් අදාළම නොවිය හැකිය. එබැවින් අනුකරණයක් ජීවිතයට අත්‍යාවශ්‍ය නොවන බව ද සිහි තබා ගනිමු.

රීතීන් සත්‍ය වශයෙන්ම අපට අවශ්‍යම ද? එයින් ඇති ඵලය කුමක් ද? කිසිම රීතියක් නැති මේ මිනිස් කය වනයේ සිටින මෘගයකු හා සමානය. අප මනස තුළ කෙතරම් ආශාවන් තිබුණ ද යම් තැනක අපගේම යහපතට, එයට සීමා තනන්න සිදු වේ. රීතියක අවශ්‍යතාව ඇතිවනුයේ අපට මෙම අවස්ථාවේදීය. තමන් සම්බන්ධව හොඳින්ම දන්නේ තමාය. තමාට අවශ්‍ය රීතීන් හෝ සීමාවන් ගොඩනැඟිය යුත්තේ තමන්මය. පිටු අතර ලියා නොතිබුණද තමන්ටම කියා රීති තිබිය යුත්තේ තම සිතෙහිය. හොඳ නරක බලා තෝරා ගැනීමට තරම් බුද්ධියක් ගොඩනැගුණ මිනිස් වර්ගයාට කළ යුතු දේ, නොකළ යුතු දේ කුමක්ද යන්න අමුතුවෙන් පහදා දීම අනවශ්‍යයි. එනිසා තමන් වෙනුවෙන්ම ලියවෙන රීති සමඟ ඕනෑ තරම් සුදුසු ලෙස නම්‍යශීලි වීම ද අපටම පහසුවක් ගෙන දෙයි.

අප ඕනෑම අයෙක් අතර පවතින සරලම රීතියක් නැතහොත් යහ පුරුද්දක් ලෙස උදෑසන මුහුණ කට සේදීම දැක්විය හැක. සැබවින්ම මෙයත් රීතියකි. උදෑසන මුහුණ නොසේදුවා කියා දඬුවම් ඔබට පමුණුවන්නේ කවුරුන් ද? කුමන නීති පොතේ ද උදෑසන මුහුණ සේදිය යුතුමයි කියා ලියවී ඇත්තේ? නමුත් කවුද මුහුණවත් සෝදන්නේ නැතිව ගෙදරින් එළියට බහින්නේ? සිතා බලන්න, ඇයි අපි රීතීන් පිළිපදින්නේ කියා. මව්පියන් කුඩා කල සිටම නොමැති අයෙක් වුවත් මේ රීතීන් පිළිපදින්න යොමු වන්නේ එසේ නොකළහොත් අත්වන ඵලවිපාක දැනෙනා බැවිනි.

තමන්ටම කියල දේපළ වතුපිටි ඉඩම් කඩම් වටිනා දේවල්, දැනුම රැස්කර ගන්නා අතරම හොඳ රීති ටිකකුත් තමන්ටම කියල ගොඩනගා ගන්න. භෞතිකව නොතිබුණත් දැනටමත් ඔබ සතුව ඇති රීති පොත සම්පූර්ණ කර ගන්න. ආගමක් දහමක් රීතියක් නැති මිනිසා වන සතකු හා සමානය. අප ඉපිද ඇත්තේ මිනිසකු ලෙස නම් අප මේ ගෙවන කාලය උපරිම අයුරින් මිනිසකු ලෙසම භුක්ති විඳිමු. සමාජයට බරක් නොවී සිනා මුවින් සතුටින් ඉඳිමු. ඒ නිදහසට රීති ටිකකුත් සමඟ ඔබේ ගමන යන්න. ස්වයං විනයක් අපි හැමෝටම තිබීම සමාජයටම යහපතක්. ඔබේ වගකීම ඔබම ගන්න.

■ ඩිල්කි දම්බරගේ

2021 මාර්තු 13 සෙනසුරාදා කොළඹ ඩී.ආර්. විජයවර්ධන මාවතේ අංක 35 දරන ස්ථානයේ පිහිටි ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.